
වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சு
Ministry of Plantation and Community Infrastructure

Funded by the European Union



# ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය සඳහා
# තිරසාර සහ තරඟකාරී වර්ධනයක් සඳහා ප්‍රජාවන් බලගැන්වීම

උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම (2026-2035)

කෙටුම්පත 1.2

UNITED NATIONS INDUSTRIAL DEVELOPMENT ORGANIZATION

BESPA-FOOD
BEST STANDARDIZED PRACTICES FOR AGRI-FOOD

## වගකීම් අත්හැරීමේ ප්‍රකාශය

©UNIDO 2026.

සියලුම හිමිකම් ඇවිරිණි. මෙම ලේඛනය එක්සත් ජාතීන්ගේ විධිමත් සංස්කරණයකින් තොරව සකස් කර ඇත. මෙම ලේඛනයේ දක්වා ඇති තනතුරු සහ කරුණු ඉදිරිපත් කිරීම් මඟින් කිසියම් රටක, ප්‍රදේශයක, නගරයක හෝ කලාපයක හෝ එහි බලධාරීන්ගේ නෛතික තත්ත්වය පිළිබඳව හෝ එහි දේශසීමා නිර්ණය කිරීම් හෝ එහි ආර්ථික පද්ධතිය හෝ සංවර්ධන මට්ටම පිළිබඳව එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානයේ (UNIDO) ලේකම් කාර්යාලය වෙනුවෙන් කිසිදු ආකාරයක අදහස් ප්‍රකාශ කිරීමක් අදහස් නොකෙරේ. "සංවර්ධිත", "කාර්මික" සහ "සංවර්ධනය වෙමින් පවතින" වැනි නාමකරණයන් සංඛ්‍යානමය පහසුව සඳහා අදහස් කර ඇති අතර, සංවර්ධන ක්‍රියාවලියේදී යම් රටක් හෝ ප්‍රදේශයක් ලබා ඇති මට්ටම පිළිබඳව අනිවාර්යයෙන්ම විනිශ්චයක් ප්‍රකාශ නොකරයි. සමාගම් නාම හෝ වාණිජ නිෂ්පාදන පිළිබඳ සඳහන් කිරීම් UNIDO ආයතනයේ පිළිගැනීමක් ලෙස අර්ථ නොදැක්විය යුතුය. අත්සන් තබන ලද ලිපිවල අඩංගු අදහස්, සංඛ්‍යානමය දත්ත සහ ඇස්තමේන්තු අදාළ කතුවරයාගේ (කතුවරුන්ගේ) වගකීම වන අතර, ඒවා UNIDO හි අදහස් පිළිබිඹු කරන හෝ එහි අනුමැතිය ලත් කරුණු ලෙස අනිවාර්යයෙන්ම නොසැලකිය යුතුය. මෙහි ඇති තොරතුරුවල නිරවද්‍යතාවය පවත්වා ගැනීමට දැඩි සැලකිල්ලක් දක්වා තිබුණද, UNIDO හෝ එහි සාමාජික රටවල් මෙම ලේඛණය භාවිතයෙන් මතු විය හැකි ප්‍රතිවිපාක සඳහා කිසිදු වගකීමක් භාර නොගනී. විශේෂයෙන්ම, මෙහි අන්තර්ගතය පුරා දක්වා ඇති උදාහරණ කිසියම් නිශ්චිත නිෂ්පාදකයෙකු හෝ භාවිතයක් අනුමත කිරීමක් ලෙස අදහස් නොකෙරේ, ඒවා වත්මන් තාක්ෂණික ශක්‍යතා සහ ප්‍රවණතා නිරූපණය කිරීමක් පමණි. මෙම ලේඛනය මුදල් ගෙවීමකින් තොරව උපුටා දැක්වීමට හෝ නැවත මුද්‍රණය කිරීමට හැකිය එනමුත් ඒ සඳහා අදාළ මූලාශ්‍රය සඳහන් කරන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

මෙම ලේඛනය යුරෝපා සංගමයේ සහයෝගය ඇතිව සකස් කර ඇත. මෙම ලේඛනයේ අන්තර්ගතය කිසිසේත්ම යුරෝපා සංගමයේ හෝ UNIDO හි අදහස් පිළිබිඹු කරන්නක් ලෙස සැලකිය නොහැකිය.

පෙරවදන

(අතිගරු ජනාධිපතිතුමා විසින්)

තුති පිදුම

(ඇතුළත් කිරීමට නියමිතයි)

## පටුන


වගකීම් අත්හැරීමේ ප්‍රකාශය

පෙරවදන

පිදුම

කෙටි යෙදුම් ලැයිස්තුව

වගු ලැයිස්තුව

රූප සටහන් ලැයිස්තුව

1. හැඳින්වීම 7

1.1. දළ විශ්ලේෂණය

1.2. පසුබිම

1.3. අරමුණු

1.4. ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) 14

1.5. මාර්ග සිතියම සැකසීමේ ක්‍රියාවලිය

2. ප්‍රතිපත්ති පසුබිම සහ උපායමාර්ගික ප්‍රමුඛතා

2.1. ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුව (NPF 2025) 16

2.2. ශ්‍රී ලංකාවේ වැවිලි අංශය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (NPPS 2024) 17

2.2.1. බෝග නිෂ්පාදනය සහ සම්පත් කළමනාකරණය: 18

2.2.2. පර්යේෂණ සහ සංවර්ධන: 18

2.2.3. අගය දාම සංවර්ධනය සහ අගය එකතු කිරීම: 18

2.2.4. අලෙවිකරණය, වෙළඳාම සහ ව්‍යවසායකත්ව සංවර්ධනය: 18

2.2.5. පරිසර ආරක්ෂණය සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව: 19

2.2.6. පාර්ශවකරුවන් බලගැන්වීම: 19

2.2.7. වෘත්තීය සෞඛ්‍යය සහ සමාජ ආරක්ෂණ: 19

2.2.8. ප්‍රතිපත්ති සහ පාලනය: 19

2.3. උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම (2026-2035) හරහා ප්‍රතිපත්ති ඒකාබද්ධ කිරීම 20

3. අගය දාම පිළිබඳ දළ විශ්ලේෂණය: වත්මන් සන්දර්භය සහ සංසන්දනාත්මක අදහස්

3ග1ග පොල් ආශ්‍රිත අගය දාමය

3.2. ඉල්ලුම

3.3. සැපයුම

3.4. අගය එකතු කිරීම සහ අපනයන

3.5. ගෝලීය තත්ත්වය

4. වෙනස් වීමේ සිද්ධාන්තය: ඇමරිකානු ඩොලර් බිලියන 2 ක ක්ෂේත්‍රයක් සඳහා වන සැලැස්ම

5. අගය දාම ක්‍රියාකාරීන්: ක්‍රියාමාර්ග, ආයෝජන අවස්ථා සහ ප්‍රතිලාභ
5.1. යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග - යෙදවුම් සපයන්නන්
5.2. යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග - සුළුපරිමාණ ගොවීන්
5.3. යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග - වතු හිමියන්
5.4. යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග - එකතු කරන්නන්
5.5. යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග
සැකසුම්කරුවන් (දේශීය වෙළඳපොළ සහ ජාත්‍යන්තර වෙළඳපොළ)
5.6. යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග - අපනයනකරුවන්
5.7. යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග - රාජ්‍ය ආයතන
5.8. යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග - මූල්‍ය ආයතන සහ ආයෝජකයින් 59
5.9. යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග - විද්වත් ප්‍රජාව සහ සංවර්ධන හවුල්කරුවන්
6. ක්‍රියාත්මක කිරීමේ / සම්බන්ධීකරණ / පාලන යාන්ත්‍රණය (ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ)
6.1. හැඳින්වීම
6.2. උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය
6.3. කාර්යභාරයන් ඒකාබද්ධ කිරීම 69
7. අධීක්ෂණය සහ ඇගයීම
8. මාර්ග සිතියම සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැපයීම
9. ඇමුණුම්
9.1. ඇමුණුම 1: පාර්ශවකරුවන්: වගකීම්, ක්‍රියාමාර්ග සහ ප්‍රතිලාභ අනුකෘතිය
9.2. ඇමුණුම 2: ගණිතමය ආකෘති අර්ථ දැක්වීම්, උපකල්පන සහ ගණනය කිරීම් 95
9.3. ඇමුණුම 3: ආයතනික සිතියම්ගත කිරීම 96
9.4. ඇමුණුම 4: පාර්ශවකරුවන්ගේ කණ්ඩායම /
උපදෙස් ලබාගත් පුද්ගලයින්, සමාරම්භක වැඩමුළුවේ සහභාගිවන්නන්, මෙහෙයුම් කමිටුව (ලැයිස්තු)

## කෙටි යෙදුම් ලැයිස්තුව

(ඇතුළත් කිරීමට නියමිතයි)

වගු ලැයිස්තුව

වගුව 1 - උපායමාර්ගික සැලැස්මේ සහ මාර්ග සිතියමේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක 14

වගුව 2 - ජාතික වැවිලි ප්‍රතිපත්ති තේමාවන් පොල් අංශයේ මාර්ග සිතියම් ක්‍රියාමාර්ග (2026-2035) සමඟ පෙළගැස්වීම 20

වගුව 3 - නිෂ්පාදන වර්ගය අනුව ඉහළම පොල් නිෂ්පාදන අපනයනකරුවෝ (2023) 39

වගුව 4 - සවිස්තරාත්මක මූල්‍ය හා ආර්ථික ප්‍රක්ෂේපණ සහ ආයෝජන පැතිකඩ 45

රූප සටහන් ලැයිස්තුව

රූපය 1 - උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම සඳහා වන ප්‍රධාන කුළුණු 09

රූපය 2 - පොල් ක්ෂේත්‍රෙය් උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියමේ (SPRM) ප්‍රධාන අරමුණු. 12

රූපය 3 - පොල් අගය දාමය 26

රූපය 4 - 2024 වර්ෂය සඳහා පොල් නිෂ්පාදනයේ පරිභෝජන රටාව 30

රූපය 5 - දේශීය පොල් පරිභෝජනය සහ අනෙකුත් භාවිතයන්හි ප්‍රවණතා 31

රූපය 6 - 2023 වර්ෂයේ පොල් වගා ව්‍යාප්තියේ භූගෝලීය ව්‍යාප්තිය 32

රූපය 7 - ලංකාවේ ප්‍රධාන වශයෙන් පොල් වගා කරන ප්‍රදේශ පිළිබඳ දිස්ත්‍රික්ක මට්ටමේ දළ විශ්ලේෂණය 33

රූපය 8 - පොල් ගෙඩි නිෂ්පාදනය සහ වගා කරන ලද භූමි ප්‍රමාණය 34

රූපය 9 - ශ්‍රී ලංකාවේ අපනයන සඳහා පොල් ආශ්‍රිත නිෂ්පාදනවල දායකත්වය 35

රූපය 10 - පොල් නිෂ්පාදනවල අපනයන කාර්ය සාධනය 36

රූපය 11 - සාමාන්‍ය අපනයන අගය අනුව ඉහළම අපනයනට හිමිකම් කියන පොල් මද ආශ්‍රිත නිෂ්පාදන දහයේ ව්‍යාප්තිය. 37

රූපය 12 - සාමාන්‍ය අපනයන අගය අනුව ඉහළම අපනයනට හිමිකම් කියන පොල් මද නොවන නිෂ්පාදන දහයේ ව්‍යාප්තිය (2020-2025) - ඇමරිකානු ඩොලර් '000. 37 38

රූපය 13 - සාමාන්‍ය ගෝලීය පොල් නිෂ්පාදනය (2019-2023) 39

රූපය 14 - පොල් ක්ෂේත්‍රයේ ආයතනික රාමුව 67

රූපය 15 - ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සහ අධීක්ෂණය හා ඇගයීම පිළිබඳ සරල රූපසටහන 70

රූපය 16 - උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම (SP&R) සඳහා අරමුදල් සැපයීමේ පිළිබඳ සරල රූපසටහන 83

# 1. හැඳින්වීම

## 1.1. දළ විශ්ලේෂණය

පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියමෙහි (SP&R) ප්‍රධානතම අරමුණ වන්නේ, පුළුල් සමාජයීය ප්‍රතිලාභ රැසක් අත්කර දෙමින් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයේ වඩාත්ම ක්‍රියාශීලී ගාමක බලවේගය බවට පොල් කර්මාන්තය පත්කිරීමයි. මෙම උත්සාහයේදී ඉලක්කගත ක්‍රියාමාර්ග සහ ඒකාබද්ධ පරිවර්තනයන් ඔස්සේ, මෙම උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම මඟින් පොල් ක්ෂේත්‍රය ඉහළ කාර්යසාධනයක්, අපනයන තරඟකාරිත්වයක් සහ කෘෂිකාර්මික ආර්ථිකය තුළ දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාවක් සහිත ක්ෂේත්‍රයක් කරා මෙහෙයවීමට අපේක්ෂා කෙරේ. 2030 වන විට ඇමරිකානු ඩොලර් බිලියන 5ක අපනයන ආදායමක් උපයා ගැනීම සඳහා වැවිලි අංශය තබා ඇති ඉලක්කයට අනුකූලව කටයුතු කරමින්, මෙම ක්ෂේත්‍රයේ උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම මඟින් විවිධාංගීකරණය, අගය එකතු කිරීම සහ වෙළඳපොළ ව්‍යාප්ත කිරීම තුළින් රටේ ආර්ථික තරඟකාරිත්වය සහ ස්ථාවරත්වය ශක්තිමත් කිරීමට මෙයින් අඩිතාලම් දමනු ඇත. තවද, පොල් නිෂ්පාදන පද්ධතිවල කාර්යක්ෂමතාව, තිරසාරභාවය සහ තාක්ෂණික දියුණුව ඉහළ නැංවීම මඟින් ජාතික මට්ටමේ ස්වයංපෝෂිතභාවය සහ ආහාර සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය කිරීම මෙහි අභිලාෂය වේ. මෙම ප්‍රයත්නයන් තුළින් පොල් ක්ෂේත්‍රයේ උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම දෙස අවධානය යොමුකිරීමේදී එය සියළු අංශ ඇතුළත් කරගත් ආර්ථික වර්ධනයක් ඇති කරන අතර, ශ්‍රී ලංකාවේ පුළුල් තිරසාර සංවර්ධන සහ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ අභිලාෂයන් ඉදිරියට රැගෙන යනු ඇත. එමඟින් දිළිඳුකම පිටුදැකීම, ආර්ථික ප්‍රගතිය ඇති කිරීම සහ දේශගුණික ක්‍රියාකාරකම් වේගවත් කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සඳහා ශ්‍රී ලංකාවේ ඇති කැපවීම නැවත තහවුරු වේ.

පොල් ක්ෂේත්‍රයේ උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම මඟින් අපනයන ආදායම 2024 වසරේ පැවති ඇමරිකානු ඩොලර් මිලියන 855 සිට 2030 වන විට ඇමරිකානු ඩොලර් බිලියන 1.5 දක්වා ද, තවදුරටත් 2035 වන විට ඇමරිකානු ඩොලර් බිලියන 2 දක්වා ද වර්ධනය කිරීමේ උපාය මාර්ග ගෙනහැර දක්වයි. මෙම වර්ධනය උදාවනුයේ පොල් ආශ්‍රිත අගය දාමයේ ඵලදායිතාව ඉහළ නැංවීම, විවිධාංගීකරණය, තාක්ෂණය මුසු කර ගැනීම සහ අගය එකතු කිරීමේ එකතුවක් මඟිනි. නිෂ්පාදන මට්ටමේදී, මෙම මාර්ග සිතියම මඟින් වාර්ෂික පොල් නිෂ්පාදනය බිලියන 2.8 සිට 2035 වන විට බිලියන 4.5 දක්වා වැඩි කිරීමට ඉලක්ක කරන අතර, එමඟින් සැකසුම් සහ අපනයන කර්මාන්ත සඳහා විශ්වාසදායක සහ තිරසාර සැපයුම් පදනමක් ක්‍රියාත්මක වන බව සහතික කෙරේ. සැකසුම් ධාරිතාව පුළුල් කිරීම, සැපයුම් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ අලෙවිකරණය මෙන්ම සන්නාමකරණය ශක්තිමත් කිරීම මඟින් පොල් ක්ෂේත්‍රයට ගෝලීය අගය දාමයන්හි ඉහළට ගමන් කිරීමට මෙමගින් සහාය සැපයෙනු ඇත. ඒ අනුව, හුදෙක් අමුද්‍රව්‍ය ලෙස අපනයනය කිරීම වෙනුවට ඉහළ ප්‍රතිලාභ අත්කර ගත හැකි අයුරින් නැඹුල් පොල්තෙල්, පොල් වතුර, පොල් කිරි සහ සක්‍රිය කාබන් වැනි ඉහළ අගයක් එකතු කළ පොල් ආශ්‍රිත නිෂ්පාදන කරා පරිවර්තනය වීම සිදුවනු ඇත.

මෙම ක්ෂේත්‍රයේ වර්ධනය මඟින් සමස්ත අපනයන ආදායම ඉහළ නැංවීමට පදනමක් සැකසෙනවා පමණක් නොව, වගා කිරීම, එකතු කිරීම සහ ප්‍රවාහනය, සැකසීම, ඇසුරුම්කරණය සහ වෙළඳාම ඇතුළු සමස්ත අගය දාමය පුරාම සැලකිය යුතු රැකියා අවස්ථා ප්‍රමාණයක් ද බිහි වනු ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පොල් කර්මාන්තයේ උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම මඟින් ජාතික ආදායමට දක්වන දායකත්වය ශක්තිමත් කිරීමටත්, ග්‍රාමීය ජීවනෝපායන් නගාසිටුවීමටත්, ශ්‍රී ලංකාවේ පුළුල් අපනයන විවිධාංගීකරණ උපාය මාර්ගයට සහාය වීමටත් මහෝපකාරී වනු ඇත.

පොල් ක්ෂේත්‍රය තුළ සියළු අංශ නැතහොත් සියළු පාර්ශව ඇතුළත් කරගත් සහ තිරසාර වර්ධනයක් සහතික කිරීම සඳහා මෙම උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම ප්‍රජා සංවර්ධනය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. ග්‍රාමීය ජීවනෝපායයන් ශක්තිමත් කිරීම මඟින් ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීමට මෙම උපාය මාර්ගය අපේක්ෂා කරයි. එපමණක් නොව, ඉලක්කගත පුහුණු සහ ධාරිතා වර්ධන උත්සායහයන් මඟින් ගොවීන්ට නවීන, තිරසාර සහ දේශගුණයට ඔරොත්තු දෙන ගොවිතැන් ක්‍රම හඳුන්වා දෙනු ඇති අතර, එමගින් ඔවුන්ගේ ඵලදායිතාව, සම්පත් කාර්යක්ෂමතාව සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට හැකි වේ. මෙම මැදිහත්වීම් මඟින් යහපත් කෘෂිකාර්මික පිළිවෙත්, වඩාත් දියුණු පළිබෝධ සහ පෝෂක කළමනාකරණය මෙන්ම පසු අස්වනු ශිල්පීය ක්‍රම අනුගමනය කිරීම ද ප්‍රවර්ධනය කරනු ඇත. තවද, මෙම මුලපිරීම් මඟින් නිෂ්පාදනයේ සිට අලෙවිකරණය දක්වා වූ පොල් අගය දාමය ශක්තිමත් කිරීමට බලාපොරොත්තු වන අතරම, සුළු පරිමාණ ගොවීන් සවිබල ගැන්වීම සහ ක්ෂේත්‍රය සඳහා තරුණ සහභාගීත්වය දිරිමත් කිරීම ද සිදු කරනු ඇත.


පොල් ක්ෂේත්‍රය කෙරෙහි දේශගුණික විපර්යාසයන්ට ඇති බැලපෑම සහ සංවේදීතාව හඳුනා ගනිමින්, මෙම පොල් උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ පාරිසරික තිරසාරභාවය ද කැපී පෙනෙන ලෙස ඉස්මතු කරයි. මෙම සැලැස්ම මඟින් වඩාත් කාර්යක්ෂම ජල භාවිතය සහ වගකීම් සහගත රසායනික හා පොහොර කළමනාකරණය තුළින් තිරසාර ගොවිතැන් පද්ධති ප්‍රවර්ධනය කරන අතර, එමඟින් පසෙහි සරු බව සහ දිගුකාලීන ඵලදායිතාව පවත්වා ගනිමින් පාරිසරික බලපෑම් අවම කරනු ලබයි. මීට අමතරව, සම්පත් උපරිම ලෙස භාවිත කිරීමට සහ ඵලදායිතාව ඉහළ නැංවීමට උපකාරී වන දියුණු වාරිමාර්ග සහ ජල කළමනාකරණ පද්ධති මඟින් සහාය ලබන, නවෝත්පාදනයන් පදනම් කරගත් දේශගුණයට ඔරොත්තු දෙන ගොවිතැන දිරිමත් කරනු ලබයි. මෙම මැදිහත්වීම් සියල්ල ඒකරාශී වීමෙන්, ජාතික වැවිලි අංශයේ ඉලක්ක, දේශගුණික අරමුණු සහ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ සමපාත වන වඩාත් කාර්යක්ෂම හා තිරසාර පොල් නිෂ්පාදන පද්ධතියක් සඳහා දායකත්වය සැපයේ.

පොල් උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම විසින් පොල් කර්මාන්තය අත්‍යවශ්‍ය ආයෝජන ආකර්ෂණය කරගත හැකි මට්ටමකට පත්කරන අතර, එය සාමාන්‍ය වෙළඳ භාණ්ඩ පදනම් කරගත් අංශයක සිට අගය එකතු කළ, උසස් තත්ත්වයේ නිෂ්පාදන කර්මාන්තයක් දක්වා පරිවර්තනය වීමට සහාය වේ. මෙය කුළුණු තුනක් මත ගොඩනැඟී ඇත (රූපය 1) - එනම් දේශගුණය **(Climate)**, ප්‍රජාවන් **(Communities)**, සහ තරඟකාරිත්වය **(Competitiveness)** යන්නයි. මෙම කුළුණු ත්‍රිත්වය ජාතික මෙන්ම ගෝලීය ඉලක්ක සපුරා ගත හැකි තිරසාර මෙන්ම සියළු පාර්ශව නැතහොත් සියළු අංශ ඇතුළත් කරගත් සහ තරඟකාරී පොල් ආශ්‍රිත ක්ෂේත්‍රයක් සංවර්ධනය කිරීම සඳහා නවෝත්පාදනයේ ශක්තිය උපයෝගී කරගනිමින් එකිනෙකට සමගාමීව ක්‍රියාත්මක වේ.

රූපය 1 හි දක්වා ඇති පරිදි, දේශගුණික කුළුණ (climate pillar) පාරිසරික තිරසාරභාවය සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. දේශගුණික ප්‍රවණතා අවබෝධ කර ගැනීම සඳහා තොරතුරු විශ්ලේෂණය, පරිසර පද්ධති ආරක්ෂා කිරීම සඳහා ජෛව විවිධත්ව සංරක්ෂණය, සම්පත්වල තිරසාරභාවය සහතික කිරීම අරමුණු කොට ගත් කාර්යක්ෂම ජල කළමනාකරණය සහ පාරිසරික බලපෑම් අවම කිරීම සඳහා වගකීම් සහගත රසායනික කළමනාකරණය එමගින් අවධාරණය කෙරේ. තවද, ප්‍රජා කුළුණ (communities pillar) මඟින් දේශීය ප්‍රජාවන් සවිබල ගැන්වීම සහ තිරසාර වර්ධනයට දායක වීම සඳහා එකී ප්‍රජාවන්ගේ ධාරිතාව ඉහළ නැංවීම අරමුණු කරන අතරම, ගෘහස්ථ මට්ටමින් පොල් අපතේ යාම අවම කිරීමට ඔවුන්ව දිරිමත් කරයි. මෙයට ප්‍රජා අවශ්‍යතා තේරුම් ගැනීමට තොරතුරු විශ්ලේෂණය භාවිත කිරීම, වෙනස් වන වෙළඳපොළ ප්‍රවණතාවලට අනුකූල වීම සඳහා පාරිභෝගික හැසිරීම් අධ්‍යයනය කිරීම, කුසලතා සංවර්ධනය සහ පුහුණුව තුළින් මානව සම්පත් ධාරිතාව ගොඩනැඟීම සහ ජීවනෝපාය හා ඵලදායිතාව නඟාසිටුවීම සඳහා ප්‍රජා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ඇතුළත් වේ. තරඟකාරිත්ව කුළුණ (competitiveness pillar) සැලසුම් කර ඇත්තේ ජාත්‍යන්තර වෙළඳපොළවල් තුළ මෙම ක්ෂේත්‍රයේ ආර්ථික ශක්තිය සහ ගෝලීය ස්ථාවරය ඉහළ නැංවීම අරමුණ කොට ගෙනය. මෙම

කුළුණු තුනම නවෝත්පාදනය හරහා එකිනෙකට බද්ධ වී ඇති අතර, එය සමස්ත උපාය මාර්ගයේම ගාමක බලවේගය ලෙස ක්‍රියා කරයි. නවෝත්පාදනය මඟින් නව තාක්ෂණයන්, සුහුරු පිළිවෙත් සහ පර්යේෂණ පදනම් කරගත් විසඳුම් සියලු ක්ෂේත්‍ර හරහා ඒකාබද්ධ කිරීම සහතික කරන අතර, එමඟින් අඛණ්ඩ වැඩිදියුණු වීම, තිරසාරභාවය, අනුවර්තනය වීමේ හැකියාව සහ වර්ධනය ළඟා කර දෙයි.

රූපය 1 - උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම සඳහා වන කුළුණු




මූලාශ්‍රය: UNIDO

## 1.2. පසුබිම

ශ්‍රී ලංකාවේ වැවිලි ආර්ථිකයේ වැදගත් කුළුණක් වන පොල් ක්ෂේත්‍රය, සමස්ත අපනයනයෙන් ආසන්න වශයෙන් සියයට 6-7 කට සහ දළ ජාතික නිෂ්පාදිතයට සියයට 1 ක දායකත්වයක් සපයන අතර, සෘජු හා වක්‍ර රැකියා මාර්ගයෙන් 1,000,000 කට වඩා අධික පිරිසකගේ ජීවනෝපාය සුරක්ෂිත කරයි. ඓතිහාසිකව දිවයිනේ සමාජ-සංස්කෘතික හා ආර්ථික රටාව සමඟ බද්ධ වී ඇති පොල් ගස, "ජීවන වෘක්ෂය" හෝ "කප්රුක" ලෙස ගෞරවයට පාත්‍ර වන අතර, එය ගෘහස්ත පරිභෝජනය, ග්‍රාමීය ජීවනෝපාය, සංස්කෘතිය සහ කාර්මික නිෂ්පාදනය සඳහා අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි.

ශ්‍රී ලංකාවේ පොල් වගාව ඈත අතීතය දක්වා දිවයන්නක් වුවද, මහා පරිමාණ වාණිජකරණයකට එය නතු වූයේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේදී ය. එහිදී ස්වයංපෝෂිත මට්ටමේ පැවති ගෘහස්ත නිෂ්පාදනය, සංවිධානාත්මක වැවිලි කෘෂිකර්මාන්තයක් දක්වා පරිවර්තනය විය. 1970 දශකයේ මුල් භාගයේ සිදු වූ ඉඩම් ප්‍රතිසංස්කරණය තුළින් අයිතිය පිළිබඳ වෙනසක් සිදුවූ අතර, එමඟින් සුළු

පරිමාණ වතු හිමියන්ට අවස්ථාව සලසමින් විශාල ව්‍යුහාත්මක වෙනසක් සිදු විය. අද වන විට, වගාකරුවන්ගෙන් ආසන්න වශයෙන් සියයට 75 ක්ම අක්කර 10 කට වඩා අඩු ඉඩම් ප්‍රමාණයන්හි වගා කටයුතු සිදු කරන අතර, ඔවුන් සාමූහිකව ජාතික නිෂ්පාදනයෙන් සියයට 70 කට ආසන්න දායකත්වයක් ලබා දෙයි. ඉතිරි ප්‍රමාණය පෞද්ගලික සහ රජය සතු වතු මගින් නිෂ්පාදනය කෙරේ.

භූගෝලීය වශයෙන් ගත් කල, ශ්‍රී ලංකාවේ පොල් වගාව මූලික වශයෙන් කේන්ද්‍රගත වී ඇත්තේ සාම්ප්‍රදායික "පොල් ත්‍රිකෝණය" වන කුරුණෑගල, පුත්තලම සහ ගම්පහ යන දිස්ත්‍රික්ක තුළ වන අතර එය ප්‍රධාන නිෂ්පාදන කලාපය ලෙස පවතී. ජාතික සැපයුමෙහි ලා එහි ඇති ප්‍රධාන භූමිකාව අවධාරණය කරමින්, රටේ සමස්ත පොල් වගා බිම් ප්‍රමාණයෙන් සියයට 36 කට වඩා වැඩි ප්‍රමාණයක් කුරුණෑගල දිස්ත්‍රික්කය සතු කර ගෙන තිබේ.

මීට අමතරව ගාල්ල, මාතර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක පුරා විහිදෙන "දකුණු පොල් තීරය" ද පිහිටා ඇත. මෙම කලාපය ජාතික "ඔරොත්තු දීමේ කලාපයක්" (Resilience Zone) ලෙස ක්‍රියා කරන අතර, වයඹ පළාතට වඩා වෙනස් කාලගුණ රටාවන්ගෙන් එය ප්‍රතිලාභ ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස, පොල් ත්‍රිකෝණයට බලපාන නියඟ, පළිබෝධ හානි හෝ වෙනත් දේශගුණික බලපෑම් පවතින කාල වකවානුවලදී නිෂ්පාදනය ස්ථාවරව පවත්වා ගැනීමට මෙය උපකාරී වන අතර, මෙම ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා වර්ධනය වෙමින් පවතින උපායමාර්ගික කේන්ද්‍රස්ථානයක් ලෙසද ක්‍රියා කරයි.

මෑත වසරවලදී, පොල් වගාව ආර්ථික අවස්ථා සහ ප්‍රාදේශීය සංවර්ධනය උදෙසා උපකාරී වන්නක් ලෙස හඳුනා ගනිමින්, උතුරු පළාත තුළ "උතුරු පොල් ත්‍රිකෝණයක්" පිහිටුවීම මගින් මෙම කර්මාන්තය තවදුරටත් ව්‍යාප්ත කර ඇත. ව්‍යුහාත්මකව, මෙම කර්මාන්තය පොල් මද ආශ්‍රිත සහ පොල් මද නොවන යන උප-අංශ දෙකෙන්ම සමන්විත වේ. පොල්තෙල්, දිසිදි පොල්, පොල්කිරි පිටි සහ කොප්පරා වැනි පොල් මද ආශ්‍රිත නිෂ්පාදන මේ හා සම්බන්ධ අගය දාමයේ ප්‍රධාන නිෂ්පාදන බවට පත්වීමට දායක වන අතර, කොහු බත්, ලෙලි කෙඳි, පොල්කටු අඟුරු සහ සක්‍රීය කාබන් ඇතුළු පොල් මද නොවන නිෂ්පාදන මෙම ක්ෂේත්‍රයේ වර්ධනය වන කාර්මික සහ අපනයන ඉල්ලුමට අනුබලය ලබා දෙයි.

2024 වර්ෂයේදී, ශ්‍රී ලංකාව හෙක්ටයාර් 467,122 ක වගා බිම් ප්‍රමාණයකින් ආසන්න වශයෙන් පොල් ගෙඩි බිලියන 2.75 ක් නිෂ්පාදනය කර ඇත. මෙයින් සියයට 9 ක් පොල් ගෙඩි ලෙසද, ඉතිරිය ඉන් පසුව වැඩි වශයෙන් භාවිතා වන පොල්තෙල් (සියයට 6.6) සහ පිටි කළ පොල් කිරි (සියයට 18.8) සඳහා යොදාගෙන ඇත. 2019 වසරේ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයට (HIES) අනුව, පොල් ශ්‍රී ලාංකික නිවෙස්වල අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යයක් ලෙස පවතින අතර, එය සමස්ත ගෘහ ඒකක ආහාර වියදමෙන් සියයට 5.4 ක් වේ.

පසුගිය දශකය තුළ මෙම අංශයේ අපනයන කාර්යසාධනය සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. 2013 සහ 2023 අතර කාලය තුළ, ශාක පදනම් කරගත්, ස්වාභාවික සහ සෞඛ්‍ය හිතකාමී නිෂ්පාදන සඳහා වන ගෝලීය ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් පොල් අපනයන ආදායම සියයට 315 කින් වැඩි විය. එක්සත් ජනපදය විශාලතම ආනයන රට බවට පත්ව ඇති අතර ජර්මනිය, නෙදර්ලන්තය සහ චීනය මීලඟ ගැනුම්කරුවන්ය. මෙම අංශය දැනට කෘෂිකාර්මික අපනයන ආදායමට සියයට 15.5 ක දායකත්වයක් ලබා දෙන අතර එය තේ වලට පසුව දෙවන විශාලතම කෘෂිකාර්මික අපනයන ආදායම් උපයන ක්ෂේත්‍රය වේ (මහ බැංකු වාර්ෂික වාර්තාව, 2024).

මෙම ක්ෂේත්‍රය ආර්ථික වැදගත්කමකින් සහ සහ ශක්තිමත් වර්ධන විභවයකින් යුක්ත වුවද මෙය අඛණ්ඩව ව්‍යුහාත්මක, කෘෂි විද්‍යාත්මක සහ වෙළඳපල ආශ්‍රිත අභියෝගවලට මුහුණ දෙයි. මෑතකදී ඇති වූ සුදු මැස්සන්ගේ හානිය ඇතුළු පළිබෝධ සහ රෝග පැතිරීම, කාබනික කෘෂිකර්මාන්තයට සංක්‍රමණය වීම සහ භූ-දේශපාලනික අවිනිශ්චිතතා සමඟ බැඳුණු පොහොර හිඟය, උසස් තත්ත්වයේ පැළ ලබා ගැනීමට ඇති සීමිත ප්‍රවේශය, යෙදවුම් පිරිවැය ඉහළ යාම, ශ්‍රම හිඟය, ඉඩම් කැබලි කිරීම සහ අස්වැන්නෙහි වරින් වර සිදුවන උච්චාවචනයන් මීට බලපාන ප්‍රධාන බාධාවන් වේ. 2025 නොවැම්බර් මාසයේ ඇති වූ 'දිට්වා' සුළි කුණාටුව වැනි දේශගුණික බලපෑම් සහ 2022 ආර්ථික

අර්බුදය ඇතුළු සාර්ව ආර්ථික බිඳවැටීම්, සැකසුම් සහ සැපයුම් දාම මෙහෙයුම් තුළ පවතින අවදානම් සහගත තත්ත්වයන් තවදුරටත් තීව්‍ර කර ඇත. අඩු භාවිතයක් සහිත අපනයන විභවතාවය, අගය එකතු කිරීමේ අවශ්‍යතාවය වැඩි වශයෙන් අවශ්‍ය වීම, වැඩිදියුණු කළ තත්ත්ව ප්‍රමිතීන් සහ නිෂ්පාදනවල මූලාරම්භය සොයා ගැනීමේ හැකියාව ඉහළ නැංවීමේ අවශ්‍යතාවය හේතුවෙන් මෙම අභියෝග තවදුරටත් සංකීර්ණ වී ඇත.

මෙම ගැටලු හඳුනාගනිමින්, රාජ්‍ය ආයතන සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් විවිධ මැදිහත්වීම් මාලාවක් ආරම්භ කර ඇත. ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ වැඩසටහන්, ඉන්ධන ලබාදීමේදී සැකසුම් පහසුකම් සඳහා ප්‍රමුඛතාව ලබාදීම, රෝපණ ද්‍රව්‍ය වැඩිදියුණු කිරීම සඳහා ශාක අභිජනන අත්හදා බැලීම් සහ බීජ උයන් සංවර්ධනය කිරීම, දෙමුහුන් ප්‍රභේද සඳහා අතින් පරාගණය කිරීමේ වැඩසටහන්, සහ සැකසුම් කාර්යක්ෂමතාව හා නිෂ්පාදන ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා උසස් තාක්ෂණයන් හඳුන්වාදීම මීට ඇතුළත් වේ. එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානයේ (UNIDO) සහයෝගය ඇතිව 'පොල් වගාකිරීමේ මණ්ඩලය' පිහිටුවීමත් සමඟ ආයතනික සම්බන්ධීකරණය ද ශක්තිමත් වී ඇති අතර, එහි අරමුණ වන්නේ වගාකරුවන්, සැකසුම්කරුවන්, අපනයනකරුවන් සහ නියාමන ආයතන අතර සහයෝගීතාව ශක්තිමත් කිරීමයි.

විශේෂයෙන් යුරෝපය, ඇමරිකා එක්සත් ජනපදය සහ ආසියාව යන කලාපවල මතුවෙමින් පවතින ගෝලීය වෙළඳපල අවස්ථාවන්, මෙම ක්ෂේත්‍රය සතු හා මෙතෙක් ප්‍රයෝජනයට නොගත් අවස්ථාවන් මනාව පැහැදිලි කරයි. විශේෂයෙන්ම අගය එකතු කළ නිෂ්පාදන සහ "සිලෝන් කොකනට්" (Ceylon Coconut) අනන්‍යතාවය යටතේ සන්නාමකරණය කිරීම මෙහිදී කැපී පෙනේ. මෙම අවස්ථාවන් ග්‍රහණය කර ගැනීම සඳහා පවතින ක්‍රමවේදයන් උපායමාර්ගිකව නැවත සිතා බැලීම සහ ඵලදායිතාව ඉහළ නැංවීම, තිරසාරභාවය සහ වෙළඳපල ව්‍යාප්තිය සඳහා ගෝලීය වශයෙන් තරඟකාරී ප්‍රවේශයන් අනුගමනය කිරීම මෙහිලා වැදගත් වේ.

මෙම යථාර්ථයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා, පොල් ක්ෂේත්‍රයේ උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම මඟින් ක්ෂේත්‍රයේ පරිවර්තනයක් කරා මඟ පෙන්වීම සඳහා ක්‍රියාත්මක කළ හැකි, පුළුල් සහ සාක්ෂි මත පදනම් වූ රාමුවක් සැපයීමට අපේක්ෂා කරයි. මෙම මාර්ග සිතියම සමාජ-ආර්ථික සංවර්ධනය, පාරිසරික තිරසාරභාවය, තාක්ෂණය මුසුකර ගැනීම, ආයතනික සම්බන්ධීකරණය, ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සහ අපනයන තරඟකාරිත්වය යන අංශ ඔස්සේ උපායමාර්ගික මඟ පෙන්වීම් සපයයි. අවසාන වශයෙන්, SP&R හි අරමුණ වන්නේ පොල් ක්ෂේත්‍රය ජාතික ආර්ථික වර්ධනයට සහ ග්‍රාමීය ජීවනෝපායන්ට වඩාත් ගතික, ඔරොත්තු දෙන සහ තරඟකාරී දායකත්වයක් සපයන අංශයක් බවට පත් කිරීම වන අතර, එමඟින් දේශීය මෙන්ම ජාත්‍යන්තර වෙළඳපල තුළ එහි අඛණ්ඩ පැවැත්ම සහ වැදගත්කම තහවුරු කිරීමයි.

## 1.3. අරමුණු (Objectives)

ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින ප්‍රධාන ව්‍යුහාත්මක අඩුපාඩු මඟහරවා ගනිමින් සහ මතු වන නව අවස්ථා ප්‍රයෝජනයට ගනිමින්, එහි දිගුකාලීන සංවර්ධනය කරා එක් එක් පාර්ශ්වකරුවන් මෙහෙයවීම සඳහා මෙම SP&R (උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම) සකස් කර ඇත. එහි ප්‍රධාන අරමුණු 2 වන රූපසටහනෙහි දැක්වේ.

*රූපය 2 - පොල් ක්ෂේත්‍රයේ SPRM හි ප්‍රධාන අරමුණු*




1. **නිෂ්පාදනය ඉහළ නැංවීම (ඵලදායිතා වැඩිදියුණු කිරීම් සහ නව ඉඩම් සංවර්ධනය කිරීම් මඟින්)**

   විශාල වශයෙන් හිස්ව පවතින ඉඩම්වල වගා කිරීම සහ නැවත වගා කිරීම මඟින් ප්‍රාථමික නිෂ්පාදනය ඉහළ නංවා ජාතික පොල් නිෂ්පාදනය පුළුල් කිරීම මෙම SP&R හි අරමුණයි. එමෙන්ම, උසස් කෘෂිකාර්මික ක්‍රමවේද, උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය, පස් සහ ජල කළමනාකරණය, වැඩිදියුණු කළ වාරි පද්ධති සහ නවීන තාක්ෂණය භාවිතයෙන් වගා බිම්වල ඵලදායිතාව ඉහළ නැංවීම ද මීට ඇතුළත් වේ. විශේෂයෙන්ම, අලුතින් බිහිවන "උතුරු පොල් ත්‍රිකෝණය" තුළ වගාව සඳහා සුදුසු නව ප්‍රදේශ හඳුනා ගැනීමට ද මෙහිදී ප්‍රමුඛතාව ලබා දේ. මෙම ද්විත්ව උපායමාර්ගය මඟින් දේශීය අවශ්‍යතා සහ දිනෙන් දින වර්ධනය වන අපනයන ඉල්ලුම යන දෙකම සපුරාලීම සඳහා ස්ථාවර හා තිරසාර සැපයුමක් තහවුරු කළ හැකිය.

**2. වගා බිම්වල ලාභදායීතාව වැඩිදියුණු කිරීම:**

ගොවි ආදායම් ශක්තිමත් කිරීම SP&R හි ප්‍රධාන ප්‍රමුඛතාවකි. එමගින් පිරිවැය-ඵලදායී නිෂ්පාදන ක්‍රමවේද, නවීන තාක්ෂණය යොදා ගැනීම, සහ අතුරු බෝග වගාව මෙන්ම ඒකාබද්ධ සත්ව පාලන පද්ධති හඳුන්වා දීම දිරිමත් කරයි. උසස් තත්ත්වයේ යෙදවුම් සඳහා පවතින ප්‍රවේශය පුළුල් කිරීම, යාන්ත්‍රිකකරණය ඉහළ නැංවීම සහ ශක්තිමත් වෙළඳපොළ සබැඳියාවන් ඇති කිරීම සඳහා ද මෙම සැලැස්ම සහාය වේ. වගා බිම්වල ලාභදායීතාව ඉහළ යාම ඔස්සේ නැවත ආයෝජනය කිරීමට, වගාවන් පුළුල් කිරීමට සහ සමස්ත පොල් කර්මාන්තයේ ඵලදායිතාව හා තරඟකාරිත්වය ඉහළ නංවන නවෝත්පාදනයන් වැළඳ ගැනීමට ගොවීන් පොළඹවයි.

**3. අපනයන තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම:**

විශේෂයෙන්ම "සිලෝන් කොකනට්" (Ceylon Coconut) ) නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම හරහා අගය එකතු කිරීම, ගුණාත්මකභාවය ඉහළ නැංවීම, සැකසුම් ධාරිතාවන් පුළුල් කිරීම, සැපයුම් දාම වැඩිදියුණු කිරීම සහ අලෙවිකරණය මෙන්ම සන්නාමකරණය ශක්තිමත් කිරීම සඳහා SP&R ප්‍රමුඛතාව ලබා දෙයි. ඉහළ වර්ධනයක් සහිත අපනයන වෙළඳපොළවල් වෙත විවිධාංගීකරණය වීම පිළිබඳ අදහසද එය අවධාරණය කරයි. මෙම සාමූහික උත්සාහයන් හරහා ගෝලීය පොල් අගය දාමයන් තුළ ශ්‍රී ලංකාව තරඟකාරී සහ පිළිගත් නිෂ්පාදන රටක් ලෙස ස්ථානගත වනු ඇත.

4. **ව්‍යාප්ති සේවා වැඩිදියුණු කිරීම:** රජයේ සහ පෞද්ගලික අංශයේ ව්‍යාප්ති සේවාවන්, ඩිජිටල් උපදෙස් මෙවලම්, ගොවි පුහුණු වැඩසටහන් සහ ක්ෂේත්‍ර නිරූපණයන් ශක්තිමත් කිරීමට මෙම මාර්ග සිතියම ප්‍රමුඛතාව ලබා දෙයි. ඉහළ නැංවූ ව්‍යාප්ති සේවා ධාරිතාව මඟින් ගොවීන්ට කාලෝචිත, ප්‍රායෝගික මඟපෙන්වීම් ලැබෙන බව සහතික කෙරේ. මීට අමතරව, තාක්ෂණය යොදා ගැනීම දිරිගැන්වීමට සහ යහපත් කෘෂිකාර්මික ක්‍රමවේද ප්‍රවර්ධනය කිරීමට කාර්යක්ෂම ව්‍යාප්ති ක්‍රමවේද අත්‍යවශ්‍ය වේ.

**5. පාරිභෝගික දැනුවත්භාවය ශක්තිමත් කිරීම:**

පොල් නිෂ්පාදන පිළිබඳව පාරිභෝගික දැනුවත්භාවය ඉහළ නැංවීමේ වැදගත්කම SP&R මඟින් අවධාරණය කරයි. එහිදී නාස්තිය අවම කිරීමේ උපායමාර්ග, පොල් භාවිතය සඳහා නව තාක්ෂණික ක්‍රමවේද අනුගමනය කිරීම සහ මෑතකදී නිපදවන ලද නව නිෂ්පාදන පිළිබඳව ගවේෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. පොල් නිෂ්පාදනවල පෝෂණීය සහ ආර්ථික වටිනාකම පිළිබඳව පාරිභෝගිකයන් දැනුවත් කිරීම වෙළඳපොළ සංවර්ධනයට සහායක් වනවා පමණක් නොව, නිවැරදි පරිභෝජන රටාවන් ද ප්‍රවර්ධනය කරයි.

6. **ආහාර සුරක්ෂිතතාව සහ ආරක්ෂාව ඉහළ නැංවීම:** ශ්‍රී ලංකාවේ කුටුම්භවල පෝෂණයට සහ ජාතික ආහාර සුරක්ෂිතතාවයට පොල් අත්‍යවශ්‍ය දායකත්වයක් සපයයි. නිෂ්පාදනය ස්ථාවර කිරීම, ඔරොත්තු දෙන සැපයුම් දාමයන් ශක්තිමත් කිරීම, පොල් සහ අගය එකතු කළ නිෂ්පාදන වෙළඳපොළේ පහසුවෙන් ලබා ගැනීමට සැලැස්වීම සහ ආහාර ගුණාත්මකභාවය මෙන්ම සුරක්ෂිතතා ප්‍රමිතීන් බලාත්මක කිරීම මඟින් මෙම මාර්ග සිතියම ආහාර

සුරක්ෂිතතාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීම පමණක් නොව, කාර්මික භාවිතය සඳහා ද අඛණ්ඩ පොල් සැපයුමක් සහතික කරයි. මෙය ශ්‍රී ලංකාවේ පොල් ආශ්‍රි කර්මාන්තයේ වර්ධනයට මනා පිටුවහලකි.

## 1.1. ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs)

පොල් ක්ෂේත්‍රයේ උපායමාර්ගික සැලැස්ම සහ ප්‍රතිපත්තිවල කාර්යසාධනය ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) හතක් මගින් ඇගයීමට ලක් කෙරේ. මෙමගින් ඉදිරි දශකය තුළ ඵලදායිතාව, ක්ෂේත්‍රයේ ව්‍යාප්තිය, ලාභදායිත්වය සහ අපනයන තරඟකාරිත්වය යන අංශවල සිදුවන ප්‍රගතිය මැන බලනු ඇත. මෙම දර්ශක මගින් වත්මන් මූලික තත්ත්වයන් (baseline conditions) මෙන්ම 2030 සහ 2035 වසර සඳහා අපේක්ෂිත ඉලක්කයන් ද ආවරණය කරයි. එමගින් ගොවි ආදායම ඉහළ නැංවීම, ගසකින් ලැබෙන අස්වැන්න වැඩි කිරීම, අපනයන ආදායම ශක්තිමත් කිරීම, සමස්ත නිෂ්පාදනය පුළුල් කිරීම, නැවත වගාකිරීම් සහ නව වගාවන් වේගවත් කිරීම, මෙන්ම උසස් තත්ත්වයේ පැළ ප්‍රමාණවත් පරිදි සැපයීම සහතික කිරීම වැනි ජාතික ප්‍රමුඛතාවන් පිළිබිඹු කෙරේ. මෙම ප්‍රධාන කාර්යසාධන දර්ශක සමූහය තුළින් සැලැස්ම ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය කිරීම, ප්‍රගතිය ඇගයීම, ප්‍රතිපත්තිමය යාවත්කාලීන කිරීම් සඳහා මඟ පෙන්වීම සහ ග්‍රාමීය ජීවනෝපායන්, කාර්මික අගය එකතු කිරීමේ දාමයන් සහ ජාතික ආර්ථික සංවර්ධනය සඳහා මෙම ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය යනාදිය තක්සේරු කිරීම උදෙසා මැන බැලිය හැකි රාමුවක් සපයයි.

1 වන වගුව මගින් උපායමාර්ගික සැලැස්ම සහ ප්‍රතිපත්තිවල ප්‍රධාන කාර්යසාධන දර්ශක, මූලික අගයන් සහ 2030 හා 2035 වසර සඳහා වන ඉලක්කයන් පිළිබිඹු කරන අතර, එක් එක් දර්ශකයේ පසුබිම පැහැදිලි කිරීම සඳහා අවශ්‍ය පරිදි අතිරේක විස්තරාත්මක පැහැදිලි කිරීම් ද සපයයි.

*1 වන වගුව - උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියමෙහි ප්‍රධාන කාර්යසාධන දර්ශක **(KPIs)***

| ප්‍රධාන කාර්යසාධන දර්ශක අංකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය | මූලික මට්ටම | ඉලක්කය * | විශේෂ සටහන් |
|---|---|---|---|---|
| 1 | වත්තකින් / ගොවියෙකුට වසරකට හෙක්ටයාරයකින් ලැබෙන ලාභය | 19,200 LKR/Month per acre* | 25,400 LKR (+32%) (2030) 29,300 LKR (+52%) (2035) | මෙයට සංරචක 2ක් ඇතුළත් වේ (ආදායම වැඩි කිරීම සහ පිරිවැය අඩු කිරීම) |
| 2 | එක් ගසකින් ලැබෙන ගෙඩි සංඛ්‍යාවේ වැඩිවීම | 45 (2024) | 57 (2025) 60 (2030) | දැනට තිබෙන ගස් |
| 3 | පොල් ක්ෂේත්‍රයේ අපනයනය (ඇමරිකානු ඩොලර්) (USD) | 855Mn (2024) | 1,500Mn (2030) 2,000Mn (2035) | සියලුම නිෂ්පාදන |
| 4 | වාර්ෂිකව නිෂ්පාදනය කෙරෙන මුළු ගෙඩි සංඛ්‍යාව | 2.8Bn (2024) | 4.2Bn (2030) | ඵලදායිතාව ඉහළ නැංවීම සහ නව වගාවන් |
| 5 | අතිරේක නව ගස් | 0 | 2.4 million Trees (2027) | ප්‍රධාන වශයෙන් උතුරු ත්‍රිකෝණය (දිස්ත්‍රික්ක 5ක්) |
| 6 | වගාව සඳහා වන බිම් ප්‍රමාණය | 484,677 Ha | 500,864 Ha (2027) | අතිරේක හෙක්ටයාර 16,000 ක් |

| | | | | |
|---|---|---|---|---|
| 7 | වසර සඳහා නිෂ්පාදනය කරන ලද පැළ සංඛ්‍යාව | 2.56M | TBD with CRI Mn (2026)<br>TBD with CRI Mn (2027) | නව වගා ප්‍රදේශ සඳහා පැළ මිලියන 1.3 ක් අවශ්‍ය වන අතර, නැවත වගා කිරීම සඳහා මිලියන 1.6 ක් අවශ්‍ය වේ.ග |

- - -

මූලාශ්‍රයඃ මෙහෙයුම් කමිටුව සහ පාර්ශවකරුවන් සමඟ පවත්වන ලද සාකච්ඡා පදනම් කර ගනිමිනි.
*සටහන: හෙක්ටයාර 1 = අක්කර 2.471; මසකට හෙක්ටයාරයකට රු. 47,443කි.

## 1.1. මාර්ග සිතියම සකස් කිරීමේ ක්‍රියාවලිය

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, පොල් සංවර්ධන අධිකාරිය (CDA), පොල් වගා කිරීමේ මණ්ඩලය (CCB), පොල් පර්යේෂණ ආයතනය (CRI), පොල් කර්මාන්ත මණ්ඩලය (CCCI), අපනයන සංවර්ධන මණ්ඩලය, මුදල් අමාත්‍යාංශය, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව සහ එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) නියෝජනය කරන සාමාජිකයින් 14 දෙනෙකුගෙන් සමන්විත වූ SP&R මෙහෙයුම් කමිටුව විසින් මෙම ක්‍රියාවලිය පුරාවටම උපායමාර්ගික මඟ පෙන්වීම්, දැඩි අධීක්ෂණය සහ අඛණ්ඩ ප්‍රතිපෝෂණ ලබා දෙන ලදී. ඔවුන් සතු සාමූහික විශේෂඥ දැනුම හේතුවෙන් මෙම SP&R සැලැස්ම විශ්ලේෂණාත්මකව ශක්තිමත්, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි සහ ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන ප්‍රමුඛතාවලට සම්පූර්ණයෙන්ම අනුකූල වන බව සහතික වීමට හැකියාව ලැබුණි

මෙම SP&R සැලැස්ම සකස් කිරීමේදී, එහි නිවැරදිභාවය සහ විශ්ලේෂණාත්මක ගැඹුර සහතික කිරීම සඳහා ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක දත්ත සහ ක්‍රමවේදයන් ද භාවිත කරන ලදී. ද්විතීයික සහ ප්‍රාථමික දත්ත මූලාශ්‍ර ඒකාබද්ධ කිරීම මඟින් පොල් ක්ෂේත්‍රයේ ආයතනික විධිවිධාන, ප්‍රතිපත්තිමය වටපිටාව, වර්ධන අවස්ථා සහ අගය එකතු කිරීමේ දාමයන්හි ගතිකත්වය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. මෙම ද්විත්ව මූලාශ්‍ර ප්‍රවේශය මඟින් යෝජිත ක්‍රියාමාර්ගවල වලංගුභාවය ශක්තිමත් වූ අතර, මෙම මාර්ග සිතියම ප්‍රායෝගික සාක්ෂි සහ පාර්ශවකරුවන්ගේ අත්දැකීම් යන දෙකෙහිම සහය ඇතිව සකස් වූවක් බව සහතික කෙරිණි.

ප්‍රාථමික සහ ද්විතීයික දත්ත රැස් කිරීම සිදු කරන ලද්දේ ඉතා සවිස්තරාත්මක අගය එකතු කිරීමේ දාම විශ්ලේෂණයක් මඟිනි. මීට ප්‍රධාන ආයතනවල පවතින සාහිත්‍යය, වාර්තා සහ ප්‍රකාශන සමාලෝචනය කිරීම, පාර්ශවකරුවන් හඳුනාගෙන සිතියම්ගත කිරීම, ආයතනික භූමිකාවන් සහ වගකීම් ඇගයීම, මෙන්ම නෛතික, මූල්‍ය සහ තිරසාර රාමු විශ්ලේෂණය කිරීම ඇතුළත් විය. ද්විතීයික දත්ත මඟින් පවතින බාධා, අවස්ථා සහ උපායමාර්ගික හිදැස් හඳුනා ගැනීමට හැකියාවක් ලැබුණු අතර, එය ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට මඟ පෙන්වීය.

පාර්ශවකරුවන්ගේ අදහස් ලබා ගැනීමට සහ ද්විතීයික දත්ත මඟින් මඟ හැරුණු තොරතුරු සම්පූර්ණ කර ගැනීම සඳහා ප්‍රාථමික දත්ත රැස් කිරීම සහභාගිත්ව ප්‍රවේශයක් ඔස්සේ සිදු කරන ලදී. ඒ සඳහා යොදාගත් ප්‍රධාන මෙවලම් අතරට ප්‍රධාන පාර්ශවකරුවන් 50 කට ආසන්න පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත්වුණු ආරම්භක වැඩමුළුව, ප්‍රධාන තොරතුරු සපයන්නන් සමඟ පැවැත්වුණු සම්මුඛ සාකච්ඡා 15 ක් (KIIs) [1], සහ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා (FGDs) [2]. 9 ක් ඇතුළත්

---

[1] ආයතනික කාර්යසාධනය, නියාමන බාධා, අපනයන අභියෝග සහ ප්‍රතිපත්තිමය ගැළපීම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා රජයේ නිලධාරීන්, පෞද්ගලික අංශයේ නායකයින්, වෘත්තීය සමිති නියෝජිතයින් සහ කර්මාන්ත සංගම් සමඟ මෙම ප්‍රධාන සම්මුඛ සාකච්ඡා 15 පවත්වන ලදී. මෙහිදී පොල් සංවර්ධන අධිකාරිය (CDA), පොල් වගා කිරීමේ මණ්ඩලය (CCB), පොල් පර්යේෂණ ආයතනය (CRI) සහ පොල් කර්මාන්ත මණ්ඩලය (CCCI) වෙත විශේෂ අවධානයක් යොමු කෙරිණි.

විය. ආරම්භක වැඩමුළුව මගින් මෙහෙයුම් කමිටුවේ සාමාජිකයින් සහ අනෙකුත් ප්‍රධාන පාර්ශවකරුවන් එකම ස්ථානයකට කැඳවා, අධ්‍යයනයේ දිශානතිය පිළිබඳව එකඟතාවකට පැමිණීමට සහ වගකීම් පැහැදිලි කර ගැනීමට අවස්ථාව සලසා දෙන ලදී.

# 2. ප්‍රතිපත්ති පසුබිම සහ උපායමාර්ගික ප්‍රමුඛතා

පොල් ක්ෂේත්‍රයේ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සහ මාර්ග සිතියම 2026-2035 සකස් කර ඇත්තේ, 'ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති රාමුව' පොහොසත් රටක් සහ ලස්සන ජීවිතයක්' සහ 'වැවිලි ක්ෂේත්‍රය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය' මගින් පෙන්වා දී ඇති පරිදි තිරසාරභාවය, නවීකරණය, සියළු පාර්ශවයන් ඇතුළත් කර ගැනීම සහ අගය එකතු කිරීම පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රමුඛතාවලට ඉතා සමීප ආකාරයෙන් අනුකූල වන පරිදි වේ. විශේෂයෙන්ම පොහොසත් රටක් සහ ලස්සන ජීවිතයක් ජාතික ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවන්හි සඳහන් කරුණු ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි සහ කාල රාමුවකට යටත් වූ ක්‍රියාකාරකම් බවට මෙම SP&R 2026-2035 සැලැස්ම මගින් පරිවර්තනය කරන්නේ කෙසේද යන්න මෙම කොටසින් පැහැදිලි කෙරේ. එය ප්‍රධාන ප්‍රතිපත්තිමය දිශානතීන් සාරාංශගත කරන අතර, පොල් කර්මාන්තයට ඒවායින් ඇති වන බලපෑම පෙන්වා දෙන අතරම, ජාතික අරමුණු කෙසේ ක්ෂේත්‍රයට නිශ්චිතවූ මැදිහත්වීම් සමඟ සම්බන්ධ වන්නේ දැයි ද පෙන්වා දෙයි.

## 1.1 ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති රාමුව (NPF 2025)

ජාතික ප්‍රතිපත්ති රාමුව මගින් කෘෂිකාර්මික සංවර්ධනය, තිරසාරභාවය සහ සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීම මත පදනම් වූ නිෂ්පාදන කේන්ද්‍රීය ආර්ථිකයක් දැඩි ලෙස ප්‍රවර්ධනය කරයි.[3] මෙම පුළුල් ජාතික දිශානතිය තුළ, ග්‍රාමීය ජීවනෝපායන්, අපනයන සහ ආහාර සුරක්ෂිතතාව සමඟ දිගු කලක් තිස්සේ බැඳී පවතින SP&R සැලැස්ම, දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ඵලදායිතාව ඉහළ නැංවීම, සම්පත් නිසි ලෙස කළමනාකරණය කිරීම සහ කෘෂිකර්මාන්තය නවීකරණය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි මූලධර්ම අනුගමනය කරයි.

කෘෂිකාර්මික සංවර්ධනය, නිවාස හා ඉඩම් කළමනාකරණය, අපනයන ආශ්‍රිත උපායමාර්ග, රෝපණ ද්‍රව්‍ය, අතුරු වගාවන්, බෝග කළමනාකරණය සහ නව තාක්ෂණයන් හඳුන්වාදීම ඇතුළුව පොල් ක්ෂේත්‍රයට අදාළ විශේෂිත දිශානතීන් කිහිපයක් ද මෙම රාමුව මගින් සපයයි. පොල් වැනි බහු වාර්ෂික සහ දේශගුණික විපර්යාසයන්ට සංවේදී බෝගයක් සඳහා, විශේෂයෙන්ම කුඩා වතු හිමියන් සහ මිශ්‍ර වතු පද්ධති වෙනුවෙන් නැවත වගා කිරීමේ වැඩසටහන්, වඩා හොඳ කෘෂි විද්‍යාත්මක ක්‍රමවේද, සුහුරු ජලසම්පාදනය සහ තාක්ෂණය පදනම් කරගත් කළමනාකරණයේ අවශ්‍යතාවය මෙකී රාමුව මගින් පෙන්වා දෙනු ලබයි.

අගය එකතු කිරීම, ව්‍යවසායකත්වය සහ වඩාත් ශක්තිමත් කර්මාන්තයක් ලෙස කෘෂිකාර්මික සම්බන්ධතා කෙරෙහි ඉහත රාමුව දක්වන අවධාරණය, ඉහළ වටිනාකමකින් යුත් පොල් නිෂ්පාදන කර්මාන්ත ව්‍යාප්ත කිරීම සඳහා නව අවස්ථා විවෘත කරයි. ණය පහසුකම් ලබා ගැනීමේ හැකියාව

---

[2] සාම්ප්‍රදායික මෙන්ම අලුතින් මතුවෙමින් පවතින පොල් වගා කරන කලාප ද ආවරණය වන පරිදි කුරුණෑගල, පුත්තලම, ගම්පහ, යාපනය, මුලතිව්, මන්නාරම, ගාල්ල සහ මාතර වැනි ප්‍රධාන පොල් වගා කරන දිස්ත්‍රික්කවල වගාකරුවන්, එකතු කරන්නන්, සැකසුම්කරුවන් සහ බෙදාහරින්නන් ඇතුළු අගය එකතු කිරීමේ දාමයේ නිරත පාර්ශවකරුවන් සමඟ මෙම ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා 9 පවත්වන ලදී.

[3] https://www.cabinetoffice.gov.lk/cab/images/Downloads/national_policies/2025-03-03/En.pdf

වැඩි දියුණු කිරීම, කුසලතා සංවර්ධනය සහ වඩා හොඳ යටිතල පහසුකම් මගින් මෙම අවස්ථාවන්ට සහයෝගය දැක්විය හැකිය. මෙම ප්‍රතිපත්තිය මගින් ඵලදායී ඉඩම් කළමනාකරණයේ වැදගත්කම ද ඉස්මතු කරන අතර, ඉඩම් කැබලි කිරීම, වයස්ගත වගාවන් සහ පාංශු හායනය වැනි අභියෝගයන්ට ද විසඳුම් සපයයි. අවසාන වශයෙන්, ග්‍රාමීය ජීවනෝපායන් නංවාලීම, සමාජ ආරක්ෂණය සහ ගොවීන් සවිබල ගැන්වීම කෙරෙහි ජාතික ප්‍රතිපත්ති රාමුව දක්වන අවධානය ඩිජිටල්කරණය, පර්යේෂණ සහ තරුණ සහභාගිත්වය සඳහා වන කැපවීම් ද සමගින් පොල් ක්ෂේත්‍රය පුරා නවීකරණය සහ සැමට ප්‍රතිලාභ ලැබෙන වර්ධනයක් සඳහා හිතකර වටපිටාවක් නිර්මාණය කරයි.

## 2.2 ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (NPPS 2024)

ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2024 (NPPS 2024) යනු මෙරට පොල් ක්ෂේත්‍රයේ සංවර්ධනය සහ පාලනය මෙහෙයවන ප්‍රධානතම ප්‍රතිපත්තිමය රාමුවයි.[4] එය තේ, රබර් සහ පොල් වැනි සාම්ප්‍රදායික බෝග ශක්තිමත් කිරීම කෙරෙහි මෙන්ම කජු, කිතුල්, තල්, ලංකා කුරුඳු සහ අනෙකුත් අපනයනය ඉලක්ක කරගත් කෘෂිකාර්මික නිෂ්පාදන වැනි නැගී එන බෝග වෙත ව්‍යාප්ත වීම කෙරෙහි ද අවධානය යොමු කරයි. වර්තමානය වන විට, වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය ජාතික අපනයන ආදායමෙන් සියයට 25 කට ආසන්න ප්‍රමාණයකට දායක වන අතර, සේවා නියුක්ත ජනගහනයෙන් සියයට 16 කට පමණ රැකියා අවස්ථා සපයයි. මෙමගින් ජාතික ආර්ථිකයේ පදනමක් ලෙස එහි පවතින ආර්ථික හා සමාජීය වැදගත්කම මැනවින් පැහැදිලි වේ. මෙම ජාතික ප්‍රතිපත්තිය මෙම කර්මාන්ත ක්ෂේත්‍රයේ ඇති වැදගත්කම පිළිගන්නා අතරම, අධික නිෂ්පාදන පිරිවැය සහ ශ්‍රම හිඟයේ සිට පසෙහි සාරවත් බව පිරිහීම, උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය හිඟකම සහ තාක්ෂණය වැළඳ ගැනීමේ අඩු ප්‍රතිශතය දක්වා වූ වර්තමානයේ පවතින දැඩි අභියෝගයන්ට මෙම ප්‍රතිපත්තිය මගින් විසඳුම් සපයයි.

ශ්‍රී ලංකාවේ වගා බිම්වලින් සියයට 66 ක්ම වැසි ජලයෙන් යැපෙන සහ බොහෝ දුරට සුළු පරිමාණ වතු හිමියන් විසින් කළමනාකරණය කරනු ලබන බැවින්, වැවිලි අංශය දේශගුණික විපර්යාසවල බලපෑමට ලක්වීමේ ප්‍රවණතාව දිනෙන් දින ඉහළ යමින් පවතී. නිතර ඇති වන නියඟයන්, අනපේක්ෂිත මෝසම් වැසි, සුළි කුණාටු සහ පළිබෝධ මෙන්ම රෝග ව්‍යාප්තිය යනාදි කරුණු ඵලදායිතාවයට සහ මෙම අංශයේ දිගුකාලීන ස්ථාවරත්වයට සෘජුවම තර්ජනයක් එල්ල කරයි. මෙම වර්ධනය වන අවදානම්වලට ප්‍රතිචාර වශයෙන්, NPPS 2024 ප්‍රතිපත්තිය විසින් දේශගුණික තත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව, තිරසාර බිම් පරිහරණ රටාවන් සහ ආපදා අවදානම් කළමනාකරණය එහි උපායමාර්ගික දිශානතියේ කේන්ද්‍රස්ථානය ලෙස සලකා අවධානය යොමු කර තිබේ. NPPS 2024 හි ප්‍රතිපත්ති ප්‍රකාශයන් අට මගින් ශ්‍රී ලංකාවේ වැවිලි අංශය නවීන, තරඟකාරී සහ තිරසාර කර්මාන්තයක් බවට පරිවර්තනය කිරීම සඳහා මඟ පෙන්වන මූලික ප්‍රතිපත්තිමය මූලධර්ම දක්වා ඇත. මෙම ප්‍රකාශයන් මගින් නිෂ්පාදනයේ සහ පර්යේෂණයේ සිට අලෙවිකරණය, දේශගුණික තත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව, පාලනය සහ සේවක සුබසාධනය දක්වා වූ සමස්ත සැපයුම් දාමය පුරා විහිදෙන එකිනෙකට ගැළපෙන උපායමාර්ගික රාමුවක් ද සපයයි.

පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ SP&R 2026–2035 (උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම) සකස් කර ඇත්තේ NPF 2025 සහ NPPS 2024 යන දෙකම පිළිබඳව පූර්ණ අවධානය යොමු කරමිනි. එමගින් නවීකරණය, තිරසාරභාවය, සියල්ල ඇතුළත් කර ගැනීම් (inclusiveness) සහ අගය නිර්මාණය කිරීම පිළිබඳ ජාතික ප්‍රමුඛතාවන්, පැහැදිලි මෙන්ම අදාළ අංශයට ආවේණික වූ සහ කාලානුරූපී ක්‍රියාමාර්ග බවට පරිවර්තනය කිරීම සහතික කරයි. NPF 2025 මගින් නිෂ්පාදනය මත පදනම් වූ සහ නවෝත්පාදන මගින් මෙහෙයවන ආර්ථිකයක් කරා වඩාත් පුළුල් ආර්ථික

[4] https://plantation.gov.lk/images/pdf/Policy_Division/National_Policy_on_Plantation_Sector_Sri_Lanka.pdf

මාවතක් සකසන අතර, NPPS 2024 මඟින් වැවිලි අංශය සඳහා මෙම දිශානතිය ප්‍රතිපත්තිමය තේමාවන් අටක් ඔස්සේ හැඩගස්වනු ලබයි.

### 2.2.1 බෝග නිෂ්පාදනය සහ සම්පත් කළමනාකරණය:

උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම මඟින් පොල් වගාවේ පදනම ශක්තිමත් කිරීම සඳහා නව ජවයක් ලබා දෙයි. එනම් බීජ උයන්, පැල තවාන් සහ පැල නිෂ්පාදනය ශක්තිමත් කරන අතරම වඩාත් යහපත් වගා පිළිවෙත් ප්‍රවර්ධනය කරයි. එමෙන්ම, ජලය සහ පස වඩාත් බුද්ධිමත් ලෙස භාවිත කිරීම මෙන්ම වඩාත් ඵලදායී පළිබෝධ සහ බෝග කළමනාකරණය සඳහා ද එය දිරිමත් කරයි. සමස්තයක් ලෙස මෙම ක්‍රියාමාර්ගයන්හි අරමුණ වන්නේ දිවයින පුරා වඩා නිරෝගී වගාවන්, ඉහළ ඵලදායිතාවයක් සහ වඩාත් ඔරොත්තු දෙන වගා ක්‍රමවේද නිර්මාණය කිරීමයි.

### 2.2.2 පර්යේෂණ සහ සංවර්ධනය:

SP&R මඟින් මෙම ක්ෂේත්‍රයේ පරිවර්තනයෙහි කේන්ද්‍රස්ථානය ලෙස නවෝත්පාදනයන් පෙරට තබා ඇත. එය වඩාත් ශක්තිමත් පර්යේෂණ ක්‍රමවේද, නව තාක්ෂණය ඉතා ඉක්මනින් වැළඳ ගැනීම සහ සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම කෙරෙහි වැඩි විශ්වාසයක් තැබීම අවධාරණය කරයි. රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ පර්යේෂණ ආයතන අතර සහයෝගීතාව වර්ධනය කිරීම මඟින්, SP&R අඛණ්ඩව දැනුම්වත්වීමේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කරයි. එමඟින් නව දැනුම, නවීන ශිල්පීය ක්‍රම සහ නැවුම් අදහස් සමඟ මෙම ක්ෂේත්‍රය නිරන්තරයෙන් ක්‍රමිකව දියුණු වන බව සහතික කරයි.

### 2.2.3 අගය දාම සංවර්ධනය කිරීම සහ අගය එකතු කිරීම:

පොල් කර්මාන්තයේ පූර්ණ විභවය මතු කර ගැනීම සඳහා, SP&R හි අරමුණ වන්නේ ගොවිපලේ සිට වෙළඳපොළ දක්වා වූ සමස්ත අගය දාමයම ඉහළ නැංවීමයි. එය ගුණාත්මකභාවය, ඵලදායීතාව සහ ප්‍රභවය පිළිබඳ තොරතුරුසොයා ගැනීම යනාදිය වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතරම, වැඩි අගයක් එකතු කළ සැකසුම් ක්‍රියාවලීන් සහ දේශගුණයට ඔරොත්තු දෙන නිෂ්පාදන දිරිමත් කරයි. මූලික අමුද්‍රව්‍යවල සිට ඉහළ වටිනාකමකින් යුත් නිෂ්පාදන කරා සිදුවන මෙම සංක්‍රමණය වෙළඳපොළ, රැකියා සහ ව්‍යවසායකත්වය සඳහා නව අවස්ථා විවර කරන අතර, මෙම ක්ෂේත්‍රය නවීන, තරඟකාරී සහ තිරසාර වර්ධනයක ගාමක බලවේගයක් ලෙස ස්ථානගත කිරීමට උපකාරී වේ.

### 2.2.4 අලෙවිකරණය, වෙළඳාම සහ ව්‍යවසායකත්ව සංවර්ධනය:

SP&R මඟින් නව වෙළඳපොළ අවස්ථා විවර කිරීම සහ 'සිලෝන් කොකනට්' (Ceylon Coconut) සතු සාඩම්බර අනන්‍යතාවය ශක්තිමත් කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. ඉහළ වටිනාකමකින් යුත් වෙළඳපොළවල් කරා ව්‍යාප්ත වීමට, වඩාත් ශක්තිමත් ගෝලීය සන්නාමයක් ගොඩනැඟීමට සහ සජීවී ව්‍යවසායකත්ව සංස්කෘතියක් පෝෂණය කිරීමට එය සහය දක්වයි. දේශසීමා හරහා සිදුවන ක්‍රියාපටිපාටීන් සරල කිරීම සහ සමස්ත වෙළඳ පරිසරය වැඩි දියුණු කිරීම මඟින්, අපනයන කාර්ය සාධනය ඉහළ නැංවීමට සහ ශ්‍රී ලාංකීය පොල් නිෂ්පාදන ඒවායේ ගුණාත්මකභාවය, තිසැකබව සහ නවෝත්පාදනය නිසා ලොව පුරා කැපී පෙනෙන බව සහතික කිරීමට SP&R අරමුණු කරයි.

### 2.2.5 පාරිසරික ආරක්ෂණය සහ දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව:

දේශගුණික විපර්යාස, පළිබෝධකයන්, රෝග සහ දැඩි කාලගුණික තත්වයන් මගින් එල්ල වන හා වර්ධනය වෙමින් පවත්නා අවදානම් හඳුනා ගනිමින්, මෙම අභියෝගවලට ඔරොත්තු දිය හැකි නිෂ්පාදන ගොඩනැගීමට SP&R කැපවී සිටී. එය ඒකාබද්ධ ආපදා-අවදානම් කළමනාකරණය ප්‍රවර්ධනය කරන අතර වඩාත් බුද්ධිමත් මෙන්ම තිරසාර බෝග කළමනාකරණ පිළිවෙත් දිරිමත් කරයි. එමෙන්ම, දේශීය පොහොර නිෂ්පාදනය, වඩාත් දියුණු ජල කළමනාකරණය, ජීව අඟුරු යෙදීම, පසේ සාරවත් බව ඉහළ නැංවීම, පරාගණ සහාය සහ ජෛව විවිධත්ව සංරක්ෂණය වැනි දිගුකාලීන ආයෝජනවල වැදගත්කම ද එය ඉස්මතු කරයි. තවද, පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති, නිෂ්පාදන පුරෝකථනය සහ දේශීය පරිභෝජනය මෙන්ම අපනයන උපයෝගීතාව සඳහා හදිසි ප්‍රතිපාදන වෙන් කිරීමේ රාමු වැනි අනාගතයට ගැළපෙන යාන්ත්‍රණයන් ඇතුළත් කිරීම මගින්, මෙම උපායමාර්ගික සැලැස්ම කෙටි කාලීන කම්පන සහ දිගු කාලීන ව්‍යුහාත්මක වෙනස්කම් යන දෙකටම ක්‍රියාකාරී සහ නම්‍යශීලී ප්‍රතිචාර දැක්වීමට මඟ පාදයි. සමස්තයක් ලෙස මෙම ක්‍රියාමාර්ගයන්හි අරමුණ වන්නේ, වර්ධනය වන පාරිසරික පීඩන හමුවේ වුවද සාර්ථක විය හැකි, අනාගතයට සූදානම් බවකින් යුක්ත, ඔරොත්තු දෙන පොල් කර්මාන්ත ක්ෂේත්‍රයක් සුරක්ෂිත කිරීමයි.

### 2.2.6 පාර්ශවකරුවන් සබල ගැන්වීම:

උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියමෙහි කේන්ද්‍රීය සාධකය වන්නේ මිනිසුන් සහ ප්‍රජාවන්ය. මෙම ක්ෂේත්‍රයේ දිගුකාලීන පරිවර්තනය රඳා පවතින්නේ මනා කුසලතාවලින් යුත්, විශ්වාසවන්ත සහ දිරිමත් වූ පාර්ශවකරුවන් මත බව මෙම සැලැස්ම පිළිගන්නා අතර විශේෂයෙන්ම මෙම ක්ෂේත්‍රයේ අනාගතයේ රඳා පවතින්නේ වගාකරුවන් මතය. එබැවින්, සමස්ත අගය දාමය පුරාම ධාරිතා සංවර්ධනය, ආකල්පමය වෙනස්කම්, සියලු දෙනා ඇතුළත් කරගත් සහභාගීත්වය සහ විවෘත අයුරින් දැනුම හුවමාරු කර ගැනීම ආදිය කෙරෙහි SP&R ප්‍රමුඛතාවය ලබා දෙයි. කුඩා පරිමාණ වතු හිමියන්ගේ සිට සැකසුම්කරුවන්, පර්යේෂකයන් සහ පෞද්ගලික අංශයේ හවුල්කරුවන් දක්වා වූ සියලුම පාර්ශවකරුවන් සවිබල ගැන්වීම මගින් අර්ථවත් සහ කල්පවත්නා වෙනසක් ඇති කළ හැකි ගතික මෙන්ම සහයෝගී ශ්‍රම බලකායක් ගොඩනැගීම SP&R හි අරමුණයි.

### 2.2.7 වෘත්තීය සෞඛ්‍යය සහ සමාජ ආරක්ෂණ:

සමස්ත පොල් අගය දාමය පුරාම ආරක්ෂිත, සෞඛ්‍ය සම්පන්න සහ සමාජීය වශයෙන් වගකිවයුතු වැඩ පරිසරයක් නිර්මාණය කිරීම කෙරෙහි SP&R දැඩි වැදගත්කමක් ලබා දෙයි. වෘත්තීය ආරක්ෂාව පිළිබඳ උසස් ප්‍රමිතීන් රැක ගැනීමටත්, සමාජීය සුභසාධනය ප්‍රවර්ධනය කිරීමටත්, සියලුම සේවකයින්ගේ අයිතිවාසිකම් සහ ගෞරවය ආරක්ෂා කිරීමටත් එය කැපවීම පෙන්නුම් කරයි. මෙහිදී වතු ප්‍රජාවන් සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරෙන අතර, මෙම ක්ෂේත්‍රයේ පරිවර්තනය සඳහා ක්‍රියාකාරී හවුල්කරුවන් ලෙස ඔවුන්ට සහයෝගය දීම, ගරු කිරීම සහ ඔවුන් සවිබල ගැන්වීම සහතික කරනු ලබයි.

### 2.2.8 ප්‍රතිපත්ති සහ පාලනය:

SP&R හි සාර්ථකත්වය සඳහා කාර්යක්ෂම සහ ඵලදායී පාලනයක් අත්‍යවශ්‍ය වේ. මෙම සැලැස්ම මගින් ශක්තිමත් කරන ලද අධීක්ෂණ, වාර්තාකරණ සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණයන් හරහා විනිවිදභාවය, වගවීම සහ සියලු දෙනා ඇතුළත් කරගැනීමේ ස්වභාවය ප්‍රවර්ධනය කරයි. එය ආයතනික රාමුවල දියුණුව සඳහා සහය දක්වන අතරම, තිරසාර,

වගකිවයුතු සහ මනාව නියාමනය වූ වතු ක්ෂේත්‍රයක් පෝෂණය කරන හා අනාගතයට ගැළපෙන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ දිරිමත් කරයි. පැහැදිලි සහ හිතකර පාලන පරිසරයක් නිර්මාණය කිරීම මගින්, මෙම ප්‍රගතිය අඛණ්ඩව සහ පුරෝකථනය කළ හැකි අයුරින් හා දිගුකාලීන ජාතික අරමුණු සමඟ සමපාත වන පරිදි සිදුවන බව SP&R සහතික කරයි.

## 2.3 උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම (2026-2035) හරහා ප්‍රතිපත්ති ඒකාබද්ධ කිරීම:

පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ SP&R 2026-2035 (උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම) ක්‍රියා කරන්නේ NPF 2025 (ජාතික ප්‍රතිපත්ති රාමුව) සහ ජාතික වැවිලි කර්මාන්ත අංශයේ ප්‍රතිපත්තියෙහි 2024 හි ප්‍රතිපත්තිමය අභිලාෂයන්, ප්‍රායෝගික මෙන්ම බිම් මට්ටමේ සම්බන්ධීකරණ ක්‍රියාවන් බවට පරිවර්තනය කරන එන්ජිම ලෙසය. මෙම ජාතික ප්‍රතිපත්තිමය මඟපෙන්වීම් SP&R හි හරය සමඟ බද්ධ කර ඇති අතර, එමගින් නවීකරණය, තිරසාරභාවය, සියලු දෙනා ඇතුළත් කරගැනීම සහ අගය නිර්මාණය කිරීම හුදු මාර්ගෝපදේශක මූලධර්ම ලෙස පමණක් නොව, එදිනෙදා ක්‍රියාත්මක කිරීම් හැඩගස්වන සක්‍රීය බලවේග ලෙස ක්‍රියාත්මක වන බව සහතික කරයි.

මෙම ප්‍රමුඛතාවයන් සමස්ත ක්ෂේත්‍රය පුරා පැහැදිලි, ක්‍රියාකාරී පියවරයන් බවට පරිවර්තනය වන ආකාරය වගුව 2 මගින් නිරූපණය කෙරේ. මීට අමතරව, SP&R මගින් නිශ්චිත සන්ධිස්ථාන සකසන අතර, වගකීම් සහ බැඳියාවන් නිර්වචනය කරමින් සමස්ත පොල් අගය දාමය පුරාම මැදිහත්වීම් සිදුකළ යුතු අනුපිළිවෙල විදහා දක්වයි. සමස්තයක් ලෙස මෙම අංගයන්, සියලුම පාර්ශවකරුවන්ට විශ්වාසයෙන්, පැහැදිලි බවකින් සහ පොදු අරමුණකින් යුතුව ඉදිරියට යාම සඳහා ඒකාබද්ධ මාවතක් සහ පොදු වේදිකාවක් සපයයි.

*වගුව 2 - ජාතික වැවිලි කර්මාන්ත ප්‍රතිපත්ති තේමාවන් පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ මාර්ග සිතියම් ක්‍රියාමාර්ග සමග අනුකූල වන අයුරින් සැකසීම (2026–2035)*

| ජාතික වැවිලි කර්මාන්ත ප්‍රතිපත්තිය 2024 - ප්‍රතිපත්ති තේමාව | ප්‍රධාන පොල් කර්මාන්ත ක්ෂේත්‍ර මාර්ග සිතියම් ක්‍රියාමාර්ග (2026–2035) |
|---|---|
| **1. බෝග නිෂ්පාදනය සහ සම්පත් කළමනාකරණය** | o වයස්ගත වූ පොල්ගස් පුනරුත්ථාපනය සහ නැවත වගා කිරීම<br>o අතුරු බෝග වගාව සහ පසෙහි සාරවත් බව ඉහළ නැංවීම<br>o නිරවද්‍ය ජල සම්පාදනය, දියර පොහොර භාවිතය සහ තෙතමනය සංරක්ෂණය කිරීම<br>o බීජ උයන් සහතික කිරීම සහ වැඩි දියුණු කළ පැල තවාන් ප්‍රමිතීන් ඇති කිරීම<br>o දේශගුණයට ඔරොත්තු දෙන සහ ඉහළ අස්වැන්නක් ලබා දෙන ප්‍රභේද ව්‍යාප්ත කිරීම<br>o LoT තාක්ෂණය පදනම් කරගත් ජල සම්පාදනය සහ සම්පත් භාවිතය අධීක්ෂණය |
| **2. පර්යේෂණ සහ සංවර්ධනය** | o අදාළ පොල් ත්‍රිකෝණ තුළ පර්යේෂණ හා සංවර්ධන අනු-මධ්‍යස්ථාන පිහිටුවීම මගින් පර්යේෂණ හා සංවර්ධන |

| | |
|---|---|
| | ව්‍යාපෘති පුළුල් කිරීම<br>o විවිධ කෘෂි-දේශගුණික කලාප සඳහා පොල් පර්යේෂණ ආයතනය / පොල් වගා කිරීමේ මණ්ඩලය මගින් නව පොල් ප්‍රභේද 3ක් සංවර්ධනය කිරීම<br>o පොල් පර්යේෂණ ආයතනය - විශ්වවිද්‍යාල - කර්මාන්ත ක්ෂේත්‍ර අතර පර්යේෂණ සහයෝගීතාව ශක්තිමත් කිරීම<br>o දේශගුණයට අනුවර්තනය වන පර්යේෂණ මධ්‍යස්ථාන සහ ක්ෂේත්‍ර අත්හදා බැලීම් ස්ථාන පිහිටුවීම<br>o පර්යේෂණ සොයාගැනීම් ගොවීන් වෙත ව්‍යාප්ත කිරීම සඳහා ඩිජිටල් වේදිකා (උදා: GIS තාක්ෂණය) භාවිත කිරීම |
| **3. අගය දාම සංවර්ධනය සහ අගය එකතු කිරීම** | o සැකසුම් කම්හල් සඳහා ආයෝජනය කිරීම<br>o ගුණාත්මකභාවය සහතික කිරීමේ සහ සොයාගත හැකි වීමේ පද්ධති ඉහළ නැංවීම<br>o චක්‍රීය ආර්ථික නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම (අපද්‍රව්‍යවලින් වටිනාකමක් නිර්මාණය කිරීම)<br>o අපනයන විවිධාංගීකරණය සහ සුවිශේෂී වෙළඳපොළ නිෂ්පාදන සංවර්ධනය කිරීම දිරිමත් කිරීම |
| **4. අලෙවිකරණය, වෙළඳාම සහ ව්‍යවසායකත්ව සංවර්ධනය** | o සුළු හා මධ්‍ය පරිමාණ සහ තරුණ ව්‍යවසායකත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>o රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සඳහා පහසුකම් සැලසීම<br>o මූල්‍ය වැඩසටහන් සහ ව්‍යාපාර බිහි කිරීමේ සහය ලබා දීම<br>o "සිලෝන් කොකනට්" සන්නාමය ගොඩනැඟීම සහ භූගෝලීය දර්ශක (Geographical Indication - GI)ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කිරීම<br>o GIS/RSතාක්ෂණයේ සහය ඇතිව, EUDR (යුරෝපා සංගමයේ වන විනාශය පිළිබඳ නියාමනය) ප්‍රමිතීන්ට අනුකූල වන බ්ලොක්චේන් මත පදනම් වූ සැපයුම් දාම සොයාගත හැකි වීමේ පද්ධතියක් ඇති කිරීම<br>o ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳව අපනයනකරුවන්ගේ ධාරිතාව සංවර්ධනය කිරීම |
| **5. දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව සහ අවදානම් අවම කිරීම** | o දේශගුණයට අනුකූල පිළිවෙත්: වසුන් යෙදීම (කොළ රොඩු වැස්ම), කෘෂි වන වගාව, නියඟයට ඔරොත්තු දෙන කළමනාකරණය<br>o දේශගුණික අවදානම් සිතියම්ගත කිරීම සහ අවදානමට |

| | |
|---|---|
| | ලක්වීමේ හැකියාවන් වර්ගීකරණය<br>o ශක්තිමත් කරන ලද පළිබෝධ සහ රෝග නිරීක්ෂණ සහ ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ (IPM) පද්ධති<br>o ජල සුරැකුම් තාක්ෂණයන් සහ දේශීයකරණය වූ නියඟ අවම කිරීමේ ක්‍රමවේද<br>o ආපදා සූදානම සහ ජෛව ආරක්ෂණ වැඩසටහන් |
| **6. පාර්ශවකරුවන් සවිබල ගැන්වීම** | o පුහුණු ව්‍යාප්ත නිලධාරීන් සංඛ්‍යාව 500 සිට 2,000 දක්වා පුළුල් කිරීම සඳහා, තරඟකාරී අනුමත කාර්ය මණ්ඩල අනුමැතිය සහ පුහුණුව සඳහාම වෙන්වූ ප්‍රතිපාදනවල සහය ඇතිව, වහාම බඳවා ගැනීම් සිදු කිරීම<br>o ගොවීන්, සැකසුම්කරුවන් සහ අගය දාමයේ අනෙකුත් පාර්ශවකරුවන් සඳහා ඩිජිටල් ඉගෙනුම් මොඩියුල හඳුන්වා දීම<br>o ගොවි සමූපාකාර සමිති සහ කාන්තා කණ්ඩායම් ශක්තිමත් කිරීම<br>o රාජ්‍ය-පෞද්ගලික උපදේශන වේදිකා සහ දැනුම හුවමාරු කර ගැනීමේ ජාල ඇති කිරීම<br>o සමස්ත අගය දාමය පුරාම කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| **7. වෘත්තීය සෞඛ්‍යය සහ සමාජ ආරක්ෂණ** | o වැවිලි වතු සහ සැකසුම් කම්හල් සඳහා වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රමිතීන් ඇති කිරීම<br>o ස්ත්‍රී-පුරුෂ භාවය පදනම් කරගත් පුහුණුවීම් සහ සේවා ස්ථාන ආරක්ෂණ ක්‍රමවේද<br>o සමාජ ආරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්<br>o සේවක පහසුකම්, ආරක්ෂිත උපකරණ සහ සුභසාධන සේවාවන් වැඩි දියුණු කිරීම |
| **8. ප්‍රතිපත්ති සහ පාලනය** | o මාර්ග සිතියමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා ඩිජිටල් උපකරණ පුවරු (ඩෑස් බෝඩ්) සකස් කිරීම<br>o වාර්ෂික කාර්ය සාධන සමාලෝචන සහ ක්ෂේත්‍ර ප්‍රගති සකස් කිරීම<br>o CRI, CDA, CCB, MPCI, CCCI සහ අනෙකුත් පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන් අතර ආයතනික සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම<br>o පර්යේෂණ හා සංවර්ධන සහ සැකසුම් ක්‍රියාවලීන්හි ආයෝජනය සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘති භාවිත කිරීම |

o නියාමන ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිපත්තිමය ප්‍රතිපෝෂණ ක්‍රමවේද ඇති කිරීම

# 3. අගය දාම දළ විශ්ලේෂණයඃ වත්මන් සන්දර්භය සහ සංසන්දනාත්මක අවබෝධය

## 3.1 පොල් අගය දාමය

දේශීය ඉල්ලුමෙන් විශාල කොටසක් සපුරාලමින් රටේ අපනයන කාර්ය සාධනය ද ශක්තිමත් කිරීම මඟින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය සැලකිය යුතු ලෙස පරිවර්තනය කිරීමේ විභවය පොල් ක්ෂේත්‍රය සතුව පවතී. නිවැරදි ආයෝජන සහ සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග සමඟින්, ජාතික රැකියා නියුක්තිය සඳහා මෙම ක්ෂේත්‍රයට ඇති දායකත්වය තවදුරටත් පුළුල් කළ හැකිය. එනම් එය අගය දාමය පුරා 1,000,000 කට අධික පිරිසකට සෘජු රැකියා ද, තවත් 350,000 කට වක්‍ර රැකියා අවස්ථා ද නිර්මාණය කර දෙමින් සිදුකළ හැකිය. මෙය පොල් කර්මාන්තය ආර්ථික ගාමක බලවේගයක් පමණක් නොව, ග්‍රාමීය සංවර්ධනය සහ කුසලතා පූර්ණ රැකියා උත්පාදනය සඳහා වූ ප්‍රබල එන්ජිමක් බවට ද පත් කරයි.

ශ්‍රී ලංකාවේ පොල් අගය දාමය දැනටමත් විවිධාංගීකරණය වී ඇති අතර ඉහළ විභවයකින් සමන්විතය. ඒ සඳහා ශක්තිමත් දේශීය පරිභෝජනය සහ උසස් තත්ත්වයේ, අගය එකතු කළ පොල් නිෂ්පාදන සඳහා ලෝක වෙළඳපොළේ ඇති වර්ධනය වන ඉල්ලුම මඟින් මනා සහයෝගයක් ලැබේ. SP&R මෙම ශක්තිය හඳුනා ගන්නා අතර, මෙම අගය දාමය පුළුල් පරාසයක පාර්ශවකරුවන්, ක්‍රියාකාරකම් සහ වෙළඳපොළ සම්බන්ධතා සහිත ගතික පද්ධතියක් ලෙස හඳුනා ගනී. එනම් මෙය කෘෂිකාර්මික යෙදවුම් සපයන්නන් සහ වගාකරුවන්ගේ සිට සැකසුම්කරුවන්, නිෂ්පාදකයින්, අතරමැදියන් සහ අපනයනකරුවන් දක්වා වූ පද්ධතියකි. මෙම ක්‍රියාකාරීන් පැහැදිලි බව සහ උපායමාර්ගික අවධානය සඳහා ප්‍රධාන කාණ්ඩ පහකට වර්ග කර ඇතඃ එනම් යෙදවුම් සැපයුම්කරුවන්, වගාකරුවන්, අතරමැදියන්, සැකසුම්කරුවන් සහ අපනයනකරුවන් ය. මීට අමතරව, ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතියට දායක වන සහ SP&R ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන වන වැදගත් ක්‍රියාකාරීන් ලෙස රාජ්‍ය ආයතන, මූල්‍ය ආයතන/ආයෝජකයින් සහ විද්වත් ප්‍රජාව / සංවර්ධන හවුල්කරුවන්ගේ ඇති වැදගත්කම ද SP&R හඳුනා ගනී.

ස්වාධීන ලෙස සිදු කරන ලද අගය දාම විශ්ලේෂණයක් [5], මත පදනම් වෙමින්, මෙහෙයුම් කමිටුව විසින් නියම කර ඇති ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය නිශ්චිත ක්‍රියාමාර්ග SP&R විසින් හඳුනා ගනු ලබයි. මෙම පාර්ශවකරුවන් සියල්ලෝම එකිනෙකා හා සම්බන්ධ වූ පරිසර පද්ධතියක් සාදන අතර, එමඟින් දේශීය මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළවල් පුරා නිෂ්පාදනය, සැකසීම සහ අලෙවිකරණය මෙහෙයවනු ලබයි (රූපය 3). 4 වන පරිච්ඡේදයේ දක්වා ඇති පරිවර්තන සිද්ධාන්තය, මෙම ක්‍රියාමාර්ගයන් එකිනෙකා හා බද්ධ වූ උපායමාර්ග බවටත් අවසානයේදී ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල බවටත් පරිවර්තනය කරන රාමුව සපයයි.

**යෙදවුම් සැපයුම්කරුවන්ඃ** නිෂ්පාදන ක්‍රියාවලියේ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා වගාකරුවන් සහ කර්මාන්ත සැකසුම්කරුවන් බොහෝ දුරට යෙදවුම් සැපයුම්කරුවන් මත යැපෙයි. වඩාත් ශක්තිමත් වගා පිළිවෙත් සහ තිරසාර ඵලදායීතා වර්ධනයක් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, සේවාවන් සහ තාක්ෂණයන් ලබා දීමෙන් මෙම සැපයුම්කරුවන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකාවේ, යෙදවුම් සැපයුම් පරිසර පද්ධතිය සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලය, පොල් පර්යේෂණ ආයතනය සහ පොල් සංවර්ධන අධිකාරිය වැනි රාජ්‍ය අංශයේ ආයතන මූලික පදනම සපයන අතර, ඔවුන් මෙම

---

[5] BESPA-Food ව්‍යාපෘතියේ රාමුව යටතේ, UNIDO හි ඉල්ලීමකට අනුව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් මෙම අගය දාම විශ්ලේෂණය සිදු කර ඇත.

ක්ෂේත්‍රයේ අත්‍යවශ්‍ය හවුල්කරුවන් ලෙස අඛණ්ඩව ක්‍රියා කරයි. පෞද්ගලික අංශය ද තම දායකත්වය ක්‍රියාශීලි පුද්ගලික පැල තවාන්, කෘෂි රසායන නිෂ්පාදකයින් සහ බෙදාහරින්නන් මෙන්ම යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සැපයුම්කරුවන්, ජල සම්පාදන පද්ධති සහ තොරතුරු තාක්ෂණ මත පදනම් වූ තාක්ෂණයන් හරහා සැලකිය යුතු මට්ටමකින් ලබා දෙන අතර එමඟින් වගාකරුවන්ට පුළුල් සම්පත් සහ වඩාත් විශේෂිත තාක්ෂණික දැනුම ලබා ගැනීමට අවස්ථාව ලැබේ.

අනාගතය දෙස බලන විට, අගය දාමයේ මෙම කොටසෙහි අතිමහත් විභවයක් පවතී. බීජ උයන් සහ පැල තවාන් පුළුල් කිරීම, කාර්යක්ෂම ජල සම්පාදන පද්ධති වඩාත් පුළුල් ලෙස වැළඳ ගැනීම සහ කාබනික පොහොර, ජීව අඟුරු, කෘෂි රසායන සහ නව්‍ය කෘෂි තාක්ෂණික විසඳුම් මහා පරිමාණයෙන් නිෂ්පාදනය කිරීම මීට ඇතුළත් වන අවස්ථාවන් ලෙස සැලකිය හැකිය.

**වගාකරුවන්**: ශ්‍රී ලංකාවේ පොල් වගාකරුවන් සාමාන්‍යයෙන් හෙක්ටයාර් 8 කට වඩා අඩු ඉඩම් හිමි කුඩා වතු හිමියන් සහ හෙක්ටයාර් 8 කට වඩා වැඩි විශාල ඉඩම් කළමනාකරණය කරන වතු පාලකයන් ලෙස වර්ගීකරණය කෙරේ. පොල් සංවර්ධන අධිකාරිය විසින් මෑතකදී වාර්තා කරන ලද සංඛ්‍යාලේඛනවලට අනුව, ශ්‍රී ලංකාව සතුව මුළු පොල් වගා බිම් අක්කර 1,095,982 ක් පවතින අතර, ඉන් අක්කර 917,307 ක් කුඩා වතු අංශයටත්, අක්කර 178,675 ක් මහා පරිමාණ වතු අංශයටත් අයත් වේ. මෙය පිළිවෙලින් මුළු පොල් වගා භූමි ප්‍රමාණයෙන් 83.7% ක සහ 16.3% ක ප්‍රතිශතයකි.[6] තවද, බහුලව සිදුවන ඉඩම් කැබලි කිරීම් හේතුවෙන්, ඉඩම් හිමිකාරිත්වයේ ප්‍රමාණය වතු මට්ටමේ සිට කුඩා පරිමාණ මට්ටම දක්වා විශාල වශයෙන් සංක්‍රමණය වී ඇති බව ඉතා පැහැදිලිය.[7] මෙම ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා අවස්ථා සපයන ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් කැපී පෙනේ. ඒවා නම් කුඩා වතු හිමියන්ගේ ව්‍යාපාරවල ලාභදායීතාවය ඉහළ නැංවීම සහ සියලුම වර්ගයේ වතු හිමිකාරිත්වයන් පුරා වගා පිළිවෙත් දියුණු කිරීමයි. කාර්යක්ෂමතාවය මුල් කරගත් සංකල්ප, සහතික කිරීමේ ක්‍රමවේද, නවීන කෘෂිකාර්මික ශිල්පීය ක්‍රම සහ කාර්ය සාධනය ඉලක්ක කරගත් වතු කළමනාකරණය හඳුන්වා දීමෙන්, ශ්‍රී ලංකාවට අස්වැන්නේ සැලකිය යුතු දියුණුවක් අත්පත් කර ගත හැකිය. මෙහිදී පොහොර යෙදීම, තෙතමනය සංරක්ෂණය, පළිබෝධ කළමනාකරණය සහ අතුරු බෝග වගාව සඳහා වන ශක්තිමත් උත්සාහයන් සමඟින් උචිත තාක්ෂණයන් වඩාත් පුළුල් ලෙස භාවිත කිරීම, වගාකරුවන්ගේ ඵලදායීතාවය පරිවර්තනය කරනු ඇති අතර වඩාත් සජීවී, අනාගතයට සූදානමින් පසුවන පොල් කර්මාන්තයක් නිර්මාණය කරනු ඇත.


**සැකසුම්කරුවන් සහ අපනයනකරුවන්**: ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික බෝග අතරින් පොල් එහි ඇති ඉහළ අගය එකතු කළ නිෂ්පාදන ධාරිතාව නිසා කැපී පෙනේ. මේ සඳහා සැකසුම්කරුවන්ගේ සක්‍රීය භූමිකාව බෙහෙවින් හේතු වේ. පොල් සැකසුම්කරුවන් මහා පරිමාණ, මධ්‍ය පරිමාණ සහ සුළු හෝ ගෘහස්ථ මට්ටමේ ක්‍රියාකාරීන් ලෙස වර්ග කළ හැකිය. මහා පරිමාණ සැකසුම්කරුවන් මූලික වශයෙන් අපනයනය ඉලක්ක කරගත් අය වන අතර, ඔවුන් බොහෝ විට අනෙකුත් සැකසුම්කරුවන්ගෙන් නිෂ්පාදන එකතු කර තොග වශයෙන් අපනයනය කරයි. සුළු සහ ගෘහස්ථ මට්ටමේ ක්‍රියාකාරීන් සාමාන්‍යයෙන් ගම්මාන පදනම් කරගත් අය වන අතර, ඔවුන් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ දේශීය ඉල්ලුම සපුරාලීමටය.

පොල් ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන ප්‍රධාන කණ්ඩායම් දෙකකට වර්ග කළ හැකිය: පොල් මද ආශ්‍රිත නිෂ්පාදන (kernel products) සහ පොල් මද නොවන නිෂ්පාදන (non-kernel products) වශයෙනි. පොල් ගෙඩියේ ආහාරයට ගත හැකි සුදු කොටස සහ ඒ තුළ ඇති දියරයෙන් ලබාගන්නා නිෂ්පාදන 'පොල් මදය ආශ්‍රිත නිෂ්පාදන' ලෙස වර්ග කෙරෙන අතර, පිටත තුනී ලෙල්ල, ඝන කෙඳි සහිත ලෙල්ල (ලෙලි කුඩු/කෙඳි) සහ දැඩි ආරක්ෂිත කට්ට ( පොල් කටුව) ආශ්‍රිතව නිපදවන දෑ 'පොල් මදය ආශ්‍රිත නොවන නිෂ්පාදන' ලෙස වර්ග කෙරේ.

---

6 https://www.cda.gov.lk/web/images/pdf/export_perfo/T01.pdf
7 https://sjae.sljol.info/articles/4641/files/submission/proof/4641-1-21235-1-10-20220104.pdf

*රූපය 3 - පොල් අගය දාමය*




මූලාශ්‍රය: 2025 පොල් අගය දාම විශ්ලේෂණය (IPS & UNIDO)

ප්‍රධාන මද ආශ්‍රිත නිෂ්පාදන අතරට පොල් තෙල්, දිසිදි පොල්, කොප්පරා, පොල් ක්‍රීම් සහ පොල් කිරි කුඩු ඇතුළත් වේ. ප්‍රධාන වශයෙන් පොල් ලෙල්ලෙන් ලබාගන්නා පොල් මද නොවන නිෂ්පාදනවලට බ්‍රිස්ටල් කොහු, මෙට්ට කොහු, කොහුබත් සහ තවත් අගය එකතු කළ නිෂ්පාදන රැසක් වන කොහු ලණු, කඹ, බුරුසු, ඉදල් / කොසු, රබර් මිශ්‍රිත පෑඩ්, ඇඳ ඇතිරිලි ද්‍රව්‍ය, පැදුරු, පාපිසි, පොල් ලෙලි කැබලි, භූ-රෙදිපිළි සහ උද්‍යාන විද්‍යාව සඳහා අච්චු සකසන ලද භාණ්ඩ ඇතුළත් වේ. කටු ආශ්‍රිත නිෂ්පාදන අතරට පොල් කටු කැබලි, පොල් කටු කුඩු, අඟුරු සහ සක්‍රිය කාබන් ඇතුළත් වේ.

මෙහි විෂයේදී ප්‍රධාන නිර්දේශයන් අතර, පාර්ශ්වකරුවන් (උදා: එකතු කරන්නන්) අතර ඒකාබද්ධ අගය දාමයන් සමඟ සැපසුම්කරුවන් සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම, සාධාරණ මිල නියම කිරීමේ පද්ධති ඇතුළත් කිරීම, ඉහළ අගය එකතු කළ නිෂ්පාදන සඳහා ධාරිතාව පුළුල් කිරීම, තත්ත්ව සහතික කිරීම්, වාර්තා තබා ගැනීම, ප්‍රභවය සොයාගැනීමේ හැකියාව සහ තොරතුරු තාක්ෂණය මත පදනම් වූ තාක්ෂණයන් (උදා: GIS මත පදනම් වූ සැලසුම් කිරීම) සඳහා ආයෝජනය කිරීම, ජාත්‍යන්තරව "සිලෝන් කොකනට්" සන්නාමය මූලෝපායිකව ප්‍රවර්ධනය කිරීමට දායක වීම සහ පාරිභෝගික හැසිරීම් වෙනස් කිරීමේ ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ.

## ප්‍රධාන සහායක සේවා. රාජ්‍ය ආයතන, මූල්‍ය ආයතන, විද්වත් ප්‍රජාව සහ සංවර්ධන හවුල්කරුවන්:

ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය ගැන අවධානය යොමු කිරීමේදී එය පර්යේෂණ, ව්‍යාප්ති සේවා, මූල්‍ය, නියාමනය සහ තාක්ෂණික සහාය ආවරණය වන පරිදි ස්ථාපිත සහායක පරිසර පද්ධතියක් තුළ ක්‍රියාත්මක වේ. පොල් පර්යේෂණ ආයතනය නිෂ්පාදන සහ සැකසුම් යන දෙඅංශයේම පුරෝගාමී පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල පෙරමුණ ගෙන සිටින අතර, පොල් සංවර්ධන අධිකාරිය විසින් කාර්මික නියාමනය, බලපත්‍ර ලබා දීම සහ අපනයන ඉලක්ක කරගත් අපේක්ෂා සහගත වෙළඳපල සංවර්ධනය හරහා මෙම අංශය ඉදිරියට ගෙන යයි.

තවද, පොල් වගාකිරීමේ මණ්ඩලය පුළුල් පුහුණු සහ උපදේශන ජාලයක් හරහා අත්‍යවශ්‍ය ව්‍යාප්ති සේවා සපයයි. මූල්‍යමය සවිබලගැන්වීම විශේෂයෙන් CCB -කප්රුක සහ CDA ණය යෝජනා ක්‍රම හරහා සිදුවන අතර පොල් අපනයනකරුවන් සඳහා සිලෝන් කොකනට් කර්මාන්තකරුවන්ගේ මණ්ඩලය විසින් සපයනු ලබන සක්‍රීය ප්‍රතිපත්ති සහ කර්මාන්ත සහායක පරිසරයක් මගින් එය තවදුරටත් සම්පූර්ණ කෙරේ. මෙයට සමගාමීව, ආයෝජන උත්ප්‍රේරණය කිරීමට සහ අවදානම් කල්තියාම හඳුනාගෙන ඒවා කළමනාකරණය කිරීමට අවශ්‍ය අත්‍යවශ්‍ය සම්පත් සහ සේවා මූල්‍ය ආයතන විසින් සපයනු ලැබේ.

පොල් සංවර්ධන අධිකාරියෙහි නියාමන කාර්යයන් සහ පොල් පර්යේෂණ ආයතනයෙහි සහතික කිරීමේ පද්ධති හරහා තත්ත්වයේ විශිෂ්ටත්වය තහවුරු කරනු ලබන අතර, එමගින් කර්මාන්තය ලෝක සංදර්භය තුළ දැඩි තරඟකාරීව පවතින බව සහතික කරයි. අනුකූලතා තක්සේරු කිරීමේ ආයතන විසින් සපයනු ලබන සේවාවන් සමගින්, තුන්වන පාර්ශ්වීය, ලෝකයේ පිළිගත් සහතික සහිතව "සිලෝන් කොකනට්" නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳපොළට බාධාවකින් තොරව ඇතුළු වේ. 'සිලෝන් කුරුඳු' සඳහා භූගෝලීය දර්ශක (GI) පිළිගැනීමක් ලබා ගැනීමට සහ 'සිලෝන් ටී' හි සාර්ථකත්වයට තීරණාත්මක වූ එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) වැනි සංවර්ධන හවුල්කරුවන්ගේ ඉහළ පෙළේ මගපෙන්වීම, දැන් ලංකාවේ පොල් ආශ්‍රිත කර්මාන්තය සමෘද්ධිමත් අනාගතයක් කරා සවිබල ගැන්වීම සඳහා අඛණ්ඩව ලබා දෙන දැවැන්ත දායකත්වය ද මෙහිදී ඇගයීමට ලක්කළ යුතුය.

මෙම SP&R හි ගම්‍යතාවය පවත්වා ගැනීම සඳහා, අපගේ ඉදිරි ගමන්මග සමස්ත කර්මාන්තයම නගා සිටුවීම සඳහා නිර්මාණය කරන ලද පරිවර්තනීය ක්‍රියාමාර්ග මාලාවක් මගින් සනිටුහන් කර ඇත. ඉහළම ප්‍රමිතියෙන් යුත් ගුණාත්මකභාවය, ප්‍රභවය සොයා ගැනීමේ හැකියාව සහ විනිවිදභාවය සුරක්ෂිත කිරීම සඳහා එකතු කරන්නන් වෙත විශේෂිත පුහුණුවක් ලබා දෙමින් අගය දාමය සවිබල ගැන්වීමෙන් මෙම ගමන ආරම්භ වේ. මෙම වර්ධනය පෝෂණය කිරීම සඳහා, ඊළඟ පරම්පරාවේ

පොල් තාක්ෂණයන් විදහා දක්වන උසස් ගොවිතැන් ආකෘති සහ අති නවීන පර්යේෂණ හා සංවර්ධන සඳහා ආයෝජනය කිරීමෙන් අප නවෝත්පාදනය මෙහෙයවිය යුතුය. මෙය අපගේ සැකසුම් අංශය නවීකරණය කිරීම මගින් සම්පූර්ණ කරනු ලබන අතර, එහිදී ඉලක්කගත තාක්ෂණික සහාය මගින් ඉහළ කාර්යක්ෂමතාවයකින් යුත් නිෂ්පාදන ක්‍රම අනුගමනය කිරීම වේගවත් කරනු ඇත. "සිලෝන් කොකනට්" සන්නාමයේ ජාත්‍යන්තර කීර්තිය ශක්තිමත් කිරීමෙන් සහ සියලුම සැපයුම් කටයුතු හරහා ශක්තිමත් ගුණාත්මක සහ ආරක්ෂණ සහතිකයක් තහවුරු කිරීමෙන්, අපගේ නිෂ්පාදන විශිෂ්ටත්වය අතින් ලෝකයේ ඉදිරියෙන්ම සිටින බව අපි සහතික කරන්නෙමු.


මෙම අනාගත අපේක්ෂා සහගත දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා පුළුල් කරන ලද මූල්‍ය වැඩසටහන් සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් වැනි ඉහළ බලපෑමක් ඇති ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් හරහා ආයෝජන විවෘත කිරීම ඉලක්ක කරගත් සැලකිය යුතු මූල්‍යමය කැපවීමක් අවශ්‍ය වේ. SP&R හි අපේක්ෂා කරන ඇමරිකානු ඩොලර් බිලියන 1කටත් වඩා වැඩි ආයෝජන ඉලක්කය සපුරා ගැනීම සඳහා, කුඩා වතු හිමියන් සඳහා වූ ක්ෂුද්‍ර ණය ක්‍රමවල සිට මහා පරිමාණ ආයෝජන රාමු දක්වා විහිදෙන විශේෂිත මූල්‍ය ප්‍රවේශ යෝජනා ක්‍රම ශ්‍රී ලංකාව විසින් ක්‍රියාත්මක කළ යුතුය. ඒ හා සමානව, මෙම මූල්‍යමය සාධක සමඟින්, අවදානම් සඳහා ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට සහ අගය දාමයේ සෑම මට්ටමකම සිටින ආයෝජකයින් ආරක්ෂා කිරීම සඳහා විස්තීර්ණ රක්ෂණ යෝජනා ක්‍රම පුළුල් ලෙස ප්‍රවර්ධනය කළ යුතුය. අවසාන වශයෙන්, මෙම ප්‍රගතිය ගැඹුරට මුල් බැස ගත් සහයෝගීතාවය හරහා පවත්වා ගෙන යනු ලබන අතර එහිදී විද්වතුන් විසින් යහ පරිචයන් සහ තාක්ෂණය හඳුන්වා දීමට මග පෙන්වන අතර, මෙම මාර්ග සිතියම සාර්ථකව සහ පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමට අවශ්‍ය මූලෝපායික ගම්‍යතාවය සහ තාක්ෂණික විශේෂඥතාවය සංවර්ධන හවුල්කරුවන් විසින් සපයනු ඇත.

## 3.2 ඉල්ලුම

ශ්‍රී ලංකාවේ වාර්ෂිකව ලැබෙන බිලියන 3ක පොල් අස්වැන්න රටට සහ ආර්ථිකයට දායක වන ආකාරය විශ්ලේෂණය කිරීම අපගේ උපායමාර්ගයේ ප්‍රධාන පදනමකි. 2024 වර්ෂයේදී, මෙම පොල් පරිභෝජනය කළ ආකාරය දෙස බැලීමේදී, අත්‍යවශ්‍ය ප්‍රධාන ආහාරයක් මෙන්ම බහුවිධ කාර්මික සම්පතක් ලෙස පොල් සතු ද්විත්ව භූමිකාව මැනවින් පැහැදිලි වේ. දේශීය පරිභෝජනය සමස්ත අස්වැන්නෙන් 50.64%ක් වූ අතර (ශ්‍රී ලංකා පොල් නිෂ්පාදන ආශ්‍රිත සංඛ්‍යාලේඛන, CDA, 2024), එයින් අපේ ජනතාවගේ දෛනික පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා පොල් සතු ගැඹුරින් මුල් බැසගත් වැදගත්කම නිරූපණය වේ.

මෙයට සමාන්තරව, සැකසුම් අංශය ද සිය වර්ධනය වෙමින් පවතින ශක්තිය පෙන්නුම් කර ඇත: දේශීය කුටුම්භ සහ පුළුල් වන අපනයන වෙළඳපොළ යන දෙකෙහිම ඉහළ ඉල්ලුමක් පවතින පොල් ක්‍රීම්, පිටි කළ පොල් කිරි සහ දියර පොල් කිරි වැනි නිෂ්පාදන සමස්ත අස්වැන්නෙන් 17%ක් උසුලයි. පොල්තෙල් (14%) සහ දිසිදි පොල් (9.89%) කර්මාන්තයේ ප්‍රධාන කුළුණු ලෙස අඛණ්ඩව පවතින අතර, කොප්පරා (0.36%) සහ අමු පොල් (0.42%) වැනි අමුද්‍රව්‍ය ලෙස කෙරෙන අපනයන අවම මට්ටමක පවතී. මෙම දත්ත මගින් ප්‍රබල තත්වයක් අනාවරණය කරයි: එනම්, ඉල්ලුමේ පදනම දේශීය පරිභෝජනය මත ගොඩනැගී තිබුණද, අපගේ අමුද්‍රව්‍ය සැපයුමෙන් වැඩි ප්‍රමාණයක්, ලෝකය ඉල්ලා සිටින ඉහළ අගයක් එකතු කළ සැකසූ නිෂ්පාදන බවට පරිවර්තනය කිරීමට විශාල සහ මෙතෙක් ප්‍රයෝජනයට නොගත් විභවයකින් සමන්විත බවයි.

*රූපය 4 - 2024 වර්ෂයේ පොල් නිෂ්පාදනයේ පරිභෝජන රටාව වෙන් කර දැක්වීම*





මූලාශ්‍රය: ශ්‍රී ලංකා පොල් සංඛ්‍යාලේඛන, **CDA** (2024) හි දත්ත ඇසුරින් කතුවරුන්ගේ සම්පාදනයකි.

"සිලෝන් කොකනට්" (ලංකා පොල්) පරිභෝජනය දෙස බැලීමේදී පෙනී යන්නේ ස්ථාවර ඉල්ලුමක් මෙන්ම මෑතකාලීන කැපී පෙනෙන වර්ධනයකි. 2022 වර්ෂයේදී සමස්ත නිෂ්පාදනය පොල් ගෙඩි මිලියන 3,000කට වඩා වැඩි ඉහළම මට්ටමකට ළඟා විය. අපගේ දත්තවලට අනුව, සමස්ත පරිභෝජනයෙන් වැඩිම කොටසක් අඛණ්ඩවම දේශීය ගෘහ මට්ටමේ අවශ්‍යතා සඳහා වෙන් වුවද, 2022 සිට 2025 දක්වා කාලය තුළ දේශීය හා කාර්මික ඉල්ලුම යන දෙකෙහිම කැපී පෙනෙන වර්ධනයක් අපට දැකගත හැකි විය.

මෙහි ඇති විශේෂත්වය නම්, සමස්ත නිෂ්පාදනයට සාපේක්ෂව දේශීය පරිභෝජනයේ ප්‍රතිශතය මීට පෙරාතුව 55%ත් 68%ත් අතර අගයක දෝලනය වී තිබුණද, 2024 වර්ෂයේදී එය එහි අවම සාපේක්ෂ ප්‍රතිශතය (50.64%) වාර්තා කිරීමයි. මෙම වෙනස කර්මාන්තය විවිධාංගීකරණය වෙමින් පවතින බව පෙන්වන සාධනීය දර්ශකයකි. එනම් සමස්ත නිෂ්පාදනය ඉහළ යන විට, එයින් වැඩි ප්‍රමාණයක් කාර්මික සහ අපනයන කේන්ද්‍ර කරගත් වර්ධනයක් සඳහා සාර්ථකව යොමු කෙරේ. 2025 වන විට, මෙම සමතුලිතතාවය බොහෝ දුරට සමාන මට්ටමකට පැමිණි අතර, එහිදී දළ වශයෙන් පොල් ගෙඩි මිලියන 1,414ක් නිවෙස්වල පරිභෝජනයට ගත් අතර පොල් ගෙඩි මිලියන 1,378ක් සැකසුම් කර්මාන්තය සඳහා යොදා ගැනුණි. මෙය 2025 ඔක්තෝබර් මාසය දක්වා පමණක් ඇමරිකානු ඩොලර් මිලියන 1,023.27ක ආකර්ෂණීය අපනයන ආදායමක් උපයා දීමට සමත් විය.

*රූපය 5 - දේශීය පොල් පරිභෝජනයේ සහ අනෙකුත් ප්‍රයෝජනයන්හි ප්‍රවණතා*




මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ (2023) දත්ත ඇසුරින් කතුවරුන්ගේ සම්පාදනයකි.

පොල් යනු හුදෙක් වෙළඳ භාණ්ඩයකට වඩා බෙහෙවින් ඔබ්බට ගිය, ජාතික යහපැවැත්ම සඳහා අත්‍යවශ්‍ය දායකත්වයක් සපයන සම්පතකි. 2023 වර්ෂය වන විට, පොල් නිෂ්පාදන මඟින් දෛනිකව පුද්ගලයෙකුට කිලෝකැලරි 239 ක පමණ ශක්තියක් ලබා දී ඇති අතර, වාර්ෂික සමස්ත ආහාර පරිභෝජනය මෙට්‍රික් ටොන් 615,100 ක් දක්වා ළඟා වී ඇත. ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව, ශ්‍රී ලාංකිකයන් ඔවුන්ගේ සාමාන්‍ය ගෘහස්ථ වියදම්වලින් 5.4% ක්ම වෙන් කරනු ලබන්නේ පොල් නිෂ්පාදන සඳහාය. එය අපගේ සාම්ප්‍රදායික ආහාර සංස්කෘතිය තුළ පොල් සතු අත්‍යවශ්‍ය සහ අත්හළ නොහැකි වැදගත්කම මනාව පිළිබිඹු කරන සාක්ෂියකි.

මෙම අත්‍යවශ්‍යතාවය සෑම පළාතකම පැහැදිලිව දැකගත හැකි අතර, එමඟින් සැබෑ ජාතික මට්ටමේ වෙළඳපොළක් නිරූපණය වේ. පොල් සඳහා වන වියදම් ප්‍රතිශතයෙන් 6.9% ක් වැය කරමින් පෙරමුණ ගන්නා සබරගමුව පළාතේ සිට, 5% ක වියදම් ප්‍රතිශතයක් පවත්වා ගන්නා නාගරීකරණය වූ බස්නාහිර පළාත දක්වා, පොල් සියලු සමාජ-ආර්ථික සීමාවන් අභිබවා යමින් ප්‍රධාන ආහාරයක් ලෙස පවතී. මෙම විශ්වීය ඉල්ලුම, වඩාත් සමෘද්ධිමත් සහ අපනයන කේන්ද්‍ර කරගත් අනාගතයක් ගොඩනැඟීම සඳහා අපට ඉතා ශක්තිමත් දේශීය පදනමක් සපයයි. සාරවත් දකුණු පළාතේ හදවත බඳු ප්‍රදේශවල වුවද, විවිධාංගීකරණය වෙමින් පවතින නැගෙනහිර පළාතේ වෙළඳපොළවල් තුළ වුවද, පොල් යනු ශ්‍රී ලාංකීය මුළුතැන්ගෙය තුළ ප්‍රධාන තැනක් අත්පත් කරගන්නා අපගේ කෘෂිකාර්මික උරුමයේ සංකේතයකි.

## 3.3 සැපයුම


පොල් නිෂ්පාදකයින් යනු අගය දාමයේ ජීව ස්පන්දනය ලෙස සැලකීම අතිශයෝක්තියක් නොවේ. 2025 වර්ෂයේදී, අපගේ පොල් වගාකරුවන් පොල් ගෙඩි බිලියන 2.75 කට ආසන්න ප්‍රමාණයක් නිෂ්පාදනය කර, ඒවා අපගේ දේශීය පවුල් ඒකක සහ වර්ධනය වෙමින් පවතින සැකසුම් කර්මාන්තය වෙත ලබා දීමට කටයුතු කළහ. මෙම අංශයේ ශක්තිය පවතින්නේ එහි සිටින සුළු පරිමාණ වගාකරුවන්ගේ උනන්දුව මතය. ඒ අනුව, සමස්ත පොල් වගා බිම් ප්‍රමාණයෙන් 83.7%

ක්ම පාලනය කරනු ලබන්නේ සුළු පරිමාණ ගොවීන් විසින් වන අතර, ඉතිරි කොටස  වැවිලි වතු වගාකරුවන් විසින් කළමනාකරණය කරනු ලැබේ[8] .

සුළු පරිමාණ වගාකරුවන්ගේ වතු ප්‍රධාන වශයෙන් විසිරී පවතින අතර වඩාත් සංවිධානාත්මක ආකාරයෙන් පවතින්නේ ඉන් කිහිපයක් පමණි. කෙසේ වෙතත්, බොහෝ වතු වගාවන් ක්‍රමවත් ලෙස කළමනාකරණය කෙරේ. ශ්‍රී ලංකාවේ සමස්ත කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයෙන් 20% කට ආසන්න ප්‍රමාණයක් ආවරණය කරන පොල් වගාව අපගේ වගා බිම් අතර සැලකිය යුතු තැනක් හිමි කර ගෙන ඇති අතර, කුරුණෑගල, පුත්තලම, ගම්පහ වැනි දිස්ත්‍රික්කවල ප්‍රබල සහ වර්ධනය වන වගාවක් ලෙසද දකුණු සහ නැගෙනහිර පළාත්වලද ව්‍යාප්ත වෙමින් පවතින වගාවක් ලෙසද තම පැවැත්ම සනිටුහන් කරයි.

*රූපය 6 - 2023 වර්ෂයේ පොල් වගාවේ භූගෝලීය ව්‍යාප්තිය*

දිස්ත්‍රික්කය
කුරුණෑගල
පුත්තලම
.ම්පහ
හම්බන්තොට
අනුරාධපුරය
රත්නපුර
මොනරාගල
කෑගල්ල
මාතර
.ාල්ල
මාතලේ
කළුතර
පොලොන්නරුව
මහනුවර
කොළඹ
අම්පාර
යාපනය
මඩකලපුව
මුලතිව්
බදුල්ල
ත්‍රිකුණාමලය
වවුනියාව
මන්නාරම
කිලිනොච්චිය
නුවරඑළිය





මූලාශ්‍රයః පොල් පර්යේෂණ ආයතනයේ දත්ත ඇසුරින් කතුවරුන්ගේ සම්පාදනයකි (2023).

පොල් කර්මාන්තයේ භූගෝලීය ව්‍යාප්තිය කැපී පෙනෙන අයුරින් විකාශනය වෙමින් පවතී. රූපය 6 හි දැක්වෙන පරිදි, වගා බිම් ප්‍රමාණයෙන් 51.6% කට හිමිකම් පාමින් කුරුණෑගල, පුත්තලම සහ ගම්පහ යන සාම්ප්‍රදායික "පොල් ත්‍රිකෝණය" තවදුරටත් අපගේ ජාතික ශක්ති ජනක කේන්ද්‍රය ලෙස පවතින අතරම, ශ්‍රී ලංකාවේ පොල් වගා සිතියම සාර්ථක ලෙස විවිධාංගීකරණය වෙමින් පවතී. මේ තුළ හම්බන්තොට දිස්ත්‍රික්කය පෙරමුණ ගනිමින් දකුණු තීරයේ ස්ථාවර මෙන්ම දිරිගන්වනසුලු වර්ධනයක් වාර්තා කරමින් සිටින අතර, එයට සමගාමීව නැගී එන "උතුරු පොල් ත්‍රිකෝණය" ස්ථාපිත කිරීම සහ ව්‍යාප්ත කිරීම සඳහා උතුරු පළාත තුළ (යාපනය, මුලතිව් සහ මන්නාරම) ශ්‍රී ලංකා රජය විසින් ක්‍රමවත් මෙන්ම අධිෂ්ඨානශීලී උත්සාහයක නිරත වෙමින් සිටියි. මෙම භූගෝලීය ව්‍යාප්තිය මගින් උපායමාර්ගික සාර්ථකත්වයක් සනිටුහන් කරන අතර, එමගින් ජාතික සැපයුමේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් වන අතරම, ඉහළ විභවයක් සහිත මෙම කර්මාන්තයේ ආර්ථික සහ සංවර්ධන ප්‍රතිලාභ රට පුරා වඩාත් පුළුල් ලෙස බෙදී යාම සහතික කෙරේ.

---

[8] ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. (2018). පොදු වාර්තාව, ආර්ථික සංගණනය 2013/14, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු . . https://www.statistics.gov.lk/Economic/Final_Report_Agri.pdf

*රූපය 7 - ප්‍රධාන ලංකා පොල් වගා කරන ප්‍රදේශ පිළිබඳ දිස්ත්‍රික්ක මට්ටමින් දළ විශ්ලේෂණය*




මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ (**DCS** 2018) සහ පොල් පර්යේෂණ ආයතනයේ ( **CRI** 2023) දත්ත ඇසුරින් කතුවරුන්ගේ සම්පාදනයකි.


රූපය 8 හි විස්තර කර ඇති අපගේ නිෂ්පාදන ඉතිහාසය, විශිෂ්ට ඔරොත්තු දීමේ හැකියාවක් පිළිබඳ කරුණු ගෙනහැර දක්වයි. අපගේ සමස්ත වගා බිම් ප්‍රමාණය සාපේක්ෂව ස්ථාවරව පැවතුනද, නිෂ්පාදන මට්ටම් වරින් වර ඇති වූ අභියෝගයන් හමුවේ වුවද ඒවාට ඉතාමත් ශක්තිමත් ලෙස මුහුණ දී ඇත. 2014 සහ 2016 වර්ෂ අතර කාලයේදී නිෂ්පාදන මට්ටම් සාපේක්ෂව ඉහළ මට්ටමක පැවති අතර, 2017 වර්ෂයේදී ඇති වූ දැඩි දේශගුණික බලපෑම හේතුවෙන් නිෂ්පාදනය පහත වැටුණි. කෙසේ වෙතත්, වසංගත තත්ත්වයෙන් පසුව, 2022 වර්ෂයේදී හෙක්ටයාර 467,122 ක වගා බිම් ප්‍රමාණයකින් පොල් ගෙඩි මිලියන 3,391 ක අසාමාන්‍ය අස්වැන්නක් ලබා ගනිමින් මෙම අංශය වාර්තාගත ඉහළම මට්ටමක් සනිටුහන් කළේය. මෙම සන්ධිස්ථානය මඟින් ලෝක මට්ටමේ නිෂ්පාදන මට්ටම් කරා ළඟා වීමට අපගේ ඉඩම් සහ ගොවීන් සතු සහජ හැකියාව මැනවින් ඔප්පු වේ. දේශගුණික විපර්යාසයන් නිසා ඇති වන උච්චාවචනයන් මධ්‍යයේ වුවද, දිගුකාලීන ප්‍රවණතාවය ස්ථාවර මෙන්ම ඉහළ විභවයක් සහිතව පවතී.

අනාගතය දෙස බලන විට, මෙම උපායමාර්ගික සැලැස්මේ සහ මාර්ග සිතියමේ (SP&R) සාර්ථකත්වය රඳා පවතින්නේ අපගේ නිම් වළලු ප්‍රසාරණය කර ගැනීමට අප සතු හැකියාව මතය. අපගේ සාම්ප්‍රදායික වගා බිම් හෙක්ටයාර 450,000 කට වඩා වැඩි ප්‍රමාණයක් ස්ථාවර පදනමක් ලෙස පවත්වා ගෙන යන අතරම, මීට පෙර නව වගා බිම් ඇති කිරීමට අප ගත් උත්සාහයේ අවම මට්ටම් හඳුනා ගනිමින්, අලුතින් පිහිටුවන ලද "උතුරු පොල් ත්‍රිකෝණය" අපගේ මීළඟ මහා ආර්ථික සංවර්ධන කලාපය පිළිබඳ අදහස මනාව පෙන්නුම් කරයි.

මෙම හැකියාව යොදා ගැනීම සඳහා, අප ශක්තිමත් ව්‍යාප්ත කිරීමේ දාමයකට ප්‍රමුඛතාවය දිය යුතුය. අපගේ බීජ උයන් ශක්තිමත් කිරීම, පැල තවාන් පුළුල් කිරීම සහ මහා පරිමාණ පැල සිටුවීමේ ප්‍රයත්නයක් දියත් කිරීම මඟින් අපගේ සැපයුමේ අනාගතය සුරක්ෂිත කර ගත හැකිය. තවද, මෙම මුලපිරීම මඟින් වයස්ගත වූ සහ අඩු අස්වැන්නක් ලබා දෙන ගස් වෙනුවට නැවත වගා කිරීමටත්, පවතින පොල් වගා බිම් තුළ නව පැල සිටුවීමටත් මඟ පාදනු ඇත. අපගේ අපේක්ෂා සහගත

ඉලක්ක සපුරා ගැනීමට සහ ශ්‍රී ලංකාව පොල් කර්මාන්තයේ ගෝලීය දැවැන්තයෙකු ලෙස අඛණ්ඩව රැඳී සිටීම සහතික කිරීමට උපකාර වන තීරණාත්මක සාධකය වන්නේ මෙම ක්‍රියාකාරී ප්‍රවේශයයි.

*රූපය 8 - පොල් නිෂ්පාදනය සහ වගා කරන ලද බිම් ප්‍රමාණය*




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ (2023) දත්ත ඇසුරින් කතුවරුන්ගේ සම්පාදනයකි


## 3.4 අගය එකතු කිරීම සහ අපනයන

පොල් නිෂ්පාදන පිරිසැකසුම් (සැකසුම්)යනු පොල් අගය දාමයේ අත්‍යවශ්‍ය අදියරක් වන අතර, එමගින් සෘජුවම අගය එකතු කිරීමක් සිදු කරන අතරම මෙම අංශයේ අපනයන හැකියාව ඉහළ නංවයි. 2024 වර්ෂයේදී, මිලියන 2,792 ක සමස්ත පොල් නිෂ්පාදනයෙන්, පොල් ගෙඩි මිලියන 1,272 ක් (45.56%) අපනයන සැකසුම් කටයුතු සඳහා යොදා ගෙන ඇති අතර, එමගින් ඇමරිකානු ඩොලර් මිලියන 854.94 ක ආදායමක් උපයා ඇත (ශ්‍රී ලංකා පොල් නිෂ්පාදන ආශ්‍රිත සංඛ්‍යාලේඛන, CDA, 2024).

පොල් නිෂ්පාදන ආශ්‍රිත සැකසුම් ක්ෂේත්‍රයේ බලපෑම ඉතා පැහැදිලිය. එහිදී එක් පොල් ගෙඩියක් වෙනුවෙන් එකතු වූ අගය ඇමරිකානු ඩොලර් 0.67 ක් වූ අතර, එය අමු පොල් ගෙඩියක අපනයන මිලට වඩා 50.5% කින් ඉහළ අගයකි[9]. මේ තුළින් කාර්මිකකරණය හරහා ළඟා කර ගත හැකි අතිමහත් ආර්ථික වාසිය මැනවින් පෙන්නුම් කෙරේ. විශේෂයෙන්ම, සමස්ත ජාතික නිෂ්පාදනයම සැකසුම් කටයුතු සඳහා යොමු කළේ නම්, අපනයන උපයා ගැනීම් දළ වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 1,876.57 ක් දක්වා ළඟා වීමට ඉඩ තිබුණි. මෙමගින් අපගේ සැකසුම් ක්ෂේත්‍රය පුළුල් කිරීමට සහ තවදුරටත් ඉදිරියට යාමට ඇති හා මෙතෙක් ප්‍රයෝජනයට නොගත් සුවිශාල හැකියාව ඉස්මතු කර පෙන්වයි.

[9] පොල් සංවර්ධන අධිකාරියේ (CDA) දත්ත අනුව අමු පොල් ගෙඩියක අපනයන මිල ඇමරිකානු ඩොලර් 0.458 ක් ලෙස සටහන් වී ඇත.


*රූපය 9 - ශ්‍රී ලංකාවේ අපනයන සඳහා පොල් ආශ්‍රිත නිෂ්පාදනවල දායකත්වය*




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ (2023) දත්ත ඇසුරින් කතුවරුන්ගේ සම්පාදනයකි.

පොල් අපනයනය යනු ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ ප්‍රධාන ක්ෂේත්‍රයකි. රූපය 9 හි දැක්වෙන පරිදි, පොල් ආශ්‍රිත කෘෂිකාර්මික අපනයනවලින් ලැබෙන ආදායම සමස්ත කෘෂිකාර්මික අපනයනවලින් අඛණ්ඩව 12% කට වඩා වැඩි දායකත්වයක් ලබා දෙන අතර, එය 2018 වර්ෂයේදී 16% කට ආසන්න උපරිම මට්ටමකට ළඟා විය. සමස්ත භාණ්ඩ අපනයනය සඳහා මෙම අංශයේ දායකත්වය 2% ත් 4% ත් අතර ස්ථාවර මට්ටමක පැවතුනද, එහි සැබෑ වටිනාකම පවතින්නේ එහි ඇති ඉහළ ”දේශීය අගය එකතු කිරීම” තුළය. ආනයනික අමුද්‍රව්‍ය මත දැඩි ලෙස රඳා පවතින ඇඟලුම් වැනි කර්මාන්ත මෙන් නොව, පොල් අංශය එහි සියලුම අගයන් පාහේ ශ්‍රී ලංකාව තුළම නිර්මාණය කරයි. එමඟින් ජාතික ධනය සඳහා මෙම කර්මාන්තයෙන් ලැබෙන දායකත්වය වඩාත් සැලකිය යුතු සහ ප්‍රබල එකක් බවට පත් වේ.

*රූපය 10 - පොල් නිෂ්පාදනවල අපනයන කාර්ය සාධනය*




මූලාශ්‍රය: ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB)


ඓතිහාසිකව බලන කල, 1970 දශකයේ මැද භාගය වන තෙක්ම අපගේ ප්‍රධාන අපනයන භාණ්ඩය වූයේ පොල්තෙල් ය. කෙසේ වෙතත්, එතැන් පටන් කර්මාන්තය කැපී පෙනෙන පරිවර්තනයක් අත්කර ගෙන ඇති අතර, කොප්පරා වැනි සාම්ප්‍රදායික අමු නිෂ්පාදනවලින් බැහැරව ඉහළ අගයක් එකතු කළ නවීන නිෂ්පාදන කළඹක් කරා ගමන් කර ඇත[10].

රූපය 10 මගින් මෙම කාර්ය සාධනය මැනවින් ඉස්මතු කරයි. පොල් මද ආශ්‍රිත නිෂ්පාදන තවදුරටත් විශාලතම දායකත්වය සපයන අංශය ලෙස පවතින අතර, ඒවායේ වටිනාකම ක්‍රමයෙන් ඉහළ ගොස් 2023 වර්ෂයේදී ඇමරිකානු ඩොලර් මිලියන 370 ඉක්මවා ගියේය. ඒ අතරම, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදන ඊටත් වඩා වේගවත් වේගයකින් වර්ධනය වෙමින් පවතින අතර, ඉදිරි වසරවලදී මද ආශ්‍රිත නිෂ්පාදන අභිබවා යාමේ හැකියාවක් ද පෙන්වයි. කොහු ආශ්‍රිත නිමි භාණ්ඩවල ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරන අතර, පොල්කටු නිෂ්පාදන සහ අනෙකුත් සුළු පොල් නිෂ්පාදන වැනි කාණ්ඩ මගින් ඉහළ අගය එකතු කිරීමේ හැකියාවක් නිරූපණය වේ. විශේෂයෙන්ම, MCT තෙල්, කොහුබත් සහ සක්‍රිය කාබන් වැනි නිෂ්පාදන මගින් නවෝත්පාදනය සඳහා අප සතු ශක්තිමත් ධාරිතාව විදහා දක්වයි.

10 Pathiraja, P. M. E. K., Griffith, G. R., Farquharson, R. J., & Faggian, R. (2015). ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය: වෙනස් වන දේශගුණයක් හමුවේ වත්මන් තත්ත්වය සහ අනාගත ප්‍රවණතා.

පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රය 2024 වර්ෂයේදී ඇමරිකානු ඩොලර් මිලියන 460 ක පමණ අපනයන ආදායමක් උපයා ඇත. අපනයනය කරන ලද මද ආශ්‍රිත නිෂ්පාදන අතරින් විශාලතම දායකත්වයන් සපයන නිෂ්පාදන තුන වන්නේ පොල් කිරි (ඇමරිකානු ඩොලර් මිලියන 111.22), දිසිදි පොල් (ඇමරිකානු ඩොලර් මිලියන 99.48) සහ සුපිරිසිදු (වර්ජින් – නැඹුල්), පොල්තෙල් (ඇමරිකානු ඩොලර් මිලියන 64.75) ය. මෙම අංශයේ අනෙකුත් කැපී පෙනෙන නිෂ්පාදන අතරට පිටිකළ පොල් කිරි, පොල් වතුර, සාමාන්‍ය පොල්තෙල් සහ තැඹිලි ආශ්‍රිත නිෂ්පාදන ඇතුළත් වන අතර, ඒවා දේශීය මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළවල් ද්විත්වයම ආක්‍රමණය කර ඇත (රූපය 11).


*රූපය 11 - සාමාන්‍ය අපනයන වටිනාකම අනුව ප්‍රධානතම පොල් මද ආශ්‍රිත අපනයන නිෂ්පාදන දහයේ ව්‍යාප්තිය (2020-2025) - ඇමරිකානු ඩොලර් '000*




මූලාශ්‍රයః පොල් සංවර්ධන අධිකාරියේ සංඛ්‍යාලේඛන (2024) ඇසුරින් කතුවරුන්ගේ සම්පාදනයකි.

පොල් මද නොවන කර්මාන්තයට කොහු නිෂ්පාදන, පොල්කටු නිෂ්පාදන සහ පොල් ලෙලි, පොල් ලී / හස්ත කර්මාන්ත සහ පොල් අතු/කොළ ආශ්‍රිත නිෂ්පාදන වැනි පොල් ගසෙන් ලබාගන්නා අනෙකුත් භාණ්ඩ ඇතුළත් වේ. සමස්තයක් ලෙස ගත් කල, මේවා අපනයන ආදායමෙන් ඇමරිකානු ඩොලර් මිලියන 395.31 ක පමණ ප්‍රමාණයකට හිමිකම් කියයි. මෙම අංශය කොහුබත් සහ හු-රෙදිපිළි සිට සක්‍රිය කාබන් වැනි විශේෂිත පොල්කටු ආශ්‍රිත නිෂ්පාදන දක්වා විහිදෙමින් අතිශයින්ම විවිධාංගීකරණය වී ඇත. මෙම දත්ත මගින් අපගේ කර්මාන්ත ක්ෂේත්‍රය ස්ථාවරව පවතිනවා පමණක් නොව, විවිධාංගීකරණය වූ, ඉහළ තාක්ෂණයෙන් යුත් ගෝලීය තරගකරුවෙකු බවට ක්‍රියාකාරීව පරිවර්තනය වෙමින් පවතින බව ද තහවුරු කරයි (රූපය 12).

*රූපය 12 - සාමාන්‍ය අපනයන වටිනාකම අනුව ප්‍රධානතම පොල් මද නොවන අපනයන නිෂ්පාදන දහයේ ව්‍යාප්තිය (2020-2025) - ඇමරිකානු ඩොලර් '000'000*





මූලාශ්‍රයː පොල් සංවර්ධන අධිකාරියේ සංඛ්‍යාලේඛන (2024) ඇසුරින් කතුවරුන්ගේ සම්පාදනයකි.

## 3.5 ගෝලීය තත්ත්වය

ශ්‍රී ලංකාව ගෝලීය පොල් අගය දාමයන් තුළ ආඩම්බර විය හැකි කීර්තිමත් ස්ථානයක් පවත්වා ගෙන යන අතර, පිලිපීනය, ඉන්දුනීසියාව සහ ඉන්දියාවට පසුව අඛණ්ඩව ලොව සිව්වන විශාලතම පොල් නිෂ්පාදකයා ලෙස ශ්‍රේණිගත වී ඇත (රූපය 13). මෙම ඉහළ ශ්‍රේණිගත කිරීම අපගේ වගා බිම් වෙන් කිරීම තුළ ද පිළිබිඹු වන අතර, එහිදී ද වගා බිම් ප්‍රමාණය අතින් ශ්‍රී ලංකාව ලොව සිව්වන ස්ථානය හිමිකරගෙන සිටියි. ගෝලීය නිෂ්පාදනයෙන් 83.7% ක් නියෝජනය කරන අන්තර් රාජ්‍ය සංවිධානයක් වන ජාත්‍යන්තර පොල් ප්‍රජාවේ (International Coconut Community - ICC) ප්‍රධාන සාමාජිකයෙකු ලෙස, ලෝක පොල් කර්මාන්තයේ අනාගතය හැඩගස්වන සාමූහික බලවේගයේ අත්‍යවශ්‍ය කොටස්කරුවෙකු වීමට ශ්‍රී ලංකාවට හැකි වී තිබේ.

*රූපය 13 - සාමාන්‍ය ගෝලීය පොල් නිෂ්පාදනය (2019-2023)*




මූලාශ්‍රයː පොල් සංවර්ධන අධිකාරියේ **(CDA)** සංඛ්‍යාලේඛන (2024) ඇසුරින් කතුවරුන්ගේ සම්පාදනයකි.

අපගේ ගෝලීය වෙළෙඳ ව්‍යාප්තිය සැබවින්ම අතිවිශාලය. "සිලෝන් කොකනට්" (ලංකා පොල්) සන්නාමය සහ එහි නිෂ්පාදන, ඇමරිකා එක්සත් ජනපදය, ජර්මනිය, නෙදර්ලන්තය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, ජපානය, ඉන්දියාව සහ චීනය ඇතුළු තවත් බොහෝ ජාත්‍යන්තර වෙළඳ හවුල්කරුවන්ගේ පුළුල් ජාලයක් වෙත ගලා යයි. උතුරු ඇමරිකාව, යුරෝපය, මැදපෙරදිග සහ ආසියාව පුරා විහිදුණු මෙම පුළුල් පැවැත්ම මගින් ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදන සඳහා ඇති විශ්වීය ආකර්ෂණය සහ ඒවායේ ඉහළ ගුණාත්මකභාවය මැනවින් පැහැදිලි වේ.

අපගේ අපනයන සාර්ථකත්වය රඳා පවතින්නේ ඉහළ කාර්ය සාධනයක් සහිත වෙළඳපොළවල් කිහිපයක් මතය. ඇමරිකා එක්සත් ජනපදය අඛණ්ඩව අපගේ ප්‍රමුඛතම ගැනුම්කරු ලෙස ක්‍රියා කරන අතර, විශේෂයෙන්ම අපගේ උසස් තත්ත්වයේ පොල්තෙල් සඳහා එහි ශක්තිමත් සහ ස්ථාවර ඉල්ලුමක් පවතී. යුරෝපයේ නෙදර්ලන්තය, ජර්මනිය, එක්සත් රාජධානිය සහ ප්‍රංශය ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථාන ලෙස ක්‍රියා කරන අතර, එමගින් තිරසාරභාවය සහ උසස් තත්ත්වයට ප්‍රමුඛතාවය දෙන ගෝලීය සැපයුම් දාමයන් සමඟ අප සාර්ථකව ඒකාබද්ධ වී ඇති ආකාරය පිළිබිඹු වේ.

ආසියාව පුරා, පකිස්ථානය, චීනය, ජපානය සහ දකුණු කොරියාව වැනි වෙළඳපොළවල් සැලකිය යුතු වාසි සහගත අවස්ථාවන් නිරූපණය කරයි. කලාපීය ගතිකත්වයන් හේතුවෙන් මෙම කලාපවල ආනයන මට්ටම්වල උච්චාවචනයන් පෙන්නුම් කළද, ඒවා අපගේ විවිධාංගීකරණය වූ අපනයන පරාසයේ අත්‍යවශ්‍ය වෙළෙඳපොළවල් ලෙස පවතී. මෙම පුළුල් වෙළඳපොළ ප්‍රවේශය, ගෝලීය වෙනස්වීම්වලට ඔරොත්තු දීමට සහ නැඟී එන පාරිභෝගික ප්‍රවණතාවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට අපට ශක්තිමත් පදනමක් සපයයි.

## *තරඟකාරී විශිෂ්ටත්වය කරා යන ගමන් මාර්ගය*

ප්‍රධාන නිෂ්පාදන කාණ්ඩ යටතේ සමස්ත අපනයන පරිමාව අතින් පිලිපීනය, ඉන්දුනීසියාව සහ ඉන්දියාව වැනි ගිනිකොනදිග ආසියානු දැවැන්තයින් පෙරමුණ ගෙන සිටියද, ශ්‍රී ලංකාව විශේෂිත වූ සුවිශේෂී වෙළඳපොළවල් තුළ ඉහළ කීර්තියක් අත්කර ගැනීමට සමත්ව ඇත. දිසිදි පොල්, කොහු නිෂ්පාදන, පොල්කටු අඟුරු සහ සක්‍රිය කාබන් නිෂ්පාදනයෙන් අපි ගෝලීය වශයෙන් පෙරමුණ ගෙන සිටින්නෙමු.

මෙම ගෝලීය සැසඳීම මගින් ඉතා පැහැදිලි සහ උද්යෝගිමත් උපායමාර්ගික අවස්ථාවක් ඉස්මතු කරයි (වගුව 3). අපගේ කලාපීය තරගකරුවන් විශාල නිෂ්පාදන පරිමාවන් මත විශ්වාසය තබන අතර, ශ්‍රී ලංකාවේ ශක්තිය පවතින්නේ විශේෂීකරණය සහ ගුණාත්මකභාවය මතය. අපගේ ස්ථාවරය තවදුරටත් ඉහළ නැංවීමට සහ සමස්ත නිෂ්පාදන පරිමාවේ පරතරය අවම කිරීම සඳහා, අපගේ සැකසුම් ධාරිතාව පුළුල් කිරීමට සහ අපගේ නිෂ්පාදන පරාසය විවිධාංගීකරණය කිරීමට අපි කැපවී සිටිමු. නැඟී එන වෙළෙඳපොළවල් වෙත ප්‍රවේශ වීමෙන් සහ සෑම පොල් ගෙඩියකටම ඊටත් වඩා ඉහළ අගයක් එකතු කිරීමෙන්, අපගේ විශේෂිත වෙළඳපොළ ආධිපත්‍යය පවත්වා ගැනීමට පමණක් නොව, වඩාත් පුළුල් පරාසයකින් අපගේ කලාපීය තරගකරුවන්ට අභියෝග කිරීමට ද අපට හැකි වනු ඇත.


*වගුව 3 - නිෂ්පාදන වර්ගය අනුව ප්‍රමුඛතම පොල් නිෂ්පාදන අපනයනය කරන්නන් (2023)*

| **නිෂ්පාදනය** | **ප්‍රමුඛතම රටවල් පහ** | | | | | |
|---|---|---|---|---|---|---|
| **කොප්පරා** | රට | ඉන්දුනීසියාව | ඉන්දියාව | පැපුවා නිව්ගිනියාව | වනුආටු | සොලමන් දූපත් |
| | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | 45669 | 20662 | 15919 | 6520 | 6375 |
| **පොල්තෙල්** | රට | පිලිපීනය | ඉන්දුනීසියාව | මැලේසියාව | පැපුවා නිව්ගිනියාව | ඉන්දියාව |
| | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | 1090418 | 722517 | 165980 | 31704 | 16201 |
| **පොල් පුන්නක්කු** | රට | ඉන්දුනීසියාව | පිලිපීනය | ශ්‍රී ලංකාව | පැපුවා නිව්ගිනියාව | වියට්නාමය |
| | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | 290147 | 284289 | 25824 | 18262 | 3252 |
| **දිසිදි පොල්** | රට | පිලිපීනය | ඉන්දුනීසියාව | ශ්‍රී ලංකාව | වියට්නාමය | මැලේසියාව |
| | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | 156273 | 113671 | 37988 | 14710 | 10907 |
| **කොහු සහ කොහු නිෂ්පාදන** | රට | ඉන්දියාව | ශ්‍රී ලංකාව | ඉන්දුනීසියාව | මැලේසියාව | තායිලන්තය |
| | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | 1285717 | 115443 | 26183 | 11642 | 545 |
| **පොල් කටු අඟුරු** | රට | ඉන්දුනීසියාව | පිලිපීනය | වියට්නාමය | ඉන්දියාව | ශ්‍රී ලංකාව |
| | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | 191270 | 118034 | 99201 | 55052 | 9975 |
| **සක්‍රීය කාබන්** | රට | ඉන්දියාව | පිලිපීනය | ශ්‍රී ලංකාව | ඉන්දුනීසියාව | මැලේසියාව |
| | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | 141861 | 60188 | 51539 | 18793 | 18611 |
| **පොල් වතුර** | රට | තායිලන්තය | පිලිපීනය | බ්‍රසීලය | ශ්‍රී ලංකාව | ඉන්දුනීසියාව |
| | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | 347464 | 75645 | 59630 | 29220 | 16826 |

මූලාශ්‍රයː WITS දත්ත ගබඩාව පදනම් කරගෙන කතුවරුන් විසින් කරන ලද ඇස්තමේන්තු[11]

[11] https://wits.worldbank.org/

# 4 වෙනස්වීමේ න්‍යාය: ඇමරිකානු ඩොලර් බිලියන 2ක ක්ෂේත්‍රයක් සඳහා වන සැලැස්ම




නිෂ්පාදනය සහ ඵලදායිතාවය සීඝ්‍රයෙන් ඉහළ නැංවීම සඳහා අපගේ උපායමාර්ගික සැලැස්මේ සහ මාර්ග සිතියමේ ප්‍රධාන කොඳු නාරටිය වන්නේ ශක්තිමත් 'වෙනස්වීමේ න්‍යායකි.' මෙම රාමුව මඟින්, 2035 වන විට ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය ඇමරිකානු ඩොලර් බිලියන 2ක අපනයන ක්ෂේත්‍රයක් බවට පරිවර්තනය කිරීම සඳහා වන පැහැදිලි, සාක්ෂි මත පදනම් වූ මාවතක් පොල් ක්ෂේත්‍රයේ උපායමාර්ගික මාර්ග සිතියමට සපයයි. නිවැරදි හේතු-ඵල සබඳතා සහිත මාර්ග සිතියමක් මඟින්, ඉහළ ඵලදායිතාවයක් අත්කර ගන්නා අතරම ගොවීන්ගේ ලාභදායිත්වය උපරිම කරන සහ රටේ වාර්ෂික පොල් නිෂ්පාදනය දැනට පවතින ගෙඩි බිලියන 3 සිට බිලියන 4.5ක ඉලක්කයක් දක්වා ඉහළ නංවන්නේ කෙසේද යන්න මෙම ආකෘතිය මඟින් පැහැදිලි කර දෙයි. මෙම රාමුව ගොඩනැඟී ඇත්තේ නිෂ්පාදනය, පරිභෝජනය, අපනයනය යන ගතිකත්වය සහ පොල් අගය දාමයේ පවතින සැබෑ තත්ත්වයන් පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් මතය.

වෙනස් වීමේ න්‍යාය ක්‍රියාත්මක වන්නේ අපගේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගන්නා අපගේ පොරොන්දු වූ අනාගතය දෘශ්‍යමාන කිරීම සහ එය කරා ළඟා වීමට අවශ්‍ය නිශ්චිත ක්‍රියාමාර්ග, පියවර සහ කොන්දේසි හඳුනා ගැනීමට වැඩ කිරීමෙනි. අපගේ ප්‍රධාන සමස්ත අරමුණ මැනිය හැකි කුඩා පූර්වගාමී සාධක සහ පූර්ව කොන්දේසිවලට වෙන් කිරීම මඟින් අප විසින් උපායමාර්ගික සන්ධිස්ථාන මාලාවක් නිර්මාණය කර ඇත. මෙහි සෑම පියවරක්ම සැලසුම් සහගත ක්‍රියාවක් වන අතර, එය සම්පූර්ණ වූ විට 2035 දැක්ම කරා යන නිශ්චිත මාවතේම අප රැඳී සිටින බව සහතික කරයි.

## *කාර්යසාධන පරතරය පියවීම*

දැනට නිෂ්පාදනය කෙරෙන පොල් ගෙඩි බිලියන 3න් බිලියන 1.5ක් පමණ දේශීයව පරිභෝජනය කෙරේ. ඉතිරි ගෙඩි බිලියන 1.5 විවිධ ආකාරවලින් අපනයනය කෙරෙන අතර, එමඟින් වාර්ෂිකව ඇස්තමේන්තුගත ඇමරිකානු ඩොලර් බිලියන 1ක අපනයන ආදායමක් උපයා දෙයි. අපගේ අපේක්ෂා සහගත ඩොලර් බිලියන 2ක ඉලක්කය සපුරා ගැනීම සඳහා, අප එකවරම නිෂ්පාදනයේ කැපී පෙනෙන වර්ධනයක් ඇති කළ යුතු අතරම, දියුණු සැකසුම් ක්‍රමවේද සහ තත්ත්ව උත්ශ්‍රේණි කිරීම් මඟින් අපනයනවලින් ලැබෙන වටිනාකම උපරිම කරගත යුතුය. අපගේ මෙම වෙනස්වීමේ න්‍යාය විශේෂයෙන්ම සැලසුම් කර ඇත්තේ අපගේ වත්මන් කාර්යසාධනය සහ අනාගත විභවය අතර පවතින මෙම පරතරය පියවීම සඳහාය.

එබැවින්, අපගේ වෙනස්වීමේ න්‍යාය ක්‍රියාකරන්නේ වාර්ෂිකව ගෙඩි බිලියන 4.5ක නිෂ්පාදනයක් සහ ඩොලර් බිලියන 2ක ආදායමක් ලබා ගැනීමේ ඉලක්කය කේන්ද්‍ර කරගත් අපගේ ගණිතමය සහ මූල්‍ය ආකෘති සඳහා තාර්කික පදනම ලෙසය. මෙම දැක්ම යථාර්ථයක් බවට පත් කිරීම සඳහා, සාර්ථකත්වය ළඟා කර ගැනීමට අවශ්‍ය කොන්දේසි සහ පියවර මෙම ආකෘතිය මඟින් නිවැරදිව ගණනය කර පෙන්වයි:

- **පැළ සිටුවීම සහ හිස් ඉඩම්වල වගා කිරීම** : තවත් 36ක් සඳහා වන උපායමාර්ගික අවශ්‍යතා සහ මහා පරිමාණ පැළ නිෂ්පාදනය විශ්ලේෂණය කිරීම.
- **ඵලදායි ගස් සංචිතය** : ජාතික ඉලක්ක සපුරාලීම සඳහා අවශ්‍ය වන ඵලදරන පොල් ගස්වල නිවැරදි සංඛ්‍යාව ඇස්තමේන්තු කිරීම.
- **වගා කටයුතු වැඩිදියුණු කිරීම**: පසෙහි සාරවත් බව නැවත ඇති කිරීම සඳහා ජල කළමනාකරණය, තෙතමනය සංරක්ෂණය, පලිබෝධ කළමනාකරණය, පර්යේෂණ හා සංවර්ධන කටයුතු සහ පාංශු සාරවත්භාවය පිළිබඳ යහ පරිචයන් හඳුනා ගැනීම.
- **අස්වැන්න ප්‍රශස්තකරණය**: ගොවිපළ මට්ටමින් ගසකින් ලැබෙන ගෙඩි ප්‍රමාණය සහ ඒ සඳහා අවශ්‍ය නිශ්චිත ඵලදායිතා වැඩිදියුණු කිරීම් ආකෘතිගත කිරීම.
- **සම්පත් සිතියම්ගත කිරීම**: බාධාවකින් තොරව මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා භූමි පරිහරණ අවශ්‍යතා සහ වාර්ෂික යෙදවුම් සැපයුම් දාමය නිශ්චය කිරීම.
- **ආයෝජන පුළුල් කිරීම**: මෙම ජාතික වර්ධනය වේගවත් කිරීම සහ එයට අනුග්‍රහය දැක්වීම සඳහා අවශ්‍ය වන මුළු මූල්‍ය යෙදවුම් ප්‍රමාණය ගණනය කිරීම.
- **මිනිසා කේන්ද්‍ර කරගත් ක්‍රියාමාර්ග**: ගොවීන් සහ ප්‍රජාවන් බල ගැන්වීම සඳහා නව්‍ය විසඳුම් සහ වඩා හොඳ සේවා කොන්දේසි හඳුන්වා දෙන අතරම, අත්‍යවශ්‍ය පුහුණුවීම්, කුසලතා සංවර්ධනය සහ චර්යාත්මක වෙනස්කම් ඇති කිරීමේ ප්‍රචාරණ වැඩසටහන් දියත් කිරීම.

සමස්තයක් වශයෙන් ගත් කල, මෙම ගණිතමය සහ මූල්‍ය ආකෘතිය තුළ ඇති අපගේ වෙනස්වීමේ සිද්ධාන්තයේ තාර්කික මාවත එකිනෙකට සම්බන්ධ විචල්‍යයන් 53ක් විසින් අනුගමනය කරයි. මුල් පැළ සැපයුමේ සිට ශක්තිමත් ඵලදරන පොල් ගස් සංචිතයක් දක්වාත්, අවසාන අපනයනය දක්වාත් වන පියවර, කොන්දේසි සහ වර්ධන ගමන් පථය පැහැදිලිව ආකෘතිගත කිරීම මඟින්, ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ ආයෝජකයින්ට මෙහි ඇති සැබෑ අවස්ථාවන්හි විශාලත්වය දැකගත හැකිය. අපගේ ජාතික නිෂ්පාදනයට තවත් පොල් ගෙඩි බිලියන 1.5ක් එකතු කිරීම සඳහා අවශ්‍ය වන මැදිහත්වීම් වෙනුවෙන්, පැහැදිලි, ප්‍රමාණාත්මකව ගණනය කළ මාර්ග සිතියමක් මෙමඟින් සපයන අතර, මුළු කර්මාන්තයටම සමෘද්ධිමත් සහ තිරසාර අනාගතයක් සහතික කරයි.

## *ගෙඩි බිලියන 4.5ක් සහ ඇමරිකානු ඩොලර් බිලියන 2ක් කරා යන මාර්ග සිතියම: උපායමාර්ගික මාවත් සහ මූල්‍ය ශක්‍යතාව*

අපගේ වත්මන් මූලික තත්ත්වයන්ට අනුව, හෙක්ටයාර 485,000ක පමණ භූමි ප්‍රමාණයක පැතිරී ඇති ශ්‍රී ලංකාවේ ඵලදරන පොල් ගස් මිලියන 65.9ක සංචිතයෙන් සාමාන්‍යයෙන් එක් ගසකින් වසරකට ලැබෙන්නේ ගෙඩි 45කි. මෙම මට්ටමේදී, සාමාන්‍ය ගොවියෙකුට හෙක්ටයාරයකින් ලැබෙන ශුද්ධ ලාභය රුපියල් 19,000ක් පමණ වේ. අපගේ උපායමාර්ගික සැලැස්ම සකස් කර ඇත්තේ මෙම මූලික සාධක සම්පූර්ණයෙන්ම වෙනස් කිරීමටයි. නව වගා බිම් ඉලක්කගත ලෙස ව්‍යාප්ත කිරීම, වැඩිදියුණු කළ තාක්ෂණයන් අනුගමනය කිරීම සහ සේවා සැපයීම ඉහළ නැංවීම මඟින් 2035 වන විට වාර්ෂිකව එක් ගසකින් ගෙඩි 65කට ආසන්න අස්වැන්නක් ලබා දෙන, ඵලදරන පොල් ගස් මිලියන 70ක් දක්වා සංක්‍රමණය වීමට අපේ අපේක්ෂාවයි. මෙම වර්ධනය මඟින් සමස්ත ජාතික නිෂ්පාදනය ගෙඩි බිලියන 4.55ක් දක්වා ඉහළ නංවන අතර, අපනයන ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 2 සීමාවෙන් ඔබ්බට රැගෙන යනු ඇත.

ඒ අනුව, අපගේ වෙනස්වීමේ න්‍යාය විසින් සාර්ථකත්වය ළඟා කර ගැනීම සඳහා එකිනෙක ශක්තිමත් කරන සමාන්තර මාවත් තුනක් ඉදිරිපත් කරයි:

1. **සම්පත් පදනම පුළුල් කිරීම:** නැවත වගා කිරීමේ සහ හිස් ඉඩම්වල වගා කිරීමේ වැඩසටහන් හරහා ඵලදරන පොල් ගස් සංඛ්‍යාව වැඩි කිරීම.
2. **ඵලදායිතාව ඉහළ නැංවීම:** උසස් කෘෂිකාර්මික භාවිතයන් මඟින් එක් ගසකින් සහ හෙක්ටයාරයකින් ලැබෙන අස්වැන්න ඉහළ නැංවීම.
3. **ගොවීන්ට ලැබෙන ප්‍රතිලාභ වැඩිකිරීම:** අපගේ ගොවි ප්‍රජාව වෙනුවෙන් හෙක්ටයාරයකින් ලැබෙන ශුද්ධ ලාභය සෘජුවම වැඩි කිරීම.

මෙම මාවත් සියල්ලම අපගේ මූල්‍ය ප්‍රක්ෂේපණයන් තුළ එකිනෙකට සම්බන්ධ වූ ප්‍රතිඵල ලෙස ඉතා සූක්ෂ්ම ලෙස ආකෘතිගත කර ඇත.

## *වර්ධනයේ එන්ජිම: වගාව සහ ඵලදායිතාව*

අපගේ රෝපණ ද්‍රව්‍ය සැපයුම ඉහළ නැංවීම මෙම පරිවර්තනයේ ප්‍රධානතම හරයයි. සහතික කළ බීජ උයන් සහ තවාන් ජාලය පුළුල් කිරීම මඟින් වාර්ෂික පැළ නිෂ්පාදනය ඉහළ නැංවීම අපගේ අරමුණයි. මෙයට අනුග්‍රහයක් ලෙස, පැළ නිෂ්පාදනය 2024 වසරේ පැවති මිලියන 2.56 සිට 2035 වන විට මිලියන 6.4ක් දක්වා කැපී පෙනෙන ලෙස වර්ධනය කෙරේ. මෙම ශක්තිමත් සැපයුම් දාමය මඟින් වාර්ෂිකව වයස්ගත වූ පොල් ගස් මිලියන 1.1ක් පමණ ඉවත් කර නව පැළ සිටුවීමටත්, වගා ඝනත්වය අඩු ඉඩම් හෙක්ටයාර 13,000ක ප්‍රමාණයක සෑම වසරකම හිස්තැන් පිරවීමටත් අපට හැකියාව ලැබේ. ළපටි පොල් පැළ පරිණතභාවයට පත්වීමේදී ස්වභාවික ජීව විද්‍යාත්මක ප්‍රමාදයක් පැවතියද, මෙම ආයෝජන මඟින් ජාතික මට්ටමෙන් ඉහළ අස්වැන්නක් ලබා දෙන ගස් ගහනය ස්ථාවර ලෙස ඉහළ යාම සහතික කෙරේ.

වගා බිම් ව්‍යාප්ත කිරීමට සමගාමීව, ඵලදායිතාව වැඩිදියුණු කිරීම ද සමස්ත නිෂ්පාදනය ඉහළ නැංවීමේ දැවැන්ත මෙවලමක් ලෙස ක්‍රියා කරයි. අපගේ ආකෘතියට ඉහළ බලපෑමක් සහිත මැදිහත්වීම් මාලාවක් ඇතුළත් කර ඇත, ඒවා නම්:ථ

- **පසෙහි නිරෝගී බව සහ පෝෂණය:** වාර්ෂිකව රසායනික පොහොර මෙට්‍රික් ටොන් 240,000ක්, කාබනික ද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 800,000ක් සහ ජීව අඟුරු  මෙට්‍රික් ටොන් 175,000ක් ඉලක්කගත ලෙස යෙදීම.
- **ජල කළමනාකරණය:** සෑම වසරකම අතිරේක හෙක්ටයාර 20,000ක් දක්වා නවීන ජල සම්පාදන පද්ධති ව්‍යාප්ත කිරීම සහ තෙතමනය සංරක්ෂණය කරන ලද භූමි ප්‍රමාණය හෙක්ටයාර 121,000 සිට 400,000 දක්වා ඉහළ නැංවීම.
- **අවදානම් අවම කිරීම:** කාලීන නිරීක්ෂණ සහ උපදේශන සේවා මඟින් පලිබෝධ හානි සහිත භූමි ප්‍රමාණය 2030 වන විට හෙක්ටයාර 40,000 සිට 20,000 දක්වා අඩු කිරීම.
- **පරාගණ සේවා:** ගෙඩි හටගැනීම සහ ඒවා රඳවා තබා ගැනීම ඉහළ නැංවීම සඳහා අවම වශයෙන් හෙක්ටයාර 40,000ක භූමි ප්‍රමාණයක සැලසුම්සහගත මී මැසි පාලනය ක්‍රියාත්මක කිරීම.

## *ආර්ථික පදනම සහ මූල්‍ය ශක්‍යතාව*

මෙම කෘෂිකාර්මික කැපවීම් යථාර්ථයක් බවට පත් කිරීම සඳහා, මූල්‍ය ආකෘතිය මඟින් සවිස්තරාත්මක ආයෝජන පැතිකඩක් පෙන්වා දෙයි. නැවත වගා කිරීම, ජල සම්පාදනය, පාංශු

නිරෝගීව තබා ගැනීම සහ පලිබෝධ පාලනය සඳහා වන සමස්ත ආයෝජනය 2035 වන විට ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 1.28ක් දක්වා ළඟා වනු ඇත.

මූලික වසරවලදී (2024-2026) ඉහළ පූර්ව පිරිවැය සහ ගස්වල ජීව විද්‍යාත්මක වර්ධන චක්‍රය හේතුවෙන් සෘණාත්මක ශුද්ධ මුදල් ප්‍රවාහයක් පෙන්නුම් කළද මෙයින් ලැබෙන දිගුකාලීන ප්‍රතිලාභ සුවිශේෂී වේ. 2020 දශකයේ අගභාගය වන විට, අස්වැන්න ඉහළ යාම සහ පරිණත වන ගස් ගහනය හේතුවෙන් වාර්ෂිකව ඩොලර් මිලියන සිය ගණනක් දක්වා වන සැලකිය යුතු ධනාත්මක ප්‍රතිලාභ ලැබෙනු ඇත. ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 1.2ක ශුද්ධ වත්මන් අගයක් සහ 61%ක කැපී පෙනෙන අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතයක් සහිතව, මෙම ආකෘතිය වසර 10ක කාලසීමාව තුළ ප්‍රබල මූල්‍ය ශක්‍යතාවක් පෙන්නුම් කරයි.

අපගේ මූල්‍ය ආකෘතිය මෙම හේතු-ඵල සබඳතාවලට අනුකූලව සකස් කිරීම මඟින්, ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය ගෝලීය වශයෙන් තරඟකාරී, ඇමරිකානු ඩොලර් බිලියන 2ක ප්‍රමුඛතම ක්ෂේත්‍රයක් ලෙස නැවත ස්ථානගත කිරීම සඳහා විශ්වසනීය සහ බලගතු ආර්ථික පදනමක් අපට සැපයිය හැක.

## *මානව සහ ආයතනික පරිවර්තනය: සමාජ සාධාරණත්වය සහ කුඩා පරිමාණ ගොවියාගේ අනාගතය*

අපගේ වගා බිම් ප්‍රමාණයෙන් 83.7%ක්ම (ශ්‍රී ලංකා පොල් නිෂ්පාදන ආශ්‍රිත සංඛ්‍යාලේඛන, පොල් සංවර්ධන අධිකාරිය, 2024) පාලනය කරනු ලබන්නේ කුඩා පරිමාණ ගොවීන් විසින් බව හඳුනා ගනිමින්, මෙම උපායමාර්ගය මූලික වශයෙන්ම මහජනයා කේන්ද්‍ර කරගනිමින් සකස් කර ඇත. මෙම සන්දර්භය තුළ තිරසාරභාවය යනු, තාක්ෂණික වශයෙන් දියුණු පද්ධතියක් කරා යන ගමනේදී කුඩා පරිමාණ ගොවියා මඟහැරීමකට හෝ මුළුකොන් වීමට ලක් නොවන බව සහතික කිරීමයි. අපගේ "මහජනයා කේන්ද්‍ර කරගත් ක්‍රියාමාර්ග" යන ප්‍රධාන කුළුණ හරහා අප පහත සඳහන් ක්ෂේත්‍රයන්හි ආයෝජනය කරනු ලබයි:

- **ධාරිතාව වර්ධනය කිරීම:** ගොවීන්ට කෘෂි-ව්‍යවසායකයින් බවට පත්වීම සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම. මීට අමතරව, ව්‍යාප්ති සේවා විෂය මාලාවට "ගොවීන් සඳහා වන මූල්‍ය කළමනාකරණ පුහුණුව" ඇතුළත් කිරීම.
- **ආරක්ෂිත සහ ගෞරවනීය රැකියා:** ක්ෂේත්‍රය වෙත මීළඟ තරුණ පරපුර ආකර්ෂණය කර ගැනීම සඳහා සේවා කොන්දේසි වැඩිදියුණු කිරීම.
- **සාධාරණ අගය බෙදී යාම:** ගොවියාගේ ශුද්ධ ලාභය ඇමරිකානු ඩොලර් මට්ටම්වලින් මනිනු ලබන ඉලක්කයන් දක්වා ඉහළ නැංවීම. එමඟින් ඉහළ වටිනාකමකින් යුත් අපනයනවලින් ජනනය වන ආර්ථික ප්‍රතිලාභය සෘජුවම ග්‍රාමීය පෙදෙස් වෙත ගලා යාම සහතික කෙරේ.

අපගේ 'වෙනස්වීමේ න්‍යාය' භෞතික සහ කෘෂිකාර්මික ආයෝජන පමණක් ප්‍රමාණවත් නොවන බව පිළිගන්නා අතර, ඒවා සැබැවින්ම මානව ප්‍රගතිය සමඟ බද්ධ විය යුතුය. නවීකරණය කරන ලද වාර්තා පවත්වා ගෙන යාම, වඩාත් ශක්තිමත් ව්‍යාප්ති සේවා සහ ගොවීන් ප්‍රමුඛ වන නවෝත්පාදන ඇතුළුව, අත්‍යවශ්‍ය චර්යාත්මක සහ ආයතනික වෙනස්කම් සඳහා වන පිරිවැය ද මෙම ආකෘතියට පැහැදිලිවම ඇතුළත් කර ඇත. මෙමඟින් සාම්ප්‍රදායික ගොවිතැනේ සිට තාක්ෂණික වශයෙන් දියුණු, වාණිජමය මුහුණුවරක් ගත් නිෂ්පාදන පද්ධතියක් කරා සංක්‍රමණය වීමේදී පවතින සැබෑ ලෝකයේ අවශ්‍යතා අපගේ ප්‍රක්ෂේපණයන් තුළින් පිළිබිඹු වන බව සහතික කරනු ලබයි.

මෙම පරිවර්තනය ග්‍රාමීය ආර්ථිකයට සිදු කරන බලපෑම අතිමහත්ය. නව තාක්ෂණයන්, විශේෂිත මූල්‍ය සහ රක්ෂණ ක්‍රමවේදයන් සමඟින් අතුරු බෝග වගාව සහ සත්ව පාලනය වැනි විවිධාංගීකරණය වූ ගොවිපළ ආකෘති හඳුන්වා දීමෙන් අප ගොවියාගේ අනාගතය සුරක්ෂිත කරමින් සිටින බව සඳහන් කිරීම වටී. සියලුම අතිරේක පිරිවැය සහ ආයෝජන අඩු කිරීමෙන් පසුවද, ප්‍රශස්ත තත්ත්වයන් යටතේ ගොවීන්ගේ ශුද්ධ ලාභයේ 47.6%ක වර්ධනයක් අත්කර ගත හැකි බව අපගේ ආකෘතිය මඟින් ප්‍රක්ෂේපණය කරයි. මෙය හුදෙක් ඵලදායිතාවයේ වර්ධනයක් පමණක් නොවේ. එය

ලංකා පොල් කර්මාන්තයේ කොඳු නාරටිය වන ජනතාවගේ ජීවන තත්ත්වය මූලික වශයෙන්ම ඉහළ නැංවීමකි.

## දේශගුණයට ඔරොත්තු දෙන නම්‍යශීලීභාවය සහ අවදානම් අවම කිරීම

අවසානයේදී, අප තිරසාරභාවය සඳහා ඉහළම වැදගත්කමක් ලබා දෙන අතර, එය පොල් ක්ෂේත්‍රයේ උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියමට බාහිරින් මුසු කරන ලද අතිරේක කොටසක් නොවේ. එය කර්මාන්තයේ පැවැත්ම සහ ගෝලීය කීර්තිමත් භාවය සහතික කරන මූලික දර්ශනයයි. අප ඇමරිකානු ඩොලර් බිලියන 2ක අපනයන ක්ෂේත්‍රයක් කරා සංක්‍රමණය වන විට, අපගේ වර්ධන ආකෘතිය ගොඩනැගී ඇත්තේ පාරිසරික වගකීම, සමාජ සාධාරණත්වය සහ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව යන ත්‍රිත්ව සාධකයන් මුල් කරගනිමිනි.

මෙම මාර්ග සිතියම පුනර්ජනනීය කෘෂිකර්මාන්තය කරා යන ගමන ශක්තිමත් කරයි. වාර්ෂිකව කාබනික පොහොර මෙට්‍රික් ටොන් 800,000ක් සහ ජීව අඟුරු මෙට්‍රික් ටොන් 175,000ක් යෙදීම ඒකාබද්ධ කිරීමෙන්, අප අස්වැන්න වැඩි කරනවා පමණක් නොව, පසෙහි නිරෝගී බව සක්‍රීයව ප්‍රතිස්ථාපනය කරමින් කාබන් රඳවා ගැනීම ද ඉහළ නංවන්නෙමු. හෙක්ටයාර 400,000ක භූමි ප්‍රමාණයක් පුරා තෙතමනය සංරක්ෂණය  කිරීම සහ කාර්යක්ෂම ජල සම්පාදන පද්ධති ව්‍යාප්ත කිරීම කෙරෙහි අපගේ අවධානය යොමුවීම, දේශගුණික විපර්යාසයන්ට දෙනු ලබන සෘජු ප්‍රතිචාරයකි. එමගින් දේශීය ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කරන අතරම අපගේ පොල් ඉඩම් දේශගුණයට ඔරොත්තු දෙන කාබන් අවශෝෂක ලෙස ක්‍රියා කිරීම සහතික කරයි. මීට අමතරව, කොහු බත්  සහ පොල් කටු අඟුරු මත පදනම් වූ සක්‍රීය කාබන් වැනි  පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදන සඳහා ලබා දෙන ප්‍රමුඛතාවය, පොල් ගෙඩියේ සෑම කොටසක්ම ප්‍රයෝජනයට ගනිමින් අපතේ යාම මුළුමනින්ම වළක්වන චක්‍රීය ආර්ථිකයක ආකෘතිය මනාව පැහැදිලි කරයි.

ගෝලීය දේශගුණික අවිනිශ්චිතතාවයන් පවතින යුගයක, මෙම SP&R සැලැස්ම තුළ නවීන අවදානම් අවම කිරීමේ උපායමාර්ග ඇතුළත් කර ඇත. නව උතුරු පොල් ත්‍රිකෝණය වෙත භූගෝලීය වශයෙන් ව්‍යාප්ත වීම සහ දකුණු කුඩා ත්‍රිකෝණය පුළුල් කිරීම මගින්, කිසියම් නිශ්චිත ප්‍රදේශයකට පමණක් බලපාන අයහපත් කාලගුණික තත්ත්වයන් හමුවේ ජාතික කර්මාන්තයට සිදුවන හානිය අවම කරයි. ජෛව විද්‍යාත්මක පාලන ක්‍රම මගින් පලිබෝධ හානි සහිත ප්‍රදේශ 50%කින් අඩු කිරීම සහ සැලසුම්සහගත පරාගණය මගින් ස්වභාවිකව ගෙඩි හටගැනීම ඉහළ නැංවීම හරහා, අප වඩාත් ස්ථාවර සහ ඵලදායී වන "දේශගුණික සුහුරු බවින් යුක්ත" පරිසර පද්ධතියක් ගොඩනගමින් සිටින බවද මෙහිදී මතක් කළ යුතුය.

තිරසාරභාවය සඳහා අපගේ ඇති කැපවීම, "සිලෝන් කොකනට්"  සන්නාමය සඳහා ලෝකය හමුවේ තැබිය හැකි ඉහළම වටිනාකම් සහතිකය කරයි. අපගේ නිෂ්පාදනය, ප්‍රභවය සොයා ගැනීමේ හැකියාව, කාබනික සහතිකකරණය සහ  අමුද්‍රව්‍ය සපයා ගැනීමේ දී සදාචාරාත්මක ලෙස කටයුතු කිරීම යනාදිය ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව සකස් කිරීමෙන්, ලොව වඩාත් විචක්ෂණශීලී ජාත්‍යන්තර වෙළඳපලවල ප්‍රමුඛස්ථානයක් ලබා ගනිමු. මෙම මාර්ග සිතියම මගින් ලෝකය ශ්‍රී ලාංකික පොල් නිෂ්පාදනයක් මිලදී ගන්නා විට, ඔවුන් ආයෝජනය කරන්නේ මහ පොළොවට ගරු කරන සහ එහි ජනතාව බලගන්වන පද්ධතියක් වෙනුවෙන් බව සහතික කරයි.

වගුව 4 - සවිස්තරාත්මක මූල්‍ය හා ආර්ථික ප්‍රක්ෂේපණ සහ ආයෝජන පැතිකඩ

| | 2026 | 2027 | 2028 | 2029 | 2030 | 2031 | 2032 | 2033 | 2034 | 2035 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| හෙක්ටයාරයකට වත්තකින් / ගොවියෙකුට ලැබෙන ලාභය | 20363 | 21258 | 22022 | 22920 | 24076 | 25441 | 26250 | 26867 | 27636 | 28359 |
| මුළු අපනයන උපයා ගැනීම් (ඇමරිකානු ඩොලර් මිලියන) | 987 | 1090 | 1207 | 1345 | 1502 | 1602 | 1702 | 1797 | 1927 | 2003 |
| මුළු ගෙඩි සංඛ්‍යාව (මිලියන) | 3250 | 3398 | 3548 | 3738 | 3949 | 4131 | 4249 | 4379 | 4509 | 4548 |
| එක් ගසකින් ලැබෙන ගෙඩි සංඛ්‍යාව | 49 | 50 | 52 | 55 | 58 | 60 | 62 | 63 | 65 | 65 |
| ගස් සංඛ්‍යාව (මිලියන) | 66 | 67 | 68 | 68 | 68 | 68 | 69 | 69 | 69 | 70 |
| වගා කර ඇති බිම් ප්‍රමාණය (හෙක්ටයාර) | 494389 | 500864 | 500864 | 500864 | 500864 | 500864 | 500864 | 500864 | 500864 | 500864 |
| නිෂ්පාදනය කරන ලද පැළ සංඛ්‍යාව (මිලියන) | 3 | 3 | 4 | 4 | 4 | 5 | 5 | 6 | 6 | 6 |
| මුළු ආයෝජනය (ඇමරිකානු ඩොලර් මිලියන) | 178 | 327 | 447 | 614 | 780 | 942 | 1028 | 1104 | 1201 | 1275 |
| වසරකට ආයෝජනය (ඇමරිකානු ඩොලර් මිලියන) | 178 | 149 | 120 | 167 | 166 | 162 | 86 | 76 | 97 | 75 |
| පුනරාවර්තන පිරිවැය (ඇමරිකානු ඩොලර් මිලියන) | 51 | 78 | 116 | 166 | 216 | 252 | 280 | 311 | 352 | 374 |
| අතිරේක අපනයන (ඇමරිකානු ඩොලර් මිලියන) | 82 | 185 | 302 | 440 | 597 | 697 | 798 | 893 | 1022 | 1099 |
| ශුද්ධ නිදහස් මුදල් ප්‍රවාහය (ඇමරිකානු ඩොලර් මිලියන) | -147 | -42 | 66 | 107 | 215 | 282 | 432 | 506 | 574 | 650 |

මූලාශ්‍රය: පදනම් දත්ත සැලකිල්ලට ගනිමින් සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක හා ඉලක්කගත අගයන්ට අනුකූලව, වෙනස්වීමේ න්‍යාය මත පදනම් වූ ගණිතමය මූල්‍ය ආකෘතිය භාවිතයෙන් කතුවරුන් විසින් සිදුකරන ලද ගණනය කිරීම් වේ.

# 5. අගය දාමයේ පාර්ශවකරුවන්: ක්‍රියාමාර්ග, ආයෝජන අවස්ථා සහ ප්‍රතිලාභ

පොල් ක්ෂේත්‍රයේ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සහ මාර්ගසිතියම (2026-2035) සාර්ථකව ක්‍රියාත්මක කිරීම රඳා පවතින්නේ අගය දාමයේ සියලුම පාර්ශවකරුවන්ගේ සමගාමී සහ සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග මතය. යෙදවුම් සපයන්නන් සහ ගොවීන්ගේ සිට සැකසුම්කරුවන්, අපනයනකරුවන්, මූල්‍ය ආයතන සහ රාජ්‍ය ආයතන දක්වා සෑම පාර්ශවකරුවෙකුම ඵලදායිතාව ඉහළ නැංවීම, අගය එකතු කිරීම ප්‍රවර්ධනය කිරීම, වෙළෙඳපොළ තරගකාරිත්වය නැංවීම සහ දිගුකාලීන තිරසාරභාවය සහතික කිරීම සඳහා සුවිශේෂී මෙන්ම අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි.

මෙම කොටස මගින් එක් එක් පාර්ශව කණ්ඩායම් සඳහා යෝජිත වගකීම් සහ ක්‍රියාකාරකම් විස්තර කරන අතර, ජාතික ප්‍රතිපත්ති ප්‍රමුඛතාවන් සමග සමපාත වීමට සහ අපගේ හවුල් ක්ෂේත්‍රීය දැක්ම සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය පරිවර්තනීය පියවරයන් ද ගෙනහැර දක්වයි. වඩාත් සවිස්තරාත්මක ලැයිස්තුවක් 'ඇමුණුම 1: පාර්ශවකරුවන්: වගකීම්, ක්‍රියාමාර්ග සහ ප්‍රතිලාභ න්‍යාසය' හි දක්වා ඇත.

## 5.1 යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග - යෙදවුම් සපයන්නන්

යෙදවුම් සපයන්නන්, පොල් පර්යේෂණ ආයතනය සහ පොල් වගා කිරීමේ මණ්ඩලය (CCB) යනු අපගේ සැපයුම් පාර්ශවීය පරිවර්තනයේ නිර්මාණකරුවන් වේ. ඔවුන්ගේ මූලික මෙහෙවර වන්නේ සාම්ප්‍රදායික මෙන්ම අලුතින් නැගී එන කලාප යන දෙකෙහිම මහා පරිමාණ වගා ව්‍යාප්තිය සඳහා පහසුකම් සැලසීම පිණිස රෝපණ ද්‍රව්‍ය සැපයුම් පද්ධතිය ශක්තිමත් කිරීමයි.

### *සැපයුම් දාමය ශක්තිමත් කිරීම*

අනාගත වගා ඉල්ලුම සපුරාලීම සඳහා, යෙදවුම් සපයන්නන් විසින් රාජ්‍ය ආයතන සහ ව්‍යාප්ති නිලධාරීන් සමග සමීප සහයෝගීතාවයෙන් යුතුව පහත සඳහන් දෑ සඳහා අවශ්‍ය සහාය ලබා දෙනු ඇත:

- **තවාන් යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම**: උසස් තත්ත්වයේ පැළ නිෂ්පාදනය සඳහා වන ජාතික ධාරිතාව ඉහළ නැංවීම පිණිස දිවයින පුරා අතිරේක සහතික ලත් තවාන් 20ක් පිහිටුවීම. මීට අමතරව, දැනට පවතින පොල් වගා කිරීමේ මණ්ඩලයේ තවාන් 36 හි යටිතල පහසුකම්, ශ්‍රම බලකායේ ධාරිතාව සහ අරමුදල් ශක්තිමත් කරමින් ඒවා නවීකරණය කිරීම.
- **පැළ නිෂ්පාදනය සහ වගා කිරීම ඉහළ නැංවීම**: වාර්ෂික බීජ හා පැළ නිෂ්පාදනය වසරකට තවත් අතිරේක පැළ මිලියන 4කින් ඉහළ නැංවීම. නැවත වගා කිරීම සහ හිස් ඉඩම් වගාවෙන් පිරවීම වේගවත් කිරීම සඳහා වන මෙම පියවර, දිගුකාලීන ඵලදායිතා වර්ධනයේ පදනම ලෙස ක්‍රියා කරනු ඇත.
- **විශේෂිත ප්‍රභේද හඳුන්වා දීම**: විවිධ කෘෂි-දේශගුණික කලාප සහ බලපෑමට ලක්විය හැකි පරිසරයන් සඳහා සුදුසු පරිදි සකස් කරන ලද හා දියුණු කරන ලද නව පොල් ප්‍රභේද 3ක් පමණ සංවර්ධනය කර බෙදා හැරීම.

යෙදවුම් සපයන්නන් යනු දේශගුණයට ඔරොත්තු දෙන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ උපායමාර්ගික හවුල්කරුවන් වේ. ඔවුන්ගේ කාර්යභාරයට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- **තෙතමනය සංරක්ෂණය කිරීම**: අතිරේක හෙක්ටයාර 300,000ක් ආවරණය වන පරිදි කොහුබත් ආශ්‍රිත කොළ රොඩු වැස්ම (වසුන් ද්‍රව්‍ය) සහ පාංශු සංශෝධක නිෂ්පාදනය හා බෙදා හැරීම ඉහළ නැංවීම.

- **උසස් ජල සම්පාදනය**: නියඟයට ගොදුරු වන ප්‍රදේශවල ජල සුරක්ෂිතතාව සහතික කරමින්, තවත් අතිරේක හෙක්ටයාර 120,000ක් පුරා කාර්යක්ෂම ක්ෂුද්‍ර සහ බිංදු ජල සම්පාදන පද්ධති සඳහා ප්‍රවේශය ලබා දීම.

- **තිරසර පෝෂණය**: පසෙහි සාරවත් බව පවත්වා ගැනීමට සහ අස්වැන්න වැඩි කිරීමට පාංශු පෝෂණ නිෂ්පාදන විශාල වශයෙන් ඉහළ නැංවීම සම්බන්ධීකරණය කිරීම. මෙයට වාර්ෂිකව රසායනික පොහොර මෙට්‍රික් ටොන් 220,000ක්, කාබනික පොහොර මෙට්‍රික් ටොන් 900,000ක් සහ ජීව අඟුරු මෙට්‍රික් ටොන් 175,000ක අතිරේක සැපයුමක් ඇතුළත් වේ.

- **පාලිත පරාගණය**: ගෙඩි රඳවා ගැනීම ඉහළ නැංවීමේ තීරණාත්මක සාධකයක් වන, හෙක්ටයාර 40,000ක් සඳහා පාලිත පරාගණ සේවා සැපයීම පිණිස මී මැසි පාලන ව්‍යාපාර සහ ප්‍රජා ජාල සමඟ සහයෝගී සම්බන්ධතාවයක් ඇති කර ගැනීම.

සපයන්නන්ගේ ප්‍රධාන වගකීමක් වන්නේ ජීව විද්‍යාත්මක අවදානම් කළමනාකරණය කිරීමේදී ගොවීන්ට සහාය වීමයි. රසායනික හා ජීව විද්‍යාත්මක පළිබෝධනාශක, උගුල් සහ නිරීක්ෂණ උපකරණ සඳහා කාලෝචිත ප්‍රවේශයක් ලබා දීමෙන්, 2035 වන විට පළිබෝධ සහ රෝගවලින් පීඩාවට පත් ප්‍රදේශය හෙක්ටයාර 40,000 සිට හෙක්ටයාර 20,000 දක්වා අඩු කිරීමට සපයන්නන් උදවු කරනු ඇත.

මෙම උත්සාහය තුළින් ද්‍රව්‍ය සැපයීමෙන් ඔබ්බට යමින්, යෙදවුම් සපයන්නන් දැනුම බෙදාහරින හවුල්කරුවන් බවට පත්වනු ඇත. රාජ්‍ය ආයතන සහ නිෂ්පාදක සංවිධාන සමඟ සාමූහික සැලසුම් ක්‍රියාකාරම්වල යෙදෙමින් ඔවුන් යෙදවුම් භාවිතය පිළිබඳ වැදගත් දත්ත හුවමාරු කර ගන්නා අතර ක්ෂේත්‍ර මට්ටමේ තාක්ෂණික නිරූපණයන් පවත්වනු ඇත. මෙහින් මෙම ක්ෂේත්‍රය තාක්ෂණයෙන් පමණක් නොව, එය ඵලදායී ලෙස භාවිතා කිරීමට අවශ්‍ය විශේෂඥ දැනුමෙන්ද සන්නද්ධ වන බව සහතික කෙරේ.

### *පාර්ශවකරුවන්ගේ ප්‍රතිලාභ: සපයන්නන්ගේ සිට හවුල්කරුවන් දක්වා*

පොහොර, ජීව අඟුරු, ජල සම්පාදන හා ජල කළමනාකරණ පද්ධති සහ ඩිජිටල් තොරතුරු තාක්ෂණ පාදක විසඳුම්, වගා තාක්ෂණය, මෙවලම් සහ යන්ත්‍රෝපකරණ සඳහා වන සැපයුම පුළුල් කිරීමට ආයෝජනය කිරීමෙන් යෙදවුම් සපයන්නන්ට පහත සඳහන් දෑ අපේක්ෂා කළ හැකිය:

- **වෙළෙඳපොළ ස්ථාවරත්වය**: පොහොර, අනෙකුත් කෘෂි යෙදවුම්, තාක්ෂණය, සේවා සහ යාන්ත්‍රීකරණය සඳහා වඩාත් පුරෝකථනය කළ හැකි, ඉහළ පරිමාවකින් යුත් ඉල්ලුමක් පැවතීම.

- **ව්‍යාපාර විවිධාංගීකරණය**: සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ජල සම්පාදනය සහ නිශ්චිත ඉලක්කගත කෘෂිකර්මාන්තය වැනි නැඟී එන ක්ෂේත්‍රයන්හි නව නිෂ්පාදන පෙළක් ආරම්භ කිරීමට ලැබෙන අවස්ථා.

- **පාරිභෝගික විශ්වාසය සහ ලැදියාව ඉහළ යාම**: අඛණ්ඩ ව්‍යාපාරික සබඳතා සහ අගය එකතු කළ ව්‍යාප්ති සේවා සැපයීම තුළින් ගොවීන් සමඟ වඩාත් ශක්තිමත් සබඳතා ගොඩනැඟීම.

## 5.2 යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග - සුළු පරිමාණ ගොවීන්

සුළු පරිමාණ ගොවීන් යනු පොල් කර්මාන්තයේ මූලික පදනමයි. ඔවුන් දිනපතා ගනු ලබන කළමනාකරණ තීරණ, මෙම ක්ෂේත්‍රයේ ඵලදායිතාව, තිරසාරභාවය සහ දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව කෙරෙහි සෘජුවම බලපායි. මෙම උපායමාර්ගික සැලැස්ම සහ මාර්ගසිතියම යටතේ,

කර්මාන්තය නැවත පණගැන්වීම සඳහා ක්‍රියාකාරී නායකත්ව භූමිකාවක් භාර ගැනීමට සුළු පරිමාණ ගොවීන්ට ඇරයුම් කෙරේ.

## නිෂ්පාදන පදනම නැවත පණගැන්වීම

වගා බිමේ උපයෝගිතාව උපරිම කිරීමට සහ වත්මන් නිෂ්පාදනයත් 2035 අපගේ ඉලක්කත් අතර ඇති පරතරය පියවීම සඳහා, සුළු පරිමාණ ගොවීන් පහත සඳහන් ප්‍රයත්නයන්ට නායකත්වය දෙනු ඇත:

- **වගා කිරීම සහ හිස් ඉඩම්වල වගාව සිදුකිරීම ඉහළ නැංවීම:** වගා භූමිය පුරා පැළ ඝනත්වය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම සඳහා වාර්ෂිකව අවම වශයෙන් පැළ මිලියන 4ක් වගා කිරීම.

- **පැරණි ගස් ප්‍රතිස්ථාපනය කිරීම:** වයස්ගත වූ හෝ ඵලදායීතාවයෙන් තොර වූ පොල් ගස් මිලියන 1.1ක් පමණ වාර්ෂිකව ක්‍රමානුකූලව ඉවත් කර නැවත වගා කිරීම.

- වගා ඉඩම් භාවිතය උපරිම කිරීම: සෑම පොල් ඉඩමකම උපරිම විභවය ළඟා කර ගැනීම සහතික කිරීම සඳහා වාර්ෂිකව හෙක්ටයාර 13,000ක් පුරා හිස් ඉඩම්වල වගා කිරීම සිදු කිරීම. මෙම කාර්යය වැඩිදියුණු කළ ක්ෂේත්‍ර සම්පත් සහ ඩිජිටල් යටිතල පහසුකම්වල සහාය ඇතිව, අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රවේශයක් ඔස්සේ සිදු කළ යුතුය. තවද, දියුණු කළ ජල සම්පාදනය, තෙතමනය සංරක්ෂණය සහ සමබර ආකාරයෙන් පොහොර භාවිතා කිරීම ආදිය මඟින් දැනට පවතින ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවීම.

පාංශු නිරෝගී බව ප්‍රතිස්ථාපනය කරන සහ දේශගුණික විපර්යාසයන්ට එරෙහිව ආරක්ෂාවක් ගොඩනඟන වඩාත් දියුණු සහ නවීන කෘෂිකාර්මික ශිල්පීය ක්‍රම අනුගමනය කිරීමට ගොවීන් දිරිමත් කරනු ලැබේ. ප්‍රධාන ක්‍රියාමාර්ග අතරට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- **ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණය:** අඛණ්ඩ පාංශු පෝෂණය සඳහා හෙක්ටයාරයකට රසායනික පොහොර මෙට්‍රික් ටොන් 1.5ක්, කාබනික පොහොර මෙට්‍රික් ටොන් 5ක් සහ ජීව අඟුරු මෙට්‍රික් ටොන් 0.75ක සමබර පෝෂණ එකතුවක් යෙදීම.

- **ජල කළමනාකරණය:** තෙතමනය සංරක්ෂණය කිරීම සහ ජල භාවිතයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා වසුන් යෙදීම, ආවරණ බෝග වගාව මෙන්ම සාමාන්‍ය සහ ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම උපයෝගී කර ගැනීම.

- **ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය:** දැඩි ක්ෂේත්‍ර පරීක්ෂණ, සනීපාරක්ෂක ශාක කප්පාදු කිරීම, පෙරමෝන උගුල් සහ ජීව විද්‍යාත්මක පාලන ක්‍රම භාවිතයෙහි නිරත වීම. මෙම සාමූහික ක්‍රියාමාර්ග 2030 වන විට ජාතික මට්ටමින් පළිබෝධ හානි ඇති ප්‍රදේශය හෙක්ටයාර 40,000 සිට 20,000 දක්වා අඩු කිරීමට අත්‍යවශ්‍ය වේ.

තාක්ෂණික කාර්යයන්ගෙන් ඔබ්බට යමින්, මෙම උපායමාර්ගික සැලැස්ම අඛණ්ඩ නවෝත්පාදන සංස්කෘතියක් පෝෂණය කරයි. එහිදී සුළු පරිමාණ ගොවීන් දිරිමත් කරනු ලබන්නේ:

- **ආදායම් විවිධාංගීකරණය:** හෙක්ටයාරයකින් ලැබෙන ආදායම උපරිම කර ගැනීමට සහ වෙළෙඳපොළ අවදානම් අවම කර ගැනීම සඳහා අතුරු බෝග වගාව සහ සත්ව පාලනය ඒකාබද්ධ කිරීම.

- **අඛණ්ඩ ඉගෙනීමට යොමු වීම:** පුහුණු වැඩසටහන්, රසායනාගාර නිරූපණයන් සහ ආදර්ශ ගොවිපළ නිරීක්ෂණ චාරිකා සඳහා සක්‍රීයව දායක වීම.

- **ක්‍රමවේදයන් වෙනස් කිරීම:** පුහුණුව ලැබීම අපගේ උපායමාර්ගයේ ප්‍රධාන අංගයකි. කෘෂිකාර්මික පිරිවැය අඩු කර ගනිමින් ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා යල් පැන ගිය

ක්‍රමවේදයන්ගෙන් බැහැර වී, මී මැසි පාලනය සහ නවීන බෝග කළමනාකරණය වැනි සාක්ෂි මත පදනම් වූ ප්‍රායෝගික ක්‍රමවේදයන් වෙත සංක්‍රමණය වීම.

නවීන ගොවිතැනට නිරවද්‍යතාව අවශ්‍ය වේ. ජාතික අධීක්ෂණ පද්ධතිවලට සහාය වීම සඳහා යෙදවුම්, පිරිවැය සහ අස්වැන්න පිළිබඳ නිවැරදි වාර්තා පවත්වා ගැනීමට සුළු පරිමාණ ගොවීන්ගෙන් අපේක්ෂා කෙරේ. ව්‍යාප්ති නිලධාරීන් සමඟ සමීපව කටයුතු කිරීමෙන් සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණ හරහා දත්ත හුවමාරු කර ගැනීමෙන්, මෙම උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම බිම් මට්ටමින් ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බව ගොවීන් සහතික කරයි.

### *ගොවීන්ට ලැබෙන ප්‍රතිලාභ: සමෘද්ධිය, ස්ථාවරත්වය සහ ගෞරවය*

සුළු පරිමාණ ගොවීන් වෙනුවෙන් ගෙනහැර දක්වා ඇති මෙම ක්‍රියාමාර්ග, වඩාත් සුරක්ෂිත, ගෞරවනීය සහ ස්ථාවර ජීවනෝපායක් කරා යන පැහැදිලි මාවතක් සකසයි. එම ප්‍රතිලාභවලට ඇතුළත් වන්නේ:

- **වැඩි දියුණු කළ ලාභදායීතාව:** නැවත වගා කිරීම සහ වඩා හොඳ පොහොර භාවිතය හේතුවෙන් සෘජුවම ඉහළ අස්වැන්නක්, වඩාත් ස්ථාවර අස්වනු නෙළීමක් මෙන්ම ශුද්ධ ලාභයේ 47.6%ක ප්‍රක්ෂේපිත වර්ධනයක් ළඟා කරගත හැකි වීම.
- **අවදානම් අවම වීම:** අතුරු බෝග වගාව සහ වැඩිදියුණු කළ ජල සම්පාදනය මගින් ආදායම් විවිධාංගීකරණය වීම නිසා දේශගුණික සහ වෙළෙඳපොළ කම්පනවල බලපෑම අවම වීම.
- **දැනුමෙන් සන්නද්ධ වීම:** පුහුණුවීම් සහ ඩිජිටල් උපදේශන සේවා මගින් නව තාක්ෂණයන් අනුගමනය කිරීමට සහ උසස් කළමනාකරණ තීරණ ගැනීමට අවශ්‍ය විශ්වාසය ගොඩනැඟීම.

සමස්තයක් ලෙස ගත් කල, මෙම ප්‍රගතිශීලී පියවරයන් කෘෂිකර්මාන්තය සාම්ප්‍රදායික ශ්‍රමයකින් ඔබ්බට ගෙන ගොස්, එය ඉහළ ඔරොත්තු දීමේ හැකියාවක් ඇති, ලාභදායී සහ තාක්ෂණික වශයෙන් සන්නද්ධ ව්‍යාපාරයක් බවට පරිවර්තනය කරන අතර, ශ්‍රී ලංකාව පුරා සිටින ගොවි පවුල්වල ජීවන තත්ත්වය සැලකිය යුතු ලෙස ඉහළ නංවයි.

## 5.3 යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග - වතු හිමියන්

පෞද්ගලික වතු සහ රාජ්‍ය වැවිලි සමාගම් ඇතුළත් මහා පරිමාණ වතු හිමියන් යනු පොල් කර්මාන්තයේ තාක්ෂණික දියුණුව සහ වාණිජමය නවෝත්පාදනයේ ගාමක බලවේගයන් වේ. මෙම උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම යටතේ, මෙම සංවිධාන ආදර්ශමත්ව ක්‍රියා කරමින්, කෘෂිකාර්මික යහපරිචයන් සහ කාර්මික මට්ටමේ තාක්ෂණික භාවිතයන් ප්‍රවර්ධනය කිරීමේ මූලික උත්ප්‍රේරක ලෙස කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### *තාක්ෂණික පෙරමුණට නායකත්වය දීම*

ජාතික මට්ටමේ ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා, මහා පරිමාණ වැවිලි සමාගම් පහත සඳහන් දෑ සඳහා වගකීම දරනු ඇත:

- **යහපරිචයන් ක්‍රියාත්මක කිරීම:** දැඩි ලෙස පාංශු සාරවත් බව කළමනාකරණය, තෙතමනය සංරක්ෂණය සහ ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය ඇතුළුව, අවම වශයෙන් වතු කම්කරුවන් 92,000ක් වෘත්තීයමය වගා ප්‍රමිතීන් අනුගමනය කරන බව සහතික කිරීම.
- **තාක්ෂණය ඉහළ නැංවීම:** ක්ෂුද්‍ර ජල සම්පාදනය, දියර පොහොර භාවිතාව, ඩිජිටල් නිරීක්ෂණ සහ යාන්ත්‍රීකරණය කළ මෙහෙයුම් වැනි නවෝත්පාදනයන් පර්යේෂණ මට්ටමේ සිට හෙක්ටයාර 50,000ක් පුරා පූර්ණ මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය දීම.

- **වැව්ලි වතු නැවත පණ ගැන්වීම:** අඛණ්ඩ, ඉහළ අස්වැන්නක් ලබා දෙන නැවත පණගැන්වීමේ චක්‍රයක් තම වතු පුරා පවත්වාගෙන යාම සඳහා ක්‍රමානුකූලව හිස් ඉඩම් වගාවෙන් පිරවීම සහ ගස් ප්‍රතිස්ථාපනය කළ යුතු ප්‍රදේශ හඳුනා ගැනීම.

**නවීන කෘෂි විද්‍යාව සඳහා ආයෝජනය කිරීම**

මහා පරිමාණ වතු සතුව, ඉහළ මට්ටමේ කෘෂිකාර්මික ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් පවතී. ඔවුන්ගේ රාජකාරිවලට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- **සම්පත් වෙන් කිරීම:** මෙම මාර්ගසිතියමේ ඉහළ ඵලදායිතා ඉලක්ක සපුරාලීම සඳහා රසායනික හා කාර්මික පොහොර සහ ජීව අඟුරු ඇතුළු අවශ්‍ය යෙදවුම් සඳහා සම්පූර්ණයෙන්ම අරමුදල් සැපයීම සහ ඒවා යෙදීම.
- **නවීන උපකරණ මිලදී ගැනීම:** වතු වටපිටාව නවීකරණය කිරීම වේගවත් කිරීම සඳහා වගා කටයුතු, ඉඩම් පුනරුත්ථාපනය සහ ක්ෂේත්‍ර මෙහෙයුම් සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ වෙනුවෙන් ආයෝජනය කිරීම.
- **පද්ධති විවිධාංගීකරණය:** ස්ථාවර ආදායමක් සහ උසස් පෝෂක චක්‍රීකරණයක් සඳහා ශක්තිමත් ආදර්ශයන් නිර්මාණය කරමින්, අතුරු බෝග වගාව සහ සත්ව පාලනය ආරම්භ කිරීමේ මූලික පිරිවැය වෙනුවෙන් ආයෝජනය කිරීම.

**දැනුම සහ දත්ත විනිවිදභාවය පිළිබඳ නායකත්වය**

මෙම ක්ෂේත්‍රයේ "ආදර්ශ ආකෘති" ලෙස, මහා පරිමාණ වතු ජාතික මට්ටමින් දැනුම බෙදාහදා ගැනීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඔවුන්ගෙන් අපේක්ෂා කරනු ලබන්නේ::

- **ප්‍රායෝගික ඉගෙනුමට පහසුකම් සැලසීම:** කර්මාන්තයේ කුඩා පරිමාණ සාමාජිකයින්ට සහාය වීම සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකාවලට පහසුකම් සැලසීම සහ නව ගොවිතැන් මාදිලි පිළිබඳ ඇගයීම් දත්ත බෙදාහදා ගැනීම.
- **විස්තරාත්මක වාර්තා පවත්වා ගැනීම:** නිෂ්පාදන පරිමාවන්, යෙදවුම් පිරිවැය සහ ආදායම් මාර්ග පිළිබඳ සංකීර්ණ ඩිජිටල් වාර්තා පවත්වාගෙන යාම. මෙම විනිවිදභාවය අභ්‍යන්තර මිණුම් සලකුණු (Benchmarking) සඳහා සහාය වන අතර, SP&R යටතේ ජාතික මට්ටමේ අධීක්ෂණ කටයුතු සඳහා ද අත්‍යවශ්‍ය වේ.
- **ජාතික සම්බන්ධීකරණය:** මෙම මාර්ගසිතියම සැබෑ බිම් මට්ටමේ තත්ත්වයන්ට අනුකූලව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා, තාක්ෂණික භාවිත අනුපාත සහ පවතින අභියෝග පිළිබඳ දත්ත හුවමාරු කර ගනිමින් සම්බන්ධීකරණ යාන්ත්‍රණ සඳහා පූර්ණ ලෙස දායක වීම.

## *වතු හිමියන් සඳහා වන උපායමාර්ගික ප්‍රතිලාභ*

SP&R සැලැස්ම සමඟ සමපාත වීමෙන්, වතු හිමියන්ට නවතම මට්ටමක මෙහෙයුම් විශිෂ්ටත්වයක් සහ ලාභදායීතාවයක් ළඟා කර ගත හැකිය. එම ප්‍රතිලාභවලට ඇතුළත් වන්නේ:

- **මෙහෙයුම් කාර්යක්ෂමතාව:** යාන්ත්‍රීකරණය සහ උසස් ජල සම්පාදනය මඟින් පවතින ශ්‍රම හිඟයට විසඳුම් ලැබෙන අතර, දිගුකාලීන මෙහෙයුම් පිරිවැය සැලකිය යුතු ලෙස අඩු වේ.
- **ESG සහ ආයෝජක විශ්වාසය:** තිරසාර, ESG (පාරිසරික, සමාජීය සහ පාලන – Environmental, Social, and Governance) ප්‍රමිතීන්ට අනුකූල භාවිතයන් අනුගමනය කිරීමෙන් සන්නාම වටිනාකම ඉහළ යන අතර ජාත්‍යන්තර ආයෝජන ආකර්ෂණය කර ගත හැකිය.

- **පුරෝකථනය කළ හැකි ලාභදායීතාව:** දත්ත මත පදනම් වූ දියුණු කළමනාකරණය සහ වැඩිදියුණු කළ පරාගණ පද්ධති හේතුවෙන් වගා බිම් භාවිතයේ කාර්යක්ෂමතාව වැඩි වන අතර වඩාත් ස්ථාවර ආදායම් මාර්ග සැලසෙයි.

- **ගෝලීය තරගකාරිත්වය:** නවීකරණය කරන ලද කළමනාකරණය මඟින්, විනිවිදභාවය සහ තිරසාරභාවය වැඩි වැඩියෙන් ඉල්ලා සිටින ගෝලීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලාංකීය වතු සමාගම්වල තරගකාරීත්වය අඛණ්ඩව පවත්වා ගැනීමට හැකි වේ.

## 5.4 යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග - එකතු කරන්නන්

එකතු කරන්නන් පොල් අගය දාමය තුළ උපායමාර්ගික ස්ථානයක් හිමිකර ගන්නා අතර, ග්‍රාමීය නිෂ්පාදනය සහ කාර්මික පිරිසැකසුම්කරණය අතර අත්‍යවශ්‍ය සම්බන්ධතාවයක් ලෙස ඔවුන් කටයුතු කරයි. මෙම උපායමාර්ගික සැලැස්ම සහ මාර්ගසිතියම යටතේ, ඔවුන්ගේ කාර්යභාරය සාම්ප්‍රදායික එකතු කිරීමේ මට්ටමෙන් ඔබ්බට ගොස්, ඉහළ කාර්යක්ෂමතාවයකින් යුත් සැපයුම් සහ දත්ත හවුල්කරුවන් බවට පරිවර්තනය වේ.

### *සැපයුම් වෘත්තීයකරණය සහ පසුඅස්වනු හානිය අවම කිරීම*

පොල් ක්ෂේත්‍රයේ සිට කර්මාන්තශාලාව දක්වා ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා එකතු කරන්නන්ගෙන් පහත සඳහන් දෑ අපේක්ෂා කෙරේ:

- **සැපයුම් යටිතල පහසුකම් නැංවීම:** නවීන ප්‍රවාහන වාහන, නිවැරදිව ප්‍රමිතිකරණය කරන ලද කිරුම් උපකරණ සහ පොල්වලට හානි නොවන පරිදි ආරක්ෂිතව හැසිරවිය හැකි කූඩ වෙනුවෙන් ආයෝජනය කිරීම.

- **ගබඩාකරණය සහ තත්ත්ව පාලනය වැඩි දියුණු කිරීම:** පොල්වල ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීම සඳහා කුඩා පරිමාණයේ ගබඩා ව්‍යුහයන් මෙන්ම උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පාලනය කළ හැකි පහසුකම් ස්ථාපිත කිරීම.

- **පසුඅස්වනු හානිය අවම කිරීම:** නාස්තිය අවම කිරීම සහ අගය දාමයේ මීළඟ අදියර කරා ඇතුළු වන අමුද්‍රව්‍යවල ගුණාත්මකභාවයේ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා ක්‍රමානුකූල එකතු කිරීමේ මාර්ග සහ දියුණු හැසිරවීම් ශිල්පීය ක්‍රම ක්‍රියාත්මක කිරීම.

**ප්‍රභවය සොයාගැනීම සහ වෙළෙඳපොළ විනිවිදභාවය ශක්තිමත් කිරීම**

නිෂ්පාදනවල ප්‍රභවය (ඇරඹුම) පිළිබඳව වැඩි වැඩියෙන් සොයා බලන ගෝලීය වෙළෙඳපොළක් තුළ, විනිවිදභාවය තහවුරු කිරීම සඳහා එකතු කරන්නන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි:

- **දත්ත මත පදනම් වූ මූලාශ්‍රකරණය:** එකතු කරන ලද, සකසන ලද සහ යොමු කරන ලද පොල් පිළිබඳ නිවරුදි වාර්තා පවත්වාගෙන යාම. මෙම ක්‍රමානුකූල දත්ත ග්‍රහණය කර ගැනීම අභ්‍යන්තර ව්‍යාපාර කළමනාකරණයට මෙන්ම ජාතික නිෂ්පාදන පුරෝකථනයට ද අත්‍යවශ්‍ය වේ.

- **ඩිජිටල් ක්‍රමයක් යටතේ ප්‍රභවය සොයා ගැනීම සහ සහ අලෙවිකරණය:** නිෂ්පාදන පරිමාවන්, ලබාගත් ප්‍රදේශ සහ බෙදාහැරීමේ කාලසීමාවන් පිළිබඳ තොරතුරු අත්පොතෙන් හෝ ඩිජිටල් වේදිකා හරහා රාජ්‍ය ආයතන සහ සකසන්නන් සමඟ හුවමාරු කර ගැනීම. උදාහරණයක් ලෙස, වෙළෙඳ ක්‍රියාවලීන් විධිමත් කිරීමට, සාධාරණ මිලක් සහතික කිරීමට සහ වෙළෙඳපොළ තුළ තරගකාරිත්වය වැඩි කිරීමට පොල් නිෂ්පාදන සඳහා මධ්‍යගත ඩිජිටල් වෙන්දේසි පද්ධතියක් ස්ථාපිත කිරීම.

- **සාධාරණ වෙළෙඳ භාවිතයන්:** ගොවීන් සහ පිරිසැකසුම්කරුවන් යන දෙපාර්ශවය සමඟම විනිවිදභාවයෙන් යුත් මිල නියම කිරීමේ චර්යාවන් සහ වඩා හොඳ සන්නිවේදනයක්

පැවැත්වීම තුළින් විශ්වාසය ගොඩනැගීම. මෙම ක්‍රමය මගින් ගනුදෙනු පිරිවැය අඩු කර ගත හැකි අතර පුරෝකථනය කළ හැකි වෙළෙඳපොළ සබඳතා සහතික කර ගත හැකිය.ග

**චක්‍රීය ආර්ථික මූලධර්ම ක්‍රියාත්මක කිරීම**

පොල් ගෙඩියේ "සම්පූර්ණ අගය" උපරිම කිරීම සඳහා එකතු කරන්නන් ප්‍රධාන මෙහෙවරක් ඉටු කරයි. ඔවුන්ගේ වගකීම්වලට ඇතුළත් වන්නේ:

- **අතුරු නිෂ්පාදන ප්‍රයෝජනයට ගැනීම**: ලෙලි සහ පොල් කටු එකතු කිරීම මෙන්ම ඒවා නැවත ප්‍රයෝජනයට ගැනීම වැඩි දියුණු කිරීම. මෙමඟින් එම වටිනා ද්‍රව්‍ය, ඉහළ වර්ධනයක් සහිත කර්මාන්ත වන කොහු කෙඳි, පොල් ලෙලි කුඩු, ලණුවලින් නිමවන නිෂ්පාදන සහ සක්‍රිය කාබන් නිෂ්පාදනය සඳහා කාර්යක්ෂමව යොමු කෙරේ.
- **අපතේ යාම වැළැක්වීම**: ගොවිපළ මට්ටමින් මෙම අතුරු නිෂ්පාදන එකතු කිරීමේ කාර්යය සංවිධානය කිරීම මඟින් එකතු කරන්නන් චක්‍රීය ආර්ථික මූලධර්මවලට සෘජුවම සහාය දක්වන අතර, අපතේ යාමට ඉඩ ඇති ද්‍රව්‍ය ජාතික අපනයන ආදායමක් බවට පරිවර්තනය කරයි.

**ප්‍රාදේශීය, කලාපීය සහ ජාතික සම්බන්ධීකරණය**

එකතු කරන්නන් ප්‍රාදේශීය සහ ජාතික සම්බන්ධීකරණ යාන්ත්‍රණ සඳහා සක්‍රීයව දායක විය යුතුය. ගොවි සංවිධාන, අපනයනකරුවන්, රාජ්‍ය ආයතන සහ ජාතික බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම මඟින් සැපයුම් දාමය ස්ථාවරව පවත්වා ගැනීමටත් වෙළෙඳපොළ ඉල්ලුමට සරිලන සේ ප්‍රතිචාර දැක්වීමටත් ඔවුන්ට හැකි වේ..

## *එකතු කරන්නන් සඳහා වන උපායමාර්ගික ප්‍රතිලාභ*

එකතු කිරීමේ සහ බෙදාහැරීමේ පද්ධතිය නවීකරණය කිරීම මඟින් සැලකිය යුතු වාණිජ වාසි රැසක් හිමිවේ:

- **කාර්යක්ෂමතාව තුළින් ඉහළ ලාභදායීතාව**: වඩාත් ක්‍රමවත්ව වාර්තා තැබීම සහ ශක්තිමත් එකතු කිරීමේ මධ්‍යස්ථාන පැවතීම හේතුවෙන් ස්ථාවර සැපයුම් ප්‍රවාහයක් පවත්වා ගත හැකි වන අතර, නාස්තිය සැලකිය යුතු ලෙස අඩු වී ඉහළ ගුණාත්මක ලාභයක් අත්කර ගත හැකිය.
- **ස්ථාවර ව්‍යාපාරික සබඳතා**: ඉහළ විනිවිදභාවය හේතුවෙන් ගැනුම්කරුවන් (සැකසුම්කරුවන්) සහ විකුණුම්කරුවන් (ගොවීන්) යන දෙපාර්ශවයම සමඟ විශ්වාසය ගොඩනැගෙන අතර, එය මිල ස්ථාවරත්වයට සහ දිගුකාලීන ගිවිසුම්වලට මඟ පාදයි.
- **වෙළෙඳපොළේ ප්‍රධාන ස්ථානයක් හිමිවීම**: වැඩිදියුණු කළ ගබඩා පහසුකම් සහ ඩිජිටල් මෙවලම් සඳහා ආයෝජනය කිරීමෙන්, එකතු කරන්නන් ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු ඩොලර් බිලියන 2ක් වටිනා පොල් ආර්ථිකයේ ප්‍රමඛ පාර්ශවයක් බවට පත් වන අතරම, කිසිසේත්ම මඟ හැරිය නොහැකි අත්‍යවශ්‍ය හවුල්කරුවන් බවට පත්වේ.

## 5.5 යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග - සැකසුම්කරුවන් (දේශීය වෙළෙඳපොළ සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ)

සැකසුම්කරුවන් යනු ශ්‍රී ලංකාවේ පොල් ක්ෂේත්‍රයේ අගය එකතු කිරීමේ සහ අපනයන තරඟකාරිත්වයේ ප්‍රධාන ගාමක බලවේගය වේ. මෙම උපායමාර්ගික සැලැස්ම සහ මාර්ගසිතියම යටතේ, අමුද්‍රව්‍ය මත පමණක් යැපෙන කර්මාන්තයේ සිට ඉහළ අගයක් සහිත, විවිධාංගීකරණය වූ සහ ගෝලීය වශයෙන් ඒකාබද්ධ වූ නිෂ්පාදන පදනමක් දක්වා කර්මාන්තය පරිවර්තනය කිරීමේ වගකීම ඔවුන් සතු වේ..

*ගුණාත්මකභාවය මත පදනම් වූ සම්පත් ඒකරාශිකිරීම සහ අගය එකතු කිරීම*

සැකසුම්කරුවන් යනු ගොවිපළ මට්ටමේ ගුණාත්මකභාවය සහ වෙළෙඳපොළ වටිනාකම අතර ඇති සම්බන්ධකම් පුරුකයි. උසස් තත්ත්වයේ අමුද්‍රව්‍යවල ස්ථාවර සැපයුමක් සහතික කිරීම සඳහා ඔවුන් පහත දෑ සිදු කරනු ඇත:

- **ගුණාත්මකභාවය මත පදනම් වූ මිල නියම කිරීම:** උසස් තත්ත්වයේ පොල් සඳහා තරඟකාරී මිල වෙනසක් ලබා දීම තුළින් විශිෂ්ට ගොවිතැන් කටයුතු හඳුනා ගැනීම සහ දිරිමත් කිරීම. මෙය වඩා හොඳ අස්වනු නෙළීමේ සහ හැසිරවීමේ තාක්ෂණයන් අනුගමනය කිරීමට ගොවීන්ව දිරිමත් කරනු ඇත.
- **නිෂ්පාදන පරාසය විවිධාංගීකරණය කිරීම:** සම්ප්‍රදායික භාණ්ඩවලින් ඔබ්බට ගොස් පොල් වතුර, පොල් මදය මත පදනම් වූ උසස් තත්ත්වයේ නිෂ්පාදන, සක්‍රීය කාබන් සහ විශේෂිත කොහු නිෂ්පාදන වැනි ඉහළ වර්ධනයක් සහිත ක්ෂේත්‍ර කරා නිෂ්පාදනය පුළුල් කිරීම.
- **ගෝලීය ප්‍රවණතා සමඟ අනුගත වීම:** ශාක පදනම් කරගත්, කිරි රහිත සහ සෞඛ්‍යය කේන්ද්‍ර කරගත් විකල්ප සඳහා පවතින ගෝලීය ඉල්ලුම සපුරාලීම කෙරෙහි අවධානය යොමු කිරීම.

**තත්ත්ව සහතිකය සහ ගෝලීය අනුකූලතාව**

"සිලෝන් කොකනට්" සතු කීර්තිමත් නාමය පවත්වා ගැනීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට දැඩි ලෙස අනුගත වීම අත්‍යවශ්‍ය වේ. සැකසුම්කරුවන් පහත කරුණු සඳහා වගකිව යුතුය:

- **සහතික කිරීමේ විශිෂ්ටත්වය:** ISO 22000, HACCP, BRCGS සහ කාබනික (USDA/EU) ප්‍රමිතීන් ඇතුළු ලෝක මට්ටමේ සහතික ලබා ගැනීම සහ ඒවා අඛණ්ඩව පවත්වා ගැනීම.
- **අඛණ්ඩ වැඩිදියුණු කිරීම:** දැඩි ජාත්‍යන්තර අපනයන රෙගුලාසිවලට 100%ක් අනුකූල වීම සහතික කිරීම සඳහා නවීන ආහාර සුරක්ෂිතතා කළමනාකරණය සහ තත්ත්ව සහතික කිරීමේ පද්ධති ඒකාබද්ධ කිරීම.
- **නිෂ්පාදනයේ ප්‍රභවය සොයා ගැනීමේ හැකියාව ඒකාබද්ධ කිරීම:** සෑම කාණ්ඩයක්ම ගසේ සිට වෙළෙඳපොළ රාක්කය දක්වා නිරීක්ෂණය කළ හැකි බව සහතික කරමින්, විනිවිද පෙනෙන ලේඛන පවත්වා ගැනීමට එකතු කරන්නන් සහ ගොවීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

2035 ඉලක්ක සපුරාලීම සඳහා, සැකසුම් අංශය නව යටිතල පහසුකම් සහ තාක්ෂණය සඳහා උපායමාර්ගික ආයෝජනවලට ප්‍රමුඛත්වය ලබා දෙනු ඇත:

- **ලංකා පොල් වතුර ව්‍යාප්තිය**: ගෝලීය වශයෙන් වේගවත් වර්ධනයක් දක්නට ලැබෙන පොල් වතුර සඳහා, පොල් වතුර එකතු කිරීම, අතිශය ඉහළ උෂ්ණත්ව (UHT) සැකසුම් සහ විෂබීජ රහිත ඇසුරුම්කරණය සඳහා වෙන්වූ මධ්‍යස්ථාන 25ක් ස්ථාපිත කිරීම හෝ වැඩිදියුණු කිරීම.
- **ක්‍රියාකාරී ආහාර (Functional Food) සහ පෝෂණීය ඖෂධ**: අපනයන ආදායම විවිධාංගීකරණය කිරීමට සහ ඉහළ නිපුණතාවයකින් යුත් රැකියා උත්පාදනය කිරීමට, පෝෂණීය අතිරේක ආහාර, විලවුන් සහ ක්‍රියාකාරී ආහාර නවෝත්පාදන සඳහා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සහ නිෂ්පාදනවල ආයෝජනය කිරීම.
- **කාර්යක්ෂමතාව සහ තිරසාරභාවය**: බලශක්ති කාර්යක්ෂමතාව සහ ධාරිතා උපයෝජනය වැඩි දියුණු කිරීම සඳහා කර්මාන්තශාලා නවීකරණය කිරීම, ලාභදායීතාවය ඉහළ නැංවීම සහ කර්මාන්තයේ කාබන් පියසටහන අඩු කිරීම.
- **නියාමන ක්‍රියා පටිපාටි විධිමත් කිරීම**: පොල් කර්මාන්තයට අලුතින් පිවිසෙන ආයතන සඳහා පවතින බාධක අවම කිරීම, එමඟින් වැඩි තරඟකාරිත්වයක් ඇති කිරීම සහ සමස්ත කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.

**වෙළඳපොළ සංවර්ධනය සහ ජාතික සම්බන්ධීකරණය**

දේශීයව මෙන්ම විදේශයන්හි ද පාරිභෝගික හැසිරීම් හැඩගැස්වීම සඳහා සැකසුම්කරුවන් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි:

- **පාරිභෝගික අධ්‍යාපනය**: දේශීය වශයෙන් අගය එකතු කළ නිෂ්පාදන පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා චර්යාත්මක වෙනස්කම් ඇති කරන ප්‍රචාරණ වැඩසටහන් සහයෝගීව මූල්‍යකරණය කිරීම. මේ හරහා ගෘහ ඒකක තුළ අමු පොල් අපතේ යාම අවම කෙරේ.
- **මූලෝපායික සහයෝගීතාව**: ජාතික ප්‍රතිපත්ති සහ ආයෝජන තීරණ සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම වෙනුවෙන්, නිෂ්පාදන දත්ත සක්‍රීයව හුවමාරු කර ගැනීම සහ රාජ්‍ය-පෞද්ගලික වේදිකාවලට දායක වීම.
- **වෙළඳ නාම ස්ථානගත කිරීම**: ශ්‍රී ලංකා නිෂ්පාදන ඉහළ මිල කාණ්ඩ සහ සුවිශේෂී විශේෂිත වෙළඳපොළවල් (Niche markets) වෙත යොමු කිරීම සඳහා "සිලෝන කොකනට්" (Ceylon Coconut) ගෝලීය වෙළඳ නාමකරණ උපායමාර්ගය සමඟ අනුගත වීම.

*සැකසුම්කරුවන් සඳහා වන මූලෝපායික ප්‍රතිලාභ*

සිය මෙහෙයුම් නවීකරණය කිරීම සහ SP&R සමඟ අනුගත වීම මඟින් සැකසුම්කරුවන්ට ගෝලීය වෙළඳපොළ තුළ ප්‍රමුඛ ස්ථානයක් තහවුරු කර ගත හැකිය:

- **වෙළඳපොළට ඔරොත්තු දීමේ හැකියාව**: සක්‍රිය කාබන් සිට පොල්කිරි දක්වා විවිධාංගීකරණය වූ නිෂ්පාදන පෙළක් පවත්වා ගැනීම මඟින්, එකම භාණ්ඩයක මිල උච්චාවචනයන්ගෙන් සිදුවන බලපෑම්වලින් ව්‍යාපාර ආරක්ෂා කරයි.
- **වාසිදායක වෙළඳපොළ ප්‍රවේශය**: ජාත්‍යන්තර සහතික කිරීම් සහ උසස් තත්ත්ව ප්‍රමිතීන් මඟින් ඉහළ ලාභදායී ගෝලීය සිල්ලර වෙළඳ ජාලයන් සහ විශේෂිත කාර්මික ගැනුම්කරුවන් වෙත ප්‍රවේශ වීමට දොරටු විවර වේ.
- **ප්‍රශස්ත සැපයුම් දාම**: කළමනාකරණය කරන ලද සැපයුම් දාමයන් හරහා අමුද්‍රව්‍ය සඳහා විශ්වාසදායක ප්‍රවේශයක් ලැබීම නිසා, ධාරිතාව උපරිමයෙන් භාවිත කිරීමට සහ ඒකක පිරිවැය අවම කර ගැනීමට හැකි වේ.

- **ගෝලීය කීර්තිය**: ශක්තිමත් තත්ත්ව කළමනාකරණ පද්ධති මඟින් සැකසුම්කරුවන්ගේ කීර්ති නාමය ඉහළ නංවන අතර, ලොව පුරා දිගුකාලීන, ස්ථාවර B2B (ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට) හවුල්කාරිත්වයන් ඇති කිරීමට මඟ පාදයි.

## 5.6 යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග - අපනයනකරුවන්

අපනයනකරුවන් යනු ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ ගෝලීය තානාපතිවරුන් ය. SP&R යටතේ ඔවුන්ගේ ප්‍රධානතම මෙහෙවර වන්නේ "සිලෝන් කොකනට්" පිළිබඳ ජාත්‍යන්තර ප්‍රතිරූපය සාමාන්‍ය තොග භාණ්ඩයක සිට සුවිශේෂී, සදාචාර සම්පන්න ක්‍රමවේදයකින් ලබාගත් සහ ඉහළ වටිනාකමකින් යුත් ගෝලීය වෙළඳ නාමයක් දක්වා පරිවර්තනය කිරීමයි. මෙම ප්‍රයත්නය ක්ෂේත්‍රයෙන් ඔබ්බට ගොස්, ලංකා පොල්වලින් සාදන ලද රසබර ආහාර පාන පිළිබඳ සෘජු අත්දැකීමක් ලබා ගැනීමට සහ තැඹිලි ගසකින් එසැනින්ම සෘජුවම ලබාගන්නා ලද තැඹිලි ගෙඩියෙන් තැඹිලි වතුර පානය කිරීමට උනන්දුවක් දක්වන ඉහළ පෙළේ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට ද දායක වනු ඇත.

### *මූලෝපායික සන්නාමකරණය සහ ගෝලීය ස්ථානගත කිරීම*

දැඩි තරඟකාරී වෙළඳපොළවල් තුළ ශ්‍රී ලංකාවේ වාණිජමය ආකර්ෂණය ඉහළ නැංවීම සඳහා, අපනයනකරුවන් පහත සඳහන් මුලපිරීම් සඳහා නායකත්වය දෙනු ඇත:

- **උසස් තත්වයේ වෙළඳ නාම ප්‍රවර්ධනය (Premium Brand Promotion)**: ලංකා පොල් යනු සුවිශේෂී ගුණාත්මකභාවය, පිරිසිදුකම සහ තිරසාරභාවය පිළිබඳ ජාතික සන්නාමයක් සහ ලකුණක් ලෙස අඛණ්ඩව ප්‍රවර්ධනය කරමින් ගෝලීය තරඟකරුවන්ගෙන් ශ්‍රී ලංකාව වෙනස් කොට කැපී පෙනීමට සැලැස්වීම.
- **ගෝලීය වෙළඳපොළ තුළ කටයුතු කිරීම**: ප්‍රධාන ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනවලදී ප්‍රමුඛ නියෝජනයක් තහවුරු කර ගැනීම සහ ඉහළ වටිනාකමකින් යුත් සිල්ලර වෙළඳ ජාලයන් සහ කාර්මික ගැනුම්කරුවන් සමඟ දිගුකාලීන උපායමාර්ගික හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම.
- **නිෂ්පාදිත රටෙහි විශිෂ්ටත්වය**: ශ්‍රී ලංකාවේ පොල්වල ඇති අද්විතීය රස සහ සදාචාරාත්මක නිෂ්පාදන ප්‍රමිතීන් ඉස්මතු කරන උසස් ලේබල් කිරීම් සහ සන්නාමකරණය ක්‍රියාවට නැංවීම.

අපනයනකරුවන් සතු තීරණාත්මක කාර්යයක් වන්නේ තොග වශයෙන් අමුද්‍රව්‍ය අපනයනය කිරීමෙන් මිදී, පාරිභෝගිකයාට සෘජුවම භාවිත කළ හැකි උසස් තත්වයේ කාණ්ඩ වෙත උපායමාර්ගිකව යොමු වීමයි. පුරෝකථනය කර ඇති විශාල අපනයන පරිමාවන් සඳහා වෙළඳපොළ හඳුනා ගැනීම සහ ඒවා තහවුරු කර ගැනීම අපනයනකරුවන්ට පැවරී ඇත. ඒ සඳහා පහත ඉලක්ක ඇතුළත් වේ::

- **පොල් වතුර මෙට්‍රික් ටොන් (MT) 36,000**: ශීඝ්‍රයෙන් වර්ධනය වන ස්වභාවික පෝෂණය සහ සුවතා වෙළඳපොළ ඉලක්ක කර ගැනීම.
- **පොල් මද ආශ්‍රිත නිෂ්පාදන මෙට්‍රික් ටොන් 440,000**: ශාක පදනම් කරගත් කිරිවලට විකල්ප වෙළඳපොළ සඳහා උසස් තත්ත්වයේ පොල්කිරි, ක්‍රීම් සහ උසස් තත්වයේ පොල්තෙල් කෙරෙහි අවධානය යොමු කිරීම.
- **ලෙලි ආශ්‍රිත නිෂ්පාදන මෙට්‍රික් ටොන් 75,000**: ඉහළ කාර්යසාධනයක් සහිත උද්‍යාන විද්‍යාත්මක සහ කාර්මික කෙඳි වෙළඳපොළ වෙත ව්‍යාප්ත කිරීම.

- **සක්‍රීය කාබන් මෙට්‍රික් ටොන් 70,000**: තිරසාර වායු සහ ජල පෙරීමේ විසඳුම් සඳහා වන ගෝලීය ඉල්ලුම ප්‍රයෝජනයට ගැනීම.

**වෙළඳපොළ පිළිබඳ තොරතුරු සහ ජවසම්පන්න උපායමාර්ගය**

අපනයනකරුවන් අගය දාමයේ "ඇස් සහ කන්" ලෙස ක්‍රියා කරයි. තොරතුරු ගලායාම සම්බන්ධයෙන් ඔවුන්ගේ කාර්යභාරය අත්‍යවශ්‍ය වේ:
:

- **වෙළඳපොළ තොරතුරු හුවමාරු කර ගැනීම**: ඉහළ පෙළේ නිෂ්පාදන සහ සැකසුම් ක්‍රියාවලීන් සඳහා තොරතරු ලබා ගැනීම සඳහා ගෝලීය ප්‍රවණතා, වෙළඳ බාධක සහ විකාශනය වන නියාමන අවශ්‍යතා (යුරෝපා සංගම් ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රභවය සොයාගත හැකි වීම) වැනි කරුණු පිළිබඳ නිතිපතා වාර්තා සැපයීම.
- **වෙළඳපොළ ප්‍රවේශ වැඩසටහන්**: නැගී එන සහ ඉහළ වර්ධනයක් සහිත වෙළඳපොළවල් තුළ අඛණ්ඩව පෙනී සිටීම සහතික කිරීම සඳහා ජාත්‍යන්තර අලෙවිකරණ සහ සන්නාම ගොඩනැගීමේ ප්‍රචාරණ වැඩසටහන් සඳහා සහයෝගීව මූල්‍යකරණය කිරීම.
- **ප්‍රතිපත්ති සංවාදය**: තරඟකාරීව රැඳී සිටීමට අවශ්‍ය ප්‍රතිපත්ති සහ ආයෝජන තීරණ හැඩගැස්වීමට සහ පවතින බාධාවන් හඳුනා ගැනීමට, ජාතික සම්බන්ධීකරණ වේදිකාවන් වෙත සක්‍රීයව දායක වීම.

### අපනයනකරුවන් සඳහා වන උපායමාර්ගික ප්‍රතිලාභ

මෙම උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම (SP&R) සමග අනුගත වීම තුළින්, අපනයනකරුවන්ට වඩාත් ඔරොත්තු දෙන සහ ලාභදායී ව්‍යාපාරික අනාගතයක් සුරක්ෂිත කර ගත හැකිය:

- **අවදානම් අවම කිරීම**: ඉහළ වටිනාකමකින් යුත් විවිධ නිෂ්පාදන පෙළක් වෙත යොමු වීම සහ නව භූගෝලීය වෙළඳපොළවල් කරා ව්‍යාප්ත වීම මඟින්, සම්ප්‍රදායික වෙළඳ භාණ්ඩවල සිදුවන මිල උච්චාවචනයන්ට ගොදුරු වීමේ ප්‍රවණතාව අඩු කරයි.
- **ගැනුම්කරුවන්ගේ විශ්වාසය ඉහළ නැංවීම**: ශක්තිමත් ජාතික සන්නාම පිළිගැනීමක් සහ විනිවිදභාවයකින් යුත් ප්‍රභවය සොයායෑමේ ඩිජිටල් පද්ධති මඟින් විදේශීය ගැනුම්කරුවන්ගේ විශ්වාසය වැඩි කරන අතර, එමඟින් වඩාත් ස්ථාවර, දිගුකාලීන ගිවිසුම් කරා එළඹීමට මඟ පාදයි.
- **ලාභ ආන්තික වැඩිදියුණු වීම**: තොග වශයෙන් අපනයනය කිරීම වෙනුවට පාරිභෝගිකයාට සෘජුවම පරිභෝජනය කළ හැකි නිමි නිෂ්පාදන ලෙස අපනයනය කිරීම මඟින්, සිල්ලර මිලෙන් වැඩි කොටසක් අත්පත් කර ගැනීමට අපනයනකරුවන්ට අවස්ථාව ලැබෙන අතර, එමඟින් ලාභ ආන්තිකය සැලකිය යුතු ලෙස ඉහළ යයි.
- **ප්‍රතිචාරාත්මක වර්ධනය**: වඩාත් දියුණු වෙළඳපොළ තොරතුරු භාවිතය මඟින් පාරිභෝගික ඉල්ලුමේ සිදුවන වෙනස්වීම්වලට වඩා වේගයෙන් ප්‍රතිචාර දැක්වීමට හැකි වන අතර, එමඟින් ශ්‍රී ලාංකීය අපනයන සැමවිටම ගෝලීය ප්‍රවණතාවලට අනුව හැඩගැසෙනවා වෙනුවට එම ප්‍රවණතාවල පෙරමුණ ගැනීමට වගබලා ගනියි.

## 5.7 යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග - රාජ්‍ය ආයතන

අමාත්‍යාංශ, පළාත් බලධාරීන්, පර්යේෂණ ආයතන සහ ව්‍යාප්ති සේවා ඇතුළු රාජ්‍ය ආයතන, ශ්‍රී ලංකාවේ පොල් ක්ෂේත්‍රය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමේ කොඳු නාරටිය බඳු ය. SP&R රාමුව යටතේ, මෙම ආයතන සාම්ප්‍රදායික නියාමන භූමිකාවෙන් ඔබ්බට ගොස් මූලෝපායික පහසුකම් සපයන්නන් බවට පත්වනු ඇත. එමගින් ප්‍රතිපත්ති මෙහෙයවීම, පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවය ගොඩනැගීම, ආයෝජන සම්බන්ධීකරණය කිරීම සහ ඩොලර් බිලියන 2 ක අපනයන පොල් කර්මාන්තයක් සඳහා අවශ්‍ය තාක්ෂණික පදනම සැපයීම සිදු කරනු ඇත

### *ඉඩම්, පාලනය සහ මූලෝපායික ව්‍යාප්තිය*

එලදායී ඉඩම් කළමනාකරණය යනු මෙම ක්ෂේත්‍රයේ වර්ධනයේ ආරම්භක ලක්ෂ්‍යයයි. මේ සඳහා රාජ්‍ය ආයතන වෙත පැවරී ඇති කාර්යයන් පහත පරිදි වේ:

- **මූලෝපායික ලෙස ඉඩම් වෙන්කිරීම**: විශේෂයෙන්ම උතුරු සහ දකුණු පොල් ත්‍රිකෝණ ව්‍යාප්ත කිරීම ඉලක්ක කර ගනිමින් නව වගාවන් සඳහා සුදුසු ඉඩම් අක්කර 40,000ක් හඳුනාගෙන වෙන්කිරීම.
- **රාජ්‍ය නිලතන්ත්‍රය සමග සිදුකරන ක්‍රියාවලීන් සරල කිරීම**: පෞද්ගලික ආයෝජන සඳහා පවතින බාධාවන් ඉවත් කිරීම පිණිස පොල් ඉඩම් උරුමයන් සහ පැවරීම් ආශ්‍රිත ක්‍රියාවලීන් විධිමත් කිරීම. (උදාහරණයක් ලෙස: ඉඩම් හිමිකාරිත්වයේ උපරිම සීමාවන් පිළිබඳ සීමාවන්, පොල් ඉඩම් වෙනත් ව්‍යාපාර සඳහා යොදා ගැනීම හා සම්බන්ධ සීමාවන් ආදිය).
- **ඒකාබද්ධ සැලසුම්කරණය**: විවිධ කෘෂි-පරිසර කලාප පුරා පහසු ක්‍රමවේදයන් ඔස්සේ නැවත වගා කිරීමේ චක්‍රයන් සහ ඒකාබද්ධ ගොවිපළ ආකෘති ස්ථාපිත කිරීම සහතික කිරීම.

**තාක්ෂණික නායකත්වය සහ නවෝත්පාදනය**

ජාතික කර්මාන්තයක් නවීකරණය කිරීම සඳහා ඉහළ මට්ටමේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සහ ශක්තිමත් ව්‍යාප්ති සේවා සහායක් අවශ්‍ය වේ. ප්‍රධාන ආයතනික ක්‍රියාමාර්ගවලට පහත දෑ ඇතුළත් වේ:

- **පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලිය**: දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන සහ ඉහළ අස්වැන්නක් ලබා දෙන පරිදි සකස් කරන ලද, වැඩිදියුණු කළ පොල් ප්‍රභේද පහක් හෝ හයක් සංවර්ධනය කිරීම සඳහා නව පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කිරීම.
- **ආදර්ශ ගොවිපළ සංකීර්ණ**: මහා පරිමාණ වතු සමග සහයෝගයෙන්, අතුරු බෝග වගාව, සත්ව පාලනය ඒකාබද්ධ කිරීම සහ උසස් ජල කළමනාකරණය පිළිබඳ යහ පරිචයන් ප්‍රදර්ශනය කිරීම සඳහා ආදර්ශ ගොවිපළ සංකීර්ණ 40ක් ස්ථාපිත කිරීම.
- **පළිබෝධ සහ අවදානම් කළමනාකරණය**: ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය සඳහා දිස්ත්‍රික් මට්ටමේ කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම සහ මී මැසි පාලනය වැනි ප්‍රජා මූලික පරාගණ මුලපිරීම් ප්‍රවර්ධනය කිරීමග

**අරමුදල් රැස්කිරීම සහ ගෝලීය සන්නාමකරණය**

පාර්ශවකරුවන් සඳහා මෙම ක්ෂේත්‍රයේ පවතින අවදානම් අවම කිරීම පිණිස රාජ්‍ය ආයතන විසින්:

- **සුහුරු මූල්‍යකරණය සක්‍රීය කිරීම**: යටිතල පහසුකම් (පැළ තවාන් ඒකකයක් පිහිටුවීම ආදිය) සහ පිරිසැකසුම් කටයුතු සඳහා අඩු පිරිවැය ප්‍රාග්ධනය ඒකරාශි කිරීම, සහන ණය පහසුකම් සැලසීම සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ඉදිරියට ගෙන යාම.

- **අවදානම් අවම කිරීම**: දේශගුණික බලපෑම්, පළිබෝධ හානි සහ මිල උච්චාවචනයන්ට එරෙහිව ගොවීන් සහ අපනයනකරුවන් ආරක්ෂා කිරීම සඳහා විශේෂිත රක්ෂණ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම.

- **"සිලෝන් කොකනට්" ජාතික සහ ජාත්‍යන්තර මූලෝපාය**: පෞද්ගලික අංශයේ සහ ශ්‍රී ලංකා පොල් කර්මාන්ත මණ්ඩලයේ සහාය ඇතිව, " සිලෝන් කොකනට් " සන්නාමය ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීමට නායකත්වය දීම සහ ඒකාබද්ධ හා උසස් ගෝලීය අනන්‍යතාවයක් සහතික කිරීම සඳහා ජාත්‍යන්තර අලෙවිකරණ ව්‍යාපාර 30ක් සම්බන්ධීකරණය කිරීම.

**සාක්ෂි මත පදනම් වූ නිරීක්ෂණය සහ GIS ඒකාබද්ධ කිරීම**

තීරණ ගැනීම් සිදු කරනු ලබන්නේ ඇස්තමේන්තු මත නොව දත්ත මත පදනම්වය. මේ සඳහා ආයතන වගකිව යුතු කරුණු වන්නේ:

- **තථ්‍ය කාලීන (සිදුවන මොහොතේම) නිරීක්ෂණය**: ගස් ගහනය, ඉඩම් පරිහරණ රටාවන් සහ ක්ෂණික පළිබෝධ අවදානම් හඳුනා ගැනීම සඳහා බහුවිධ මට්ටමේ, GIS පාදක කරගත් නිරීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම.

- **පුරෝකථනය සහ විනිවිදභාවය**: SP&R හි ඉලක්ක නිවැරදිව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා මාසික නිෂ්පාදන පුරෝකථනයන් නිවැරදිව පවත්වා ගැනීම සහ ගොවීන්ගේ ලාභදායීතාවය නිරීක්ෂණය කිරීම.

- **වගවීම**: පවතින බාධාවන් විසඳීමට සහ අගය දාමයේ සෑම සම්බන්ධතාවයකදීම පූර්ණ විනිවිදභාවයක් සහතික කිරීම සඳහා නිතිපතා පාර්ශවකරුවන් රැස් කිරීම.ග

## *රාජ්‍ය අංශයේ ආයතනික ප්‍රතිලාභ: කාර්යක්ෂමතාව සහ බලපෑම*

සම්පත් හෙබි, දත්ත මත පදනම් වූ පරිසරයක් කරා ගමන් කිරීමෙන් රාජ්‍ය ආයතන සහ ව්‍යාප්ති නිලධාරීන්ට අත්වන ප්‍රතිලාභ

- **වැඩිදියුණු කළ** : ඩිජිටල් මෙවලම් සහ GIS වේදිකා මඟින් ව්‍යාප්ති නිලධාරීන්ට අඩු ශ්‍රමයකින් වැඩි ගොවීන් පිරිසකට කාලීන මෙන්ම එම ප්‍රදේශයට ගැලපෙන උපදෙස් ලබා දීමට අවස්ථාව සැලසේ.

- **තහවුරු වූ ප්‍රතිඵල**: වැඩිදියුණු කරන ලද නිරීක්ෂණ පද්ධති මඟින් ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන්ට දත්ත මත පදනම් වූ පැහැදිලි ප්‍රතිඵල පෙන්වීමට රජයේ ආයතනවලට හැකි වේ.

- **ශක්තිමත් වූ ප්‍රජා සබඳතා**: ක්‍රියාශීලී මෙන්ම සාර්ථක ආධාරක පද්ධතියක් මඟින් රාජ්‍ය ආයතන සහ ඔවුන් සේවය කරන ගොවි ජනතාව අතර වඩාත් ගැඹුරු විශ්වාසයක් ගොඩනැගේ.

- **වෘත්තීයභාවය සහ ගෝලීය වෘත්තීය මිණුම් සලකුණු**: GIS පාදක කරගත් නිරීක්ෂණ සහ මහා දත්ත විශ්ලේෂණ වැනි ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුගමනය කිරීමෙන්, ව්‍යාප්ති නිලධාරීන් සහ පර්යේෂකයින් ඔවුන්ගේ සාම්ප්‍රදායික භූමිකාවන්ගෙන් මිදී විශේෂිත "කෘෂි-තාක්ෂණ" වෘත්තිකයන් බවට පරිවර්තනය වේ.

- **වැඩිදියුණු කළ මූල්‍ය තිරසාරභාවය සහ සම්පත් ස්වාධිපත්‍යය:** සෙස් බද්ද සහ ක්ෂේත්‍රයේ අනෙකුත් බදු විනිවිදභාවයකින් යුතුව නැවත ආයෝජනය කිරීම මගින් ස්වයං-තිරසාර මූල්‍ය පරිසර පද්ධතියක් ගොඩනැගීම සුදුසු යැයි SP&R අවධාරණය කරයි. මේ තුළින් රාජ්‍ය ආයතන මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත යැපීමේදී ඇතිවන "අයවැය අවිනිශ්චිතභාවය" අවම වේ. උසස් තාක්ෂණික රසායනාගාර සහ පුහුණු මධ්‍යස්ථාන වැනි තමන්ගේම භෞතික යටිතල පහසුකම් නවීකරණය කිරීම සඳහා කැප වූ අරමුදල් ලබා ගැනීමට මෙමගින් දෙපාර්තමේන්තුවලට අවස්ථාව ලැබෙන අතර, තමන් අධීක්ෂණය කරන පෞද්ගලික වතු මෙන්ම රාජ්‍ය ආයතනද නවීන මට්ටමක පවතින බව සහතික කරයි.
- **උසස් ආයතනික තත්ත්වය සහ මූලෝපායික හවුල්කාරිත්වය:** මූල්‍ය ශක්තිය සහිත හා මනා සම්පත්වලින් සන්නද්ධ රාජ්‍ය අංශයක්, සාම්ප්‍රදායික නියාමකයෙකුගේ සිට අගය දාමයේ ප්‍රධාන මෙහෙයවන්නෙකු දක්වා පරිවර්තනය වේ. උසස් තාක්ෂණික පාලන මධ්‍යස්ථාන සහ ශක්තිමත් අරමුදල් සහිතව, ආයතනවලට මහා පරිමාණ අපනයනකරුවන් සහ ගෝලීය ආයෝජකයින් සමග සම තත්ත්වයේ වෘත්තීය සබඳතා පැවැත්විය හැකි අතර, ඒ සමගම සුළු පරිමාණ වතු හිමියන් වෙත ඍජු සහාය ලබා දිය හැකිය. මෙම වෘත්තීයමය පරිසරය මගින් නිලධාරීන්ට පූර්ණ මට්ටමේ වෙළඳ සමුළු සහ පර්යේෂණ හා සංවර්ධන සහයෝගීතාවයන් මෙහෙයවීමට අවස්ථාව ලැබෙන අතර, එමගින් සමස්ත ඩොලර් බිලියන 2 ක කර්මාන්තය පුරා ගෞරවයට පාත්‍ර වන අත්‍යවශ්‍ය මෙන්ම ඉහළ මට්ටමේ හවුල්කරුවෙකු බවට රාජ්‍ය අංශය පත් වේ.
- **වෘත්තීය ආතතිය අවම වීම සහ පූර්ව-ක්‍රියාකාරී අවදානම් කළමනාකරණය:** දිස්ත්‍රික් මට්ටමේ කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණ හරහා "පසු-ක්‍රියාකාරී" පාලනයේ සිට "පූර්ව-ක්‍රියාකාරී" පාලනයකට මාරුවීම ක්ෂේත්‍ර නිලධාරීන්ගේ වෘත්තීය ආතතිය සැලකිය යුතු ලෙස අඩු කරයි. මහා පරිමාණ පළිබෝධ හානි හෝ දේශගුණික විපත් සිදු වූ පසු ඒවා කළමනාකරණය කරනු වෙනුවට, පුරෝකථන විශ්ලේෂණ සහ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති මගින් නිලධාරීන් සවිබල ගැන්වේ. මෙයින් වඩාත් තෘප්තිමත් සේවා පරිසරයක් නිර්මාණය වන අතර, එහිදී සාර්ථකත්වය මනිනු ලබන්නේ අර්බුද කළමනාකරණය කිරීමේ වෙහෙස මහන්සියෙන් නොව, අර්බුද කලින් වළක්වා ගැනීම මගිනි.

## 5.8 යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග - මූල්‍ය ආයතන සහ ආයෝජකයින්

මූල්‍ය ආයතන සහ ආයෝජකයින් යනු පොල් ක්ෂේත්‍රය නවීකරණය කිරීමේ කාර්යයේ ප්‍රධාන බලවේගයන් ලෙස සැලකිය හැක. මහා පරිමාණයෙන් නැවත වගා කිරීම්, තාක්ෂණය වැළඳ ගැනීම සහ ඉහළ අගයක් එකතු කළ සැකසුම් කර්මාන්ත කරා පරිවර්තනය වීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය මුදා හැරීම ඔවුන් සතු වගකීමකි. SP&R රාමුව යටතේ, ඔවුන් සාම්ප්‍රදායික ණය දීමේ ක්‍රමවේදවලින් ඔබ්බට ගොස් වඩාත් සංකීර්ණ, ප්‍රවේශ විය හැකි, දැරිය හැකි මෙන්ම ක්ෂේත්‍රයට ආවේණික වූ මූල්‍ය විසඳුම් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### *බහුවාර්ෂික වර්ධනය සඳහා ගැලපෙන මූල්‍යකරණය*

පොල් වගාව යනු දිගුකාලීන කැපවීමක් අවශ්‍ය වන කාර්යයක් වන බැවින් ප්‍රාග්ධන සපයන්නන්ගෙන්ද ඒ සඳහා ඉවසීමක් අවශ්‍ය වේ. මේ සඳහා මූල්‍ය ආයතන වෙත පැවරී ඇති කාර්යයන් පහත පරිදි වේ:

- **විශේෂයෙන් සකසන ලද ණය වැඩසටහන්:** නව පොල් වගාවන්ගෙන් අස්වැන්න ලැබීමට ගතවන වසර 5-7 ක කාලසීමාවට ගැළපෙන පරිදි, දිගුකාලීන ණය සහ සහන කාලසීමාවන් සහිත ණය ක්‍රමවේදයන් සකස් කිරීම.

- **මිශ්‍ර මූල්‍ය යාන්ත්‍රණ**: හෙක්ටයාර 200,000 ක වගාබිම් සංවර්ධනය කිරීමට සහ නව අගය එකතු කිරීමේ මධ්‍යස්ථාන ඇති කිරීමට සහාය වීම සඳහා, පෞද්ගලික ප්‍රාග්ධනය වෙළඳපොළ-තරගකාරී අරමුදල් සමඟ ඒකාබද්ධ කරන ක්‍රමවේදයන් නිර්මාණය කිරීම.

- **සුළු පරිමාණ වතු හිමියන් සවිබල ගැන්වීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය**: ව්‍යාප්ති සේවාවන් හා සම්බන්ධ වෙමින් සහනදායී මූල්‍ය යෝජනා ක්‍රම ආරම්භ කිරීම. ඉලක්කගත අරමුදල් සැපයීම නවීන කෘෂිකාර්මික භාවිතයන් පිළිබඳ පුහුණුව සමඟ ඒකාබද්ධ කිරීම මඟින්, සුළු පරිමාණ පොල් වගාවේ සහ නිෂ්පාදනයේ උපරිම විභවය මුදා හැරීමට මෙම මූලපිරීම් සමත් වනු ඇත.

- **තාක්ෂණයට විශේෂිත වූ පහසුකම්**: දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීම සඳහා අත්‍යවශ්‍ය වන ක්ෂුද්‍ර ජල සම්පාදනය, දියර පොහොර සහ සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන යාන්ත්‍රිකකරණය ඇතුළු ඉහළ බලපෑමක් සහිත තාක්ෂණයන් සඳහා සුවිශේෂී ණය පහසුකම් සැපයීම.

**අගය දාමයේ අවදානම් අවම කිරීම**

පුළුල් සහභාගීත්වයක් දිරිගැන්වීම සහ බාහිර බලපෑම්වලින් ආයෝජන ආරක්ෂා කිරීම සඳහා මූල්‍ය ආයතන සහ ආයෝජකයින් විසින් පහත සඳහන් කරුණුවලට ප්‍රමුඛතාවය දෙනු ඇත:

- **අවදානම් අවම කිරීමේ ක්‍රමවේද**: නියඟය, පළිබෝධ හානි සහ වෙළඳපොළ අස්ථාවරත්වයට එරෙහිව ණය දෙන්නා සහ ණය ගන්නා යන දෙපාර්ශවයම ආරක්ෂා කිරීම සඳහා කාලගුණ දර්ශක පාදක කරගත් රක්ෂණ සහ බෝග රක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වා දීම.

- **විකල්ප ණය ලකුණු කිරීමේ ක්‍රමවේද** : සාම්ප්‍රදායික ඉඩම් ඇපකර මත පමණක් දැඩි ලෙස යැපීම අවම කිරීම සඳහා, ගොවිපළ කළමනාකරණ යෙදවුම් සහ නිෂ්පාදන ප්‍රභවය සොයාගැනීමේ පද්ධති මඟින් ලබාගන්නා ඩිජිටල් දත්ත උපයෝගී කරගනිමින් ණය සුදුසුකම් ඇගයීමට ලක් කිරීම.

- **ගබඩා ලේඛණ ආශ්‍රිත මූල්‍යකරණය**: සැකසුම්කරුවන්ට සහ එකතු කරන්නන්ට තමන් සතු තොගය ඇපයක් ලෙස භාවිත කිරීමට ඉඩ සලසන පද්ධති ක්‍රියාත්මක කිරීම, එමඟින් සැපයුම් දාමය පුරා ද්‍රවශීලතාව වැඩිදියුණු කිරීම.

**සියලු දෙනා ඇතුළත් වන පරිදි ප්‍රජාව වෙත ළඟාවීම සහ ඩිජිටල් ඒකාබද්ධතාවය**

නවීන මූල්‍ය පහසුකම් බිම් මට්ටමට ප්‍රවේශ විය හැකි පරිදි සකස් විය යුතුය. මේ සඳහා මූල්‍ය ආයතනවලින් පහත දෑ අපේක්ෂා කෙරේ:

- **ක්‍රියාවලීන් සරල කිරීම**: සුළු පරිමාණ වතු හිමියන්ගේ සහභාගීත්වය දිරිගැන්වීම සඳහා ණය අයදුම් කිරීමේ ක්‍රියාවලීන් විධිමත් කිරීම සහ රාජ්‍ය තාන්ත්‍රික කොන්දේසි අවම කිරීම.

- **ඩිජිටල් මූල්‍යකරණය ව්‍යාප්ත කිරීම**: අඩු පහසුකම් සහිත ග්‍රාමීය ප්‍රදේශවල මූල්‍ය ආවරණය ඉහළ නැංවීම සඳහා ජංගම දුරකථන බැංකුකරණය සහ ඩිජිටල් පසුම්බි භාවිත කිරීම.

- **සහයෝගීතා නිරීක්ෂණය**: ණය ලබා ගැනීමේ ප්‍රවණතා පිළිබඳ දත්ත බෙදා ගැනීමට සහ මූල්‍ය බාධාවන් තථ්‍ය කාලීනව හඳුනා ගැනීමට රාජ්‍ය-පෞද්ගලික සම්බන්ධීකරණ වේදිකාවලට දායක වීම.

### *මූල්‍ය ආයතන සහ ආයෝජකයින් සඳහා වන මූලෝපායික ප්‍රතිලාභ*

පොල් ක්ෂේත්‍රයේ පරිවර්තනය සඳහා ආයෝජනය කිරීම හුදෙක් සංවර්ධන ඉලක්කයක් පමණක් නොවේ; එය සැලකිය යුතු වාණිජමය අවස්ථාවක් ද වේ:

- **හරිත ආයෝජන කළඹේ වර්ධනය**: පොල් කර්මාන්තය හරිත මූල්‍යකරණය සහ ESG (පරිසර, සමාජ සහ පාලන) අනුකූල ආයෝජන සඳහා ඉහළ විභවයක් ලබා දෙන අතර, එමගින් බැංකුවලට ජාත්‍යන්තර තිරසාරත්ව නියමයන් සපුරාලීමට අවස්ථාව ලැබේ.

- **ඉහළ අස්වැන්නක් සහිත අවස්ථාවන්**: මෙම ක්ෂේත්‍රය සක්‍රීය කාබන් සහ පෝෂණ ඖෂධ වැනි ඉහළ අගයක් එකතු කළ නිෂ්පාදන කරා යොමු වීමත් සමඟ, ශක්තිමත් ගෝලීය ඉල්ලුමක් ඇති, වේගයෙන් වර්ධනය වන කාර්මික අංශයන් වෙත ප්‍රවේශ වීමට ආයෝජකයින්ට අවස්ථාව ලැබේ.

- **යහපත් මූල්‍ය කළඹ**: රක්ෂණ සහ අවදානම් හුවමාරු ආකෘති භාවිත කිරීම නිසා, සාම්ප්‍රදායික කෘෂිකාර්මික ණය දීම්වලට සාපේක්ෂව ඉහළ ණය පියවීමේ ප්‍රතිශතයක් සහ අඩු අක්‍රිය ණය අනුපාතයක් පවත්වා ගත හැකිය.

- **ග්‍රාමීය වෙළඳපොළ ආක්‍රමණය**: පොල් ක්ෂේත්‍රය සඳහා විශේෂිත නිෂ්පාදන සංවර්ධනය කිරීම මගින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හදවත බඳු ප්‍රදේශවල විශ්වාසවන්ත සහ වර්ධනය වන පාරිභෝගික පදනමක් තමන් සතු කර ගැනීමට මූල්‍ය ආයතනවලට අවස්ථාව සැලසේ.

## 5.9 යෝජිත ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ග - විද්වත් ප්‍රජාව සහ සංවර්ධන හවුල්කරුවන්

විද්වත් ප්‍රජාව සහ සංවර්ධන හවුල්කරුවන් යනු පොල් ක්ෂේත්‍රයේ ප්‍රධාන දැනුම උත්පාදනය කරන්නන්, නවෝත්පාදන සඳහා උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියා කරන්නන් සහ ධාරිතා වර්ධන නියෝජිතයන් වේ. SP&R රාමුව යටතේ, කර්මාන්තයේ පරිවර්තනය සාක්ෂි මත පදනම් වූ, තාක්ෂණිකව දියුණු සහ ගෝලීය යහ පරිචයන් සමඟ අනුකූල වන බව සහතික කිරීමට ඔවුන්ගේ දායකත්වය ඉවහල් වේ.

### *විද්‍යාත්මක පදනමක් සහිත තාක්ෂණික සහයෝගීතාවය සහ සංවර්ධන හවුල්කාරිත්වය*

සාම්ප්‍රදායික ක්‍රමවේදවලින් ඔබ්බට ක්ෂේත්‍රය ගෙන යාම සඳහා, විද්වත් සහ සංවර්ධන හවුල්කරුවන්ට පැවරී ඇති කාර්යයන් පහත පරිදි වේ:

- **වගා ආකෘති දියුණු කිරීම**: කෘෂි වන වගාව, ඒකාබද්ධ සත්ව පාලන පද්ධති සහ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන නිෂ්පාදන ක්‍රියාවලීන් ඇතුළු වගා ආකෘති සංවර්ධනය කිරීම, පරීක්ෂා කිරීම සහ වලංගු කිරීම සඳහා තාක්ෂණික විශේෂඥතාව ලබා දීම.

- **ආර්ථික හා සමාජීය වලංගුතාවය**: නව ආකෘති විද්‍යාත්මකව නිවැරදි වනවා පමණක් නොව, සුළු පරිමාණ වතු හිමියන් සහ වතු සමාගම් යන දෙපාර්ශවයටම ආර්ථික වශයෙන් වාසිදායක සහ සමාජීය වශයෙන් පිළිගත හැකි ඒවා බව සහතික කිරීම.

- **තාක්ෂණික නවෝත්පාදනය**: නිෂ්පාදන පිරිවැය විශාල ලෙස අඩු කිරීම සඳහා පසෙහි සාරවත් බව, ඩිජිටල් කෘෂිකර්මය, නිරවද්‍ය යාන්ත්‍රිකරණය සහ අස්වනු නෙළීමෙන් පසු පරිහරණය යන අංශවල නව සොයාගැනීම් යෝජනා කිරීම සහ පරීක්ෂා කිරීම.

**පර්යේෂණ සහ ආදර්ශ ගොවිපළ ව්‍යාප්ත කිරීම**

පර්යේෂණ මට්ටමේ පවතින ආකෘති ප්‍රායෝගික ක්ෂේත්‍රය වෙත ගෙන යාම සඳහා මෙම හවුල්කරුවන් පහත පරිදි කටයුතු කරයි

- **ගොවිපළ ආදර්ශ ආකෘති ලේඛනගත කිරීම**: ආදර්ශ මධ්‍යස්ථාන පිහිටුවීමට සහාය වීම සහ හැසිරීම් වෙනස් කිරීමේ මැදිහත්වීම් මෙන්ම තාක්ෂණය වැළඳ ගැනීමේ ප්‍රතිඵල ක්‍රමවත්ව ලේඛනගත කිරීම.

- **උසස් විශ්ලේෂණ සහ GIS**: නිවැරදි අවදානම් සිතියම්ගත කිරීම, ඉඩම් පරිහරණ සැලසුම්කරණය සහ නිෂ්පාදන පුරෝකථනය සඳහා ඉහළ මට්ටමේ දත්ත විශ්ලේෂණ සහ **GIS පාදක ඇගයීම් භාවිත කිරීම.** මෙමගින් නිෂ්පාදන ක්‍රියාවලිය පුරාම නිෂ්පාදන ප්‍රභවය සොයාගත හැකි වීම වැඩි දියුණු වන අතර, එමගින් නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කෙරේ. තවද, මෙය සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීමට සහ තිරසාරභාවය, ආරක්ෂාව සහ ගුණාත්මකභාවය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් පවත්වා ගැනීමට සහාය වේ.

- **පර්යේෂණ හා සංවර්ධනය වේගවත් කිරීම**: ඉහළ අස්වැන්නක් සහිත, නියඟයට ඔරොත්තු දෙන පොල් ප්‍රභේද සංවර්ධනය කිරීම වේගවත් කරන උසස් විද්‍යාත්මක සාක්ෂි ජනනය කිරීම සඳහා රජයේ පර්යේෂණ ආයතන සමග හවුලේ කටයුතු කිරීම.

- **සමාජ-ආර්ථික බලපෑම් වලංගු භාවයට පත්කිරීම**: ගොවීන්ගේ ශුද්ධ ලාභයේ සැබෑ වැඩිවීම (අපේක්ෂිත 47.6% ක වර්ධනය) සහ පවුල් ඒකකවල ඔරොත්තු දීමේ හැකියාව මැන බැලීම සඳහා දීර්ඝකාලීන අධ්‍යයනයන් පැවැත්වීම සහ ආයෝජනය මත ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ නිවැරදි සාක්ෂි සැපයීම.

- **ප්‍රමිතිකරණය සහ තාක්ෂණ හුවමාරු මෙවලම්**: සාර්ථක ගොවිපළ ආකෘති මත පදනම්ව සරල, පියවරෙන් පියවර උපදෙස් ඇතුළත් තාක්ෂණික අත්පොත් සහ ඩිජිටල් සැලසුම් සකස් කිරීම.

**ධාරිතා වර්ධනය සහ දැනුම හුවමාරු කිරීම**

අගය දාමයේ සෑම සාධකයක්ම අනාගතයට සූදානම් බව සහතික කිරීම සඳහා පහත දෑ අවශ්‍ය වේ:

- **තාක්ෂණික පුහුණුව**: නව තාක්ෂණයන්, ජාත්‍යන්තර ගුණාත්මක ප්‍රමිතීන් සහ නැගී එන වෙළඳපොළ අවශ්‍යතා පිළිබඳව ගොවීන්, සැකසුම්කරුවන් සහ අපනයනකරුවන් පුහුණු කිරීමේදී නායකත්වය දීම.

- **අනුවර්තන කළමනාකරණ සහාය**: ප්‍රතිඵල නිරීක්ෂණය කිරීමට සහ ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීමට අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දීම සඳහා SP&R සම්බන්ධීකරණ යාන්ත්‍රණයන්ට සක්‍රියව දායක වීම.

- **දැනුම පිළිබඳ නායකත්වය**: ක්ෂේත්‍රය තුළ සිදු කරන මැදිහත්වීම් තිරසාර, ව්‍යාප්ත කළ හැකි සහ සියල්ලන් ඇතුළත් කරගන්නා සුළු ඒවා බව සහතික කිරීම සඳහා නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම සහ තොරතුරු පරතරය අවම කිරීම.

- **ආයතනික වශයෙන් ශක්තිමත් කිරීම (පුහුණුකරුවන් පුහුණු කිරීම)**: රජයේ නිලධාරීන් සහ ප්‍රමුඛ පෙළේ ගොවීන් සහතික ලත් ප්‍රධාන පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමෙන් ජාතික ව්‍යාප්ති පද්ධතිය සවිබල ගැන්වීම. මෙමගින් නිරවද්‍ය වාරි පද්ධති සහ ප්‍රවේණික තේරීම් වැනි සංකීර්ණ තාක්ෂණික දැනුම විමධ්‍යගත වන අතර, ව්‍යාපෘති අවසන් වූ පසුව පවා ගම් මට්ටමින් එම දැනුම පවතින බව සහතික කෙරේ.

- **තරුණ සහ වෘත්තීය ඒකාබද්ධතාවය**: තරුණ දක්ෂයින් පොල් ක්ෂේත්‍රයට ආකර්ෂණය කර ගැනීම සඳහා වෘත්තීය ආයතන සහ විශ්වවිද්‍යාල සමග එක්ව විශේෂිත විෂය මාලා සහ සීමාවාසික වැඩසටහන් සකස් කිරීම. "සිලෝන් කොකනට්" ක්ෂේත්‍රය ඉහළ තාක්ෂණික සහ ලාභදායී වෘත්තීය මාවතක් ලෙස හඳුන්වා දීමෙන්, 2035 දක්වා කර්මාන්තය පවත්වා ගැනීමට අවශ්‍ය දක්ෂ කළමනාකරුවන්, ඩිජිටල් කෘෂි විද්‍යාඥයින් සහ අගය එකතු කිරීමේ විශේෂඥයින්ගේ නිරන්තර සැපයුමක් විද්වත් ප්‍රජාව විසින් සහතික කරනු ලබයි.

### *විද්වත් ප්‍රජාව සහ සංවර්ධන හවුල්කරුවන් සඳහා වන උපායමාර්ගික ප්‍රතිලාභ*

SP&R මඟින් පර්යේෂකයන්ට සහ ජාත්‍යන්තර හවුල්කරුවන්ට ඉහළ සාර්ථකත්වයක් අත්කර ගත හැකි සක්‍රීය වටපිටාවක් නිර්මාණය කර දෙන අතර, ඒ ඔස්සේ පහත ප්‍රතිලාභ හිමි කර දෙයි:

- **ප්‍රායෝගික පර්යේෂණ අවස්ථා:** පුළුල් ක්ෂේත්‍ර දත්ත ජාලයකට සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් වෙත සෘජුව ප්‍රවේශ වීමේ අවස්ථාව ලැබීම. මේ හරහා සැබෑ ලෝකයේ ගැටලුවලට ප්‍රායෝගික විසඳුම් සෙවීමටත්, ඒවා පරීක්ෂා කර බලා මහා පරිමාණයෙන් ක්‍රියාත්මක කිරීමටත් අවකාශ සැලසේ.

- **බුද්ධිමය දේපළ සහ නවෝත්පාදන නායකත්වය:** පොල් ආශ්‍රිත නව අතිරේක පෝෂක ප්‍රතිලාභ, උසස් ජෛව පළිබෝධනාශක හෝ සුවිශේෂී ඩිජිටල් රෝග විනිශ්චය මෙවලම් වැනි සුවිශේෂී තාක්ෂණයන් ඒකාබද්ධව සංවර්ධනය කරමින් නව නිපැයුම්කරණයේ පෙරමුණ ගැනීමට ඇති අවස්ථා.

- **ගෝලීය පිළිගැනීම සහ අරමුදල්:** මෙම කෘෂිකාර්මික පරිවර්තනය ගෝලීය සිද්ධි අධ්‍යනයක් බවට පත්වීමත් සමඟ, ජාත්‍යන්තර පර්යේෂණ ආධාර ලබා ගැනීමට සහ ලෝක බැංකුව, FAO, IFAD වැනි ගෝලීය ආයතන සමඟ ඒකාබද්ධ ව්‍යාපෘති සඳහා ඇති අවස්ථා පුළුල් වීම.

- **රාජ්‍ය ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීමේ හැකියාව:** රජයේ ඉහළ පෙළේ සාකච්ඡාමය වේදිකාවලට සක්‍රියව දායක වෙමින්, ජාතික සංවර්ධන ඉලක්කයන් කෙරෙහි සෘජු බලපෑමක් ඇති කිරීමට සහ දත්ත හා සාක්ෂි මත පදනම් වූ සාර්ථක රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට මඟ පෙන්වීමේ හැකියාව.

- **ශක්තිමත් කර්මාන්ත සන්ධාන:** පෞද්ගලික අංශය සහ රාජ්‍ය ආයතන සමඟ පවත්වන සාර්ථක මෙන්ම කැපී පෙනෙන හවුල්කාරිත්වයන් ඔස්සේ ආයතනික ගෞරවය, පිළිගැනීම සහ ස්ථාවරත්වය තවදුරටත් ඉහළ නැංවීමට ඇති හැකියාව.

- දීර්ඝකාලීන ආයතනික ඔරොත්තුදීමේ හැකියාව සහ: SP&R වැඩපිළිවෙළ සමඟ අත්වැල් බැඳගැනීම තුළින්, සංවර්ධන හවුල්කරුවන්ට තමන් ක්‍රියාවට නංවන දේශීය ව්‍යාපෘති, රජයේ පූර්ණ අනුමැතිය සහ ප්‍රමුඛතාව හිමි ජාතික මාර්ග සිතියමක් සමඟ මනාව බද්ධ කිරීමේ අවස්ථාව උදාවේ. මෙම අන්‍යෝන්‍ය සහයෝගීතාවය හේතුවෙන් ඔවුන්ගේ මැදිහත්වීම් හුදෙකලා ව්‍යාපෘති බවට පත් නොවී, දීර්ඝකාලීන මෙන්ම ස්වයං-තිරසාර පරිසර සමඟ බද්ධ වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, මූලික අරමුදල් සපයන කාලසීමාව අවසන් වූ පසුව ද මැනිය හැකි සමාජීය හා ආර්ථිකමය ප්‍රතිලාභ අඛණ්ඩව ජනනය කිරීමට මෙම ව්‍යාපෘතිවලට හැකියාව ලැබෙනු ඇත.

# 6 ක්‍රියාත්මක කිරීම / සම්බන්ධීකරණය / පාලන යාන්ත්‍රණය (ප්‍රතිපෝෂණ පද්ධති)

## 6.1 හැඳින්වීම

උපායමාර්ගික සැලැස්මක් සහ මාර්ග සිතියමක් මඟින් අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමේදී, එහි ප්‍රගතිය බාධාවකින් තොරව නිරීක්ෂණය කිරීම සහ පහසුවෙන් සොයා බැලීම සඳහා මනාව ව්‍යුහගත කරන ලද ක්‍රියාත්මක කිරීමේ හා අධීක්ෂණ පද්ධතියක් අත්‍යවශ්‍ය වේ. නිතිපතා සිදු කෙරෙන ප්‍රගති සමාලෝචන මඟින්, සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ඇති වන බාධා හඳුනා ගැනීමට සහ ඒවා මඟහරවා ගැනීමට අවශ්‍ය නිවැරදි කිරීමේ පියවර ගැනීමට මඟ පෑදෙන අතරම, සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම, අධීක්ෂණය සහ ඇගයීම සඳහා පැහැදිලි ක්‍රියාවලියක් ද සකස් කර දෙයි. එබැවින්,

මෙම පරිච්ඡේදය මගින් යෝජිත SP&R (2026-2035) ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය සහ එහි අධීක්ෂණ හා ඇගයීම් ක්‍රියාදාමය පිළිබඳව විස්තර කෙරේ.

ජාතික වැවිලි ප්‍රතිපත්තියට අනුව, ශ්‍රී ලංකාව තුළ 'ජාතික වැවිලි ප්‍රතිපත්තිය (NPP) 2025' ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අධීක්ෂණ වගකීම පැවරෙන්නේ වැවිලි කර්මාන්ත සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය වෙතය. මනාව සංවිධානය වූ ආයතනික ව්‍යුහයක් මගින් මෙම ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා පූර්ණ සහයෝගය ලබා දෙයි.

වැවිලි ක්ෂේත්‍රය යනු සාම්ප්‍රදායික ත්‍රිත්ව භෝග වන තේ, රබර් සහ පොල් පමණක් නොව කජු, කිතුල්, තල් සහ අනෙකුත් අපනයන ඉලක්ක කරගත් කෘෂිකාර්මික නිෂ්පාදන ද ඇතුළත් වන පුළුල් ක්ෂේත්‍රයකි. ප්‍රතිපත්තිමය විධිවිධාන උපරිම අයුරින් සහ වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා, මෙම අමාත්‍යාංශය අදාළ සියලුම රාජ්‍ය ආයතනවල කළමනාකාරිත්වය සමඟ සමීපව කටයුතු කරයි. NPP 2025 මගින්, අදාළ අංශ තුළ යහ පරිචයන් නියාමනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම උදෙසා වගාකරුවන් සහ කර්මාන්තයට විශේෂිත වූ ආයතන සතු තීරණාත්මක කාර්යභාරය, ක්‍රියාත්මක කිරීමේ ව්‍යුහයේ දෙවැනි ස්ථරය ලෙස පිළිගනී. මීට අමතරව, ශ්‍රී ලංකාවේ වැවිලි ප්‍රතිපත්තියේ සමස්ත සාර්ථකත්වය ඉහළ නැංවීම සඳහා සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ ඇගයීම ශක්තිමත් වන අයුරින් මෙම ආයතනික ව්‍යුහය සැලසුම් කිරීමේ වැදගත්කම ද NPP 2025 තුළ අවධාරණය කර ඇත. එමෙන්ම, මෙම ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා, ජාත්‍යන්තර විශේෂඥ දැනුම, අරමුදල් සහ හොඳම ගෝලීය යහ පරිචයන් ලබා ගැනීමේ අරමුණින් ජාත්‍යන්තර සංවිධාන සහ කාර්මික අංශය සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම ද මීට ඇතුළත් වේ.

ශ්‍රී ලංකාවේ පොල් ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන පුළුල් ආයතනික ව්‍යුහයක සහයෝගය හිමිවේ. වැවිලි කර්මාන්ත සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පොල් ක්ෂේත්‍රය පාලනය වන ප්‍රධාන ආයතන පහත රූප සටහනින් දැක්වේ. මෙම ආයතන ක්‍රියාත්මක වන්නේ ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සමස්ත ක්ෂේත්‍රයේ සම්බන්ධීකරණය භාරව කටයුතු කරන MPCI හි උපායමාර්ගික මඟපෙන්වීම යටතේය. එහිදී පොල් සංවර්ධන අධිකාරිය (CDA), පොල් වගා කිරීමේ මණ්ඩලය (CCB) සහ පොල් පර්යේෂණ ආයතනය (CRI) වැනි ප්‍රධාන ආයතන සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකා පොල් කර්මාන්ත මණ්ඩලය යනු ඇපයෙන් සීමිත සමාගමක් වන අතර, එහි කොටස් හිමියන් නියෝජනය කරන්නේ පොල් කර්මාන්තයේ විවිධ අංශවලට අයත් සංගම්ය. ඔවුන් පොල් කර්මාන්තයේ දියුණුව වෙනුවෙන් රජය සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කරයි. මීට අමතරව, MPCI අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය වැවිලි සමාගම් දෙකක් පවතී (හලාවත වැවිලි සමාගම සහ කුරුණෑගල වැවිලි සමාගම).


මීට අමතරව, අපනයන ප්‍රවර්ධනය, කාර්මික වර්ධනය සහ වෙළෙඳපොළ පහසුකම් සැලසීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය, කර්මාන්ත අමාත්‍යාංශය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය ද සිය දායකත්වය සපයයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සහ කාර්මික තාක්ෂණ ආයතනය මඟින් පොල් ක්ෂේත්‍රයට අදාළ සේවාවන් සපයනු ලබයි. ශාක නිරෝධායනය, පොහොර ආනයනය, පාරිසරික සහතිකකරණය, නිෂ්පාදන සහ තාක්ෂණික ප්‍රමිතීන්, ආහාර සුරක්ෂිතතාව සහ පර්යේෂණ සහයෝගීතාව ඒ අතර වේ. ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ ඵලදායිතාව ඉහළ නැංවීමට, අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට සහ සමස්ත ක්ෂේත්‍රයේ වර්ධනය හා ගෝලීය තරඟකාරිත්වය ශක්තිමත් කිරීමට මෙම ආයතන සියල්ලම එකිනෙකාට අත්වැලක් වෙමින් සුවිශාල දායකත්වයක් සපයයි.

වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය NPP 2025 මඟින් ප්‍රධාන ක්ෂේත්‍ර අටක් (8) ඔස්සේ දක්වා ඇත: (i) භෝග නිෂ්පාදනය සහ සම්පත් කළමනාකරණය, (ii) පර්යේෂණ

හා සංවර්ධන, (iii) අගය දාම සංවර්ධනය සහ අගය එකතු කිරීම, (iv) අලෙවිකරණය, වෙළෙඳාම සහ ව්‍යවසායකත්ව සංවර්ධනය, (v) දේශගුණික ඔරොත්තුදීමේ හැකියාව සහ අවදානම් අවම කිරීම, (vi) පාර්ශවකරුවන් සවිබල ගැන්වීම, (vii) වෘත්තීය සෞඛ්‍යය හා සමාජ ආරක්ෂණය, සහ (viii) ප්‍රතිපත්ති සහ පාලනය. ශ්‍රී ලංකා පොල් කර්මාන්තය සඳහා වන උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම (2026-2035) ද NPP 2025 හි තේමාත්මක ක්ෂේත්‍රයන් සමඟ මනාව ගැලපෙන පරිදි ක්‍රියාවට නැංවිය යුතු කාර්යයන් සහ ක්‍රියාකාරකම් මැනවින් දක්වා ඇත.

දැනට පවතින ආයතනික ව්‍යුහය සහ ක්‍රියාවට නැංවීමේ යාන්ත්‍රණය සඳහා NPP 2025 හි ඇතුළත් විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා පොල් කර්මාන්තය සඳහා වන SP&R (2026-2035) හි සමස්ත ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම උදෙසා පහත සඳහන් විධිවිධානයන් යෝජනා කරනු ලැබේ.

. *රූපය 14 - පොල් ක්ෂේත්‍රයට අදාල ආයතනික රාමුව*



## 6.7 උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය

උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියමෙහි ඇතුළත් ක්‍රියාකාරකම්, එම සැලැස්ම මඟින් පවරා ඇති වගකීම් සහ විධිවිධානවලට අනුකූලව අදාළ ආයතන විසින් ඉටු කරනු ලබයි. මෙම ක්‍රියාමාර්ග අදාළ ආයතනවල වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්වලට ද ඇතුළත් කෙරෙනු ඇත. මීට අමතරව, ප්‍රධාන තේමා අට යටතේ හඳුනාගෙන ඇති ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සම්පත් ඒකරාශි කිරීමේ වගකීම් ද මෙහි පැහැදිලිව දක්වා ඇත. මෙම සමස්ත ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම, සම්බන්ධීකරණය, නිරීක්ෂණය සහ ඇගයීම සම්බන්ධයෙන් වගකීම දරන ප්‍රධානතම ආයතනය ලෙස වැවිලි කර්මාන්ත සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය කටයුතු කරයි. එහිදී අමාත්‍යාංශයේ පොල් සංවර්ධන අංශය මෙහි ප්‍රධාන සම්බන්ධීකරණ මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කරයි. මෙම ක්‍රියාවට නැංවීමේ, අධීක්ෂණය කිරීමේ සහ ඇගයීමේ කටයුතු පහසු කිරීම සඳහා මෙහෙයුම් කමිටුවක් පිහිටුවනු ලබන අතර, එහි සභාපතිත්වය දරනු ලබන්නේ වැවිලි කර්මාන්ත සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම්වරයාය. ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම සඳහා වන ව්‍යුහය පහත රූප සටහනින් දැක්වේ.

යෝජිත මෙහෙයුම් කමිටුවේ ව්‍යුහය සහ සාමාජිකත්වය පහත පරිදි වේ:

අ) අතිරේක ලේකම්, වැවිලි කර්මාන්ත සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය.

ආ) උපායමාර්ගික සැලැස්මේ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම භාර ප්‍රධාන ආයතන වන පොල් සංවර්ධන අධිකාරිය, පොල් පර්යේෂණ ආයතනය, පොල් වගා කිරීමේ මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය සහ කර්මාන්ත අමාත්‍යාංශය යන ආයතනවල ඉහළ නිලධාරීන්.

ඇ) ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන්ගේ නියෝජනය (ශ්‍රී ලංකා පොල් කර්මාන්ත මණ්ඩලය: මෙයට විවිධ පාර්ශවකරුවන් නියෝජනය කරමින් වගාකරුවන්ගේ සංගම් (වතු අංශය), මද ආශ්‍රිත නිෂ්පාදන (පොල් කිරි, පොල් තෙල්, දිසිදි පොල්) සහ මද නොවන ආශ්‍රිත නිෂ්පාදන (කොහු, නිමි කොහු නිෂ්පාදන, කටු ආශ්‍රිත නිෂ්පාදන සහ පොල් වතුර) ඇතුළත් වේ).

ඈ) ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු.

ඉ) අදාළ විෂය පථයන් පිළිබඳව පිළිගත් විශේෂඥයින්.

ඊ) අදාළ සුවිශේෂී ක්ෂේත්‍රවලට සම්බන්ධ ජාත්‍යන්තර සංවිධාන (මූල්‍ය ප්‍රතිපාදන සහ තාක්ෂණික සහාය ලබා දෙන).

උ) පෞද්ගලික අංශයේ නියෝජනය (රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සහ බැංකු ක්ෂේත්‍රය).

ඌ) අවශ්‍යතාවය පරිදි සම්බන්ධ කරගනු ලබන අනෙකුත් රාජ්‍ය ආයතන.


එ) එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය සහ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.

මෙහිදී මෙහෙයුම් කමිටුවේ සභාපතිවරයා ඇතුළු 'අ' සිට 'ඈ' දක්වා දක්වා ඇති නියෝජිතයන් හට, අවශ්‍යතාවය පරිදි 'ඉ' සිට 'ඌ' දක්වා දක්වා ඇති සාමාජිකයන්ව කමිටුව වෙත ආරාධනා කිරීමට තීරණය කළ හැකිය.

මෙම මෙහෙයුම් කමිටුවේ ප්‍රධාන කාර්යභාරයන් පහත පරිදි වේ:

1. කමිටුව වරින් වර (සෑම කාර්තුවකටම වරක්) රැස්වී, අදාළ තේමාත්මක ක්ෂේත්‍ර යටතේ උපායමාර්ගික සැලැස්මේ ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම.
2. අදාළ ආයතන හෝ රේඛීය ආයතන හරහා උපායමාර්ගික සැලැස්මේ ක්‍රියාවලිය බාධාවකින් තොරව කරගෙන යාමට ඇති වන ගැටලු හෝ බාධා හඳුනා ගැනීම සහ ඒවා මඟහරවා ගැනීමට අවශ්‍ය මඟපෙන්වීම් සහ සහයෝගය ලබා දීම.
3. උපායමාර්ගික සැලැස්මෙහි අඩංගු ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමට සම්පත් හිඟයක් පවතින ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය සම්පත් ඒකරාශි කිරීමට මඟපෙන්වීම.
4. උපායමාර්ගික සැලැස්මෙහි දැනට සඳහන් කර ඇති ප්‍රතිපත්තිවලට වඩා වෙනස් වූ, අලුතින් මතුවන තීරණාත්මක ගැටලු හඳුනා ගනිමින් ඒ සඳහා අවශ්‍ය නව ප්‍රතිපත්ති, රෙගුලාසි හෝ ව්‍යවස්ථාදායක ප්‍රවේශයන් මොනවාදැයි හඳුනා ගැනීම.
5. සෑම වසරක් අවසානයේදීම ලබා ඇති ප්‍රගතිය පිළිබඳව පුළුල් වාර්ෂික සමාලෝචනයක් සිදු කිරීම සහ ඉදිරි වර්ෂය සඳහා වන සැලැස්ම අනුමත කිරීම.
6. සැලැස්ම ක්‍රියාත්මක කර වසර පහකට පසු (එනම් 2030 වසරේදී) උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියමෙහි සමස්ත ප්‍රගතිය පිළිබඳව මධ්‍යකාලීන සමාලෝචනයක් සිදු කිරීම.

*රූපය 15 - ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය, සහ අධීක්ෂණය හා ඇගයීම පිළිබඳ ක්‍රමානුකූල නිරූපණය*



[1] කුඩා පරිමාණ වතු හිමියන්, සුවිශේෂී නිෂ්පාදන කණ්ඩායම් (අත්කම් නිර්මාණ, අලුත් පොල් අපනයනකරුවන්, තෙලිජ්ජ ආශ්‍රිත නිෂ්පාදන, විනාකිරි නිෂ්පාදකයන් සහ පාරිභෝගිකයන්) වැනි සංවිධානය නොවූ අංශ මෙහි නියෝජනය නොවීමට ඉඩ ඇත. එබැවින්, අවශ්‍ය අවස්ථාවලදී ඔවුන්ගේ නියෝජනය සහතික කිරීම සඳහා පියවර ගත යුතුය. උදාහරණයක් ලෙස, සිල්ලර වෙළෙඳපොළෙහි පොල් මිල සීඝ්‍රයෙන් ඉහළ යාම පිළිබඳව ගෘහණියන්ගේ සංගම් නිරන්තරයෙන් සිය අදහස් හා ගැටලු මතු කරයි. මීට අමතරව, කාන්තාවන්, තරුණ ප්‍රජාව සහ පීඩාවට පත් වීමේ අවදානමක් ඇති කණ්ඩායම් හෝ ප්‍රජාවන්ගේ නියෝජනය පිළිබඳව ද මෙහිදී අවධානය යොමු කළ යුතුය.

[2] වැවිලි කර්මාන්ත සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම්වරයා.

## 6.8 කාර්යභාරයන් ඒකාබද්ධ කිරීම


ආයතනික ව්‍යුහයන් විශ්ලේෂණය කිරීමේදී, ඇතැම් සුවිශේෂී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී ආයතන කිහිපයක් එකම කාර්යයන් සිදු කිරීම සහ ඇතැම් අත්‍යවශ්‍ය කාර්යයන් මගහැරී තිබීම දක්නට ලැබුණි. එබැවින්, එකිනෙකට වෙනස් සහ සුවිශේෂී කුසලතා පූර්ණ ව්‍යුහයන් සහිත ආයතන එකිනෙක සමඟ ඒකාබද්ධ කරනවා වෙනුවට, බෙහෙවින් සමාන කාර්යභාරයන් පවතින අංශ පමණක් එකට එකතු කිරීම වඩාත් සුදුසු වේ. මෙමගින් අත්‍යවශ්‍ය කාර්යයන් භෞතිකව හෝ පරිපාලනමය වශයෙන් ඒකාබද්ධ කිරීමට පහසු වනු ඇත. ඒ අනුව, කාර්යභාරයන් ඒකාබද්ධ කිරීම සහ සම්බන්ධීකරණය වඩාත් සාර්ථක කර ගැනීම සඳහා පහත සඳහන් යාන්ත්‍රණ යෝජනා කෙරේ.

**එකම කාර්යයන් සිදු කිරීම සහ සම්බන්ධීකරණයේ පවතින අඩුපාඩු:** පොල් පර්යේෂණ ආයතනයේ පොල් සැකසුම් පර්යේෂණ අංශය මෙන්ම, පොල් සංවර්ධන අධිකාරියේ සැකසුම් සංවර්ධන අංශය සහ තත්ත්ව පාලන හා තත්ත්ව සහතික කිරීමේ අංශය යන සියල්ලම පාරිභෝගික ආහාර සුරක්ෂිතතාව ඇතුළු පොල් සැකසුම් ක්ෂේත්‍රයේ අවශ්‍යතා වෙනුවෙන් සේවා සපයයි. ශ්‍රී ලංකා පොල් කර්මාන්ත මණ්ඩලය මෙහිදී අතරමැදියෙකු ලෙස ක්‍රියා කරමින්, කර්මාන්තයේ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා උපායමාර්ගිකව අමාත්‍යාංශයේ අවධානයට යොමු කරයි. එබැවින්, පොල් සැකසුම් ක්ෂේත්‍රය තුළ පොල් පර්යේෂණ ආයතනය සිදු කරන පර්යේෂණ සහ පොල් සංවර්ධන අධිකාරියේ කාර්යභාරයන්, සමස්ත කර්මාන්තයේ සහ පාරිභෝගිකයාගේ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි සම්බන්ධීකරණය කර එය පෙළගැස්විය යුතුය. ශ්‍රී ලංකා පොල් කර්මාන්ත මණ්ඩලය සහ අනෙකුත් පාර්ශවකරුවන් හරහා ලැබෙන තොරතුරු මෙම අංශ වෙත නිසි පරිදි ගලා යන බව තහවුරු කිරීම සඳහා වැවිලි කර්මාන්ත සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සහ මෙහෙයුම් කමිටුව එක්ව කටයුතු කළ යුතුය. මීට අමතරව, සියලුම තීරණ අමාත්‍යාංශයේ සහ මෙහෙයුම් කමිටුවේ මගපෙන්වීම යටතේ සිදු විය යුතුය.

**ද්විත්ව කාර්යයන් සහ වෙන් වෙන්ව ක්‍රියාත්මක වීම:** පොල් සංවර්ධන අධිකාරියේ අලෙවිකරණ සංවර්ධන හා පර්යේෂණ අංශය සහ පොල් පර්යේෂණ ආයතනයේ ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය එකිනෙකාගෙන් වෙන්ව හුදෙකලාව කටයුතු කරන අතර, ඔවුන් අතින් ද ඇතැම් සමාන කාර්යයන් සිදු වේ. අනවශ්‍ය ලෙස එකම කාර්යය දෙවරක් සිදු වීම වළක්වා ගැනීමටත්, සහයෝගීතාවය තුළින් වඩාත් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමටත් කර්මාන්ත සහ පාරිභෝගික සමීක්ෂණ වැනි කටයුතු එකිනෙකා සමඟ සම්බන්ධීකරණය කළ හැකිය. දත්ත හුවමාරු කර ගන්නා පොදු පද්ධති ස්ථාපිත කිරීම මගින් ශ්‍රී ලංකා රේගුවෙන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගෙන් එකම දත්ත නැවත නැවත එකතු කිරීම වළක්වා ගත හැකිය. පොල් පර්යේෂණ ආයතනයේ ආර්ථික විද්‍යාඥයින් සතු පර්යේෂණ කුසලතා සහ අවශ්‍ය සහයෝගීතාවයන් උපයෝගී කර ගනිමින්, දත්ත හා සාක්ෂි මත පදනම් වූ සාර්ථක රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට සහාය විය හැකිය. උදාහරණයක් ලෙස, වාර්ෂික නිෂ්පාදනය පුරෝකථනය කිරීම සඳහා පොල් පර්යේෂණ ආයතනය සහ පොල් සංවර්ධන අධිකාරිය භාවිත කරන එකිනෙකට වෙනස් ක්‍රමවේදයන් දෙක සංසන්දනය කර බලා, වඩාත් නිවැරදි ක්‍රමය ප්‍රතිපත්තිමය තීරණ සඳහා යොදා ගත යුතුය. මේ සඳහා අවශ්‍ය සහයෝගීතාවයන් (හෝ වැඩසටහන් මත පදනම් වූ සම්බන්ධීකරණයන්) හඳුනාගෙන, ඒවා පහසු කරවීමට අමාත්‍යාංශය සහ මෙහෙයුම් කමිටුව පියවර ගත යුතුය. අවශ්‍ය අවස්ථාවලදී, විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් හරහා, එකම කාර්යයන් සිදු වන ක්ෂේත්‍ර සඳහා එක් ආයතනයක්

ප්‍රධාන ආයතනය ලෙස පත් කර, අනෙක් ආයතනවලට සහායක භූමිකාවක් ලබා දිය හැකිය. ඇතැම් විට මේ සඳහා ආයතන අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට ද සිදු විය හැකිය

**අවශ්‍යතාවයේ සිට ප්‍රායෝගික භාවිතය දක්වා:** කර්මාන්තයේ පවතින අවශ්‍යතාවන් මත පදනම්ව පර්යේෂණ හැඩගැසෙන අතර, එම පර්යේෂණවල ප්‍රතිඵල පාර්ශවකරුවන්ට (සැකසුම්කරුවන්ට, පාරිභෝගිකයන්ට සහ වගාකරුවන්ට) ප්‍රායෝගිකව භාවිත කළ හැකි තාක්ෂණයන් බවට පරිවර්තනය වේ. අමාත්‍යාංශය විසින් මෙහි සම්බන්ධීකරණය සහ වගවීම සහතික කරනු ලබයි. පහත රූප සටහනේ දක්වා ඇති පරිදි අවශ්‍යතාවන් හඳුනා ගැනීම ද්විත්ව ක්‍රියාවලියක් ඔස්සේ සිදු වේ. පළමුව, සැකසුම් සහ වතු අංශයේ (කර්මාන්ත අවශ්‍යතා) ඉල්ලීම් ශ්‍රී ලංකා පොල් කර්මාන්ත මණ්ඩලය හරහා ඉදිරිපත් කෙරේ. එහි සාමාජිකත්වය නොදරන අනෙකුත් සංවිධානය නොවූ පාර්ශවකරුවන්ට වැවිලි කර්මාන්ත සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සෘජුවම සම්බන්ධ කර ගත හැකිය. දෙවනුව, වගාකරුවන් (කුඩා වතු හිමියන් සහ වතු අංශය) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන වගා ව්‍යාප්ති පද්ධතිය සමඟ සම්බන්ධ වේ. එමඟින් පොල් පර්යේෂණ ආයතනය විසින් නිපදවන වගා තාක්ෂණයන් (ප්‍රදර්ශනය සහ ක්‍රියාත්මක කිරීම) වගාකරුවන් වෙත සාර්ථකව ළඟා කර දෙයි. මෙම ප්‍රතිපෝෂණ පද්ධතිය මඟින්, සංවර්ධනය කරන ලද තාක්ෂණයන් මහා පරිමාණයෙන් ව්‍යාප්ත කිරීමට සහ වාණිජකරණය කිරීමට අවශ්‍ය පරිදි තවදුරටත් වැඩිදියුණු කිරීමට සහ විධිමත් කිරීමට සහාය වේ. මේ හරහා, පර්යේෂකයන් විසින්ම "තාක්ෂණ ව්‍යාප්ති කටයුතු" කිරීමට යාම හෝ තාක්ෂණ ව්‍යාප්ති නිලධාරීන් විසින් පර්යේෂණ ප්‍රතිඵල වැරදියට අර්ථකථනය කිරීම වැනි පොදු ගැටලු මඟහරවා ගත හැකිය. මේ සඳහා තාක්ෂණ හුවමාරු කර ගැනීමේ නිල ක්‍රමවේදයක් සකස් කිරීම බෙහෙවින් උපකාරී වනු ඇත. එහිදී පර්යේෂකයන් හට පුහුණුකරුවන් පුහුණු කිරීමේ කටයුතු සිදු කළ හැකි අතර, පර්යේෂණ ප්‍රතිඵල ගොවියන්ට පහසුවෙන් තේරුම් ගත හැකි අයුරින් සකස් කිරීමට අනුමැතිය සහ සහාය ලබා දිය හැකිය. මෙලෙස කාර්යයන් එකිනෙක පැටලීම සහ අතපසු වීම් වැළැක්වීම සඳහා එක් එක් පාර්ශවයේ වගකීම් දාමය පැහැදිලිව නිර්වචනය කිරීම අතිශයින්ම වැදගත් වේ.



**වගකීම් පිළිබඳ සාරාංශය: ඒකාබද්ධ සම්බන්ධීකරණය**

| මට්ටම | වගකීම |
|---|---|
| අමාත්‍යාංශය | පාලනය, ප්‍රතිපත්ති සම්පාදනය සහ වගවීම |
| මෙහෙයුම් කමිටුව | උපායමාර්ගික සම්බන්ධීකරණය සහ ප්‍රමුඛතා හඳුනා ගැනීම |
| පර්යේෂණ අංශ | නවෝත්පාදන සහ සංවර්ධනය |
| තාක්ෂණ හුවමාරු අංශ | තාක්ෂණය ප්‍රායෝගිකව ගැළපීම සහ වලංගුභාවය පරීක්ෂා කිරීම |
| ව්‍යාප්ති අංශ (පොල් වගා කිරීමේ මණ්ඩලය) | ක්ෂේත්‍රය වෙත තාක්ෂණය ව්‍යාප්ත කිරීම සහ ප්‍රතිපෝෂණ ලබා ගැනීම |
| ශ්‍රී ලංකා පොල් කර්මාන්ත මණ්ඩලය / කර්මාන්ත ක්ෂේත්‍රය | අවශ්‍යතා සහ ඉල්ලීම් ඉදිරිපත් කිරීම සහ වෙළෙඳපොළ ප්‍රතිපෝෂණ සැපයීම |
| පොල් සංවර්ධන අධිකාරිය | කර්මාන්ත සංවර්ධනය සහ අපනයන ප්‍රවර්ධනය |

**කර්මාන්ත සහ පර්යේෂණ ක්ෂේත්‍ර අතර සහයෝගීතාවය:** මූල්‍ය ප්‍රතිපාදන හිඟතාවන් මතු වන අවස්ථාවලදී, කර්මාන්තයේ අවශ්‍යතා මත පදනම් වූ පර්යේෂණ සඳහා පහසුකම් සැලසීමට අදාළ මාර්ගෝපදේශ සකස් කළ යුතුය. මූල්‍ය බාධක මඟහරවා ගැනීමට සහ කර්මාන්තයේ සැබෑ අවශ්‍යතා පර්යේෂණවලට ඇතුළත් කර ගැනීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදයක් දිරිගැන්විය හැකිය.

**ඩිජිටල් සම්බන්ධීකරණ පද්ධතිය:** අමාත්‍යාංශය විසින් කළමනාකරණය කරනු ලබන තනි ඩිජිටල් පද්ධතියක් ස්ථාපිත කිරීම වඩාත් සුදුසු වේ. මෙමඟින් කර්මාන්තයේ පවතින ගැටලු ඉදිරිපත් කිරීමේ ද්වාරය (portal), වත්මන් පර්යේෂණ නිරීක්ෂණ පුවරුව (dashboard), තාක්ෂණික වලංගුභාවය පරීක්ෂා කිරීමේ ප්‍රගතිය සොයා බැලීම, ව්‍යාප්ති කටයුතු අධීක්ෂණය සහ තාක්ෂණයන් ප්‍රායෝගිකව වැළඳ ගැනීම නිරීක්ෂණය කිරීම පහසු කරවයි. වගා ව්‍යාප්ති පද්ධතියෙන් සජීවී දත්ත ලබා ගැනීමට හැකි වීම, පොල් පර්යේෂණ ආයතනයේ තාක්ෂණ හුවමාරු අංශයේ පර්යේෂකයන්ට තාක්ෂණික භාවිතය සහ එහි වලංගුභාවය ඇගයීමට බෙහෙවින් උපකාරී වේ. එමඟින් වෙන වෙනම ක්ෂේත්‍ර සමීක්ෂණ පැවැත්වීම සඳහා වැය වන සම්පත් ප්‍රමාණය ද අවම කරගත හැකිය.

# 7. අධීක්ෂණය සහ ඇගයීම

ඉහත ක්‍රමානුකූල රූප සටහනෙහි විස්තර කර ඇති පරිදි, අධීක්ෂණ කටයුතු ප්‍රධාන වශයෙන් සිදුවන්නේ මෙහෙයුම් කමිටුව විසින් අදාළ තේමාත්මක ක්ෂේත්‍ර යටතේ සිදු කරනු ලබන කාර්තුමය ප්‍රගති සමාලෝචන හරහා පමණි. උපායමාර්ගික සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම් අදාළ ආයතනවල වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සමඟ බද්ධ කර ඇති බැවින්, එම ක්‍රියාකාරකම්වල ප්‍රගතිය විශ්ලේෂණය කිරීමට මෙම කාර්තුමය ප්‍රගති වාර්තා භාවිත කළ හැකිය. වැවිලි කර්මාන්ත සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ පොල් සංවර්ධන අංශයට මෙම දත්ත රැස් කර විශ්ලේෂණය කළ හැකි අතර, එම ප්‍රගතිය මෙහෙයුම් කමිටුව සමඟ බෙදා ගත හැකිය. පොදු දත්ත ගබඩාවක් පැවතීම මඟින් මෙහි කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය තවදුරටත් ඉහළ නැංවිය හැකිය. මෙයින් ආයතනික මට්ටමේ ප්‍රගතිය ආවරණය වන බැවින්, තේමාත්මක ක්ෂේත්‍ර සහ පාර්ශවකරුවන්ගේ මට්ටමින් (අගය දාමයේ නිරතවන්නන්) ද යම් දුරකට අධීක්ෂණය සහ ඇගයීම සිදු කිරීම සුදුසු වේ. එවැනි අධීක්ෂණ කටයුතු සඳහා විෂය පථයන් පිළිබඳ විශේෂඥයින්ගේ සහ අධීක්ෂණ හා ඇගයීම් පිළිබඳ

විශේෂඥයින්ගේ සහාය අවශ්‍ය විය හැකිය. මේ සඳහා උපායමාර්ගික සැලැස්මේ දක්වා ඇති සුවිශේෂී ක්‍රියාකාරකම්වල ප්‍රධාන කාර්ය සාධන දර්ශක, මූලික දත්ත සහ අපේක්ෂිත ඉලක්ක සැලකිල්ලට ගත හැකිය. තේමාත්මක ක්ෂේත්‍ර සහ අගය දාමයේ නිරතවන්නන්ගේ මට්ටමින් සිදු කෙරෙන අධීක්ෂණ හා ඇගයීම් කටයුතු සඳහා අර්ධ වාර්ෂික සමාලෝචන පැවැත්වීම වඩාත් සුදුසුය.

උපායමාර්ගික සැලැස්ම නිල වශයෙන් ක්‍රියාත්මක කිරීමට පෙර, එහි ප්‍රතිඵලවලින් ඇති වූ බලපෑම මැන බැලීම සඳහා සුදුසු තේමාත්මක මට්ටමේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක, මූලික දත්ත සහ ඉලක්ක හඳුනාගත යුතුය. සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පෙර ඒ සඳහා අධීක්ෂණ හා ඇගයීම් පිළිබඳ විශේෂඥයෙකුගේ දායකත්වය ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. මෙම අධීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව අර්ධ වාර්ෂික සමාලෝචන පැවැත්විය යුතු අතර, සැලැස්ම ක්‍රියාත්මක කර වසර පහකට පසු (එනම් 2030 වසරේදී) උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම පිළිබඳ සමස්ත සමාලෝචනය සිදු කළ යුතුය.

## 8. මාර්ග සිතියම සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැපයීම

ශ්‍රී ලංකාවේ පොල් ක්ෂේත්‍රය සඳහා වන උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම ක්‍රියාවට නැංවීම, සාම්ප්‍රදායික රාජ්‍ය අංශයේ සැලැස්මකට එහා ගිය, ක්‍රමවත් ආයෝජන වැඩසටහනක් ලෙස ස්ථානගත කෙරෙන අතර, එය විවිධාංගීකරණය වූ පුළුල් සම්පත් ඒකරාශි කිරීමේ ව්‍යුහයක් ඔස්සේ සිදු කරනු ලබයි. එක් එක් තේමාත්මක වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා බැංකු මට්ටමින් පිළිගත හැකි සවිස්තරාත්මක ව්‍යාපාරික සැලසුම් සකස් කිරීමෙන් අනතුරුව, සමස්ත මූල්‍ය අවශ්‍යතාවය තීරණය කරනු ඇත. මේ යටතේ මැදිහත් වීම් සඳහා වැය වන නිශ්චිත පිරිවැය ගණනය කිරීම, ආර්ථික, සමාජීය සහ පාරිසරික ප්‍රතිලාභවල අගය තක්සේරු කිරීම මෙන්ම, වඩාත් සුදුසු මූල්‍ය උපකරණ, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආකෘති සහ අවදානම් බෙදාහදා ගැනීමේ යාන්ත්‍රණ හඳුනා ගැනීම සිදු කෙරේ. සම්පත් උපයා ගැනීමේදී සාම්ප්‍රදායික රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදනවලට පමණක් සීමා නොවී, වඩාත් පුළුල් පරාසයක විහිදුණු ප්‍රාග්ධන මූලාශ්‍ර ඒකාබද්ධ කෙරෙන බහු-මූලාශ්‍ර මූල්‍ය ව්‍යුහයක් භාවිත කරනු ඇත. රජයේ අයවැය ප්‍රතිපාදන, වැඩසටහන් සහ ව්‍යාපෘති මත පදනම් වූ මූල්‍ය ප්‍රතිපාදන, පෞද්ගලික අංශයේ ආයෝජන, සංවර්ධන මූල්‍ය ආධාර සහ ක්ෂේත්‍රය තුළින්ම උපයා ගන්නා අභ්‍යන්තර ආදායම් මීට ඇතුළත් වේ.

මෙම ප්‍රවේශය සැලසුම් කර ඇත්තේ, රාජ්‍ය අරමුදල් මත පවතින යැපීම ක්‍රමයෙන් අවම කරමින්, පෞද්ගලික සහ ජාත්‍යන්තර ප්‍රාග්ධනය ක්ෂේත්‍රය වෙත වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීමටය. මෙය නව්‍ය පද්ධතිමය ප්‍රවේශයක් මත පදනම් වන අතර, එමඟින් රාජ්‍ය ආයතන, නිෂ්පාදක සංවිධාන, පර්යේෂණ ආයතන, මූල්‍ය ආයතන සහ පෞද්ගලික ව්‍යවසායකයන්ගේ සම්බන්ධීකරණ සහභාගීත්වය සහතික කෙරේ. ඒ ඔස්සේ සමස්ත ක්ෂේත්‍රයටම ලැබෙන බලපෑම මෙන්ම, ආයතනික මූල්‍ය තිරසාරභාවය ද ශක්තිමත් වේ. දේශීය මූල්‍ය පද්ධතිය ශක්තිමත් කරන අතරම, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව වැනි ප්‍රමුඛ පෙළේ ආයතන සමඟ පවතින හවුල්කාරිත්වයන් උපයෝගී කර ගනිමින්, ශ්‍රී ලංකාවේ පොල් ක්ෂේත්‍රය ගෝලීය වශයෙන් තරඟකාරී, ආයෝජන මත පදනම් වූ කර්මාන්තයක් බවට පරිවර්තනය කිරීමේ මාවත මෙම උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියම ඔස්සේ විවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### 8.1 පොල් ක්ෂේත්‍රය සඳහා වන ආයෝජන අවස්ථා

ශ්‍රී ලංකාවේ පොල් ක්ෂේත්‍රය යනු ඉහළ අපනයන විභවයක් ජනනය කරන, නව නිෂ්පාදන සංවර්ධනය සඳහා වැඩි අවස්ථා නිර්මාණය කරන, එමෙන්ම දේශගුණික විපර්යාසයන්හි බලපෑම්වලට එරෙහිව ස්වාභාවික ආරක්ෂාවක් සහිත ක්ෂේත්‍රයක් බැවින්, එය ඉතා ශක්තිමත් ආයෝජන අවස්ථාවක් සපයයි. වර්තමාන ගෝලීය පාරිභෝගිකයන් ස්වාභාවික, තිරසාර සහ ශාක පදනම් කරගත් නිෂ්පාදන සඳහා වැඩි කැමැත්තක් දක්වන බැවින්, අලුතින් මතුවන වෙළෙඳපොළ ප්‍රවණතාවලින් උපරිම ප්‍රයෝජන ලැබීමට මෙන්ම ජාතික ආර්ථිකයේ වර්ධනය අඛණ්ඩව ඉදිරියට රැගෙන යාමට ද මෙම ක්ෂේත්‍රය මනාව ස්ථානගත වී ඇත.

මෙම ක්ෂේත්‍රය විවිධ පරාසයන්හි ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට විශේෂයෙන් සමත් වේ. ඉහළ වටිනාකමකින් යුතු නිෂ්පාදන සමඟ ජාත්‍යන්තර වෙළෙඳපොළට ප්‍රවේශ වීමට අපේක්ෂා කරන ආයතන, පාරිසරික වශයෙන් තිරසාර මෙන්ම සමාජීය වශයෙන් සියලු දෙනා ඇතුළත් කර ගන්නා අගය දාමයන්ට සහය වීමට කැමති පාර්ශවයන්, සහ පාරිසරික, සමාජීය හා පාලන නිර්ණායකයන්ට ගැළපෙන ප්‍රාග්ධනයක් සහිත ආයෝජකයෝ මෙම කණ්ඩායමට ඇතුළත් වෙති. පොල් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් අවම කාබන් නිෂ්පාදන පද්ධති සහ චක්‍රීය ආර්ථික භාවිතයන් අනුගමනය කරන බැවින් ද, දේශගුණික විපර්යාස හමුවේ වුවද එහි පද්ධතීන් අඛණ්ඩව පවත්වාගෙන යා හැකි බැවින් ද, දේශගුණික සහ හරිත මූල්‍යකරණය සඳහා මෙයින් නව මාවත් විවර වේ.

### 8.2 මූල්‍ය ව්‍යුහය

අප විසින් යෝජනා කරනු ලබන මූල්‍ය ව්‍යුහය එකිනෙකට සම්බන්ධ වූ ස්ථර තුනකින් (3) සමන්විත වන අතර, එමඟින් ආයෝජන සුරක්ෂිත කරන අතරතුර සහ පොල් කර්මාන්තය සඳහා පෞද්ගලික අරමුදල් ආකර්ෂණය කර ගන්නා අතරම, අවශ්‍ය සම්පත් සාර්ථකව උපයා ගැනීමටත් මඟ පාදයි.

| ස්ථරය 1<br>රාජ්‍ය සහ සහනදායී ප්‍රාග්ධනය | ස්ථරය 2<br>සංවර්ධන සහ මිශ්‍ර මූල්‍යකරණය | ස්ථරය 3<br>වාණිජ ප්‍රාග්ධනය |
|---|---|---|
| **ප්‍රධාන ආයතන**<br>■ ශ්‍රී ලංකා රජය<br>• JICA, USAID, GIZ, EU<br>■ හරිත දේශගුණ අරමුදල<br>■ ගෝලීය පාරිසරික පහසුකම | **ප්‍රධාන ආයතන**<br>ලෝක බැංකුව<br>■ IFC<br>■ ආසියානු සංවර්ධන බැංකුව<br>■ IFAD<br>■ ඉස්ලාමීය සංවර්ධන බැංකුව | **ප්‍රධාන ආයතන**<br>■ ■ ලංකා බැංකුව<br>■ මහජන බැංකුව<br>■ අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික බැංකු |
| **ප්‍රධාන කාර්යභාරය**<br>■ මූල්‍යාධාර සහ තාක්ෂණික සහාය<br>■ ප්‍රථම-අලාභ ප්‍රාග්ධනය සැපයීම<br>■ ණය ඇපකර සහ අවදානම් බෙදාහදා ගැනීම | **ප්‍රධාන කාර්යභාරය**<br>■ සහනදායී ණය පහසුකම්<br>■ මිශ්‍ර මූල්‍යකරණ විධිවිධාන ක්‍රියාවට නැංවීම<br>■ ප්‍රධානමූල්‍යකරණය<br>■ තාක්ෂණික සහාය | **ප්‍රධාන කාර්යභාරය**<br>ප්‍රමුඛ ණය සහ කාරක ප්‍රාග්ධනය<br>■ වෙළෙඳ සහ අපනයන මූල්‍යකරණය<br>■ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය පහසුකම්<br>■ සංවර්ධන මූල්‍ය ආයතන සමඟ ඒකාබද්ධ මූල්‍යකරණය |

පළමු ස්ථරය "රාජ්‍ය සහ සහනදායී ප්‍රාග්ධනයෙන්" සමන්විත වන අතර, එය ආයෝජනවල පවතින අවදානම අවම කරන ස්ථරය (de-risking layer) ලෙස ක්‍රියා කරයි. මහා භාණ්ඩාගාරය සහ රේඛීය අමාත්‍යාංශ හරහා ලැබෙන ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන මෙන්ම, ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය, එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය, ජර්මානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය සහ යුරෝපීය සංගමය වැනි ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන් ද මෙහි

මූල්‍ය ප්‍රභවයන් අතර වේ. මීට අමතරව, හරිත දේශගුණ අරමුදල සහ ගෝලීය පාරිසරික පහසුකම වැනි ගෝලීය දේශගුණික මූල්‍යකරණ යාන්ත්‍රණ ද මෙම ස්ථරය සඳහා තීරණාත්මක මූල්‍ය සහයෝගයක් ලබා දෙයි. මෙම ආයතන ව්‍යුහය මඟින් මූල්‍යාධාර සහ තාක්ෂණික සහාය ලබා දෙන අතරම, මිශ්‍ර මූල්‍යකරණ ව්‍යුහයන් තුළ ප්‍රථම-අලාභ ප්‍රාග්ධනය ලෙස ක්‍රියා කිරීම ද සිදුවේ. එමෙන්ම පෞද්ගලික ආයෝජකයන්ට වෙළෙඳපොළට ප්‍රවේශ වීමට මඟ පාදමින් ණය ඇපකර සහ අවදානම් බෙදාහදා ගැනීමේ මෙවලම් (risk-sharing instruments) සැපයීම ද මෙමඟින් සිදු කෙරේ.

දෙවැනි ස්ථරය "සංවර්ධන සහ මිශ්‍ර මූල්‍යකරණයෙන්" සමන්විත වන අතර, එහි පදනම සඳහා ප්‍රධාන ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල සහයෝගය හිමි වේ. ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව, ආසියානු සංවර්ධන බැංකුව, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල සහ ඉස්ලාමීය සංවර්ධන බැංකුව මෙම අංශයේ ක්‍රියාත්මක වන ප්‍රධාන ආයතන වේ. මෙම ආයතන මඟින් සහනදායී සහ අර්ධ සහනදායී මූල්‍ය පහසුකම් සපයන අතරම, මිශ්‍ර මූල්‍යකරණ මෙවලම් නිර්මාණය කිරීම සහ මහා පරිමාණ වැඩසටහන්වල ප්‍රධාන ආයතන ලෙස ක්‍රියා කිරීම ද සිදු කරයි. මෙම ආයතන ව්‍යුහය මඟින් ව්‍යාපෘති සංවර්ධනය, මූල්‍ය සැලසුම්කරණය සහ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය තාක්ෂණික සහාය ලබා දෙන අතර, රාජ්‍ය අංශයේ අරමුදල් පෞද්ගලික අංශයේ ආයෝජන සමඟ සම්බන්ධ කිරීමට ද කටයුතු කරයි.

තුන්වැනි ස්ථරය සඳහා "වාණිජ ප්‍රාග්ධනය" අවශ්‍ය වන අතර, එය සමස්ත අගය දාමය පුරා මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යමින් ආයෝජන මට්ටම් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන තීරණාත්මක මූල්‍ය ප්‍රතිපාදනයක් ලෙස ක්‍රියා කරයි. ලංකා බැංකුව, මහජන බැංකුව, ඩී.එෆ්.සී.සී. බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, සම්පත් බැංකුව සහ හැටන් නැෂනල් බැංකුව ඇතුළු දේශීය මූල්‍ය ආයතන, ප්‍රමුඛ ණය, කාරක ප්‍රාග්ධනය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය විසඳුම් ලබා දෙමින් මේ සඳහා අත්‍යවශ්‍ය සේවාවන් සපයයි. මෙම ආයතන ස්ටැන්ඩර්ඩ් චාටඩ් සහ එච්.එස්.බී.සී. වැනි ජාත්‍යන්තර සහ කලාපීය බැංකු සමඟ ඒකාබද්ධව කටයුතු කරන්නේ, ඒවා මඟින් වෙළෙඳ මූල්‍යකරණය සහ අපනයන මූල්‍යකරණය සමඟ සංවර්ධන මූල්‍ය ආයතන භාවිත කරන ඒකාබද්ධ මූල්‍යකරණ ගිවිසුම් ලබා දෙන බැවිනි. මෙම ස්ථරය මඟින් ව්‍යාපාරවලට නව ආයෝජන සිදු කිරීමට අවකාශ සැලසෙන අතරම, ඔවුන්ගේ අගය දාමයන් සඳහා මූල්‍ය පහසුකම් සැපයීමටත්, ක්ෂේත්‍රයේ පවතින මහා පරිමාණ සමාගම් මෙන්ම සුළු ව්‍යාපාරවල ද මෙහෙයුම් මුදල් ප්‍රවාහය සාර්ථකව පවත්වාගෙන යාමටත් උපකාරී වේ.

මෙම ත්‍රිත්ව මූල්‍ය පද්ධතිය මඟින් ඒකාබද්ධ ව්‍යුහයක් ස්ථාපිත කෙරෙන අතර, එහිදී රාජ්‍ය සහ සහනදායී අරමුදල් භාවිත කරමින් ආයෝජන අවදානම අවම කරන අතරතුර, සංවර්ධන මූල්‍ය ආයතන මඟින් සුදුසු මූල්‍ය විසඳුම් නිර්මාණය කරනු ලබයි. එමෙන්ම, වාණිජ ප්‍රාග්ධනය මඟින් ව්‍යාපාරවලට තිරසාර වර්ධනයක් ළඟා කර ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කර දෙයි.

## 8.3 බැංකු මට්ටමින් පිළිගත හැකි ව්‍යාපෘති පෙළගැස්මක් සංවර්ධනය කිරීම

පොල් ක්ෂේත්‍රය සඳහා ආයෝජන සාර්ථකව ආකර්ෂණය කර ගැනීමේ අරමුණින්, අප විසින් අලුතින් "ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ඒකකයක්" පිහිටුවනු ලබයි. ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව වැනි ආයතනවලට මෙම ඒකකය සඳහා මූල්‍ය සහයෝගය ලබා දිය හැකිය. මෙම ඒකකය මඟින්, මූලික ව්‍යාපෘති සංකල්ප ආයෝජකයන් ආකර්ෂණය කර ගත හැකි මට්ටමේ තිසි ව්‍යාපෘති බවට පරිවර්තනය කරමින්, ආයෝජනයට සූදානම් ව්‍යාපෘති බිහි කරනු ඇත. එහිදී මෙම ඒකකය මඟින් ප්‍රධාන කාර්යයන් තුනක් ඉටු කරනු ලබන අතර, සම්පූර්ණ ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම, ලාභ උත්පාදනය කළ හැකි ආයෝජන ආකෘති සකස් කිරීම සහ ආයෝජකයන්ට පිළිගත හැකි මට්ටමේ නිල ලේඛන සකස් කිරීම ඊට ඇතුළත් වේ. මෙමඟින් ව්‍යාපෘතිවල පවතින අවදානම් අවම කිරීමටත්, ඒවායේ ප්‍රායෝගික සාර්ථකත්වය ඉහළ නැංවීමටත් අවශ්‍ය තාක්ෂණික හා මූල්‍ය සහාය ලබා දෙන අතර, එමඟින් ආයෝජකයන්ගේ විශ්වාසය තහවුරු කර කර්මාන්තය වෙත ප්‍රාග්ධන ආයෝජන වේගවත්ව ගලා ඒමට මඟ පාදනු ඇත.

පොල් කර්මාන්තයේ සමස්ත අගය දාමයේම සියලුම අංශ නගාසිටුවීම සඳහා ප්‍රමුඛතා ආයෝජන ක්ෂේත්‍ර ඔස්සේ ප්‍රාග්ධන ආයෝජන යොමු කරනු ඇත. අනාගතය සඳහා තිරසාර සහ විශ්වාසදායක නිෂ්පාදන පදනමක් සහතික කිරීම වෙනුවෙන් නැවත වගා කිරීමේ සහ ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන් මීට ඇතුළත් වේ. අමුද්‍රව්‍යවලින් උපරිම වටිනාකමක් ලබා ගනිමින් අපනයන ආදායම ඉහළ නැංවිය හැකි අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා සැකසුම් මධ්‍යස්ථාන වෙත ආයෝජන ප්‍රමුඛතාවය හිමි වනු ඇත. මීට අමතරව, කාර්යක්ෂමතාව අවම වීම සහ මෙහෙයුම් ප්‍රමාදයන් වැළැක්වීම සඳහා සැපයුම් දාම යටිතල පහසුකම් සහ ප්‍රවාහන කටයුතු වැඩිදියුණු කිරීමට ඉලක්කගත ආයෝජන යොමු කෙරේ. නව අපනයන වෙළෙඳපොළවල් සොයා යාමට සහ පවතින වෙළෙඳපොළවල් තවදුරටත් පුළුල් කිරීම සඳහා ද උපායමාර්ගික වැඩසටහන් ක්‍රියාවට නැංවෙනු ඇත. සමස්තයක් ලෙස ගත් කල, මෙම ප්‍රමුඛතා ආයෝජන ක්ෂේත්‍රවල අරමුණ වන්නේ පොල් ක්ෂේත්‍රයේ තරගකාරිත්වය ඉහළ නැංවීම, එහි ඔරොත්තුදීමේ හැකියාව ශක්තිමත් කිරීම සහ කර්මාන්තය පුරා ඉහළ වටිනාකමක් ජනනය කිරීමයි.

### 8.4 ප්‍රමුඛතා මූල්‍ය උපකරණ

පොල් ක්ෂේත්‍රයේ අගය දාමයේ එක් එක් අදියර සඳහා වඩාත් ගැළපෙන මූල්‍ය විසඳුම් සපයනු ලබන සුවිශේෂී මූල්‍ය උපකරණ ඔස්සේ මෙම ක්ෂේත්‍රයට ආයෝජන සහයෝගය හිමි වනු ඇත.

| මූල්‍ය උපකරණ | විස්තරය |
|---|---|
| පොල් ක්ෂේත්‍රය සඳහා වන මිශ්‍ර මූල්‍යකරණ පහසුකම | ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව සහ ආසියානු සංවර්ධන බැංකුව ප්‍රමුඛත්වය ගන්නා, දේශීය බැංකුවල දායකත්වය සහිත ඒකාබද්ධ අරමුදල් පද්ධතියකි. |
| නැවත වගා කිරීම සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වන ණය පහසුකම | ලෝක බැංකුව සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල හරහා ලබාදෙන, දේශීය බැංකු මඟින් ප්‍රති-ණය ලෙස නිකුත් කරනු ලබන දීර්ඝකාලීන අරමුදල් සම්පාදනයකි. |
| ණය ඇපකර ක්‍රමය | ණය දීමේදී පවතින අවදානම අවම කිරීම සඳහා ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුවේ පූර්ණ අනුග්‍රහය ඇතිව ක්‍රියාත්මක වන වැඩපිළිවෙළකි. |
| දේශගුණික මූල්‍යකරණ උපකරණ | හරිත දේශගුණික අරමුදල, ගෝලීය පාරිසරික පහසුකම සහ ජපන්-සංවර්ධන බැංකු හරිත අරමුදල වැනි ගෝලීය පද්ධතීන් උපයෝගී කර ගැනීමයි. |
| අපනයන මූල්‍යකරණ පහසුකම් | එච්.එස්.බී.සී., ස්ටැන්ඩර්ඩ් චාටඩ් සහ දේශීය වාණිජ බැංකු හරහා සපයනු ලබන මූල්‍ය සේවාවන්ය. |

මෙහිදී භාවිත වන ප්‍රධානතම මූල්‍ය උපකරණයක් වන්නේ "පොල් ක්ෂේත්‍රය සඳහා වන මිශ්‍ර මූල්‍යකරණ පහසුකම" ස්ථාපිත කිරීමයි. මෙය ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි සංවර්ධන මූල්‍ය ආයතනවල මූලිකත්වයෙන් සහ දේශීය මූල්‍ය ආයතනවල දායකත්වයෙන් යුතුව ක්‍රියාත්මක වන ඒකාබද්ධ අරමුදල් පද්ධතියක් ලෙස සැලසුම් කර ඇත. මෙම පහසුකම මඟින් සහනදායී මෙන්ම වාණිජ මූල්‍ය ක්‍රමවේදයන් ද්විත්වයම භාවිත කරන අතර, එමඟින්

වඩාත් සුරක්ෂිත ආයෝජන වටපිටාවක් නිර්මාණය කර පෞද්ගලික අංශයේ අරමුදල් කර්මාන්තය වෙත ආකර්ෂණය කර ගැනීමට මඟ පාදයි.

මීට අමතරව, විශේෂිත "නැවත වගා කිරීම සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වන ණය පහසුකම" හඳුන්වා දීම මඟින් දීර්ඝකාලීන ඵලදායිතා වර්ධනයන් සඳහා සහයෝගය ලැබෙනු ඇත. මෙමඟින් ලෝක බැංකුව සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල වැනි ආයතනවල අනුග්‍රහය සහිත දීර්ඝකාලීන මූල්‍ය විසඳුම් සපයන අතර, එම අරමුදල් දේශීය බැංකු හරහා බෙදා හැරීම මඟින් නිෂ්පාදකයන්ට සහ ව්‍යවසායයන්ට සෘජු ප්‍රතිලාභ සැලසේ. එමෙන්ම ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුවේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක වීමට නියමිත "ණය ඇපකර ක්‍රමය" මඟින් ණය දීමේදී පවතින අවදානම් අවම කිරීමට සහාය වන අතර, කුඩා වතු හිමියන් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් මෙම ක්ෂේත්‍රයට වැඩි වශයෙන් ණය පහසුකම් සැපයීමට මූල්‍ය ආයතන දිරිමත් කරනු ලබයි.

තිරසාර සංවර්ධනය සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කරන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන සැපයීමේ අරමුණින් මෙම ක්ෂේත්‍රය තුළ "දේශගුණික මූල්‍යකරණ උපකරණ" ද ස්ථාපිත කෙරේ. එහිදී දේශගුණික හිතකාමී ව්‍යාපෘති සහ පාරිසරික වශයෙන් තිරසාර වැඩසටහන් සඳහා අරමුදල් සැපයීමට හරිත දේශගුණ අරමුදල, ගෝලීය පාරිසරික පහසුකම සහ ඒකාබද්ධ පාරිසරික මූල්‍ය පහසුකම වැනි ගෝලීය පද්ධතීන් හරහා මූල්‍ය ප්‍රතිපාදන සුරක්ෂිත කරගනු ඇත. එච්.එස්.බී.සී. සහ ස්ටෑන්ඩර්ඩ් චාටඩ් වැනි ජාත්‍යන්තර බැංකු මෙන්ම දේශීය වාණිජ බැංකු ද සම්බන්ධ කරගනිමින් ගොඩනඟන හවුල්කාරිත්වයන් ඔස්සේ "අපනයන මූල්‍යකරණ පහසුකම්" සඳහා ලැබෙන සහයෝගය තවදුරටත් ශක්තිමත් කෙරේ. එමඟින් වෙළෙඳ මූල්‍යකරණය, කාරක ප්‍රාග්ධනය සහ අපනයන ඉලක්ක කරගත් ආයෝජන සහයෝගය අඛණ්ඩව ලබා දිය හැකිය. මෙම පද්ධතිය තුළ පවතින මූල්‍ය උපකරණ මඟින් සමස්ත පොල් කර්මාන්තයේම වර්ධනය, ඔරොත්තුදීමේ හැකියාව සහ තරඟකාරී වාසිය ශක්තිමත් කරන සියළු කොටස් සහිත මූල්‍ය ජාලයක් නිර්මාණය කර දෙනු ලබයි.

### 8.5 රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘති

ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව ඇතුළු සංවර්ධන හවුල්කරුවන් විසින් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘති සඳහා සහයෝගය ලබා දෙනු ඇත. එමඟින් පොල් කර්මාන්තය පුරා ඵලදායිතාව ඉහළ නංවන අතරම ආයෝජන වර්ධනය ද වේගවත් කරනු ඇත. මෙම හවුල්කාරිත්වයන් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලබන්නේ, සැකසුම් කලාප සහ කාර්මික පොකුරු පිහිටුවීම මෙන්ම අපනයන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වැනි විශාල මූල්‍ය ප්‍රතිපාදන සහ ක්‍රමවත් ක්‍රියාවට නැංවීමක් අත්‍යවශ්‍ය වන සුවිශේෂී ක්ෂේත්‍ර කෙරෙහිය. රාජ්‍ය සහ පෞද්ගලික අංශ සතු දක්ෂතාවන් සහ හැකියාවන් ඒකාබද්ධ කිරීම තුළින් ප්‍රාග්ධනය ඒකරාශී කිරීමටත්, මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමටත් හැකි වන අතර, ඒ ඔස්සේ අගය එකතු කළ නිෂ්පාදන බිහිකිරීම සහ අපනයන ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර තරඟකාරිත්වය ඉහළ නැංවීමට අවශ්‍ය පසුබිම සකස් කෙරේ.

### 8.6 සියලු දෙනා ඇතුළත් කර ගන්නා මූල්‍ය යාන්ත්‍රණ

සංවර්ධන හවුල්කරුවන් වන කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල සහ ලෝක බැංකුව, කුඩා වතු හිමියන්ට සහ අගය දාමයේ නිරතවන්නන්ට සාධාරණ ලෙස මූල්‍ය සේවාවන් ලබා ගැනීමට මඟ පාදන, සියලු දෙනා ඇතුළත් කර ගන්නා මූල්‍ය යාන්ත්‍රණයන් ක්‍රියාවට නැංවීම සඳහා සහයෝගය දක්වනු ඇත. මෙම වැඩසටහන් මඟින් කුඩා වතු හිමියන්ගේ සුවිශේෂී අවශ්‍යතාවලට ගැළපෙන මූල්‍ය නිෂ්පාදන සංවර්ධනය කරන අතරම, ගොවි කණ්ඩායම් සහ අගය දාම සබැඳියාවන් උපයෝගී කර ගන්නා ඒකාබද්ධ ණය දීමේ ක්‍රමවේදයන් ප්‍රවර්ධනය කිරීමට ද කටයුතු කරයි. එමෙන්ම, මෙහෙයුම් කාර්යක්ෂමතාව, මූල්‍ය විනිවිදභාවය සහ ප්‍රවේශ වීමේ හැකියාව ඉහළ නංවන ඩිජිටල් මූල්‍ය විසඳුම් සංවර්ධනය කිරීම ද මීට ඇතුළත් වේ. මෙම විවිධ ප්‍රවේශයන් එකිනෙකා හා බද්ධ වී ක්‍රියා කිරීම තුළින් මූල්‍ය බාධක අවම කිරීමටත්, වෙළෙඳපොළ සහභාගීත්වය ඉහළ නැංවීමටත්, පොල් ක්ෂේත්‍රයේ සමස්ත සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමටත් හැකි වනු ඇත.

**8.7 දේශගුණික සහ පාරිසරික මූල්‍යකරණය**

ශ්‍රී ලංකාවේ පොල් ක්ෂේත්‍රය, පැරිස් ගිවිසුමේ දේශගුණික ඉලක්ක සපුරා ගැනීමට රටට උපකාරී වන පරිසර හිතකාමී සහ ස්වභාව ධර්මයට හිතකර කර්මාන්තයක් ලෙස පිළිගැනීමට ලක්ව ඇත. පොල් වගාවන් සතුව කාබන් අවශෝෂණය කර රඳවා තබා ගැනීමට, ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට සහ පාංශු ඛාදනය අවම කිරීමට ඇති හැකියාව හේතුවෙන් පාරිසරික ප්‍රතිලාභ තුනක් (3) හිමි වන අතර, එමඟින් ජාත්‍යන්තර දේශගුණික මූල්‍යකරණය ලබා ගැනීම සඳහා මෙම ක්ෂේත්‍රය මනාව සුදුසුකම් ලබයි. මහා පරිමාණ සහනදායී දේශගුණික අරමුදල් ලබා ගැනීම සඳහා, මෙම ක්ෂේත්‍රයේ ආයෝජන ශ්‍රී ලංකාවේ "ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන්" සමඟ සම්බන්ධ කිරීම අත්‍යවශ්‍ය වේ. දේශගුණික අනුකූලතාවයකින් යුත් ආයෝජන සඳහා සහයෝගය දක්වන ප්‍රධාන බහුපාර්ශවීය මූල්‍ය පද්ධතීන් දෙක ක්‍රියාත්මක වන්නේ හරිත දේශගුණ අරමුදල සහ එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානයේ තාක්ෂණික සහාය ලබන ගෝලීය පාරිසරික පහසුකම හරහාය.

| හරිත දේශගුණික අරමුදල | ගෝලීය පරිසර පහසුකම | UNIDO තාක්ෂණික සහාය |
|---|---|---|
| ▪ දේශගුණික ඔරොත්තුදීමේ හැකියාව සහිත නැවත වගාකිරීම්<br>▪ දැඩි අයහපත් කාලගුණික තත්ත්වයන්ට අනුවර්තනය වීම<br>▪ ජල හා වාරිමාර්ග කළමනාකරණය<br>▪ ජාතික වශයෙන් නිර්ණය කළ දායකත්වයන්ට අනුකූල වැඩසටහන් | ▪ පාරිසරික පද්ධති සේවාවන්<br>▪ තිරසාර භූමි කළමනාකරණය<br>▪ කෘෂි-ජෛව විවිධත්ව සංරක්ෂණය<br>▪ හරිත දේශගුණික අරමුදල සමඟ ඒකාබද්ධ මූල්‍යකරණය | ▪ GCF/GEF තාක්ෂණික සහාය<br>▪ ධාරිතා වර්ධනය<br>▪ අඩු කාබන් සැකසුම් තාක්ෂණයන්<br>▪ වඩාත් පිරිසිදු නිෂ්පාදන ප්‍රමිති |

හරිත දේශගුණික අරමුදල (GCF) මඟින් මහා පරිමාණ අනුවර්තන හා දේශගුණික විපර්යාස අවම කිරීමේ වැඩසටහන් සඳහා සහාය ලබා දෙනු ඇත. මේවා ප්‍රධාන වශයෙන්ම දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන නැවත වගාකිරීම්, ජල කළමනාකරණය මෙන්ම දැඩි අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් අස්වැන්න නෙළීමෙන් පසු සිදුවන හානි අවම කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ලබයි. ගෝලීය පරිසර පහසුකම (GEF) මඟින් පොල් වගාකරන ප්‍රදේශවල පාරිසරික පද්ධති සේවාවන්, තිරසාර භූමි කළමනාකරණය සහ කෘෂි-ජෛව විවිධත්ව සංරක්ෂණය කෙරෙහි අවධානය යොමු කරන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන සපයනු ඇත. හරිත කෘෂි-කාර්මික ව්‍යාපෘති සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් මනා පළපුරුද්දක් ඇති එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය, තාක්ෂණික සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමේ සහාය ලබා දෙනු ඇත.

**8.8 අවදානම් කළමනාකරණ රාමුව**

කෘෂිකාර්මික අගය දාමයන් සඳහා ආයෝජනය කිරීමේ ක්‍රියාවලිය තුළ විවිධ අවදානම් පවතියි. ඊට ප්‍රධාන වශයෙන් සාධක දෙකක් බලපායි: එනම්, බෝග නිෂ්පාදනයට බලපාන අනපේක්ෂිත කාලගුණ රටාවන් හා වෙනස් වන වෙළෙඳපොළ මිල ගණන්, සහ කුඩා පරිමාණ ගොවි කටයුතු මෙන්ම ව්‍යාපාරවල ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු හා සම්බන්ධ මූල්‍ය අවදානම් ය. ආයෝජකයින්ගේ විශ්වාසය දිනාගැනීම සඳහා සංවර්ධන මූල්‍ය ආයතන (DFIs) සතු මූල්‍ය සම්පත් සහ විශේෂඥ

දැනුම උපයෝගී කරගනිමින්, පොල් ක්ෂේත්‍රය තුළ අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කරනු ඇත. ක්ෂේත්‍රයේ පවතින අවිනිශ්චිතතාව හේතුවෙන් මීට පෙර උනන්දුවක් නොදැක් වූ පුද්ගලික හා වාණිජ අංශයේ මූල්‍ය ආයෝජන දායකත්වය ආකර්ෂණය කරගැනීම සඳහා ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව ප්‍රධාන සංවර්ධන මූල්‍ය ආයතන ලෙස කටයුතු කරනු ඇත. ඒ සඳහා ඔවුන් අර්ධ ණය සහතික, මුල්-අලාභ ආරක්ෂණ යාන්ත්‍රණ සහ දේශපාලන අවදානම් රක්ෂණ ක්‍රමවේද ඒකාබද්ධව භාවිත කරනු ඇත. මෙම මූල්‍ය ක්‍රමවේද හරහා, සැකසුම් සමාගම්වලට, අපනයන ව්‍යාපාරවලට සහ කුඩා පරිමාණ ගොවීන් සමඟ කටයුතු කරන සංවිධානවලට අඩු පිරිවැයකින් ණය මුදල් ලබාගැනීමට අවස්ථාව සැලසෙන අතර, ණය දෙන්නන්ට දිගුකාලීන ණය පියවීමේ කාලසීමාවන් සහ වැඩි ණය මුදල් ප්‍රමාණයන් ලබාදීමට ද එමගින් හැකියාව ලැබෙනු ඇත.

මෙම අවදානම් කළමනාකරණ පද්ධතියේ තෙවැනි අත්‍යවශ්‍ය අංගය ලෙස තාක්ෂණික සහාය ලබාදීම ස්ථාපිත කෙරේ. එමගින් ණය ලබාගන්නන් සහ මූල්‍ය අතරමැදියන් යන දෙපාර්ශවයටම, පරිසර හා සමාජ ආරක්ෂණ පියවරයන් පිළිබඳ විශේෂඥ දැනුම සමගින් ඔවුන්ගේ මූල්‍ය කළමනාකරණ සහ දත්ත වාර්තාකරණ හැකියාවන් වර්ධනය කරගැනීමට අවස්ථාව සැලසේ. මෙම මූල්‍ය උපකරණවල සංකලනය තුළින්, මූල්‍යකරණ කාණ්ඩ තුන පුරාම බැංකුවලට තමන්ගේ මෙහෙයුම් සඳහා අඛණ්ඩව අරමුදල් සපයාගත හැකි විශ්වාසදායක මෙහෙයුම් පරිසරයක් නිර්මාණය වනු ඇත.

### 8.9 ආයතනික විධිවිධාන

පොල් අංශයේ ආයෝජන පහසුකම් සැලසීමේ ඒකකය (CSIFU) පොල් ක්ෂේත්‍රයේ සියලුම ආයෝජන කටයුතු කළමනාකරණය කරන ප්‍රධාන ආයතනය ලෙස ක්‍රියා කරනු ඇත. මෙම ඒකකය, පොල් ක්ෂේත්‍රයට ගලා එන ආයෝජන එක්රැස් කරන, සම්බන්ධීකරණය කරන සහ කළමනාකරණය කරන මධ්‍යම වේදිකාව ලෙස කටයුතු කරන අතරම, රාජ්‍ය ආයතන, සංවර්ධන හවුල්කරුවන් සහ පෞද්ගලික ආයෝජකයින් අතර සම්බන්ධීකරණ පාලමක් ලෙස ද ක්‍රියා කරයි.

CSIFU ආයතනය සිය මෙහෙයුම් හරහා විවිධ මූල්‍යකරණ හවුල්කරුවන් වෙත ප්‍රවේශ වීමේ අවස්ථාව උදාකර දෙයි. මේ යටතේ, සහනදායී සහ ඒකාබද්ධ අරමුදල් සපයන සංවර්ධන මූල්‍ය ආයතන සමඟ ද; ව්‍යවසාය මට්ටමේ මූල්‍යකරණය සහ මෙහෙයුම් ප්‍රාග්ධන සහාය ලබා දෙන වාණිජ බැංකු සමඟ ද තිරසාරභාවය සහ ඔරොත්තු දීමේ හැකියාව වෙනුවෙන් ආයෝජනය කිරීමට ඉඩ සලසන දේශගුණික අරමුදල් සමඟ ද මෙම ආයතනය එක්ව කටයුතු කරනු ඇත. එසේම, වැදගත් අගය දාම සඳහා අරමුදල් උපදවා ගැනීම අරමුණු කරගනිමින්, දේශීය මෙන්ම ජාත්‍යන්තර මට්ටමින් ක්‍රියාත්මක වන පෞද්ගලික ආයෝජකයින් සමඟ ද මෙම ඒකකය සෘජුවම සම්බන්ධ වී කටයුතු කරනු ඇත.

CSIFU ආයතනය විසින් ආයෝජන ප්‍රමුඛතා හඳුනාගැනීම සහ ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම හරහා විවිධ පාර්ශවයන් අතර වඩා හොඳ සම්බන්ධීකරණයක් ගොඩනගනු ලබයි. මෙය ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නැංවීමට මෙන්ම ක්ෂේත්‍රය තුළ මූල්‍ය ආයෝජනයන් කඩිනම් කිරීමට ද හේතු වේ. මෙම සංවිධානය පොල් ක්ෂේත්‍රයේ ආයෝජන සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කරන අතරම, අරමුදල් ව්‍යුහය ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන අත්‍යවශ්‍ය ආයතනික පද්ධතියක් ලෙස ක්‍රියා කරයි.

### 8.10 අදියරගත මූල්‍යකරණ උපායමාර්ගය

පොල් අංශයේ මූල්‍යකරණ උපායමාර්ගය අදියර කිහිපයක් ඔස්සේ ක්‍රියාත්මක කෙරෙන අතර, එමගින් ක්ෂේත්‍රය තිරසාර වෙළෙඳපොළ පදනම් කරගත් අරමුදල් සැපයීමේ අරමුණ කරා ළඟා වන තෙක් ආයෝජක විශ්වාසය තහවුරු කරනු ඇත. මෙහි ආරම්භක අදියරේදී දායකයින්ගේ සහ සහනදායී මූල්‍ය ආධාර භාවිතයෙන් ආයෝජන සඳහා අරමුදල් සපයනු ලබයි. එහිදී ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර කෘෂිකාර්මික සංවර්ධන අරමුදල වැනි ජාත්‍යන්තර

සංවර්ධන ආයතන විසින්, අවදානම් අවම කිරීමේ උත්සාහයන් හරහා ක්ෂේත්‍රයට අවශ්‍ය මූලික පද්ධති ගොඩනැගීමට කටයුතු කරනු ඇත.

දෙවැනි අදියර මගින් ඒකාබද්ධ මූල්‍යකරණය හඳුන්වා දෙනු ලබන අතර, එහිදී සංවර්ධන මූල්‍ය ආයතන විසින් ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව, දේශීය බැංකු සහ පෞද්ගලික ආයෝජකයින් සමඟ අත්වැල් බැඳගනිමින් ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සහ ආයෝජන පුළුල් කිරීම සිදු කරනු ඇත. දේශීය බැංකු, ආයතනික ව්‍යවසායන් සහ ප්‍රාග්ධන වෙළෙඳපොළවල් ආයෝජන කටයුතුවල වගකීම භාරගැනීමත් සමඟ, වාණිජ මූල්‍යකරණය ප්‍රධාන අරමුදල් ප්‍රභවය බවට පත්වන විට මෙම ක්ෂේත්‍රය එහි අවසාන අදියරට අවතීර්ණ වේ. එමගින් සහනදායී මූල්‍යකරණය මත පවතින යැපීම අවම කරමින්, දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වයක් තහවුරු කරනු ඇත.


| අදියර | මට්ටම | ප්‍රධාන මූල්‍යකරණ වර්ගය | ප්‍රමුඛ දායකයින් |
|---|---|---|---|
| 1 වන අදියර | පදනම ගොඩනැගීම | දායකයින්ගේ සහ සහනදායී මූල්‍යකරණය | ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර කෘෂිකාර්මික සංවර්ධන අරමුදල |
| 2 වන අදියර | පුළුල් කිරීම | ඒකාබද්ධ මූල්‍යකරණය | ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව, පෞද්ගලික ආයෝජකයින්, දේශීය බැංකු |
| 3 වන අදියර | පරිණත අවධිය | වාණිජ මූල්‍යකරණය | බැංකු, ආයතනික ව්‍යවසායන්, ප්‍රාග්ධන වෙළෙඳපොළවල් |

### 8.11 මූල්‍යකරණ ඉලක්ක (දර්ශක)

යෝජිත මූල්‍ය ව්‍යුහය සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය අත්‍යවශ්‍ය වේ. මන්දයත්, වෙළෙඳපොළ පදනම් කරගත් සංවර්ධන අවශ්‍යතා සහ අගය දාමයේ වර්ධන අවශ්‍යතාවලට අනුකූලව, සමස්ත අරමුදල්වලින් දළ වශයෙන් සියයට 50 ත් 60 ත් අතර ප්‍රමාණයක් සපයනු ලබන්නේ පෞද්ගලික ආයෝජකයින් විසිනි. සංවර්ධන මූල්‍ය ආයතන සහ දේශීය කාලගුණික අරමුදල් මගින් සමස්ත අරමුදල්වලින් සියයට 25 ත් 35 ත් අතර ප්‍රමාණයක් සැපයීමට අපේක්ෂා කෙරේ. එමගින් සහනදායී මූල්‍යකරණය සහ අවදානම් ආරක්ෂණ ක්‍රමවේදයන් සපයන අතරම, ආයෝජකයින්ට වෙළෙඳපොළට පිවිසීමට ද අවස්ථාව සලසා දෙයි. සමස්ත ක්ෂේත්‍රයේම වර්ධනයට ඉවහල් වන පොදු යහපත උදෙසා කෙරෙන ආයෝජන සහ උපායමාර්ගික මුලපිරීම් සඳහා රජය සියයට 10 ත් 15 ත් අතර ප්‍රතිපාදන ප්‍රමාණයකින් දායක වනු ඇත. පොල් ක්ෂේත්‍රයේ මූල්‍ය සැලැස්ම මෙම ඉලක්ක තුන උපයෝගී කරගනිමින්, අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් සහ බාහිර මූල්‍ය සම්පත් හරහා මෙහෙයුම් අරමුදල් සපයා ගන්නා අතරම එහි දිගුකාලීන පැවැත්ම ද තහවුරු කරයි.

| පාර්ශවය | දායකත්ව ප්‍රතිශතය |
|---|---|
| පෞද්ගලික අංශය | 50–60% |
| සංවර්ධන මූල්‍ය ආයතන සහ දේශගුණික අරමුදල් | 25–35% |
| රජය | 10–15% |

රූපය 16 - SP&R සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැපයීමේ ක්‍රමානුකූල නිරූපණය



## 9. ඇමුණුම්

### 9,1 ඇමුණුම 1: පාර්ශවකරුවන්: වගකීම්, ක්‍රියාමාර්ග සහ ප්‍රතිලාභ න්‍යාසය

| පාර්ශවකරු | ප්‍රධාන ක්‍රියාකාරකම් / වගකීම් | වගකිවයුතු ආයතනය | අපේක්ෂිත ප්‍රතිලාභ |
|---|---|---|---|
| **කුඩා පරිමාණ ගොවීන්** | ■ වාර්ෂිකව පැළ මිලියන 4ක් සිටුවීම<br><br>■ පොල් සංවර්ධන නිලධාරීන්ගේ සහාය ඇතිව වාර්ෂිකව වයස්ගත/ඵලදායීතාවයෙන් තොර ගස් වෙනුවට මිලියන 1.1ක් නැවත වගා කිරීම<br><br>■ වාර්ෂිකව හෙක්ටයාර 13,000ක හිඩැස් පිරවීම<br><br>■ හෙක්ටයාරයකට රසායනික පොහොර මෙට්‍රික් ටොන් 1.5ක්, කාබනික පොහොර මෙට්‍රික් ටොන් 5ක් සහ ජෛව අඟුරු මෙට්‍රික් ටොන් 0.75ක් යෙදීම<br><br>■ ඒකාබද්ධ කෘමි හානි කළමනාකරණ ක්‍රමවේද අනුගමනය කිරීම: ක්ෂේත්‍ර නිරීක්ෂණය, පැරමෝන උගුල්, ජෛව විද්‍යාත්මක පාලනය<br><br>■ පාංශු තෙතමනය සංරක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීම<br><br>■ පුහුණු වැඩසටහන්, ආදර්ශ ගොවිපොළවල් සහ ක්ෂේත්‍ර චාරිකා සඳහා සම්බන්ධ වීම<br><br>■ අතුරු බෝග වගාව, සත්ත්ව | **ප්‍රමුඛ දායකත්වය:**<br><br>■ පොල් වගා කිරීමේ මණ්ඩලය - ව්‍යාප්ති සේවා, ගොවීන් ඒකරාශි කිරීම<br><br>■ පොල් පර්යේෂණ ආයතනය - තාක්ෂණික මඟපෙන්වීම<br><br>**සහායක දායකත්වය:**<br><br>■ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br><br>■ ජාතික පොහොර ලේකම් කාර්යාලය<br><br>■ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (බීෂ) - ගුණාත්මක ප්‍රමිති (සීමිත භූමිකාවක්)<br><br>■ පොල් වගා කරන්නන්ගේ සංගම් / සමිති | ■ ඉහළ අස්වැන්නක් සහ වඩාත් ස්ථාවර ආදායමක් ලැබීම<br><br>■ නියඟය, කෘමි හානි සහ වෙළෙඳපොළ කම්පනයන්ට මුහුණ දීමේ අවදානම අවම වීම<br><br>■ අතුරු බෝග සහ සත්ත්ව පාලනය මඟින් ආදායම් මාර්ග විවිධාංගීකරණය වීම<br><br>■ පුහුණුව සහ උපදේශන සේවා හරහා වඩා හොඳ තීරණ ගැනීමට හැකි වීම<br><br>■ ඔරොත්තුදීමේ හැකියාව ශක්තිමත් වීම සහ රටේ ආහාර සුරක්ෂිතතාව වර්ධනය වීම<br><br>■ ගොවිතැන් ජීවනෝපාය කෙරෙහි වැඩි විශ්වාසයක් සහ අභිමානයක් ඇති වීම |

| | | | |
|---|---|---|---|
| | පාලනය ඒකාබද්ධ කිරීම සහ නව තාක්ෂණයන් වැළඳගැනීම<br><br>■ පරාගණ පිළිවෙත් දියුණු කිරීම (වාසස්ථාන කළමනාකරණය/මී මැසි පාලනය)<br><br>■ නිවැරදි ගොවිපොළ වාර්තා පවත්වා ගැනීම, ප්‍රගති සමාලෝචනය සඳහා දත්ත හුවමාරු කරගැනීම සහ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් සඳහා දායක වීම<br>■ පොල් වතු 20,000ක් පුරා දියුණු කළ වගා පිළිවෙත් ක්‍රියාවට නැංවීම<br><br>■ හෙක්ටයාර 50,000ක භූමි ප්‍රමාණයක නව තාක්ෂණයන් ස්ථාපිත කිරීම (ක්ෂුද්‍ර වාරි ක්‍රම, දියර පොහොර යෙදීම, යාන්ත්‍රීකරණය, ඩිජිටල් මෙවලම්)<br><br>■ අවශ්‍ය පොහොර සහ පාංශු සංශෝධක මිලදී ගැනීම<br><br>■ වගා කටයුතු සහ භූමි කළමනාකරණ යාන්ත්‍රණ සඳහා ආයෝජනය කිරීම<br><br>■ නැවත වගා කිරීම් සහ හිඩැස් පිරවීම් හඳුනාගෙන ඒවා ක්‍රියාවට නැංවීම<br><br>■ අතුරු බෝග සහ සත්ත්ව පාලනය සඳහා ආයෝජනය කිරීම | ■ මාධ්‍ය ආයතන (දැනුවත් කිරීම් සඳහා පමණි)<br><br>■ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය<br><br>■ ජනමාධ්‍ය අමාත්‍යාංශය<br><br>■ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව<br><br>■ තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය | |

| | | | |
|---|---|---|---|
| | ■ නිෂ්පාදනය, යෙදවුම්, පිරිවැය සහ ආදායම පිළිබඳ සවිස්තරාත්මක වාර්තා පවත්වා ගැනීම<br><br>■ පරාගණය වැඩි දියුණු කිරීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම (උදා: මී මැසි පාලනය)<br><br>■ දැනුම බෙදාහදා ගැනීම සහ ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකාවලට සත්කාරකත්වය සැපයීම<br><br>■ මාර්ග සිතියම් සම්බන්ධීකරණ පද්ධති සඳහා දායක වීම | | |
| පොල් වතු හිමියන් (පෞද්ගලික සහ රාජ්‍ය වතු) | ■ පොල් වතු 20,000ක් පුරා දියුණු කළ වගා පිළිවෙත් ක්‍රියාවට නැංවීම<br><br>■ හෙක්ටයාර 50,000ක භූමි ප්‍රමාණයක නව තාක්ෂණයන් ස්ථාපිත කිරීම (ක්ෂුද්‍ර වාරි ක්‍රම, දියර පොහොර යෙදීම, යාන්ත්‍රීකරණය, ඩිජිටල් මෙවලම්)<br><br>■ අවශ්‍ය පොහොර සහ පාංශු සංශෝධක මිලදී ගැනීම<br><br>■ පොල් වතු 20,000ක් පුරා දියුණු කළ වගා පිළිවෙත් ක්‍රියාවට නැංවීම<br><br>■ හෙක්ටයාර 50,000ක භූමි ප්‍රමාණයක නව තාක්ෂණයන් | **ප්‍රමුඛ දායකත්වය:**<br><br>■ වතු සමාගම් / රාජ්‍ය වතු ආයතන<br><br>■ පොල් වගා කිරීමේ මණ්ඩලය<br><br>**සහායක දායකත්වය:**<br><br>■ පොල් පර්යේෂණ ආයතනය<br><br>■ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ■ ඵලදායීතාව සහ ලාභදායීතාව ඉහළ යාම<br><br>■ ශක්‍යතා සහිත අගය දාම ක්‍රියාකාරකම් තුළ යාන්ත්‍රීකරණය සහ නවතම තාක්ෂණය භාවිත කිරීම මගින් ශ්‍රම හිඟයට පිළියම් ලැබීම<br><br>■ ව්‍යාප්ති සේවාවන් ස්වයංක්‍රීයකරණය සහ ඩිජිටල්කරණය වීම<br><br>■ ආයෝජකයින් ආකර්ෂණය කරගැනීම සඳහා පාරිසරික, සමාජීය සහ පාලන පැතිකඩ දියුණු වීම |

| | | | |
|---|---|---|---|
| | ස්ථාපිත කිරීම (ක්ෂුද්‍ර වාරි ක්‍රම, දියර පොහොර යෙදීම, යාන්ත්‍රීකරණය, ඩිජිටල් මෙවලම්)<br><br>■ අවශ්‍ය පොහොර සහ පාංශු සංශෝධක මිලදී ගැනීම<br><br>■ වගා කටයුතු සහ භූමි කළමනාකරණ යාන්ත්‍රණ සඳහා ආයෝජනය කිරීම<br><br>■ නැවත වගා කිරීම් සහ හිඩැස් පිරවීම් හඳුනාගෙන ඒවා ක්‍රියාවට නැංවීම<br><br>■ අතුරු බෝග සහ සත්ත්ව පාලනය සඳහා ආයෝජනය කිරීම<br><br>■ නිෂ්පාදනය, යෙදවුම්, පිරිවැය සහ ආදායම පිළිබඳ සවිස්තරාත්මක වාර්තා පවත්වා ගැනීම<br><br>■ පරාගණය වැඩි දියුණු කිරීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම (උදාඃ මී මැසි පාලනය)<br><br>■ දැනුම බෙදාහදා ගැනීම සහ ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකාවලට සත්කාරකත්වය සැපයීම | ■ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br><br>■ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය<br><br>■ පෞද්ගලික තාක්ෂණ සැපයුම්කරුවන්<br><br>■ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA ආදිය) - (නිෂ්පාදන තොරතුරු සොයායෑමේ පද්ධති සඳහා | ■ වඩාත් පුරෝකථනය කළ හැකි සහ වෘත්තීයමය ගොවිපොළ කළමනාකරණය<br><br>■ ඉහළ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පිරිවැය අවම වීම<br><br>■ දේශීය හා අපනයන වෙළෙඳපොළ තුළ තරගකාරීත්වය ශක්තිමත් වීම |

| | | | |
|---|---|---|---|
| | ■ මාර්ග සිතියම් සම්බන්ධීකරණ පද්ධති සඳහා දායක වීම | | |
| එකතු කරන්නන් / බෙදාහරින්නන් / ප්‍රාථමික සකසන්නන් | ■ එකතු කරන ලද සහ පිරිසැකසුම් කරන ලද පොල් පිළිබඳ නිවැරදි වාර්තා තබා ගැනීම<br><br>■ කාලසටහන්ගත කිරීම, සන්නිවේදනය සහ මිල ගණන්වල විනිවිදභාවය දියුණු කිරීම<br><br>■ සැපයුම් ජාල සඳහා ආයෝජනය කිරීම (ලී/ප්ලාස්ටික් කූඩ, ගබඩා පහසුකම්, තෙතමනය පාලනය කළ මධ්‍යස්ථාන, ප්‍රවාහන වාහන)<br><br>■ ඩිජිටල් හෝ අතින් ලියන ලද දත්ත හුවමාරුව හරහා තොරතුරු සොයායෑමේ හැකියාව වැඩි දියුණු කිරීම<br><br>■ ලෙලි සහ කටු එකතු කිරීම ඉහළ නැංවීම<br><br>■ ගොවීන්, සැකසුම්කරුවන් සහ රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය පවත්වා ගැනීම<br><br>■ මාර්ග සිතියම් ප්‍රගති සමාලෝචනය සඳහා දත්ත හුවමාරු කරගැනීම | **ප්‍රමුඛ දායකත්වය:**<br><br>■ පොල් සංවර්ධන අධිකාරිය - වෙළෙඳපොළ නියාමනය<br><br>■ එකතු කරන්නන්ගේ සංගම් (CCCI යටතේ පවතින)<br><br>**සහායක දායකත්වය:**<br><br>■ පොල් වගා කිරීමේ මණ්ඩලය<br><br>■ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br><br>■ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය<br><br>■ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICT ආදිය) - නිෂ්පාදන තොරතුරු සොයායෑමේ පද්ධති සඳහා | ■ නාස්තිය සහ අස්වැන්න නෙළීමෙන් පසු සිදුවන හානි අවම වීම<br><br>■ එකතු කරනු ලබන පොල්වල ගුණාත්මකභාවය සහ අඛණ්ඩතාව වර්ධනය වීම<br><br>■ ඉහළ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පිරිවැය අවම වීම<br><br>■ ගොවීන් සහ ගැනුම්කරුවන් අතර විශ්වාසය තහවුරු වීම<br><br>■ වඩාත් ස්ථාවර මිල ගණන් සහ දිගුකාලීන ව්‍යාපාරික හවුල්කාරිත්වයන් ඇති වීම<br><br>■ අගය දාමයේ ප්‍රධාන සම්බන්ධීකාරකයින් ලෙස භූමිකාව ශක්තිමත් වීම |

| | | | |
|---|---|---|---|
| සැකසුම්කරුවන් (දේශීය සහ අපනයන ඉලක්ක කරගත්) | ■ අමුද්‍රව්‍යවල ගුණාත්මකභාවය මත පදනම් වූ සාධාරණ මිලක් ගෙවීම<br><br>■ ආහාර ආරක්ෂණ පද්ධති නඩත්තු කිරීම සහ සංවර්ධනය කිරීම (ISO, HACCP, කාබනික සහතික)<br><br>■ මදය, ලෙලි, සක්‍රිය කාබන්, කොහු බත්, දිසිදි පොල් සහ පොල් වතුර සැකසීමේ ධාරිතාව ඉහළ නැංවීම<br><br>■ නව හෝ නවීකරණය කරන ලද පොල් වතුර සැකසුම් මධ්‍යස්ථාන 25ක් සඳහා ආයෝජනය කිරීම<br><br>■ අතිරේක පෝෂණ ද්‍රව්‍ය, රූපලාවන්‍ය ද්‍රව්‍ය සහ ශාක පදනම් කරගත් නිෂ්පාදන සඳහා විවිධාංගීකරණය වීම<br><br>■ දේශීය පරිභෝජන චර්යාවන් වෙනස් කිරීමේ ප්‍රචාරණ වැඩසටහන් සඳහා ඒකාබද්ධ අරමුදල් සැපයීම<br><br>■ මාර්ග සිතියම් ප්‍රගති සමාලෝචනය සහ දත්ත හුවමාරුව සඳහා දායක වීම | **ප්‍රමුඛ දායකත්වය:**<br><br>■ පොල් සංවර්ධන අධිකාරිය<br><br>■ කර්මාන්ත සංගම් (CCCI, CMA)<br><br>**සහායක දායකත්වය:**<br><br>■ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br><br>■ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය<br><br>■ පොල් පර්යේෂණ ආයතනය- නිෂ්පාදන පර්යේෂණ හා සංවර්ධන කටයුතු<br><br>■ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය | ■ උසස් තත්ත්වයේ අමුද්‍රව්‍ය සඳහා ප්‍රවේශය ලැබීම<br><br>■ ඉහළ පෙළේ ගෝලීය වෙළෙඳපොළවල් වෙත පිවිසීමට අවස්ථාව ලැබීම<br><br>■ අගය එකතු කළ නිෂ්පාදන හරහා ඉහළ ලාභයක් ලැබීම<br><br>■ ශක්තිමත් ගෝලීය සන්නාම කීර්තියක් සහ ප්‍රමිතීන්ට අනුකූලතාවක් ගොඩනැඟීම<br><br>■ වඩාත් කාර්යක්ෂම සැපයුම් දාමයන් ඇති වීම<br><br>■ නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම මඟින් ව්‍යාපාරික ඔරොත්තුදීමේ හැකියාව ඉහළ යාම |
| අපනයනකරුවන් | ■ 'සිලෝන් කොකනට් උසස් | **ප්‍රමුඛ දායකත්වය:** | ■ ඉහළ ආදායම් ලබන ගෝලීය |

| | | | |
|---|---|---|---|
| | තත්ත්වයේ සන්නාමයක් ලෙස ප්‍රවර්ධනය කිරීම<br>■ ඉහළ අගයක් එකතු කළ නිෂ්පාදන දෙසට අලෙවිකරණය යොමු කිරීම<br>■ ගෝලීය වෙළෙඳපොළ ප්‍රවණතා, බාධාවන් සහ අවස්ථාවන් පිළිබඳ වාර්තා කිරීම<br>■ පුළුල් කරන ලද නිෂ්පාදන සඳහා ගැනුම්කරුවන් සොයා ගැනීම: පොල් වතුර මෙට්‍රික් ටොන් 205,000ක්; පොල් මද ආශ්‍රිත නිෂ්පාදන මෙට්‍රික් ටොන් 400,000ක්; ලෙලි ආශ්‍රිත නිෂ්පාදන මෙට්‍රික් ටොන් 38,000ක්; සක්‍රිය කාබන් මෙට්‍රික් ටොන් 28,000ක්<br>■ ගෝලීය අලෙවිකරණ ව්‍යාපාර සඳහා ඒකාබද්ධ අරමුදල් සැපයීම<br>■ මාර්ග සිතියම් සම්බන්ධීකරණය සහ ප්‍රතිපත්තිමය සාකච්ඡා සඳහා දායක වීම | ■ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය<br>■ පොල් සංවර්ධන අධිකාරිය<br>**සහායක දායකත්වය:**<br>■ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br>■ ජාතික ශාක නිරෝධායන සේවාව<br>■ ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය<br>■ කර්මාන්ත සංගම් (CCCI)<br>■ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය ICTA ආදිය) - වෙළෙඳපොළ තොරතුරු වේදිකා සඳහා | වෙළෙඳපොළවල් වෙත වැඩි ප්‍රවේශයක් ලැබීම<br>■ ඉහළ අපනයන උපයා ගැනීම් සහ වඩා හොඳ ලාභ පරතරයක්<br>■ අස්ථාවර වෙළෙඳ භාණ්ඩ වෙළෙඳපොළ මත යැපීම අවම වීම<br>■ ගැනුම්කරුවන් අතර ශක්තිමත් සන්නාම දෘශ්‍යතාවක් සහ විශ්වාසයක් ගොඩනැඟීම<br>■ වෙළෙඳපොළ තොරතුරු හේතුවෙන් තරගකාරීත්වය ඉහළ යාම<br>■ ගෝලීය ඉල්ලුමේ ප්‍රවණතාවලට ඉක්මනින් ගැළපීමට ඇති හැකියාව |
| රාජ්‍ය ආයතන සහ ව්‍යාප්ති සේවාවන් | ■ නව වගාවන් සඳහා අක්කර 40,000ක් වෙන් කිරීම<br>■ ව්‍යාප්ති ක්‍රමවේද සහ උපදේශන සේවාවන් ශක්තිමත් කිරීම | **ප්‍රමුඛ දායකත්වය:**<br>■ පොල් පර්යේෂණ ආයතනය | ■ ශක්තිමත් ජාතික සැලසුම්කරණයක් සහ ක්ෂේත්‍ර පාලනයක් ඇති වීම<br>■ සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති |


| | | | |
|---|---|---|---|
| | ■ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති 9ක් ක්‍රියාත්මක කිරීම සහ නව ප්‍රභේද 10ක් සංවර්ධනය කිරීම<br><br>■ ආදර්ශ ගොවිපොළවල් 40ක් පිහිටුවීම<br><br>■ ඒකාබද්ධ කෘමි හානි කළමනාකරණ වැඩසටහන් සහ දිස්ත්‍රික් මට්ටමේ ප්‍රතිචාර දැක්වීම් සඳහා නායකත්වය දීම<br><br>■ ගොවීන්ගේ හැසිරීම් රටාවන් වෙනස් කිරීමේ ප්‍රචාරක වැඩසටහන් 20ක්, උපායමාර්ගික සන්නිවේදන වැඩසටහන් 50ක් සහ ගෝලීය අලෙවිකරණ වැඩසටහන් 30ක් දියත් කිරීම<br><br>■ ප්‍රතිපාදන, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සහ රක්ෂණ ක්‍රමවේද සැපයීම<br><br>■ ප්‍රතිපත්තිමය වටපිටාව, තාක්ෂණය හඳුන්වා දීම, ජල ප්‍රවේශය සහ පොහොර නිෂ්පාදනය දියුණු කිරීම<br><br>■ භූගෝලීය තොරතුරු පද්ධති සහ | ■ පොල් වගා කිරීමේ මණ්ඩලය<br><br>■ පොල් සංවර්ධන අධිකාරිය<br><br>**සහායක දායකත්වය:**<br><br>■ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br><br>■ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය<br><br>■ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA ආදිය)<br><br>■ ජනමාධ්‍ය අමාත්‍යාංශය (ප්‍රචාරණ කටයුතු සඳහා පමණි) | සම්පාදනය දියුණු වීම<br><br>■ රාජ්‍ය සේවාවන් කෙරෙහි ගොවීන්ගේ විශ්වාසය ඉහළ යාම<br><br>■ ක්ෂේත්‍රයේ ඵලදායීතාව සහ තිරසාරභාවය ඉහළ යාම<br><br>■ අවදානම්, අස්වැන්න සහ ලාභදායීතාව වඩා හොඳින් නිරීක්ෂණය කිරීමට හැකි වීම<br><br>■ සම්බන්ධීකරණය සහ විනිවිදභාවය සම්බන්ධයෙන් ජාත්‍යන්තර කීර්තියක් අත්කර ගැනීම |

| | | | |
|---|---|---|---|
| | ජාතික දත්ත පද්ධති ස්ථාපිත කිරීම මෙන්ම ප්‍රධාන ආයතන 3 තුළ (CCB, CRI, CDA) ඩිජිටල් ඒකක පිහිටුවීම<br><br>■ මාර්ග සිතියමේ සම්බන්ධීකරණය සහතික කිරීම | | |
| මූල්‍ය ආයතන / ආයෝජකයින් | ■ හෙක්ටයාර 200,000ක ආයෝජනයන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැපයීම<br><br>■ නව තාක්ෂණයන් සඳහා ණය පහසුකම් ලබා දීම (ක්ෂුද්‍ර වාරි කටයුතු, යාන්ත්‍රීකරණය, ඩිජිටල් මෙවලම්)<br><br>■ දැරිය හැකි ණය පහසුකම් පවතින බව සහතික කිරීම<br><br>■ රක්ෂණ සහ අවදානම් බෙදාහදා ගැනීමේ ක්‍රමවේද හඳුන්වා දීම<br><br>■ ණය පටිපාටි සරල කිරීම සහ ඩිජිටල් මූල්‍යකරණය පුළුල් කිරීම<br><br>■ මාර්ග සිතියම් සම්බන්ධීකරණය සඳහා දායක වීම | **ප්‍රමුඛ දායකත්වය:**<br><br>■ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br><br>■ රාජ්‍ය සහ පෞද්ගලික බැංකු<br><br>**සහායක දායකත්වය:**<br><br>■ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය<br><br>■ සංවර්ධන හවුල්කරුවන්<br><br>■ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA ආදිය) - ඩිජිටල් මූල්‍ය වේදිකා සඳහා | ■ ග්‍රාමීය ණය දීමේ අවස්ථා පුළුල් වීම<br><br>■ ණය පැහැර හැරීමේ අනුපාත අවම වෙමින් වඩාත් යහපත් ණය කළඹක් නිර්මාණය වීම<br><br>■ හරිත මූල්‍යකරණය සහ කෘෂි-තාක්ෂණික ආයෝජන තුළ නව වෙළෙඳපොළවල් බිහිවීම<br><br>■ රක්ෂණ සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් හේතුවෙන් ණය දීමේ අවදානම අවම වීම<br><br>■ ග්‍රාමීය ප්‍රදේශවල මූල්‍ය අන්තර්ගතභාවය ශක්තිමත් වීම |


| | | | |
|---|---|---|---|
| | | ■ CDA / CCB (ව්‍යාපෘති සම්බන්ධීකරණය සඳහා) | |
| විද්වත් ප්‍රජාව සහ සංවර්ධන හවුල්කරුවන් | ■ ගොවිතැන් ආදර්ශයන් සඳහා තාක්ෂණික සහාය ලබා දීම<br>■ පිරිවැය අවම කරන නව තාක්ෂණයන් සඳහා ව්‍යාපෘති යෝජනාවලි සකස් කිරීම<br>■ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සඳහා සහාය වීම<br>■ හැසිරීම් රටාවන්ගේ වෙනස්වීම් සහ තාක්ෂණය වැළඳගැනීම ලේඛනගත කිරීම සහ විශ්ලේෂණය කිරීම<br>■ දත්ත සහ GIS තොරතුරු විශ්ලේෂණය කිරීම<br>■ ගොවීන්, එකතු කරන්නන්, සැකසුම්කරුවන් සහ අපනයනකරුවන් පුහුණු කිරීම<br>■ මාර්ග සිතියම් සම්බන්ධීකරණය සහ ඇගයීම් කටයුතු සඳහා දායක වීම | **ප්‍රමුඛ දායකත්වය:**<br>■ විශ්වවිද්‍යාල / කෘෂිකර්ම පීඨ<br>■ පොල් පර්යේෂණ ආයතනය<br>**සහායක දායකත්වය:**<br>■ ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය<br>■ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>■ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA)<br>■ සංවර්ධන හවුල්කරුවන් (FAO, ලෝක බැංකුව, IFAD, ACIAR ආදිය) | ■ පර්යේෂණ සහ නවෝත්පාදනයන්හි ප්‍රායෝගික බලපෑමක් ක්ෂේත්‍රය තුළ දැකගත හැකි වීම<br>■ රජය සහ කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ ශක්තිමත් හවුල්කාරිත්වයන් ගොඩනැගීම<br>■ අරමුදල් සහ ඒකාබද්ධ ව්‍යාපෘති සඳහා වැඩි ප්‍රවේශයක් ලැබීම<br>■ කෘෂිකාර්මික නවෝත්පාදනයන්හි ප්‍රමුඛ ස්ථානයක් හිමි කරගැනීම<br>■ ධාරිතා වර්ධනය සහ දැනුම හුවමාරු කිරීමේ භූමිකාවන් ශක්තිමත් වීම |

| | | | |
|---|---|---|---|
| | ▪ ජාතික පොල් නවෝත්පාදන මධ්‍යස්ථානයක් පිහිටුවීම | | |


# 5.7 ඇමුණුම 2: ගණිතමය ආකෘති අර්ථ දැක්වීම්, උපකල්පන සහ ගණනය කිරීම්



## 6.9 5.7 ඇමුණුම3: ආයතනික සිතියම්ගතකරණය



# රූපය 14 - පොල් ක්ෂේත්‍රයට අදාල ආයතනික රාමුව



## 9.4 ඇමුණුම 4: පාර්ශවකරුවන්ගේ කණ්ඩායම / අදහස් ලබාගත් පුද්ගලයින්, ආරම්භක වැඩමුළුවේ සහභාගිවූවන්, මෙහෙයුම් කමිටුව (ලැයිස්තු)

### 9.4.1 මෙහෙයුම් කමිටුවේ සාමාජිකයින්

| අංකය | නම | ආයතනය - තනතුර |
|---|---|---|
| 1 | බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා (නව ලේකම්වරුන්ගේ විස්තර ඇතුළත් කළ යුතුය) | වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය - ලේකම් |
| 2 | කේ. එස්. විජයකීර්ති මහතා (නව අතිරේක ලේකම්වරුන්ගේ විස්තර ඇතුළත් කළ යුතුය) | වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය - අතිරේක ලේකම් (පොල් හා අනුබද්ධ භෝග සංවර්ධන) |
| 3 | පී. පී. චම්පිකා මහත්මිය | මුදල් අමාත්‍යාංශය - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 4 | ඩබ්ලිව්. ඒ. එස්. ඉරෝෂණ මහතා | මුදල් අමාත්‍යාංශය (ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව) - අධ්‍යක්ෂ |
| 5 | ජයනි ගලගෙදර මහත්මිය | සහකාර අධ්‍යක්ෂ - අපනයන කෘෂිකර්ම අංශය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය |
| 6 | ආචාර්ය නයනි ආරච්චිගේ මහත්මිය | පොල් පර්යේෂණ ආයතනය (CRI) - අධ්‍යක්ෂ |
| 7 | ආචාර්ය සුනිමල් ජයකොඩි මහතා | සභාපති, පොල් වගා කිරීමේ මණ්ඩලය |
| 8 | ශාන්ත රණතුංග මහතා | සභාපති, පොල් සංවර්ධන අධිකාරිය |
| 9 | කේ. එස්. දීපාල් මහතා | පොල් වගා කිරීමේ මණ්ඩලය - සහකාර සාමාන්‍යාධිකාරී (සැලසුම් හා නිරීක්ෂණ) |
| 10 | සම්පත් සේනානායක මහතා | ඔහෂෘධ - ජාතික කෘෂි ව්‍යාපාර විශේෂඥ |
| 11 | ජේසන් සමරනායක මහතා | පොල් කර්මාන්ත මණ්ඩලය – අධ්‍යක්ෂ |
| 12 | චාමර මුණසිංහ මහතා | පොල් කර්මාන්ත මණ්ඩලය |
| 13 | ක්‍රිශාන්ත ජයවර්ධන මහතා | පොල් කර්මාන්ත මණ්ඩලය - අධ්‍යක්ෂ |
| 14 | ශකිල විජේවර්ධන මහතා | පොල් කර්මාන්ත මණ්ඩලය - ලේකම් |
| 15 | රන්දීව මලලසූරිය මහතා | පොල් කර්මාන්ත මණ්ඩලය |
| 16 | දිනේෂ් ප්‍රනාන්දු මහතා | පොල් කර්මාන්ත මණ්ඩලය - අධ්‍යක්ෂ |

**9.4.2 2025 ජනවාරි 15 වන දින IPS ශ්‍රවණාගාරයේදී පවත්වන ලද ආරම්භක වැඩමුළුවට සහභාගී වූවන්ගේ ලැයිස්තුව**

| අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1 | වෛද්‍ය සුනිල් ජයකොඩි මහතා | සභාපති | පොල් වගා කිරීමේ මණ්ඩලය (CCB) |
| 2 | එස්. කේ. දීපාල් මහතා | සහකාර සාමාන්‍යාධිකාරී | පොල් වගා කිරීමේ මණ්ඩලය (CCB) |
| 3 | වෛද්‍ය නයනි ආරච්චිගේ මහත්මිය | අධ්‍යක්ෂ | පොල් පර්යේෂණ ආයතනය (CRI) |
| 4 | ශාන්ත රණතුංග මහතා | සභාපති | පොල් සංවර්ධන අධිකාරිය (CDA) |
| 5 | ජේසන් සමරනායක මහතා | සභාපති | පොල් කර්මාන්ත මණ්ඩලය (CCCI) |
| 6 | චාමර මුණසිංහ මහතා | - | පොල් කර්මාන්ත මණ්ඩලය (CCCI) |
| 7 | පී. පී. චම්පිකා මහත්මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | මුදල් අමාත්‍යාංශය |
| 8 | ඩබ්ලිව්. ඒ. එස්. ඉරෝෂණ මහතා | අධ්‍යක්ෂ | මුදල් අමාත්‍යාංශය (ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව) |
| 9 | ජයනි ගලගෙදර මහත්මිය | සහකාර අධ්‍යක්ෂ | අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) |
| 10 | ශලික විජේවර්ධන මහතා | ලේකම් | පොල් කර්මාන්ත මණ්ඩලය (CCCI) |
| 11 | රන්දීව මලලසූරිය මහතා | අධ්‍යක්ෂ | පොල් කර්මාන්ත මණ්ඩලය (CCCI) |
| 12 | දිනේෂ් ප්‍රනාන්දු මහතා | අධ්‍යක්ෂ | පොල් කර්මාන්ත මණ්ඩලය (CCCI) |
| 13 | එස්. එච්. එස්. සෙනෙවිරත්න මහතා | අධ්‍යක්ෂ | වැවිලි අමාත්‍යාංශය, සංවර්ධන අංශය (පොල් ක්ෂේත්‍රය) |
| 14 | ආචාර්ය වෛද්‍ය චන්දි යාලේගම මහත්මිය | ප්‍රධානී / පොල් සැකසුම් අංශය | පොල් පර්යේෂණ ආයතනය (CRI) |
| 15 | එන්. එස්. ජයලත් මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | පොල් වගා කිරීමේ මණ්ඩලය (CCB) |
| 16 | අශෝක පුෂ්පකුමාර මහතා | අතිරේක අධ්‍යක්ෂ | පොල් සංවර්ධන අධිකාරිය |

| | | | |
|---|---|---|---|
| | | | (CDA) |
| 17 | සුජාන්ති මායාදුන්නේ මහත්මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය |
| 18 | ශලනි ජයසේකර මහත්මිය | සහකාර අධ්‍යක්ෂ | වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය |
| 19 | තීෂ්‍යා දුල්මිණි මහත්මිය | සම්බන්ධීකාරක | වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය |
| 20 | එම්. එම්. පුෂ්පකාන්ත මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | පොල් සංවර්ධන අධිකාරිය (CDA) |
| 21 | විලජ රම්‍යදාස මහතා | අතිරේක අධ්‍යක්ෂ | පොල් සංවර්ධන අධිකාරිය (CDA) |
| 22 | ආචාර්ය අංජන අතපත්තු මහතා | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | පොල් පර්යේෂණ ආයතනය (CRI) |
| 23 | ලලිත් රත්නායක මහතා | ලේකම් | කිරි නිෂ්පාදකයින්ගේ සංගමය |
| 24 | ජයන්ත සමරකෝන් මහතා | සභාපති | පොල් කර්මාන්ත මණ්ඩලය (CCCI) |
| 25 | රනිල් ද සේරම් මහතා | ප්‍රධාන ලේකම් | ලංකා පොල් කර්මාන්ත මණ්ඩලය (CCCI) |
| 26 | ක්‍රිෂාන්ති දාබරේ මහත්මිය | ව්‍යාපෘති නිලධාරී (ග්‍රාමීය සංවර්ධන) | ආසියානු සංවර්ධන බැංකුව |
| 27 | ජුවාන් ෆොරේරෝ මහතා | ක්‍රියාකාරකම් කණ්ඩායම් ප්‍රධානී | PSD |
| 28 | සුනෙත් බණ්ඩාර මහතා | කෘෂි කළමනාකාර | PSD |
| 29 | ප්‍රදීප් ලියනමාන මහතා | ව්‍යාපෘති අධ්‍යක්ෂ | IESC |
| 30 | ආචාර්ය ජොහැන් හෙසේ මහතා | සහයෝගිතා ප්‍රධානී | යුරෝපා සංගමය |
| 31 | චන්දන හේමවාසම් මහතා | වැඩසටහන් කළමනාකාර | යුරෝපා සංගමය |
| 32 | ඩෙනිස් වෙස්නර් මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආර්ථික වර්ධන කාර්යාලය) | USAID |
| 33 | දීපාල් උඩුකුඹුර මහතා | කෘෂි ව්‍යාපාර ප්‍රධානී | හැටන් නැෂනල් බැංකුව |
| 34 | ප්‍රදීප් අල්විස් මහතා | උප සභාපති | DFCC බැංකුව |
| 35 | චන්දන වනිගසේකර මහතා | උප සභාපති, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර | DFCC බැංකුව |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රධානී | |
| 36 | ශෆ්රාස් ෆාරුක් මහතා | ජාතික සන්නිවේදන හා ප්‍රචාරණ නිලධාරී | UNIDO |
| 37 | ආචාර්ය ජයිරෝ විලමිල්-ඩයස් මහතා | ජාත්‍යන්තර ජ්‍යෙෂ්ඨ විශේෂඥ | UNIDO |
| 38 | නාලක සිරිවර්ධන මහතා | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | IESC |
| 39 | කේ. එස්. විජයකීර්ති මහතා | අතිරේක ලේකම් | වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය |
| 40 | සංදීප ගුණරත්න මහතා | ජාතික අගය දාම කමිටුව | UNIDO |
| 41 | සුනෙත් බණ්ඩාර මහතා | කෘෂිකර්ම කළමනාකාර | USAID |
| 43 | ගෝමින්ද ගුණසාද මහතා | සාමාන්‍යාධිකාරී | පොල් කර්මාන්ත මණ්ඩලය (CCCI) |
| 44 | මහේන් මඩුගල්ල මහතා | අධ්‍යක්ෂ | CGASL |
| 45 | අනුරාධි හතුරුසිංහ මෙනෙවිය/මහත්මිය | අලෙවිකරණ අධ්‍යක්ෂ | පොල් සංවර්ධන අධිකාරිය |
| 46 | තරංගනී වික්‍රමසිංහ මහත්මිය | අතිරේක ලේකම් | වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය |
| 47 | ගයානි පත්නල මහත්මිය | සැලසුම් කළමනාකාර | පොල් වගා කිරීමේ මණ්ඩලය |
| 48 | ආචාර්ය මනෝජ් තිබ්බටුවාව මහතා | පර්යේෂණ නිලධාරී | ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය |
| 49 | ආචාර්ය එරන්දතී පතිරාජ මහත්මිය | පර්යේෂණ නිලධාරී | ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය |
| 50 | දිලානි හිරිමුතුගොඩගේ මහත්මිය | පර්යේෂණ ආර්ථික විද්‍යාඥ | ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය |
| 51 | චන්දුල ඉදිරිසිංහ මහතා | පර්යේෂණ නිලධාරී | ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය |
| 52 | නිෂාමිනි ඉහළගෙදර මෙනෙවිය/මහත්මිය | පර්යේෂණ නිලධාරී | ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය |
| 53 | සුලෝචනා සිල්වා මහත්මිය | පර්යේෂණ නිලධාරී | ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය |

**9.4.3 : ප්‍රධාන තොරතුරු සපයන්නන් පිළිබඳ සම්මුඛ සාකච්ඡාවලට සහභාගී වූවන්ගේ ලැයිස්තුව**

| නම | තනතුර | ආයතනය |
|---|---|---|
| ඩබ්ලිව්. එම්. ඩී. ටී. වික්‍රමසිංහ මහත්මිය | අතිරේක ලේකම් | වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය |
| කේ. එස්. විජයකීර්ති මහතා | අතිරේක ලේකම් | වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය |
| ඩබ්ලිව්. එම්. බී. ඒ. විජේසිංහ මහතා | සාමාන්‍යාධිකාරී | පොල් වගා කිරීමේ මණ්ඩලය |
| එන්. එස්. ජයලත් මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | පොල් වගා කිරීමේ මණ්ඩලය |
| එස්. එච්. එස්. සෙනෙවිරත්න මහතා | අධ්‍යක්ෂ | වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය - සංවර්ධන අංශය |
| ශකිල විජේවර්ධන මහතා සහ ක්‍රිශාන්ත ජයවර්ධන මහතා | විධායක කමිටු සාමාජික | ලංකා පොල් කර්මාන්ත මණ්ඩලය |

| | | |
|---|---|---|
| ජේසන් සමරනායක මහතා | අධ්‍යක්ෂ | ලංකා පොල් කර්මාන්ත මණ්ඩලය (CCCI) |
| ආචාර්ය නයනි ආරච්චිගේ මහත්මිය සහ කණ්ඩායම (මහාචාර්ය අජිත් ජයවීර - සභාපති CRI, ආචාර්ය සරත් ඉදිරිසිංහ සහ ආචාර්ය යාලේගම ඇතුළත්ව) | අධ්‍යක්ෂ | පොල් පර්යේෂණ ආයතනය |
| අශෝක පුෂ්පකුමාර මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | පොල් සංවර්ධන අධිකාරිය |
| එම්. එම්. පුෂ්පකාන්ත මහතා සහ ඕෂධී මෙනෙවිය/මහත්මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ | පොල් සංවර්ධන අධිකාරිය |

**9.4.4 : පොල් වගාකරන දිස්ත්‍රික්කවල පවත්වන ලද ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවලට සහභාගී වූවන්ගේ ලැයිස්තුව**

**ගම්පහ, මාකොළ දී 2025 ජුනි 11 වන දින පවත්වන ලද ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාව 2025**

| අංකය | නම | අගය දාමයේ භූමිකාව |
|---|---|---|
| ක්ෂේත්‍ර සංවිධායකවරුන් | | |
| 1 | එම්. ඒ. සී. කේ. විජය ගුණරත්න මහතා | සහකාර ප්‍රාදේශීය කළමනාකාර |
| 2 | කේ. එච්. එම්. ඩී. එන්. බණ්ඩාර මහතා | පොල් සංවර්ධන නිලධාරී - CCB |
| 3 | එච්. පී. තරංගා මහත්මිය | පොල් සංවර්ධන නිලධාරී - CCB |
| සහභාගිවූවන් | | |
| 4 | එල්. එල්. ඩබ්ලිව්. එන්. ආර්. කේ. වික්‍රමසිංහ මහතා | කෘෂිකර්ම උපදේශක - උඩුපිල |
| 1 | එම්. ජේ. ඒ. පෙරේරා මහතා | වගාකරු |
| 2 | එස්. එස්. මායාදුන්නේ මහතා | වගාකරු |
| 3 | මංගලිකා රණසිංහ මහත්මිය | වගාකරු |
| 4 | එච්. නිලන්ති පෙරේරා මහත්මිය | පොල් කර්මාන්ත - නිෂ්පාදක |
| 5 | එල්. ඒ. ඩබ්ලිව්. ඩී. ලියනආරච්චි මහතා | වගාකරු |

| | | |
|---|---|---|
| 6 | ඊ. ඒ. හේමචන්ද්‍ර මහතා | වගාකරු |
| 7 | ඩබ්ලිව්.ප්‍රසන්න මහතා | වගාකරු |
| 8 | කසුන් වකිරිගල මහතා | අපනයනකරු |
| 9 | සෝමතිලක අධිකාරි මහතා | වගාකරු |
| 10 | ධනංජය මන්නායක මහතා | වගාකරු |
| 11 | දමින්ද මන්නායක මහතා | වගාකරු |
| 12 | කේ. ඩී. පෙරේරා මහතා | වගාකරු |
| 13 | ඩබ්ලිව්. ඒ. සී. කුමාර මහතා | තැඹිලි වතුර අපනයනකරු |
| 14 | පී. කේ. බී. ඩී. මයුර දේශප්‍රිය මහතා | වගාකරු |
| 15 | ආර්. ඒ. සී. කුමාර මහතා | පොල්තෙල් නිෂ්පාදකයින් |
| 16 | එන්. මනේශ් ගනේෂ් කුලරාලු මහතා | කොහුබත් කැට අපනයනකරු |
| 17 | සරත් මායාදුන්නේ මහතා | පොල් ආශ්‍රිත නිෂ්පාදන |
| 18 | කේ. ජේ. සුරේන්ද්‍රන් මහතා | වගාකරු |
| 19 | ලක්ෂ්මන් රණසිංහ මහතා | කර්මාන්තය - කොහුබත් |
| 20 | රෝහණ ආරියපාල මහතා | අපනයනකරු - කොහු සහ කෘෂි නිෂ්පාදන |

**ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා ලබුදූව, ගාල්ල - 2025 ජූනි 25 දින පැවැත්වුණු සාකච්ඡාව**

| අංකය | නම | අගය දාමයේ භූමිකාව |
|---|---|---|
| | ක්ෂේත්‍ර සංවිධායකවරුන් | |
| 1 | එච්. ජී. හේමන්ත මහතා | ප්‍රාදේශීය කළමනාකාර |
| 2 | එල්. එන්. මාධවී දේදුණු මහත්මිය | ව්‍යාපෘති කළමනාකාර |
| 3 | කේ. එම්. ජී. නිශාන්ති මහත්මිය | සංවර්ධන නිලධාරී |
| 4 | ඩබ්ලිව්. වී. නදීෂා යසංගිකා මහත්මිය | සංවර්ධන නිලධාරී |
| | සහභාගිවූවන් | |
| 5 | තිලකරත්න ගමගේ මහතා | වගාකරු |
| 6 | ඉන්දික සංජීව ද සිල්වා මහතා | වගාකරු |
| 7 | බී. ජී. නන්දසේන මහතා | වගාකරු |
| 8 | එච්. ජේ. හරිශ්චන්ද්‍ර මහතා | වගාකරු |
| 9 | එන්. ඒ. චින්තක ගුණරත්න මහතා | පොල්තෙල් නිෂ්පාදක |
| 10 | බී. ඩී. ධර්මසේන මහතා | වගාකරු |

| | | |
|---|---|---|
| 11 | ඩබ්ලිව්. ජයතිලක මහතා | වගාකරු |
| 12 | ඩී. ඩී. සූරියආරච්චි මහතා | එකතු කරන්නන් |
| 13 | වී. සී. දිසානායක මහතා | වගාකරු |
| 14 | වී. ඒ. ජයතිලක මහතා | එකතු කරන්නන් |
| 15 | ඩබ්ලිව්. වී. ද සිල්වා මහතා | වගාකරු |
| 16 | එම්. සමරසේකර මහතා | වගාකරු |
| 17 | ආර්. පී. තිලක්ෂි ද සිල්වා මහත්මිය | වගාකරු |
| 18 | පී. එල්. ඩී. පුෂ්පකුමාර මහතා | වගාකරු |

**ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා වෙහෙර, කුරුණෑගල - 2025 ජූනි 12 දින පැවැත්වුණු සාකච්ඡාව**

| අංකය | නම | අගය දාමයේ තනතුර / භූමිකාව |
|---|---|---|
| ක්ෂේත්‍ර සංවිධායකවරුන් | | |
| 1 | ආර්. ඒ. එල්. සී. රණසිංහ මහතා | නිලධාරී, පොල් සංවර්ධන මණ්ඩලය |
| 2 | ආර්. ඒ. පී. මහිලාල් මහතා | ව්‍යාප්ති නිලධාරී, CCB - කුරුණෑගල |
| 3 | වයි. එම්. යූ. ඩී. කේ. යාපා මහතා | ව්‍යාප්ති නිලධාරී, CCB - කුරුණෑගල |
| 4 | ආර්. අයි. බී. සෙනරත්න මහතා | ව්‍යාප්ති නිලධාරී, CCB - කුරුණෑගල |
| 5 | පී. ආර්. ටී. දිල්හානි මහත්මිය | ව්‍යාප්ති නිලධාරී, CCB - කුරුණෑගල |
| සහභාගිවූවන් | | |
| 6 | බී. එම්. කේ. ඩී. වන්නිනායක මහතා | කර්මාන්ත ක්ෂේත්‍රය |
| 7 | එම්. එම්. ප්‍රියන්ත කුමාර මහතා | වගාකරු |
| 8 | ඒ. සේනාධීර මහතා | වගාකරු |
| 9 | එස්. ඩී. එස්. සී. සුමනරත්න මහතා | වගාකරු |
| 10 | රේ. එම්. මහින්ද රසායක මහතා | වගාකරු |
| 11 | එල්. එම්. එස්. සිසිර කුමාර මහතා | කෝල්ටෙක් ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම |
| 12 | ඩී. එස්. එල්. බී. දොලොස්වල මහතා | වගාකරු |
| 13 | යූ. ඩී. එන්. එන්. උඩවත්ත මහතා | වගාකරු |
| 14 | ජානක පතිරණ මහතා | වගාකරු |
| 15 | කනිෂ්ක ප්‍රභාත් මහතා | වගාකරු |
| 16 | සමන්ත විජේසිරි මහතා | වගාකරු |
| 17 | ලලිත් ගුණවර්ධන මහතා | වගාකරු |

| | | |
|---|---|---|
| 18 | පී. ඩී. කල්‍යාණි මහත්මිය | වගාකරු |
| 19 | පී. වීරක්කොඩි මහතා | වගාකරු |
| 20 | ඩබ්ලිව්. සී. ඒ. කල්දේරා මහතා | වගාකරු |
| 21 | රංජිත් බාලසූරිය මහතා | වගාකරු |
| 22 | ඊ. එම්. සිරිවර්ධන මහතා | වගාකරු |
| 23 | ඩබ්ලිව්. එම්. එස්. බී. විජේකෝන් මහත්මිය | හෘක එක්ස්පෝර්ට්ස් ප්‍රයිවේට් ලිමිටෙඩ් |
| 24 | එස්. පී. ඩී. සී. එස්. පතිරණ මහතා | වගාකරු |
| 25 | ඉන්දික ප්‍රියන්ත මහතා | වගාකරු |
| 26 | සමන්ත ප්‍රදීප් වර්ණකුල මහතා | වගාකරු |
| 27 | එස්. පී. ඩී. එස්. පතිරාජ මහතා | වගාකරු |
| 28 | තිළිණ බණ්ඩාරනායක මහතා | වගාකරු |

**ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා පුත්තලම - 2025 ජූනි 16 දින පැවැත්වුණු සාකච්ඡාව**

| අංකය | නම | අගය දාමයේ තනතුර භූමිකාව |
|---|---|---|
| | ක්ෂේත්‍ර සංවිධායකවරුන් | |
| 1 | එස්. ජී. වී. ජේ. එන්. සෙනරත් මහතා | ප්‍රාදේශීය කළමනාකාර - මාරවිල |
| 2 | සේ. එම්. එම්. කේ. පුෂ්පිතා මහත්මිය | ව්‍යාප්ති නිලධාරී - මාරවිල |
| 3 | ඩී. එම්. එස්. දිසානායක මහතා | සංවර්ධන නිලධාරී - පොල් සංවර්ධන අධිකාරිය |
| 4 | කේ. එම්. එන්. එස්. විජේවර්ධන මහතා | සංවර්ධන නිලධාරී - පොල් සංවර්ධන අධිකාරිය |
| | සහභාගිවූවන් | |
| 5 | කේ. එස්. නිව්ටන් මහතා | වගාකරු |
| 6 | එස්. ඒ. උපාලි රණසිංහ මහතා | වගාකරු |
| 7 | එම්. චානුක ප්‍රනාන්දු මහතා | වගාකරු |
| 8 | ඩෙරික් සයිමන්ස් මහතා | වගාකරු |
| 9 | සන්ධ්‍යා විජේවර්ධන මහත්මිය | වගාකරු |
| 10 | ඩබ්ලිව්. බී. ජේ. තිස්සේරා මහතා | වගාකරු |
| 11 | පී. ඒ. ඩී. ඒ. එස්. ශාන්ත අප්පුහාමි මහතා | වගාකරු |
| 12 | එල්. කලණ ගීසර පෙරේරා මහතා | දිසිදි පොල් නිෂ්පාදක |

| | | |
|---|---|---|
| 13 | එම්. ඒ. එච්. කේ. මාරසිංහ මහතා | වගාකරු |
| 14 | චාරක මංගල මහතා | වගාකරු / වගා කරන්නා |
| 15 | කේ. හෙට්ටිආරච්චි මහතා | නිලධාරී |
| 16 | රෝහණ සරස්වතී මහත්මිය | නිලධාරී |
| 17 | එන්. එම්. දුල්හි කමීරා | නිලධාරී - කළමනාකරණ සහකාර |
| 18 | කේ. එච්. ආර්. විජයකීර්ති මහතා | නිලධාරී - කළමනාකරණ සහකාර |
| 19 | එම්. එල්. ඩී. එන්. රෝලන්ඩ් මහතා | කළමනාකරණ සහකාර |
| 20 | ජේ. ඒ. ඩී. විමන්ත ගිහාන් මහතා | ව්‍යාප්ති නිලධාරී |
| 21 | ඩබ්ලිව්. ඒ. නිෂානි කාංචනා | ව්‍යාප්ති නිලධාරී |

**ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා මන්නාරම - 2025 ජූනි 17 දින පැවැත්වුණු සාකච්ඡාව**

| අංකය | නම | අගය දාමයේ තනතුර භූමිකාව |
|---|---|---|
| | ක්ෂේත්‍ර සංවිධායකවරුන් | |
| 1 | එස්. ඇන්තනි ප්‍රදීස් මහතා | සංවර්ධන නිලධාරී |
| 2 | එම්. එච්. එෆ්. සෆානා මහත්මිය | CDO |
| 3 | ඒ. ධනංජයන් මහතා | CDO |
| 4 | සඳන් මංජුල මහතා | ප්‍රාදේශීය කළමනාකාර -CCB |
| | සහභාගිවූවන් | |
| 1 | එස්. ඒ. රහුමාන් මහතා | වගාකරු |
| 2 | ඒ. කේ. එම්. සියාත් මහතා | වගාකරු |
| 3 | ඒ. ආර්. එම්. මොහොමඩ් මහතා | වගාකරු |
| 4 | සී. ඒ. නලේන්දන් මහතා | වගාකරු |
| 5 | ඒ. නිතර්ෂන් මහතා | වගාකරු |
| 6 | සෙයියදු නයිම්පිල්ලෙයි මහතා | වගාකරු |
| 7 | එස්. යෝගරාජා මහතා | වගාකරු |
| 8 | ඒ. එම්. මුස්තකීම් මහතා | වගාකරු |
| 9 | එම්. එස්. එම්. අහුබර් මහතා | වගාකරු |

| | | |
|---|---|---|
| 10 | එස්. මී. රසිත් මහතා | වගාකරු |
| 11 | ජේ. වජිත් මහතා | වගාකරු |
| 12 | එස්. එම්. ඉසෙඩ්. හක් මහතා | වගාකරු |
| 13 | එස්. කතිර්කාමනාදන් මහතා | වගාකරු |
| 14 | ඒ. එල්. මොහොමඩ් මහතා | වගාකරු |
| 15 | වයි. කලීල් මහතා | වගාකරු |
| 16 | එස්. එම්. ඉමාම් මහතා | වගාකරු |
| 17 | පී. රාජේන්ද්‍රන් මහතා | වගාකරු |
| 18 | බී. එම්. හුසේන් මහතා | වගාකරු |

**ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා යාපනය - 2025 ජූනි 18 දින පැවැත්වුණු සාකච්ඡාව**

| අංකය | නම | අගය දාමයේ භූමිකාව |
|---|---|---|
| | ක්ෂේත්‍ර සංවිධායකවරුන් | |
| 1 | කේ. ස්වගුණනාදන් මහතා | සංවර්ධන නිලධාරී |
| 2 | පී. සුබාෂිණී මහත්මිය | නිලධාරී - පොල් සංවර්ධන අධිකාරිය |
| 3 | ඊ. සතුනන් මහතා | ප්‍රාදේශීය කළමනාකාර |
| | සහභාගිවූවන් | |
| 4 | එස්. සිවරාජසිංගම් මහතා | වගාකරු |
| 5 | කේ. රමීසා බෙගම් මහත්මිය | වගාකරු |
| 6 | එස්. යදුසන් මහතා | කර්මාන්ත සහභාගිවන්නෙක් |
| 7 | ජේ. පිරින්දන් මහතා | වගාකරු |
| 8 | සිලෝජන් මහතා | වගාකරු |
| 9 | කේ. ප්‍රභාකරන් මහතා | වගාකරු |
| 10 | එස්. සිවකරන් මහතා | වගාකරු |
| 11 | බී. කුගජනන් මහතා | වගාකරු |
| 12 | එස්. තේවරාජන් මහතා | වගාකරු |
| 13 | එම්. වාකීසන් මහතා | වගාකරු |
| 14 | පී. සසිරූපන් මහතා | වගාකරු |
| 15 | එස්. බාමිකා මෙය | වගාකරු |
| 16 | එස්. යසෝධා මෙය | වගාකරු |

| | | |
|---|---|---|
| 17 | ටී. සෙල්වරාජ් මහතා | වගාකරු |
| 18 | වී. ප්‍රභාකරන් මහතා | වගාකරු |
| 19 | කේ. කමලාදේවි මහත්මිය | වගාකරු |
| 20 | කේ. අනුරාජ් මහතා | වගාකරු |
| 21 | කේ. මහින්දන් මහතා | වගාකරු |
| 22 | එස්. මතිවදනන් මහතා | වගාකරු |
| 23 | පී. සර්මිණි මෙය | වගාකරු |
| 24 | ජේ. ජයන්ති මෙය | වගාකරු |
| 25 | ඊ. කුමුදා මෙය | වගාකරු |
| 26 | වී. සතුකලා මෙය | වගාකරු |

**ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා මුලතිව් - 2025 ජූනි 19 දින පැවැත්වුණු සාකච්ඡාව**

| අංකය | නම | අගය දාමයේ භූමිකාව |
|---|---|---|
| 1 | පී. තවමෝහන් මහතා | වගාකරු |
| 2 | එස්. ප්‍රභාකරන් මහතා | වගාකරු |
| 3 | එම්. ප්‍රදීපන් මහතා | වගාකරු |
| 4 | කේ. ගුණසීලන් මහතා | වගාකරු |
| 5 | පී. රමේෂ් මහතා | වගාකරු |
| 6 | එම්. අමුතරසා මහතා | මෝල් හිමිකරු |
| 7 | වී. තුරෙයිරාජා මහතා | වගාකරු |
| 8 | එන්. ජයකරන් මහතා | වගාකරු |
| 9 | එස්. තුවාරගන් මහතා | වගාකරු |
| 10 | කේ. මහේෂ්වරන් මහතා | වගාකරු |
| 11 | එස්. ක්‍රිෂ්ණරාජා මහතා | වගාකරු |
| 12 | එස්. ගනේෂලිංගම් මහතා | මෝල් හිමිකරු |
| 13 | එස්. ජයකරන් මහතා | වගාකරු |
| 14 | ටී. තයකරන් මහතා | වගාකරු |
| 15 | කේ. කෙදිල්ල මහතා | වගාකරු |
| 16 | කේ. කේසවන් මහතා | වගාකරු |
| 17 | එස්. කලාධරන් මහතා | වගාකරු |

| | | |
|---|---|---|
| 18 | එස්. සුජෙන්තිනී මෙය | වගාකරු |
| 19 | ටී. කාසිතා මෙය | වගාකරු |
| 20 | නී. යසෝදිනී මෙය | වගාකරු |
| 21 | කේ. රත්නාවලී මෙය | වගාකරු |
| 22 | එස්. වසන්ත කුමාරි මෙය | වගාකරු |
| 23 | එස්. පුෂ්පමාලා මෙය | වගාකරු |
| 24 | පී. තවමෝහන් මහතා | වගාකරුවෙ |
| 25 | එස්. ප්‍රභාකරන් මහතා | වගාකරු |

**ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා: නූපේ, මාතර - 2025 ජූනි 25 දින පැවැත්වුණු සාකච්ඡාව**

| අංකය | නම | අගය දාමයේ භූමිකාව |
|---|---|---|
| ක්ෂේත්‍ර සංවිධායකවරුන් | | |
| 1 | ඒ. ජී. එස්. රංගජී මහතා | නිලධාරී, CDA |
| 2 | ඒ. ඒ. ටී. ලක්මිණී මෙය | කළමනාකරණ සහකාර |
| 3 | පී. අබේසිංහ මහතා | සංවර්ධන නිලධාරී, CCB |
| 4 | සී. ආර්. ගුණවර්ධන මහතා | සංවර්ධන නිලධාරී, CCB |
| සහභාගිවූවන් | | |
| 1 | ආර්. කේ. සී. නිරෝෂන් මහතා | පොල් කටු අඟුරු නිෂ්පාදක |
| 2 | කේ. කේ. කරුණාරත්න මහතා | කප්රුක සමිතිය |
| 3 | එම්. බී. නිමල් පියතිලක මහතා | පොල් කටු අඟුරු නිෂ්පාදක |
| 4 | ඒ. පී. ලියනගේ මහතා | පොල්තෙල් නිෂ්පාදක |
| 5 | සම්පත් බුද්ධික මහතා | වගාකරු |
| 6 | සී. එච්. ජගත්ප්‍රිය මහතා | වගාකරු |
| 7 | ඩබ්ලිව්. පී. සුමනසේන මහතා | කොහු නිෂ්පාදක |
| 8 | සමිත් ගුණසේකර මහතා | වගාකරු |
| 9 | අශෝක ඉන්දික වික්‍රමගේ මහතා | නිෂ්පාදකයින් |
| 10 | මලීෂා විතානගේ මෙය | වගාකරු |
| 11 | දමිත් සමරකෝන් මහතා | වගාකරු |
| 12 | විජිත සිරිවර්ධන මහතා | වගාකරු |
| 13 | කේ. ආරියදාස මහතා | වගාකරු |

| | | |
|---|---|---|
| 14 | එස්. පී. ඒ. ලසන්ති මෙය | සංවර්ධන නිලධාරී |
| 15 | ජී. සුමුදු නිර්මලා මෙය | සංවර්ධන නිලධාරී |
| 16 | බී. කේ. ගිම්හානි මෙය | සංවර්ධන නිලධාරී |
| 17 | එච්. ඩබ්ලිව්. එස්. සෙව්වන්දි මෙය | සංවර්ධන නිලධාරී |
| 18 | ඩබ්ලිව්. ප්‍රියංකා මෙය | සංවර්ධන නිලධාරී |
| 19 | ඩී. එල්. ඒ. වසන්ත මහතා | සංවර්ධන නිලධාරී |
| 20 | චාමර මහතා | සංවර්ධන නිලධාරී |

**ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාඃ කුරුණෑගල - 2025 අගෝස්තු 7 දින පැවැත්වුණු සාකච්ඡාව**

| අංකය | නම | අගය දාමයේ භූමිකාව |
|---|---|---|
| 1 | සුජිත් බන්දුල මහතා | එකතු කරන්නන් |
| 2 | රොහාන් හේරත් මහතා | එකතු කරන්නන් |
| 3 | එම්. එම්. කේ. කුමාරතුංග මහතා | එකතු කරන්නන් |